326 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 326 - இல. 12
Volume 326 - No. 12

2026 මැයි 22වන සිකුරාදා
2026 மே 22, வெள்ளிக்கிழமை
Friday, 22nd May, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2184-2218]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

2029 වන විට සෙස් බද්ද ඉවත් කිරීමෙන් ඇති විය හැකි ආර්ථික බලපෑම [තීරුව 2219]

රුපියල අවප්‍රමාණය වීම සහ ඉන්ධන මිල ඉහළ යාමේ බලපෑම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර [තීරුව 2221]

**රාජ්‍ය ආයතන සහ මූල්‍ය පද්ධති සයිබර් ප්‍රහාරවලින් ආරක්ෂා කිරීම:**

ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2230]

**ශෝක ප්‍රකාශ:** [තීරු 2239-2307]

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු එස්.සී. මුතුකුමාරණ මහතා
ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මහතා
ගරු නන්දන ගුණතිලක මහතා
ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මහතා
ගරු ටී. කනගසබෙයි මහතා

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 2308-2319]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 2319-2330]

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2184-2218]

**தனி அறிவித்தல் மூல வினா:**

2029இல் செஸ் வரி நீக்கத்தால் ஏற்படக்கூடிய பொருளாதாரத் தாக்கம் [ப: 2219]

ரூபாயின் தேய்மானம் மற்றும் எரிபொருள் விலை உயர்வால் ஏற்படும் தாக்கத்தைத் தணிப்பதற்கான நடவடிக்கை [ப: 2221]

**அரச நிறுவனங்கள் மற்றும் நிதியியல் முறைமைகளை சைபர் தாக்குதல்களிலிருந்து பாதுகாத்தல்:**

டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சரினது கூற்று [ப: 2230]

**அனுதாபத் தீர்மானங்கள்:** [ப:  2239- 2307]

மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண
மாண்புமிகு எஸ்.சீ. முதுகுமாரண
மாண்புமிகு சந்திரதாச கலப்பத்தி
மாண்புமிகு நந்தன குணதிலக
மாண்புமிகு ஜனக் மஹேந்திர அதிகாரி
மாண்புமிகு ரீ. கனகசபை

**ஒத்திவைப்பு வினாக்கள்:** [ப: 2308-2319]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 2319-2330]

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2184-2218]

QUESTION BY PRIVATE NOTICE:

Projected Economic Impact of Phasing Out CESS by 2029 [Col. 2219]

Measures Taken to Mitigate Impact of Rupee Depreciation and Rising Fuel Prices [Col. 2221]

SAFEGUARDING PUBLIC INSTITUTIONS AND FINANCIAL SYSTEMS FROM CYBERATTACKS:

Statement by Deputy Minister of Digital Economy [Col. 2230]

VOTES OF CONDOLENCE: [Cols. 2239-2307]

Hon. (Prof.) Tissa Vitarana
Hon. S. C. Muthukumarana
Hon. Chandradasa Galappaththi
Hon. Nandana Gunathilake
Hon. Janak Mahendra Adhikari
Hon. T. Kanagasabai

ADJOURNMENT QUESTIONS [Cols. 2308-2319]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 2319-2330]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මැයි 22වන සිකුරාදා***
*2026 மே 22, வெள்ளிக்கிழமை*
*Friday, 22nd May, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 106 සහ 78(ආ) වගන්ති සමඟ කියවිය යුතු 105 වගන්තිය යටතේ පාලක මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් සාදන ලදුව, 2026 මාර්තු 12 දිනැති අංක 2479/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති මම ඉදිරිපත් කරමි.

මෙම රීති රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, කුරුණෑගල, පොළොන්නරුව, මාතලේ, මහනුවර, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, බදුල්ල, මොනරාගල, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බලශක්ති අමාත්‍යාංශය (විදුලිබල අංශය) සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රත්මලාන, නෙලුම්පුර දකුණ, පස්වන පටුමග, අංක 1 යන ලිපිනයෙහි පදිංචි එල්.එන්. ද සොයිසා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, පිළියන්දල, බෝකුන්දර, සඳ කිරණ මාවත, අංක 112 යන ලිපිනයෙහි පදිංචි එම්.එම්. සිරිලාල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂණ රාජකරුණා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චමිපික හෙට්ටිආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු සතිය අවසන් වෙන්නට පෙර ඉදිරි පාර්ලිමේන්තු සතියේ වැඩ කටයුතු ගැන සාකච්ඡා කරන්න පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමක්, පක්ෂ නායක රැස්වීමක් පවත්වනවා. නමුත් එවැනි සූදානමක් ඇති බව තවමත් අපිට වාර්තා වෙලා නැති නිසා විශේෂයෙන්ම රටේ පවතින තත්ත්වය පිළිබඳව සියලු දේශපාලන පක්ෂ, මහජන නියෝජිතයෝ, ඒ වාගේම ජනතාව විමසිල්ලෙන් පසු වෙන වෙලාවක ඊයේ විපක්ෂයේ පක්ෂ ගණනාවක සාකච්ඡාවක් පවත්වපු වෙලාවේදීත් අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, මේ තත්ත්වය යටතේ අද දවස ඇතුළත අපට පක්ෂ නායක රැස්වීමක් ලබා දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Parliamentary Business Committee එකේදි කථා කරලා ඔබතුමන්ලාට යෝජනාවක් ගේන්න පුළුවන්. Parliamentary Business Committee එකට යෝජනාව ගේන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමක් සාමාන්‍යයෙන් පවත්වන බව ඇත්ත. නමුත් නැවත පාර්ලිමේන්තු සභා වාරය පවත්වන්න තිබෙන්නේ ලබන ජූනි මාසයේ 09වැනි දා. එතකොට, සති දෙකකට එහා පැත්තේ කාලයක් තිබෙනවා. ඒ නිසා අපි අපේ පැත්තෙන් තීන්දු කරපු දේ තමයි, ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානයක් ගන්න නිසා, කලින් දැනුවත් කරලා ජූනි මාසයේ මුල් සතියේ වාගේ දිනයක පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව රැස් කරනවාය කියන එක.

ගරු කථානායකතුමනි, වෙන දේශපාලන කටයුත්තක් වෙනුවෙන් එතුමන්ලාට ඔබතුමා සමඟ සාකච්ඡාවක් කරන්න අවශ්‍ය නම් ඒක වෙනම දෙයක්. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ගත්තොත්, අපිට ආණ්ඩුවේ කටයුතු පෙළ ගස්වාගන්න පුළුවන් වෙන්නේ අණපනත් ලැබෙන විධියත් එක්ක. ඒ නිසා අපි ජූනි මාසයේ මුල වෙනදා වාගේම ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාව දැනුවත් කරලා ඔබතුමාගේත් එකඟතාවෙන් තමයි බොහෝ වෙලාවට දින යොදා ගන්නේ. එහෙම තමයි අපි කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, අපි ඒ විධියට ඒ වැඩ කටයුතු කරමු. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රටේ පවතින තත්ත්වය ගැන ඊයේ පෙරේදා දවස් දෙකේම මෙතැනදී කථා කළා. රට පාලනය කරන්න ජනතාව පත් කර ගත් ජනාධිපතිවරයෙක් ඉන්නවා; ආණ්ඩුවක් තිබෙනවා. ඒ කටයුත්ත සඳහා මේ ආණ්ඩුව මැදිහත් වෙමින් තිබෙනවා. මේ රටේ දැන් ඇති වී තිබෙන, ඩොලරය පිළිබඳ ප්‍රශ්නය අපි දන්නවා. *[බාධා කිරීමක්]* ඩොලරයේ ප්‍රශ්නය අපි දන්නවා. ඒ ප්‍රශ්නය විසඳන්න කරන්න පුළුවන් හැම මැදිහත්වීමක්ම අපි කරමින් ඉන්නවා. ඒ පිළිබඳව මෙතැන සම්පූර්ණයෙන්ම දින දෙකක විවාදයක් පැවැත්වූවා. ඒ අනුව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්, උදහස්වලට අපි ඇහුම්කන් දීලා තිබෙනවා. ඒවා ගැන කිසිම අවතක්සේරුවක් නැහැ. නමුත් මට කියන්න තිබෙන්නේ, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ජූනි මාසයේ මුල, නැත්නම් මේ මාසයේ අග දිනයක පවත්වන්න බලාපොරොත්තු වන බවයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න - *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අපට අවශ්‍යයි, පක්ෂ නායක රැස්වීමක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා රැස්වීමක් පවත්වලා Parliamentary Business Committee එකට දැනුම් දීමට කටයුතු කරන්න, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමායි එය ලබා දෙන්න ඕනෑ- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපි නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීම ඔබතුමන්ලා- [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඔබතුමන්ලාට ඉදිරි දිනයකදී- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමන්ලා, ඔබතුමන්ලාට ලබා දීමට කටයුතු කරනවා- [බාධා කිරීමක්]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115හි සඳහන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව කැඳවීම සඳහා යෝජනා කරන්න ඕනෑ, වැඩ පිළිවෙළ හදන්න ඕනෑ තමුන්නාන්සේයි. සභානායකතුමා යොදවා, විපක්ෂ නායකතුමා යොදවා ඔබතුමාගේ කාර්ය පටිපාටිය පහසු කර ගැනීම සඳහා තමයි එය පිහිටුවා තිබෙන්නේ. ඒ කියන්නේ ඔබතුමා තමයි එය කැඳවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ වැඩ පිළිවෙළ ලබා දෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවශ්‍ය වෙලාවට එය කැඳවීමේ කටයුතු කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒකයි විපක්ෂයේ අපි ඉල්ලන්නේ. ඒ අවස්ථාව කරුණාකර ලබා දෙන්න.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1186/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මේක රටේ තිබෙන බරපතළ ආර්ථික ප්‍රශ්නයක් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණාව ගැන තමයි මම මීට කලිනුත් ඔබතුමන්ලාට දැනුම් දුන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි ඉල්ලා සිටින්නේ- *[බාධා කිරීමක්]* ඔබතුමායි නායකයා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පක්ෂ නායක රැස්වීමක් විතරයි අපි ඉල්ලන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි ඉල්ලන්නේ, පක්ෂ නායක රැස්වීමක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ දවස ඉදිරියේදී ඔබතුමාට දැනුම් දීමට කටයුතු කරන්නම්.

## මුල්ලිකුලම්හි අවතැන් වූ ජනතාවට අයත් පාරම්පරික ඉඩම්: නැවත පදිංචි කිරීම
## முள்ளிக்குளத்தில் இடம்பெயர்ந்த மக்களுக்குச் சொந்தமான பாரம்பரிய காணிகள்: மீளக்குடியமர்த்தல்
## ANCESTRAL LANDS BELONGING TO DISPLACED PEOPLE OF MULLIKULAM: RESETTLEMENT

1360/2025

**2.** ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුල්ලිකුලම් ප්‍රදේශයේ ජනතාවට අයත් ඉඩම් 2007 වර්ෂයේ සිට යුද්ධ හමුදාව යටතේ පවතින බැවින්, එම ප්‍රදේශයෙන් අවතැන් වූ ජනතාවට මේ වන තෙක් තමන්ගේ ගම්මානවලට ආපසු යෑමට නොහැකි වී ඇති බව දන්නේද;

(ii) එම ජනතාවට තමන්ගේ වාසස්ථානවල නැවත පදිංචි වීමට නොහැකි වීමට හේතු කවරේද;

(iii) එම ප්‍රදේශයේ අවතැන් වූ පවුල් 300කට අධික සංඛ්‍යාවකට නිසි නිවාස පහසුකම්, ජීවනෝපාය අවස්ථා සහ මූලික පහසුකම් නොමැති අතර, එම ජනතාව වෙනුවෙන් රජය විසින් මෙතෙක් ලබා දී ඇති සහන කවරේද;

(iv) මුල්ලිකුලම් ජනතාව සතු පාරම්පරික ඉඩම්, නිවාස, පාසල් සහ ආගමික ස්ථාන වර්තමානයේ නාවික හමුදාව යටතේ පවතින්නේද;

(v) එසේ නම්, ඒවා නිදහස් කොට ජනතාවට නැවත භාර දීමට ගනු ලබන පියවර කවරේද;

(vi) එම අවතැන් වූ ජනතාව ඔවුන්ගේ ස්ථිර වාසස්ථානවල නැවත පදිංචි කිරීම සඳහා තිරසර සැලැස්මක් හෝ නිශ්චිත කාලරාමුවක් තිබේද;

(vii) එසේ නම්, එම ක්‍රියාදාමය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முள்ளிக்குளம் பிரதேச மக்களுக்குச் சொந்தமான காணிகள் 2007ஆம் ஆண்டு முதல் இராணுவத்தின் கீழ் காணப்படுவதால், அப்பிரதேசத்திலிருந்து இடம்பெயர்ந்த மக்கள் இதுவரையில் தமது சொந்தக் கிராமங்களுக்குத் திரும்பிச் செல்ல முடியாமல் இருப்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி மக்கள் தமது வாழ்விடங்களில் மீள்குடியேற முடியாமல் இருப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) குறிப்பிட்ட பிரதேசத்தில் இடம்பெயர்ந்துள்ள 300க்கும் அதிகமான குடும்பங்களுக்கு முறையான வீட்டு வசதிகள், வாழ்வாதார வாய்ப்புகள் மற்றும் அடிப்படை வசதிகள் எதுவும் காணப்படாத நிலையில், அரசாங்கம் இந்த மக்களுக்கு இதுவரை வழங்கியுள்ள நிவாரணங்கள் யாவை என்பதையும்;

(iv) முள்ளிக்குளம் மக்களுக்குச் சொந்தமான பாரம்பரிய காணிகள், வீடுகள், பாடசாலைகள் மற்றும் மத வழிபாட்டுத்தலங்கள் தற்போது கடற்படையின்கீழ் காணப்படுகின்றனவா என்பதையும்;

(v) ஆமெனில், அவற்றை விடுவித்து மக்களிடம் மீளக் கையளிப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) மேற்படி இடம்பெயர்ந்துள்ள மக்களை அவர்களின் நிரந்தர வாழ்விடங்களில் மீள்குடியமர்த்துவதற்கான நிரந்தரத் திட்டம் அல்லது குறிப்பிட்ட காலவரையறை காணப்படுகின்றதா என்பதையும்;

(vii) ஆமெனில், மேற்படி செயன்முறையைப் பூர்த்தி செய்வதற்கு எதிர்பார்க்கப்படும் காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) whether he is aware that since the lands belonging to the people of Mullikulam have been under the control of the military since 2007, the displaced people from the said area have not been able to return to their villages;

(ii) the reasons as to why the said people have been unable to resettle in their places of residence;

(iii) as there are more than 300 displaced families in the said area, who lack proper housing facilities, livelihood opportunities and basic amenities, the relief that has so far been provided by the Government to those people;

(iv) whether the ancestral lands, houses, schools and religious places belonging to the people of Mullikulam are currently under the control of the Navy;

(v) if so, the steps that will be taken to release them and return them to the people;

(vi) whether there is a sustainable plan or a specific time frame for the resettlement of the said displaced people in their permanent residences; and

(vii) if so, the expected time frame for the completion of the said process?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මුල්ලිකුලම් ප්‍රදේශයේ ජනතාවට අයත් ඉඩම් යුද්ධ හමුදාවේ පරිහරණයට ගෙන නොමැත.

තවද, 2007 වර්ෂයේ සිට අවතැන් වූ ජනතාවට මේ වනතෙක් තම ගම්මානවලට ආපසු යෑමට නොහැකි වීම පිළිබඳ තොරතුරු අප අමාත්‍යාංශය සතුව නොමැත.

කෙසේ වුවද, මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරිච්චිකඩ්ඩි ග්‍රාම නිලධාරි වසමේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් - ඒ රජයේ ඉඩම් - හෙක්ටෙයාර 245.9ක භූමි ප්‍රමාණයක් නාවික හමුදා කඳවුරක් සඳහා 2009 වර්ෂයේ සිට පරිහරණය කරන අතර අවස්ථා කිහිපයකදී ඉඩම් කොටස් නාවික හමුදාව විසින් නිදහස් කරන ලද අතර, ආසන්නම අවස්ථාව ලෙස 2017 වර්ෂයේදී ආසන්න වශයෙන් අක්කර 77ක ප්‍රමාණයක් සිවිල් පරිහරණය සඳහා නිදහස් කර ඇත. එලෙස නාවික හමුදාව පරිහරණය කරන ඉඩම තුළ පිහිටි සිවිල් නිවාස 27ක් වෙනුවෙන් 2012 වර්ෂයේදී මනල්කාඩු ග්‍රාමයේ නිවාස 27ක් සිවිල් පුද්ගලයින් වෙනුවෙන් ඉදි කර ලබා දී ඇත. ගරු මන්ත්‍රීතුමනි, මනල්කාඩු ප්‍රදේශයේ හදලා තිබෙන ගෙවල් 27 පිළිබඳ විස්තර ඇතුළත් ලැයිස්තුවක් තිබෙනවා. එම ලැයිස්තුව ඇමුණුම වශයෙන් පහත දක්වා ඇත.

**NAME LIST OF THE HOUSE HOLDERS**

| S/NO | NAME | NO OF FAMILY MEMBERS | NIC NUMBER | LOT NO | RESETTLED FAMLIES |
|---|---|---|---|---|---|
| 1 | J Thilaharajan Dias | 5 | 762933993 V | House no-01 | √ |
| 2 | S Anthony Reval | 6 | 500371501 V | House no-02 | √ |
| 3 | M Anthony Reval | 5 | 542723653 V | House no-03 | √ |
| 4 | E Anthony Lambert | 4 | 411001148 V | House no-04 | √ |
| 5 | C MariyathasanCroos | 7 | 610614212 V | House no-05 | √ |
| 6 | S Francis Peries | 1 | 472612123 V | House no-06 | √ |
| 7 | C Andru Edward Croos | 5 | 712510960 V | House no-07 | √ |
| 8 | J PathinathanCroos | 6 | 530723372 V | House no-08 | √ |
| 9 | Y SebamalaiCroos | 2 | 560043392 V | House no-09 | √ |
| 10 | A PilesiyanCroos | 2 | 353360951 V | House no-10 | √ |
| 11 | SA JebamalarDimal | 6 | 641094609 V | House no-11 | √ |
| 12 | S Pilenthiran Fernando | 7 | 592352354 V | House no-12 | √ |
| 13 | P CalistasCroos | 5 | 542881135 V | House no-13 | √ |
| 14 | S Thomas Croos | 7 | 523391941 V | House no-14 | √ |
| 15 | C MarteenVaz | 6 | 650303679 V | House no-15 | √ |
| 16 | Y JujinMasnadCroos | 5 | 530583864 V | House no-16 | √ |
| 17 | V Sebasthian Dias | 6 | 632503365 V | House no-17 | √ |
| 18 | R AnthoniyappuCoonghe | 5 | 523241931 V | House no-18 | √ |
| 19 | M SahayanathanReval | 6 | 612503320 V | House no-19 | √ |
| 20 | V Jude Selvaraj Lambert | 6 | 713214358 V | House no-20 | √ |
| 21 | M Francis Vaz | 2 | 2804080075 | House no-21 | √ |
| 22 | A Moses ThayanReval | 3 | 780635002 V | House no-22 | √ |
| 23 | K Jesunesan Dias | 5 | 710620679 V | House no-23 | √ |
| 24 | S SoosaiyappuCroos | 3 | 553112265 V | House no-24 | √ |
| 25 | A Emmanuel Croos | 4 | 640182199 V | House no-25 | √ |
| 26 | SS Michel Peries | 2 | 450804360 V | House no-26 | √ |
| 27 | J CholasticaSiraiva | 4 | 711644332 V | House no-27 | √ |

තවද, නාවික හමුදාව විසින් පානීය ජලය, ප්‍රවාහන පහසුකම් වැනි යටිතල පහසුකම් ද මේ වන විට ප්‍රදේශයේ ජනතාව වෙත ලබා දීලා තිබෙනවා. ඒ අර කියපු අක්කර ප්‍රමාණයේ ඉන්න කොටසේ විතරයි. ඒක රජයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති එකක්.

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාව පරිහරණය කරන භූමියට අයත්ව තිබූ සිවිල් නිවාස 27ක් වෙනුවට මනල්කාඩු ප්‍රදේශයේ 2012 වර්ෂයේදී නිවාස 27ක් නාවික හමුදාව විසින් ඉදි කර දී ඇති අතර එම නිවාසවල සිවිල් වැසියන් දැනට පදිංචි වෙලා සිටිනවා.

(iii) මේ සම්බන්ධ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය සතුව නැහැ. අවතැන් වූ සිවිල් පුද්ගලයන් නැවත පදිංචි කිරීම සම්බන්ධව විස්තර අනෙක් අමාත්‍යාංශයේ තිබෙන්නේ. ඒ අමාත්‍යාංශයට යොමු කරලා ඒ විස්තර ඉදිරිපත් කරන්නම්.

(iv) ඉහත ප්‍රශ්න අංක (ii) සඳහා ලබා දී ඇති පිළිතුර ප්‍රකාරව නාවික හමුදාව විසින් පරිහරණය කරන ඉඩම් ප්‍රදේශය තුළ පිහිටි නිවාස 27ක් නාවික හමුදාව විසින් රාජකාරි සඳහා භාවිත කරනු ලබන අතර ඒ වෙනුවෙන් විකල්ප නිවාස 27ක් සිවිල් වැසියන් සඳහා මනල්කාඩු ප්‍රදේශයේ ඉදි කර දී ඇත. ඇමුණුමෙහි විස්තර සඳහන් වේ.

තවද, නාවික හමුදා කඳවුර පිහිටා ඇති පරිශ්‍රය තුළ රෝමානු කතෝලික දේවස්ථානයක් සහ රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසල පිහිටා ඇති අතර එම ප්‍රදේශය ආවරණය වන පරිදි අක්කර 77ක භූමි ප්‍රමාණයක් නාවික හමුදාව විසින් නිදහස් කොට ඇති අතර එම ස්ථානයන්ට පිවිසීම සඳහා පිවිසුම් මාර්ගය ද නාවික හමුදාව විසින් නිදහස් කරන ලද අතර කතෝලික දේවස්ථානය සහ රෝමානු කතෝලික මිශ්‍ර පාසලෙහි කටයුතු පහසු කිරීම උදෙසා පහත සඳහන් සේවාවන් නාවික හමුදාව විසින් තවදුරටත් සපයා ඇත.

- කතෝලික දේවස්ථානය හා රෝමානු කතෝලික දමිළ මිශ්‍ර විදුහලට පැමිණෙන බැතිමතුන්ට හා පාසල් සිසුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් නාවික හමුදාව මඟින් නොමිලේ ලබා දීම සිදු කරනු ලබයි.
- සිංහල හා දමිළ දරුවන් සඳහා නාවික හමුදා සේවා වනිතා ඒකකය මඟින් පෙර පාසලක් පවත්වා ගෙන යනු ලබන අතර ඒ සඳහා විශේෂ ක්‍රමය යටතේ ගුරුවරුන් දෙදෙනෙකු බඳවාගෙන ඇත. ඔවුන් නාවික හමුදාව මඟින් වැටුප් ලබා දෙමින් සේවයට අනුයුක්ත කර ඇත.

මෙම ප්‍රදේශයේ සිවිල් ජනතාව කිසිදු ආකාරයකින් නෙරපීමක් හෝ අවතැන්වීමට ඉඩ සැලසීමක් නාවික හමුදාව විසින් සිදු කොට නොමැත.

(v) නාවික හමුදාව විසින් පරිහරණය කරන ලද ඉඩම් ප්‍රමාණයෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අක්කර 752ක් සහ 2017 වර්ෂයේදී අක්කර 77ක් වශයෙන් මුළු ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 829ක් සිවිල් ජනතාව වෙත මේ වන විට නිදහස් කිරීමට කටයුතු කර ඇත. දැනට නාවික හමුදාව විසින් භාවිත කරන හෙක්ටෙයාර 245.9ක ප්‍රමාණය නිවැරදි තක්සේරු කිරීමකින් අනතුරුව ජාතික ආරක්ෂාව සඳහා උපායමාර්ගිකව වැදගත් වන සහ නාවික කඳවුරක් පවත්වාගෙන යාමට අවශ්‍ය වන ඉඩම් කොටස් තබා ගනිමින් ඉතිරි ඉඩම් කොටස් ඉඩම්වල අයිතිය හිමි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී සලකා බැලීමට නියමිතව ඇත.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

(vi) නාවික හමුදා පරිහරණයට ගන්නා ලද නිවාස 27 වෙනුවට ඉහත (ii)හි පරිදි නිවාස ඉදි කර ජනතාව වෙත ලබා දී ඇත.

(vii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவை நான் கேட்கின்றேன்.

கௌரவ பிரதிப் பாதுகாப்பு அமைச்சர் குறிப்பிட்ட சில விடயங்கள் என்னைப் பொறுத்தவரையிலும் குறித்த மக்களைப் பொறுத்தவரையிலும் தவறானது என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். முள்ளிக்குளம் கிராம மக்கள் அந்த இடத்தி லிருந்து 1990ஆம் ஆண்டு முதன்முதல் இடம்பெயர்ந்தனர். பின்பு 2002ஆம் ஆண்டு அவர்கள் சொந்த இடங்களில் மீள்குடியமர்த்தப்பட்டபோது 150 வீடுகள் அமைத்துக் கொடுக் கப்பட்டன. 2007ஆம் ஆண்டு திரும்பவும் இடம்பெயர்வு ஏற்பட்டதன் பின்பு அந்த வீடுகளில் கடற்படையினர்தான் இருக்கின்றார்கள். நான் நேரடியாகப் போய்ப் பார்வை யிட்டேன். அந்த மக்கள் காயாக்குழி உள்ளிட்ட வேறு கிராமங்களில் குடியமர்த்தப்பட்டிருக்கின்றார்கள். அவர்கள் கடந்த அரசாங்கங்களின் ஆட்சிக் காலங்களின்போது பாரிய போராட்டங்களை மேற்கொண்டிருந்தார்கள். பிள்ளைகள் பாடசாலைக்குப் போய்ப் படிப்பதற்கான வசதிகள் அங்கு ஏற்படுத்தப்பட்டிருக்கின்றன; தேவாலயத்திற்குச் சென்று வழிபடுவதற்கான வசதிகள் ஏற்படுத்தப்பட்டிருக்கின்றன. ஆனால், அவர்கள் இப்போது குடியேறியிருக்கும் இடங்களி லிருந்து அந்தப் பாடசாலைக்கும் தேவாலயத்திற்கும் பெரும் சிரமத்தின் மத்தியில்தான் போய்க் கொண்டிருக்கிறார்கள். இது உண்மையிலேயே முன்னைய அரசாங்கங்கள் செய்த வேலைகள்தான். இருந்தாலும், உங்களுடைய அரசாங்கத்தின் மீது மக்களுக்கு நம்பிக்கை கூடுதலாக இருக்கின்றது. அந்த வகையில், முள்ளிக்குளம் கிராம மக்களை உரிய இடத்தில் மீள் குடியேற்ற வேண்டும். ஏனென்றால், அந்த இடம் அக்கிராம மக்களுக்குரியது.

இதுதவிர, வயல் நிலங்கள், தோட்டச்செய்கை நிலங்கள் கூட அபகரிக்கப்பட்டிருக்கின்றன. அவற்றை வன இலாகாவும், கடற்படையினரும் சேர்ந்துதான் பாவிக்கிறார்கள். அத்துடன், அங்கு கடற்றொழிலாளர்கள் பயன்படுத்தும் இறங்குதுறையை முற்றுமுழுதாகக் கடற்படைதான் பயன்படுத்திக் கொண்டிருக் கிறது. உங்களுக்கு சரியான தரவுகள் கிடைக்கப் பெற வில்லையோ என்பது எனக்குத் தெரியாது. ஆனால் நான் நேரடியாக மூன்று தடவை அந்தக் கிராமத்துக்குச் சென்று பார்த்ததைத்தான் இங்கு சுட்டிக் காட்டுகின்றேன்.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්වපු මුල්ලිකුලම් නාවික හමුදා කඳවුර පිහිටා ඇති පරිශ්‍රය තුළ රෝමානු කතෝලික දේවස්ථානයක් සහ රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලක් පිහිටලා තිබෙනවා. එම ප්‍රදේශය ආවරණය වන විධියට අක්කර 77ක භූමි ප්‍රමාණයක් තමයි නාවික හමුදාව විසින් නිදහස් කරලා තිබෙන්නේ, මම කිව්ව විධියට. මේ ස්ථානයට සිවිල් ජනතාවට පිවිසෙන්න පිවිසුම් මාර්ගය ද නාවික හමුදාව විසින් නිදහස් කරලා තිබෙනවා. එතකොට කතෝලික දේවස්ථානයේ සහ රෝමානු කතෝලික මිශ්‍ර පාසලේ කටයුතු පහසු කිරීම සඳහා තමයි ඒ සේවා නාවික හමුදාව විසින්ම සිද්ධ කරන්නේ. කතෝලික දේවස්ථානයට පැමිණෙන බැතිමතුන්ට සහ රෝමානු කතෝලික දමිළ මිශ්‍ර විදුහලට පැමිණෙන පාසල් සිසුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ද නොමිලේම ලබා දෙනවා. ඒ වාගේම සිංහල හා දමිළ දරුවන් සඳහා නාවික හමුදා සේවා වනිතා ඒකකය මඟින් පෙර පාසලක් ද පවත්වා ගෙන යනවා. ඒ සඳහා විශේෂ ක්‍රමය යටතේ ගුරුවරුන් දෙදෙනෙකුත් බඳවාගෙන ඔවුන් නාවික හමුදාවෙන් වැටුප් ලබාගෙන සේවය කරනවා. මේ ප්‍රදේශයේ සිවිල් ජනතාව කිසිදු ආකාරයකින් ඉවත් කරලා නැහැ. අවතැන් වීමට ඉඩ සැලසීමක් නාවික හමුදාව විසින් සිද්ධ කරලාත් නැහැ.

ඔබතුමා දැන්වූ පරිදි නාවික හමුදාව විසින් පරිහරණය කරන ලද ඉඩම් 2012 සිට 2015 දක්වා අක්කර 752ක් නිදහස් කරලා තිබෙනවා. 2017දීත් අක්කර 77ක් නිදහස් කරලා තිබෙනවා. එතකොට මුළු ප්‍රමාණය අක්කර 829ක්. ඒ කියන්නේ 607න් විධාන මූලස්ථානයට අක්කර 245ක් තියාගෙන ඉතිරි ප්‍රමාණය නිදහස් කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. මම අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ ඔබතුමන්ලා හමුවෙන්න ලබන සතියේ සඳුදා එනවා.

ඒ වාගේම, මේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාත් සමඟ ඒ ප්‍රදේශයේ වෙසෙන ජනතාව නියෝජනය කරන සභාපතිවරුන්, ඒ සමිතිවල අය දැනට සුමාන 4කට විතර කලින් මගේ කාර්යාලයට ගෙන්වා මේ ගැන සාකච්ඡා කළා. පසුගිය අදාළ Consultative Committee එකේදීත් ඔබතුමා මේ සම්බන්ධ විස්තර ඇහුවාම ගරු ජනාධිපතිතුමාත් දැන්වූවා, මටත් සම්බන්ධ වෙලා ඒ ගැන කටයුතු කරන්න කියලා. ඒ අනුව මම එනවා. නාවික හමුදාපතිත් ඒ පළාතට ගියා දැනට සුමාන 3කට කලින්. අනිවාර්යයෙන්ම මේ පිළිබඳව සලකා බලා, දෙන්න පුළුවන් උපරිම ඉඩම් ටික නිදහස් කරන එක තමයි අපේ රජයේ වගකීම සහ පරමාර්ථය.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி, கௌரவ பிரதிப் பாதுகாப்பு அமைச்சர் அவர்களே! நாங்கள் கேட்பதும் அதுதான். அந்த மக்கள் குடியிருந்த காணிகளில் கொஞ்சக் காணிகளை விடுவித்து இருக்கிறீர்கள் என்பதில் மறுப்பதற்கில்லை. நீங்கள் பாடசாலைக்குப் பிள்ளைகள் போவதற்கு அனுமதித்ததுமாதிரி, தேவாலயத்துக்கு மக்கள் சென்று வழிபட அனுமதித்ததுமாதிரி, கடற்றொழி லாளர்கள் பயன்படுத்தும் இறங்குதுறையும் விடுவிக்கப்பட வேண்டும். ஏனென்றால், அவர்கள் மிகவும் கஷ்டப்படுகின் றார்கள். கடற்படையினர் இருக்கின்ற வீடுகள் தமிழ் மக்களுக்குரியவை. அந்த மக்கள் அங்கே குடியிருந்தார்கள். அந்த வீடுகளில்தான் இப்போது கடற்படையினர் இருக்கின்றனர். "எங்களுடைய வீடுகளில் கடற்படையினர் இருக்கின்றார்கள்; அதனை எங்களுக்கு விடாமல் அவர்கள் அபகரித்திருக்கிறார்கள்" என்று அந்த மக்கள் கூறுகிறார்கள். அந்த வார்த்தையை நீங்கள் பொய்யாக்க வேண்டும். அதாவது, அந்த வீடுகளை விடுவித்து அந்த மக்களை அங்கு மீள்குடியேற்ற வேண்டும் என்பதுதான் எங்களுடைய கோரிக்கையாகும். நிச்சயமாக நீங்கள் அதனைச் செய்வீர்கள் என்று நாங்கள் நம்புகின்றோம்.

மாண்புமிகு ஜனாதிபதியோடு நீங்களும் இருந்தவேளை சம்பந்தப்பட்ட ஆலோசனைக் குழுக் கூட்டத்தில் நான் இது சம்பந்தமாகக் கதைத்தபோது, ஜனாதிபதி அவர்களுடைய பதில்கள் இணக்கப்பாடானதாகத்தான் இருந்தன. அதற்கேற்ப அந்த மக்களுக்குரிய காணிகளை, வீடுகளை, வயல் நிலங்களை, இறங்குதுறையை விடுவிக்க ஆவன செய்ய வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමාත් දන්නවා ඇති, පසුගිය කාලවකවානුවල ඒ ප්‍රදේශයට අයත් ඔය වෙරළ තීරයේ ගොඩක් නීතිවිරෝධී කටයුතු සිද්ධ වුණා කියලා. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම් සිද්ධ වුණා. ඒ පැත්තෙන් තමයි බෝට්ටුවලින් එන්න පුළුවන් මාර්ග අපි හඳුනාගෙන තිබෙන්නේ. මේ තොටුපොළ හරහාම ඒක සිද්ධ වෙනවා කියලා අපි කියන්නේ නැහැ. නමුත්, මේ තොටුපොළ ගැනත් අපි විමර්ශනයක්, එහෙම නැත්නම් සලකා බැලීමක් කරලා තිබෙනවා. අපට අත්‍යවශ්‍යම භූමි ටික විතරක් තියාගන්න තමයි අපේ බලාපොරොත්තුව. ඒ වාගේම, හදිසි අවස්ථාවක් වුණාම ඒ තැන්වලට ත්‍රිවිධ හමුදාව ඉක්මනින්ම යොමු කරන්න ඒ ඒ ප්‍රදේශවල ස්ථානගත වෙලා සිටින්න ඕනෑ. පොලීසියට විතරක් කරගන්න බැරි අවස්ථාවලදී ත්‍රිවිධ හමුදාව යොමු කරන්න, ජන ජීවිතවල ආරක්ෂාව තහවුරු කිරීම, ආපදා තත්ත්වයක් වාගේ දෙයක් සිදු වුණාම ඒ ආපදාවලට ලක් වෙලා සිටින අයගේ ජීවිත බේරා ගැනීම, ඒ සඳහා ක්ෂණිකව මැදිහත් වීම සම්බන්ධයෙන් මේ ස්ථානවල ලොකු වැදගත්කමක් තිබෙනවා. නමුත්, ඔබතුමා කියනවා වාගේම මමත් එන සතියේ ඇවිල්ලා, ප්‍රාදේශීය ලේකම් ඇතුළු ඒ ප්‍රදේශයේ සිටින අනෙකුත් රජයේ නිලධාරි මහත්ම මහත්මීනුත් හමුවෙලා, එකට ඉඳගෙන සාකච්ඡා කරලා මේ ටික කරලා දෙන්න අපි උපරිමයෙන්ම උත්සාහ කරනවා.

## රාජ්‍ය සේවකයින්ට බෙදා දුන් ඕමන්තායි-වෙප්පන්කුලම්හි ඉඩම්: දීමනා පත්‍ර
## அரசாங்க ஊழியர்களுக்கு வழங்கப்பட்ட ஓமந்தை - வேப்பங்குள காணிகள்: அளிப்புப் பத்திரங்கள்
## LAND PLOTS IN OMANTHAI-VEPPANKULAM DISTRIBUTED TO PUBLIC SECTOR EMPLOYES: LAND GRANTS

1407/2025

**3. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට භාර කර ඇති 2011 වර්ෂයේදී රජයේ සේවකයන්ට ලබා දුන් වවුනියාව දිස්ත්‍රික්කයේ ඕමන්ත-වෙප්පන්කුලම් ප්‍රදේශයේ පර්චස් 20ක් බැගින්වූ ඉඩම් කැබැලි 125ක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දීමනා පත්‍ර ලබා දිය යුතු බව දන්නේද;

(ii) වසර 14කට පෙර රජයේ සේවකයන්ට ලබා දුන් සංවර්ධනය නොකළ එම ඉඩම් සංවර්ධනය කිරීමෙන් පසු වත්මන් වටිනාකමට ඇස්තමේන්තු කර තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් ලබා දුන් අවස්ථාවේදී තිබූ වටිනාකම සැලකිල්ලට ගනිමින් එම දේපළ නැවත තක්සේරු කරනු ලබන්නේද;

(iv) නැවත ඇස්තමේන්තු කිරීම සිදු කරන කාලවකවානු කවරේද;

(v) නැවත ඇස්තමේන්තු කිරීමෙන් අනතුරුව, අදාළ පදිංචිකරුවන්ට ඉඩම් බලපත්‍ර ලබා දිය හැකි කාලවකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா பிரதேச செயலகத்தினால் தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையிடம் ஒப்படைக்கப்பட்டுள்ள, 2011ஆம் ஆண்டில் அரசாங்க ஊழியர்களுக்கு வழங்கப்பட்ட வவுனியா மாவட்டத்தின் ஓமந்தை - வேப்பங் குளம் பிரதேசத்தில் 20 பேர்ச்சஸ் கொண்ட 125 காணித் துண்டுகளுக்கான அளிப்புப் பத்திரங்களை தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை வழங்க வேண்டும் என்பதை அவர் அறிவாரா;

(ii) 14 வருடங்களுக்கு முன்னர் அரசாங்க ஊழியர்களுக்கு வழங்கப்பட்ட அபிவிருத்தி செய்யப்படாத மேற்படி காணிகள், அபிவிருத்தி செய்யப்பட்டதன் பின்னர் தற்போதைய பெறுமதிக்கு ஏற்ப மதிப்பீடு செய்யப் பட்டுள்ளனவா;

(iii) ஆமெனில், மேற்படி காணிகளை வழங்கும் போது இருந்த பெறுமதியைக் கருத்திற்கொண்டு இச்சொத்துக்கள் மீள்மதிப்பீடு செய்யப்படுமா;

(iv) மீள்மதிப்பீடு செய்யப்படும் காலப்பகுதி யாது;

(v) மீள்மதிப்பீடு செய்ததன் பின்னர், சம்பந்தப்பட்ட குடியிருப்பாளர்களுக்கு காணி அளிப்புப் பத்திரங்களை வழங்கக்கூடிய காலப்பகுதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that the National Housing Development Authority should issue land grants for the 125 plots of land of 20 perches each in Omanthai-Veppankulam area in the Vavuniya District, which were handed over to the National Housing Development Authority by the Vavuniya Divisional Secretariat and which were distributed among public sector employees in 2011;

(ii) whether the current value of the said lands, which were distributed among public sector employees 14 years ago as undeveloped lands, has been estimated after development of those lands;

(iii) if so, whether the said lands will be revalued taking into account the value of those lands at the time of their distribution;

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

(iv) the time frame in which such revaluation will be done; and

(v) the time frame in which land permits can be issued to the occupants of these lands after revaluation?

(b) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)

(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මෙම ව්‍යාපෘතිය 2011 වසරේදී වවුනියාව ප්‍රාදේශීය ලේකම් විසින් තෝරා ගනු ලැබූ රාජ්‍ය සේවකයන් 709ක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙනු ලැබූ ණය හා ආධාර සහිතව ඉදිකරනු ලැබූ නිවාස ව්‍යාපෘතියකි. වර්තමානය වන විට මෙහි පදිංචිව සිටින ප්‍රතිලාභීන් සංඛ්‍යාව 171ක් වන අතර, අනෙක් අය පිළිබඳ වර්ගීකරණය පහත පරිදි වේ.

- මුල් පදිංචිකරුවන් විසින් කුලියට දී ඇති පවුල් සංඛ්‍යාව 24කි.
- මුල් අයිතිකරුවන්ගේ ඥාති පවුල් සඳහා දී ඇති සංඛ්‍යාව 05කි.
- නිවාස ඉදිකර ඇතත් පදිංචි වී නොමැති පවුල් සංඛ්‍යාව 101කි.
- පදිංචි වී නොමැතිව ඉඩම් කොටස් හිස්ව තබා ඇති පවුල් සංඛ්‍යාව 169කි.
- නිවාස ඉදිකිරීම් අවසන් නොකළ පවුල් සංඛ්‍යාව 239ක් වේ.

එහෙයින් ඉඩම් කැබලි 125ක් සඳහා නොව වර්තමානයේ මෙලෙස පදිංචිව ඇති ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගෙන ඒ සියලුදෙනා වෙත ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරමින් පවතී.

(ii) 2012 වසරේදී මෙම ඉඩම් සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබාගෙන ඇත.

(iii) 2011 වසරේදී ආරම්භ කරන ලද මෙම නිවාස ව්‍යාපෘතියේ ඉඩම් සඳහා 2012 වසරට අදාළව තක්සේරුව ලබාගෙන ඇති බැවින්, නැවත තක්සේරු ලබා ගැනීමක් අවශ්‍ය නොවේ.

(iv) අදාළ නොවේ.

(v) වවුනියාව ප්‍රාදේශීය ලේකම් සතුව තිබූ මෙම ඉඩම 2022 වසරේදී දීමනා පත්‍රයක් මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පවරා දී ඇති අතර, එම ඉඩම් සඳහා ප්‍රතිලාභීන්ගෙන් ඉඩමේ වටිනාකම අය නොකරන ලෙසත්, මෙම නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියට වැය වූ මුදල් පමණක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ඔප්පු ලබා දීමට කටයුතු කරන ලෙසත් එම දීමනා පත්‍රයේ සඳහන්ව ඇත.

මේ වන විට මිනින්දෝරු සැලැස්මට අනුව කැබලි ලේබන ලැබී ඇති අතර, සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය සේවකයන් සඳහා ඔප්පු ලබා දීමට තහවුරු කළ ප්‍රතිලාභී නාම ලේඛනයක් ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති අතර, එය ලද පසු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අදාළ අනුමැතිය ලද වහාම ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු කළ හැකිය.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)

(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இந்த வீட்டுத்திட்டம் 2011ஆம் ஆண்டு பிரதேச செயலாளரால் அரச உத்தியோகத்தர்களுக்கு வழங்கப்பட்டது. அந்தக் காணிகள் 2019ஆம் ஆண்டு வீடமைப்பு அதிகாரசபைக்கு பிரதேச செயலாளரால் கையளிக்கப்பட்டு இருக்கின்றது. அங்கு ஏற்கனவே குடியேறியவர்களுக்குரிய அளிப்புப் பத்திரத்தை வழங்க வேண்டிய பொறுப்பு உங்களுடைய அமைச்சுக்கு இருக்கிறது. அந்தக் காணிக்கான மதிப்பீடு 2012ஆம் ஆண்டின் பெறுமதியின்படி மேற்கொள்ளப்பட்டுள்ளதாக நீங்கள் சொன்னீர்கள். எனினும், அந்தப் பத்திரங்களை வழங்கு வதற்கான நடவடிக்கை எடுக்கும்போது, அந்தக் காணிக்குரிய மதிப்பீடு 2022ஆம் ஆண்டின் பெறுமதியின்படி மேற் கொள்ளப்படும் என்று குறித்த காணி உரிமையாளர்களுக்குச் சொல்லப்பட்டு இருக்கிறது. அந்தக் காணி கொடுக்கப்பட்டது 2011ஆம் ஆண்டு. 2022ஆம் ஆண்டின் பெறுமதியின்படி மதிப்பீடு மேற்கொள்ளும்போது, அந்தக் காணியின் பெறுமதியில் பாரிய வித்தியாசம் ஏற்படும். 2011ஆம் ஆண்டு காணி வழங்கப்பட்டபோது இருந்த பெறுமதியைச் செலுத்துவதற்கு அவர்கள் தயாராக இருக்கிறார்கள். நீங்கள் சொல்லியிருந்தீர்கள், 2012ஆம் ஆண்டின் பெறுமதியின்படி மதிப்பீடு செய்யப்பட்டுள்ளதாக. அப்படிச் செய்தால் நல்லது. அதனை அவர்கள் ஏற்றுக் கொள்வார்கள். எனினும், 2022ஆம் ஆண்டின் பெறுமதியின் அடிப்படையில் அந்தக் காணிக்குரிய தொகையைச் செலுத்த வேண்டுமென்று அவர்களுக்கு அறிவிக்கப்பட்டு இருக்கிறது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் சொல்வது சரியாக இருக்குமென நான் நினைக்கின்றேன்.

கிட்டத்தட்ட 700 காணித் துண்டுகள் அடையாளப் படுத்தப்பட்டு வழங்கப்பட்டபொழுது, மிகுதிக் காணித் துண்டுகளை வழங்குவதற்குப் பிரதேச செயலாளரால் இன்னும் 325 அரச ஊழியர்கள் - அதில் பெரும்பாலானவர்கள் சிற்றூழியர்கள் - தெரிவுசெய்யப்பட்டு, பட்டியலொன்று தயாரிக்கப்பட்டு இருக்கிறது. அந்தக் காணித் துண்டுகள் உங்களுடைய அமைச்சின்கீழ் வந்த பிற்பாடு, வவுனியாவில் இருக்கின்ற வீடமைப்பு அதிகாரசபையின் Manager பிரதேச செயலாளருக்குக் கடிதமொன்றை அனுப்பியிருக்கிறார், தாங்கள் புதிதாக இதற்கான பயனாளிகளைத் தெரிவு செய்வதாக. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் சொன்னதுபோல வீடமைப்பு அதிகாரசபையும் வவுனியா நகர பிரதேச செயலாளரும் சேர்ந்து ஏற்கனவே interview பண்ணி தெரிவுசெய்துள்ள பயனாளிகள் தொடர்பில் மீண்டும் ஒருமுறை சரி, பிழை பார்த்து, அந்தக் காணித் துண்டுகளை அவர்களுக்கு வழங்குவதற்கு நடவடிக்கையெடுக்க முடியுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

දැනට පදිංචි 125දෙනා සඳහා අවශ්‍ය ලිපි ලේඛන සකස් කරමින් ඉන්නවා, ඔප්පු ලබා දීම සඳහා. 169ක් පිළිබඳව අනන්‍යතාව තහවුරු වෙන්නේ නැහැ. ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වමින් ඉන්නවා. ඒගොල්ලන් පදිංචි වෙලා නැත්නම් ඒගොල්ලන්ගේ ඔප්පු අවලංගු කරන්න තමයි අධිකාරිය සූදානම් කර තිබෙන්නේ. නමුත්, ගම් තිබුණාට තවමත් අපට වාර්තා වෙලා නැහැ, ඒ අය ගැන. ඔවුන් ඉදිරිපත් වෙලා නැහැ. ඉදිරිපත් වෙච්ච හැමෝටම අවශ්‍ය කරන නීතිමය කටයුතු කරලා තිබෙන්නේ, ඉඩම් ලබා දීම සඳහා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඒක නොවෙයි ඇහුවේ. දැන් ඉන්න 125දෙනාට දුන්නා නේ. ඒගොල්ලන් එතැන ජීවත් වෙනවා. හැබැයි, ඒගොල්ලන්ට ඔප්පු දෙන වෙලාවේ තව government servantsලාටත් interviews තිබුණා. දැන් ඒගොල්ලනුත් list එකේ ඉන්නවා. ඒ list එකේ අයට තවම ඔප්පු දීලා නැහැ. එහෙම තුන්සිය ගාණක් ඉන්නවා. ඒ තුන්සිය ගාණට තවම ඔප්පු දීලා නැහැ. හේතුව, DS මේ lands NHDA එකට hand over කරලා අවසන් වීම. ඒ නිසා දැන් ඒගොල්ලන් අහන්නේ මේ waiting list එකේ ඉන්න අයට ඔබතුමාගේ අමාත්‍යාංශයයි, වවුනියාවේ DSයි එකතු වෙලා - මොකද, list එකේ 300 odd ඉන්නවා නේ - ඒගොල්ලන්ට නැවත කථා කරලා, හරි වැරදි බලලා මේ ඉතුරු lands දෙන්න පුළුවන්ද කියලායි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව පරීක්ෂණයක් කරලා අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මම ජූනි 15වන දා වවුනියාවට යනවා. ඒ වෙලාවේදී අපි ඔය පිළිබඳව සාකච්ඡා කරමු, ප්‍රාදේශීය ලේකම්තුමා, නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ දිස්ත්‍රික් ලේකම් එක්ක. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Sir, could I ask my second Supplementary Question?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

You raised the second Supplementary Question.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

No, I did not. Give me just a minute, please.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எங்களுடைய ஏனைய பாராளுமன்ற உறுப்பினர்களையும் தயவு செய்து அந்தக் கூட்டத்துக்குக் கூப்பிடுங்கள்!

என்னுடைய இரண்டாவது மேலதிக வினா என்ன வென்றால், இப்போது உங்களுடைய அமைச்சின் கட்டுப் பாட்டின்கீழ் இந்தப் பிரதேசம் இருக்கின்றது. அங்கு உட்கட்டமைப்பு வசதிகள் மிகவும் மோசமாக இருக்கின்றன. நீங்கள் அதனைப் பார்த்திருப்பீர்கள் அல்லது யூன் 15ஆம் திகதி நாங்கள் போய்ப் பார்க்கலாம்! அங்குள்ள உள்வீதிகள் மிக மோசமாக இருக்கின்றன. உங்களுக்குத் தெரியும், அங்கு பெரிய ground ஒன்றும் இருக்கிறது. அங்கே உள்ளக, வெளியக விளையாட்டுகள் நடைபெறுகின்றன. நிறையப் பாடசாலை மாணவர்கள் அந்தக் groundக்கு வந்து போகிறார்கள். ஆகவே, குறைந்தது 2027ஆம் ஆண்டிலாவது அந்தப் பிரதேசத் தினுடைய உள்வீதிகள், ஏனைய கட்டமைப்புகளை உங்களுடைய அமைச்சினால் செய்துகொடுக்க முடியுமா என்று கேட்கின்றேன்.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන සාකච්ඡා කරලා, ඒ අවශ්‍ය යටිතල පහසුකම් සකස් කර දෙන්න අපේ අමාත්‍යාංශයත් මැදිහත් වෙන්නම්, ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශත් ඒ සඳහා මැදිහත් කරවන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1514/2025- (1), ගරු රොෂාන් අක්මීමන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අඩු ධාරිතාවකින් යුතු විදුලි රැහැන් පද්ධති: පුළුල් කිරීම

குறைந்த இயலளவுகொண்ட மின் கம்பிக் கட்டமைப்புகள்: விரிவுபடுத்தல்

LOW-CAPACITY ELECTRICITY CABLE SYSTEMS: EXPANSION

1547/2025

**5. ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල අනාරක්ෂිත ලෙස විදුලි කණු සහ විදුලි රැහැන් සවිකර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදුකර තිබේද;

(iii) අඩු ධාරිතාවකින් යුතු විදුලි රැහැන් පද්ධති පුළුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் கிராமியப் பிரதேசங்களில் பாது காப்பற்ற வகையில் மின் கம்பங்கள் மற்றும் மின் கம்பிகள் பொருத்தப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பில் முறையான விசாரணை மேற்கொள்ளப்பட்டுள்ளதா என்ப தையும்;

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

(iii) குறைந்த இயலளவுகொண்ட மின் கம்பிக் கட்டமைப்புகளை விரிவுபடுத்துவதற்கு மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that electrical poles and electrical cables are installed unsafely in rural areas of Sri Lanka;

(ii) if so, whether a proper investigation has been conducted in this regard; and

(iii) the measures that are taken to expand low-capacity cable systems?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) අමාත්‍යාංශය හැටියට ඇත්තටම අපට කියන්න පුළුවන්කම තිබෙන්නේ, කිසිම අවස්ථාවක විදුලිබල මණ්ඩලයේ හෝ අනුප්‍රාප්තික සමාගම් හැටියට අනාරක්ෂිත විදුලි රැහැන්, විදුලි කණු සවි කරන්නේ නැති බවයි.

නමුත්, පසු කාලීනව සමහර වෙලාවට ස්වාභාවික හේතූන්, එහෙම නැත්නම් මිනිස් ක්‍රියාකාරකම් වැනි විවිධ හේතූන් නිසා ඒවායේ අනාරක්ෂිත තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අමාත්‍යාංශය හැටියට, විදුලිබල මණ්ඩලය හැටියට සහ එහි අනුප්‍රාප්තික සමාගම් හැටියට අපි කිසිම ලෙසකින් අනාරක්ෂිත විදුලි කණු හෝ විදුලි රැහැන් සවි කිරීමට කටයුතු කරන්නේ නැහැ.

(ii) අපි සාමාන්‍යයෙන් විදුලි කණු සහ රැහැන් ස්ථාපනය කරන්නේ සම්මත ක්‍රමවේදයන්ට අනුව නිසි අධීක්ෂණය යටතේයි. මම කලින් සඳහන් කළා වාගේ, පසු කාලීනව බාහිර හේතූන් නිසා එහෙම අනාරක්ෂිත තත්ත්වයකට පත් වීමට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේ අවස්ථාවක දෝෂ පරීක්ෂා කිරීමට සහ ඒ සම්බන්ධයෙන් වන මහජන පැමිණිලි හඳුනා ගෙන ඒවාට ප්‍රමුඛතාව ලබා දීලා කටයුතු කරන්න විදුලිබල මණ්ඩලය හැටියට සහ අනුප්‍රාප්තික සමාගම හැටියට කටයුතු කරමින් ඉන්නවා.

(iii) විදුලි බලය බෙදා හැරීමේ, විදුලි රැහැන් පද්ධති දියුණු කිරීමේ කටයුතු සාමාන්‍යයෙන් නිරන්තරයෙන්ම සිදු කෙරෙනවා. ඒක ක්‍රම දෙකකට තමයි කරන්නේ.

විදුලි රැහැන් වැඩිදියුණු කිරීම සඳහා වාර්ෂිකව වෙන් කරන "පද්ධති දියුණු කිරීමේ" ප්‍රතිපාදන මඟින් දෛනිකව හඳුනා ගන්නා පද්ධති දියුණු කිරීමත්, විදුලි රැහැන් පද්ධති පුළුල් කිරීම හා පද්ධති සංවර්ධනය කිරීම සඳහාත් ද්වි වාර්ෂිකව සකසනු ලබන වැඩ පිළිවෙළක් තිබෙනවා, "මධ්‍යම වෝල්ටීයතා පද්ධති සංවර්ධන සැලැස්ම" නමින්. මෙන්න මේ ක්‍රම දෙක මඟින් තමයි ඒ අදාළ විදුලි රැහැන් වැඩිදියුණු කිරීමේ කටයුතු කරන්නේ. 2026 වර්ෂයේ අය වැය ප්‍රතිපාදනවලට යටත්ව රුපියල් මිලියන 17,835ක් මේ සඳහා වෙන් කරලා තිබෙනවා. Breakdown එක හැටියට කිව්වොත්, පද්ධති දියුණු කිරීමේ ප්‍රතිපාදන සඳහා රුපියල් මිලියන 9,744ක් සහ මධ්‍යම වෝල්ටීයතා පද්ධති සංවර්ධන සැලැස්ම යටතේ රුපියල් මිලියන 8,091ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ ව්‍යාපෘති දෙක යටතේ අවශ්‍ය වන වැඩිදියුණු කිරීම් කෙරෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවලට සහ කඳුකර ප්‍රදේශවලට විදුලි බලය සම්පාදනය කිරීමේදී ඔබතුමා මුලින් සඳහන් කළ විධියට අඩු ප්‍රමිතියකින් යුක්තව අනාරක්ෂිත ලෙස විදුලි රැහැන් ඇදීම කියන එක සිදු නොවුණත්, දැවමය කණු යොදාගෙන විදුලි රැහැන් ඇදීම කලක් තිබුණා වාගේම එය දැනටමත් ක්‍රියාත්මක වනවා. ආපදා තත්ත්වයකදී එක රැහැනක් උඩට ගහක් කඩා වැටුණාට පසුව කණු හත අටක් කැඩී යනවා. "දිට්වා" ආපදාව වෙලාවේදී වුණත් එලෙස සිදු වුණා. ඒවායේ ප්‍රමිතිය පිළිබඳව ගැටලු තිබෙනවා කියන එක ඉතා පැහැදිලිව අපට පෙනෙනවා. ඒ නිසා එක පැත්තකින් රැහැන්වලට හානි වනවා, ට්‍රාන්ස්ෆෝමර්වලට හානි වනවා විතරක් නොවෙයි, මිනිස් ජීවිතවලටත් හානි වනවා. මේ තත්ත්වය නිසා ඉදිරි සංවර්ධන කටයුතුවලදී විදුලි රැහැන් අදිනකොට සහ විදුලිබල සම්පාදන ක්‍රියාවලින් සිදු කරනකොට වඩාත් ආරක්ෂිතව සහ ප්‍රමිතියකින් යුක්තව විදුලි බලය සම්පාදන ක්‍රම සිදු කරන්න රජයේ සැලසුම් මොනවාද කියන එක මම දැනගන්න කැමැතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඔබතුමා පෙන්වා දෙන කාරණය සම්බන්ධයෙන් මම එකඟ වනවා. මම කලිනුත් සඳහන් කළා වාගේ, පසුකාලීනව විවිධ හේතු නිසා විදුලි රැහැන් සහ කණු පද්ධති අනාරක්ෂිත තත්ත්වයට පත් වෙන්න පුළුවන්. නමුත්, මම කලිනුත් සඳහන් කළා වාගේ මේවා පළමු වරට ස්ථාපනය කිරීමේදී අනිවාර්යයෙන්ම නිසි ප්‍රමිතියට අනුකූලව, ඒ වාගේම නිසි අධීක්ෂණය යටතේ තමයි සිදු කරන්නේ. විශේෂයෙන් නිසි ක්‍රමවේදය සහ නිසි අධීක්ෂණය යටතේ, තවදුරටත් ඔබතුමා සඳහන් කළ කරුණු පිළිබඳ සැලකිල්ලට ගනිමින් අපට ඉදිරියේදී කටයුතු කරන්න පුළුවන්.

## පානීය ජලය සැපයීම: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

குடிநீர் வழங்கல்: திருகோணமலை மாவட்டம்
PROVISION OF DRINKING WATER: TRINCOMALEE DISTRICT

1643/2025

**6. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජලය සපයා ඇති ප්‍රදේශ කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ මේ දක්වා පානීය ජලය ලබාදී නොමැති ප්‍රදේශ කවරේද;

(iii) කුච්චවේලි, පුඩවයික්කට්ටු, තිරියාය සහ සලප්පේයාරු ප්‍රදේශවලට පානීය ජලය සපයා නොමැති බැවින්, එම ප්‍රදේශවල ජීවත් වන පවුල් 4,000ක් පානීය ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවලට මුහුණදී ඇති බව දන්නේද;

(iv) එම ප්‍රදේශවලට කඩිනමින් පානීය ජලය සැපයීම සඳහා සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையால் குடிநீர் வழங்கப்பட்டுள்ள பிரதேசங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி மாவட்டத்தில் இன்றுவரை குடிநீர் வழங்கப்படாத பிரதேசங்கள் யாவை என்பதையும்;

(iii) குச்சவெளி, புடவைக்கட்டு, திரியாய் மற்றும் சலப்பையாறு ஆகிய பிரதேசங்களுக்கு குடிநீர் வழங்கப்படாமையால், அங்கு வசிக்கும் 4,000 குடும்பங்கள் குடிநீரைப் பெறுவதில் சிரமங்களுக்கு முகம்கொடுத்துள்ளார்கள் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iv) அப்பிரதேசங்களுக்கு உடனடியாக குடிநீர் வழங்கு\வதற்கான ஏதேனும் திட்டம் நடைமுறைப்படுத்தப்படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) the areas in the Trincomalee District which have been provided with drinking water by the National Water Supply and Drainage Board;

(ii) the areas in the said district which have not yet been provided with drinking water;

(iii) whether he is aware that 4,000 families living in the areas of Kuchchaveli, Pudawaikkattu, Thiriyaya and Salappeyaru are facing difficulties in obtaining drinking water as drinking water has not been provided to the said areas; and

(iv) whether a plan will be implemented forthwith to provide drinking water to the said areas?

(b) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක් සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස 230ක් පවතී. එකී සම්පූර්ණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්ගෙන් කොට්ඨාස 185ක් සඳහා මේ වන විට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් නල ජල පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.

පහත ඇමුණුමෙහි සඳහන් පරිදි දැනට එම ප්‍රදේශ වෙත ජලය බෙදා හරිනු ලබයි.

| අ.අ | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ජලසම්පාදන ක්‍රමය | ග්‍රාම නිළධාරි කොට්ඨාශ ගණන | ආවරණය වනු ලබන ග්‍රාම නිළධාරි කොට්ඨාශ ගණන | ජලසම්බන්ධන ගණන | ජල පවිත්‍රා ගාරය හා ධාරිතාවය (දිනකට) | සැපයුම් වාරය |
|---|---|---|---|---|---|---|---|
| 01 | නගර හා කඩවත් | නගර ජලසම්පාදන ක්‍රමය | 42 | 41 | 11,861 | කන්තලේ (54,000 $m^3$ ) | දින දෙකකට වරක් පැය 04 ක් |
| | | පාලයුත්තු ජලසම්පාදන ක්‍රමය | | | 9,778 | | |
| | | ආන්දම්කුලම ජලසම්පාදන ක්‍රමය | | | 8,318 | | |
| 02 | කන්තලේ | වාන්ඇල ජලසම්පාදන ක්‍රමය | 23 | 23 | 2,904 | | දිනකට පැය 18 ක් |
| | | කන්තලේ ජලසම්පාදන ක්‍රමය | | | 13,283 | | |
| 03 | කින්නියා | කින්නියා ජලසම්පාදන ක්‍රමය | 31 | 30 | 20,297 | | දිනකට පැය 18 ක් |
| 04 | තඹලගමුව | තඹලගමුව ජලසම්පාදන ක්‍රමය | 12 | 12 | 10,800 | | දිනකටපැය 18 ක් |
| 05 | කුච්චවේලි | නිලාවේලි ජලසම්පාදන ක්‍රමය | 24 | 11 | 6,365 | | දින දෙකකට වරක් පැය 04 ක් |
| | | පුල්මුඩේ ජලසම්පාදන ක්‍රමය | | | 1,919 | පුල්මුඩේ (750 $m^3$) | |
| 06 | මූතූර් | සාම්පූර් ජලසම්පාදන ක්‍රමය | 42 | 42 | 7,995 | මූතූර් (8,500 $m^3$) | පැය 24 ක ජල සැපයුමක් |
| | | මූතූර් ජලසම්පාදන ක්‍රමය | | | 10,111 | | දින දෙකකට වරක් පැය 04 ක් |
| 07 | වෙරුගල් | ඊච්චලම්පත්තු ජලසම්පාදන ක්‍රමය | 10 | 10 | 3,416 | ඊච්චලම්පත්තු (6000 $m^3$) / මූතූර් | පැය 24 ක ජල සැපයුමක් |
| 08 | සේරුවිල | සේරුවිල ජලසම්පාදන ක්‍රමය | 16 | 16 | 4,218 | | පැය 24 ක ජල සැපයුමක් |
| 09 | මොරවැව | - | 10 | - | - | - | ජල පහසුකම් ලබා දී නොමැත |
| 10 | ගෝමරන්කඩවල | - | 10 | - | - | - | ජල පහසුකම් ලබා දී නොමැත |
| 11 | පදවි ශ්‍රී පුර | - | 10 | - | - | - | ජල පහසුකම් ලබා දී නොමැත |
| | | **මුළු ගණන** | **230** | **185** | **111,265** | | |

[ගරු ටී.බී. සරත් මහතා]

(ii) ඉහත ඇමුණුමෙහි සඳහන් කර ඇති පරිදි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මොරවැව, ගෝමරන්කඩවල හා පදවි ශ්‍රී පුර යන ප්‍රදේශ සඳහා ද, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා ද, කින්නියා එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් සඳහා ද, කුච්චවේලි ග්‍රාම නිලධාරි කොට්ඨාස 13ක් සඳහා ද දැනට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් නල ජල පහසුකම් ලබා දී නොමැත.

(iii) මේ වන විට අපගේ ජල සැපයුම් ලබා දී ඇත්තේ එරක්කන්ඩි පාලම තෙක් පමණි. එතැන් සිට ජල නල දීර්ඝ කිරීමකින් ජලය ලබා දීමද මේ වන විට ප්‍රායෝගික නොවේ. ඒ මන්ද යත්, මේ වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ කාර්මික අවශ්‍යතාවන් සඳහා ජල ඉල්ලුම ඉතා අධිකව පවතින බැවින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙත ජලය ලබා දීම සඳහා කන්තලේ ජල පවිත්‍රාගාරය උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ තත්ත්වය යටතේ වුවද ලබාදෙන ජල සැපයුම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාරිභෝගිකයන් සඳහාද ප්‍රමාණවත් නොවේ. ඒ හේතුවෙන් කුච්චවේලි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 13ක්ද, පුඩවයික්කට්ටු, තිරියාය සහ සලෙප්පේයාරු යන ප්‍රදේශ සඳහා පානීය ජල පහසුකම් ලබා දීමට නොහැකි වී ඇත.

(iv) දැනට ජල සැපයුම ලබා දී නොමැති ප්‍රදේශ සඳහා (ඉහත ප්‍රශ්න අංක iii හි සඳහන් ප්‍රදේශද ඇතුළුව) මොරවැව, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, කුච්චවේලි ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම ලබා දීමට කටයුතු සූදානම් කර ඇති අතර මේ වන විට එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ව්‍යාපෘති ඇගයීම සිදු කර ඉඩම් හඳුනාගෙන ඇත. නමුත්, 2021 වර්ෂයේ රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් එම ව්‍යාපෘතියේ කටයුතු මේ වන විට නතර වී ඇත.

තවද Improvement of the Greater Trincomalee Integrated Water Supply Scheme මඟින් කින්නියා නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ඉතිරි ග්‍රාම නිලධාරි කොට්ඨාසයන් සඳහා අවශ්‍ය පානීය ජල අවශ්‍යතාව සපුරාලීමටත් දැනට පවතින ජල සැපයුම වැඩි දියුණු කර අඛණ්ඩ ජල සැපයුමක් ලබා දීමට සැලසුම් සකස් කර ඇත. දැනට මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ඇගයීම් කමිටුවේ අනුමැතිය සහ ජලසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන මේ වන විට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கிறேன்.

என்னால் கேட்கப்பட்ட கேள்வியின் பிரதான நோக்கம் என்னவென்றால், அங்குள்ள எல்லாப் பகுதிகளுக்கும் குழாய் நீர் வழங்கப்பட வேண்டும் என்பதுதான். எங்களுடைய குச்சவெளி பிரதேச செயலகப் பிரிவில் இறக்கண்டி வரை குழாய் நீர் வழங்கப்பட்டுள்ளது. அதேபோல, மறுபுறம் புல்மோட்டை வரையிலான குழாய் நீர் இணைப்பும் வழங்கப் பட்டுள்ளது. ஆனால், இவற்றுக்கிடையில் காணப்படுகின்ற கும்புறுபிட்டி, சலப்பையாறு, குச்சவெளி, புடவைக்கட்டு, கள்ளம்பத்தை, திரியாய் மற்றும் கல்லறாவ போன்ற கிராமங்களுக்குக் குழாய் நீர் வழங்கப்படவில்லை. இதனால் 10,000இற்கும் மேற்பட்ட குடும்பங்கள் பாதிப்பை எதிர்நோக்குகின்றன. அவர்கள் இன்னும் கிணற்று நீரை அருந்த வேண்டிய நிலையே காணப்படுகின்றது.

கௌரவ அமைச்சர் அவர்கள் சொன்னது போன்று பதவிசிறிபுர, கோமரங்கடவல, மொரவெவ போன்ற பிரதேசங் களிலுள்ள மக்கள் சிறுநீர் சம்பந்தப்பட்ட பிரச்சினைகளை - kidney failure - எதிர்நோக்குகின்றார்கள். கௌரவ அமைச்சர் அவர்கள் சிறப்பானதொரு பதிலைச் சொல்லியிருந்தார். இருந்தாலும், அவ்வாறான வேலைத்திட்டங்கள் இந்த அரசாங்கத்தால் முன்னெடுக்கப்பட இருக்கின்றனவா? அவை எப்பொழுது ஆரம்பிக்கப்படப் போகின்றன? ஆரம்பிக்கப்பட்டு எவ்வளவு காலத்துக்குள் முடிவடையும்? என்ற விடயத்தை இந்தச் சபையில் சற்றுத் தெளிவுபடுத்த வேண்டும். சென்ற காலங்களிலும் இவ்வாறான பிரச்சினைகள் குறித்து என்னால் கேள்வி கேட்கப்பட்டது. இருந்தாலும், எங்களால் சரியான இலக்கை அடைய முடியவில்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have to wind up now.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
Okay, Sir.

நான் நினைக்கின்றேன், சென்ற காலத்தில் 'கொவிட்' பிரச்சினை மற்றும் பொருளாதார நெருக்கடி போன்ற காரணங்களால் அவற்றை முன்னெடுக்க முடியவில்லை என்று. ஆகையால், இந்த வேலைத்திட்டம் எப்போது ஆரம்பிக் கப்பட்டு, எப்போது முடிவடையும் என்பதை இந்த இடத்தில் தெளிவுபடுத்த முடியுமா?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු කථානායකතුමනි, අපි රට පුරා මෙවැනි ව්‍යාපෘති පිළිබඳව මේ මොහොතේ සොයා බලමින් ඉන්නවා. අපි ඒ සඳහා ඉදිරි අය වැය ලේඛනයට රුපියල් බිලියන 120ක විතර යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනා අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ජලය ලබා දීම සම්බන්ධයෙනුත් කටයුතු කරන්න අපි යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. බොහෝ විට අපිට ලබන අවුරුද්දේ මෙම ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කරලා වැඩ ආරම්භ කරන්න පුළුවන් වෙයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி! கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் குறிப்பாக கிண்ணியா, மூதூர், தோப்பூர், தம்பலகாமம் போன்ற பிரதேசங்களில் குறைந்த அழுத்தத்தில் நீர் விநியோகம் செய்யப்படுவதால் பல

பிரச்சினைகள் காணப்படுகின்றன. அதுமாத்திரமன்றி, இந்தப் பிரதேசங்களுக்கு ஒருநாள் விட்டு ஒருநாள்தான் உங்களுடைய அமைச்சின்மூலம் நீர் வழங்கப்படுகின்றது. இதனால் இந்தப் பிரதேசங்களிலுள்ள மக்கள் பல பிரச்சினைகளை எதிர்நோக்கிக்கொண்டு இருக்கின்றார்கள். நீங்கள் உங்களுடைய பதிலில் சொன்னதுபோன்று, மக்கள் தொகை அதிகரிப்பு, பாவனையாளர்களின் எண்ணிக்கை அதிகரிப்பு என்பன காரணமாகவே இந்தப் பிரச்சினை ஏற்படுகின்றது. இதற்குத் தீர்வொன்றை வழங்கும் வகையில், ஏதாவதொரு வேலைத்திட்டத்தை மிக விரைவில் ஆரம்பிப்பதற்கான ஏற்பாடு ஏதும் இருக்கின்றதா? எனக் கேட்கின்றேன்.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, කන්තලේ ජල පවිත්‍රාගාරය තමයි අපි මේ සඳහා භාවිත කරන්නේ. දිනකට ඝන මීටර් 54,000ක් තමයි කන්තලේ ජල පවිත්‍රාගාරයෙන් අපිට පිරිපහදු කරන්න පුළුවන් වන්නේ. ඝන මීටර් 54,000කට වඩා ජල පරිභෝජනයක් මේ මොහොත වනකොටත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිද්ධ වෙනවා. ඒ නිසා තමයි මේ අර්බුදයට මුහුණ දී තිබෙන්නේ. ඉදිරියේදී ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය යෝජනා සකස් කරලා ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් කර ගැනීමට පුළුවන්, පළමු මොහොතේම. මේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න වර්තමාන ආණ්ඩුව සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1716/2005- (3), ගරු ආර්.ජී. විජේරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -1757/2025- (1), ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -1908/2026- (1), ගරු බී. ආරියවංශ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1990/2026- (1), ගරු තිළිණ සමරකෝන් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## කිලි/කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය: කාර්ය මණ්ඩල සහ සම්පත් හිඟය

### கிளி/கிளிநொச்சி மத்திய மகா வித்தியாலயம்: ஊழியர்கள் மற்றும் வளப் பற்றாக்குறை

KILI/ KILINOCHCHI CENTRAL COLLEGE: SHORTAGE OF STAFF AND RESOURCES

1186/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිලි/කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය යනුවෙන් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් දෙකෙන් එකක් වන ඉහත පාසලේ අධ්‍යාපන මට්ටම මේ වනවිට පසුබෑමට ලක්වී ඇති බවත්;

(iii) පාසලේ අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහ ගෘහ භාණ්ඩ ඇතුළු සම්පත් හිඟයක් පවතින බවත්;

(iv) එම පුරප්පාඩු නොපුරවා සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවිය නොහැකි බවත්;

එතුමිය පිළිගන්නේද?

(ආ) (i) ඉහත පාසලේ මේ වනවිට සේවය කරනු ලබන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු මේ දක්වා නොපිරවීමට හේතු කවරේද;

(iii) ඉහත පාසලේ පවතින සියලු පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පුරවනු ලබන දිනය කවරේද;

(iv) ඉහත පාසලේ ගොඩනැගිලි සහ ගෘහ භාණ්ඩ අවශ්‍යතාව සම්පූර්ණ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தில் கரைச்சி பிரதேச செயலாளர் பிரிவில் கிளி/கிளிநொச்சி மத்திய மகா வித்தியாலயம் என்றதொரு தேசிய பாடசாலை உள்ளது என்பதையும்;

(ii) கிளிநொச்சி மாவட்டத்திலுள்ள இரண்டு தேசியப் பாடசாலைகளுள் ஒன்றான மேற்படி பாடசாலையின் கல்வி நிலை தற்போது பின்னடைந்துள்ளது என்பதையும்;

(iii) மேற்படி பாடசாலையில் கல்விசார், கல்விசாரா ஊழியர்களின் வெற்றிடங்கள் மற்றும் தளபாடங்கள் உள்ளிட்ட வளங்களின் பற்றாக் குறை நிலவுகின்றது என்பதையும்;

(iv) அவ்வெற்றிடங்களை நிரப்பாமல் மாணவர் களின் கல்வி நிலையை மேம்படுத்த முடியாது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா;

(ஆ) (i) மேற்படி பாடசாலையில் தற்போது பணி யாற்றும் அதிபர், பிரதி அதிபர்கள், ஆசிரியர்கள் மற்றும் கல்விசாரா ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அப்பாடசாலையின் கல்விசாரா ஊழியர்களின் ஆளணியில் நிலவும் வெற்றிடங்கள் இதுவரை நிரப்பப்படாமல் இருப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி பாடசாலையில் நிலவும் அனைத்து வெற்றிடங்களும் முழுமையாக நிரப்பப்படும் திகதி யாது என்பதையும்;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iv) மேற்படி பாடசாலையின் கட்டிடங்கள் மற்றும் தளபாடங்களின் தேவைகள் பூர்த்திசெய்யப்படும் காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she admit that -

(i) there is a National School known as Kili/ Kilinochchi Central College in the Karachchi Divisional Secretary's Division of the Kilinochchi District;

(ii) the standard of education in the above school, which is one of the two National Schools in the Kilinochchi District, has now declined;

(iii) there exist vacancies for both academic and non-academic staff and a shortage of resources, including furniture, at the school; and

(iv) the standard of education for the students cannot be improved without filling the vacancies referred to above?

(b) Will she inform this House -

(i) separately, the number of the principal, deputy principals, teachers and non-academic staff serving at present in the above school;

(ii) the reasons for not filling the vacancies in the non-academic staff of the above school to date;

(iii) the date on which all the vacancies in the said school will be completely filled; and

(iv) the dates on which the needs related to the buildings and furniture of the above school will be fulfilled?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිලි/කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය යනුවෙන් ජාතික පාසලක් තිබේ.

(ii) ඉහත පාසලේ අ.පො.ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල විශ්ලේෂණ සැලකීමේදී පසුගිය වසර 4 තුළ සමත් ප්‍රතිශත සහ කලාපය තුළ පාසල ලබා ගත් ස්ථානය පහත පරිදි වේ.

| වර්ෂය | පාසලෙහි සමත් % | කලාපයෙහි සමත් % | දිස්ත්‍රික්කයෙහි සමත් % | දිවයිනේ සමත් % | කලාපය තුළ පාසල ලබා ගෙන ඇති ස්ථානය |
|---|---|---|---|---|---|
| 2021 | 71.43 | 74.30 | 74.62 | 74.52 | 27 |
| 2022 | 81.70 | 72.60 | 72.92 | 74.38 | 14 |
| 2023 | 83.59 | 70.41 | 70.75 | 75.72 | 07 |
| 2024 | 80.32 | 69.31 | 70.71 | 73.45 | 10 |

ඒ අනුව 2021ට සාපේක්ෂව 2024 වර්ෂය වනවිට අ.පො.ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල අනුව කලාපය තුළ පාසල ඉහළ ස්ථානයකට පැමිණ ඇත.

පසුගිය වසර 4 තුළ අ.පො.ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල විශ්ලේෂණය සහ කලාපය තුළ පාසල ලබා ගත් ස්ථානය පහත වගුව මඟින් දක්වා ඇත.

| වර්ෂය | පාසලෙහි විශ්වවිද්‍යාලය ට සුදුසුකම් ලත් % | කලාප මට්ටමේ විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලත් % | දිස්ත්‍රික් මට්ටමේ විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලත් % | දිවයිනේ විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලත් % | කලාපය තුළ පාසල ලබා ගෙන ඇති ස්ථානය |
|---|---|---|---|---|---|
| 2021 | 50.01 | 60.98 | 60.23 | 63.53 | 19 |
| 2022 | 50.00 | 63.68 | 63.18 | 64.21 | 21 |
| 2023 | 51.65 | 59.32 | 59.70 | 66.07 | 15 |
| 2024 | 53.62 | 60.57 | 59.88 | 67.32 | 17 |

ඒ අනුව 2021 සිට 2024 දක්වා අදාළ වර්ෂ හතර තුළ කලාප, දිස්ත්‍රික් හා දිවයිනේ සමත් ප්‍රතිශතවලට වඩා පාසලේ සමත් ප්‍රතිශතය අඩු මට්ටමක ඇති බව නිරීක්ෂණය වන නමුත් එම කාල පරාසය තුළ කලාප හා දිස්ත්‍රික් මට්ටම්වල සමත් ප්‍රතිඵල යම් පසුබෑමකට ලක් වුවද, පාසල විසින් තම ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට සමත්ව ඇත.

2023 සිට 2026 වර්ෂය දක්වා පාසලෙහි පාසල් ගුණාත්මක අධ්‍යාපනය පිළිබඳ තහවුරුව සඳහා බාහිර ඇගයීමේදී පාසලට හිමි වී ඇති පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක - SEQI - අගයන් පහත දැක්වේ.

| වර්ෂය | SEQI අගය (බාහිර ඇගයීම) |
|---|---|
| 2023 | 67 |
| 2024 | - |
| 2025 | - |
| 2026 | 67 |

ඒ අනුව SEQI අගය ලකුණු 60%-69% අතර පවත්වා ගනිමින් මෙම පාසල "හොඳයි" යන මට්ටමේ පවත්වා ගෙන ඇත.

ඒ අනුව සමස්තයක් ලෙස කිලි/කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය කලාපයේ අනෙකුත් පාසල්වලට සාපේක්ෂව අධ්‍යාපන තත්ත්වය හොඳ මට්ටමක පවත්වා ගෙන යන බව නිරීක්ෂණය වේ.

(iii) පාසලේ ගුරු පුරප්පාඩු, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහ ගෘහ භාණ්ඩ ඇතුළු සම්පත් හිඟයක් පවතී.

(iv) ඉදිරියේදී ඉහත පුරප්පාඩු පිරවීම මඟින් මෙම පාසලේ අධ්‍යාපන තත්ත්වය තවදුරටත් ඉහළ නැංවීමට හැකියාවක් පවතී.

(ආ) (i) ඉහත පාසලේ මේ වනවිට සේවය කරනු ලබන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| විදුහල්පති තනතුර | - | 01 |
| නියෝජ්‍ය විදුහල්පති තනතුරු | - | 01 |
| ගුරුවරු | - | 101 |

<u>අනධ්‍යයන සේවකයින් සංඛ්‍යාව</u>

ඒකාබද්ධ සේවා නොවන

| තනතුර | දැනට සිටින අනධ්‍යයන සේවක සංඛ්‍යාව |
|---|---|
| ක්‍රීඩා පුහුණුකරු | 01 |
| කාර්ය සහායක | 02 |
| පාසල් ආරක්ෂක | 03 |
| සේවා සහායක (සනීපාරක්ෂක) | 02 |

ඒකාබද්ධ සේවා

| තනතුර | දැනට සිටින අනධ්‍යයන සේවක සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන නිලධාරි | 09 |
| කළමනාකරණ සේවා නිලධාරි | - |

(ii) <u>ඒකාබද්ධ සේවා නොවන/ඒකාබද්ධ සේවා</u>

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම විද්‍යාලය සඳහා ඒකාබද්ධ නොවන සේවයට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු මේ දක්වා අනුමත කර නොමැති අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් නිර්ණායක මත පදනම්ව කාර්ය මණ්ඩල අනුමත කර ගැනීම සඳහා මගේ අංක ED/18/17/67/05 හා 2025.11.02 දිනැති ලිපි මඟින් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් යොමු කර ඇත.

(iii) <u>විදුහල්පති පුරප්පාඩු</u>

ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නවක නිලධාරින් බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා ගැසට් නිවේදනයක් මඟින් අයදුම් පත් කැඳවීමෙන් අනතුරුව අදාළ ලිඛිත විභාගය 2026.06.07 වන දින පැවැත්වීමට නියමිතය. එමඟින්, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

<u>ගුරු පුරප්පාඩු</u>

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 6/2021ට අනුව කිලි/කිලිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලයට අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 90ක් වන අතර දැනට ගුරුවරුන් 96ක් සේවයේ නිරත වුවද ඇතැම් විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු පවතින බවත් ඇතැම් විෂයයන් සඳහා ගුරු අතිරික්තයක් පවතින බවත් නිරීක්ෂණය වේ.

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරින් හා අනෙකුත් උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලද අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් මේ වනවිට අයදුම් පත් කැඳවා ඇත. ඒ අනුව, එකී ගැසට් නිවේදනය ප්‍රකාරව ගුරු සේවයේ පුරප්පාඩු සඳහා මෙම වර්ෂය තුළ උපාධිධාරින් ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇත.

එමෙන්ම, 2022-2024 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් එම ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම මත ජාතික හා පළාත් පාසල්හි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියේ පවතින ගුරු පුරප්පාඩු සඳහා 2027 වර්ෂයේ මුල් කාර්තුව තුළ ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇත.

ඒ අනුව, උක්ත බඳවා ගැනීම් මඟින් හා ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත ගුරු තුලනය මඟින් මෙම පාසලේ ගුරු සේවයේ පවතින පුරප්පාඩු 2027 වර්ෂයේ මුල් කාර්තුව වන විට සම්පූර්ණ කිරීමට හැකි බව වාර්තා කරමි.

<u>අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>

- <u>ඒකාබද්ධ සේවා නොවන</u>

  කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මගේ අංක ED/12/01/14 හා 2024.08.12, ED/05/67/17/18 හා 2025.01.02, ED/12/01/14 හා 2025.03.06 සහ ED/05/67/17/18 හා 2025.08.27 යන ලිපි මේ වනවිටත් යොමු කර ඇති අතර ඒ සඳහා පිළිතුරු ලැබුණු පසු අනධ්‍යයන සේවක පුරප්පාඩු සම්පූර් කිරීමට පියවර ගත හැක.

- <u>ඒකාබද්ධ සේවා</u>

  මෙම පාසලේ මේ වනවිටත් අදාළ අනුමත කර ගැනීමට යෝජිත තනතුරු සංඛ්‍යාව ඉක්මවා සංවර්ධන නිලධාරි සංඛ්‍යාවක් සේවය කරනු ලබයි. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් තනතුරු අනුමැතිය ලැබීමෙන් පසු කාර්ය මණ්ඩලය තුලනය කිරීමට නියමිතය.

(iv)
- අර්ධ වශයෙන් ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ 2027 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අර ඒ සඳහා රු.මි. 60ක් වෙන් කිරීමට කටයුතු කරනු ඇත.
- ඉදිරියේදී මෙම පාසලට ඩෙස්ක් 250ක් හා පුටු 248ක ප්‍රමාණයක් ලබා දීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

## ත්‍රිකුණාමලය වරාය: 2010-2024 දක්වා මෙහෙයුම් ලාභය/අලාභය

## திருகோணமலை துறைமுகம்: 2010-2024 வரை தொழிற்பாட்டு இலாபம்/நட்டம்

TRINCOMALEE PORT: OPERATIONAL PROFIT/ LOSS FROM 2010-2024

1514/2025

**4. ගරු කංචන වැලිපිටිය මහතා (ගරු රොෂාන් අක්මීමන මහතා වෙනුවට)**

(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய - மாண்புமிகு ரொஷான் அக்மீமன சார்பாக)

(The Hon. Kanchana Welipitiya on behalf of the Hon. Roshan Akmeemana)

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 සිට 2024 දක්වා ත්‍රිකුණාමලය වරායේ මෙහෙයුම් ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ත්‍රිකුණාමලය වරායට අයිතිව තිබූ ජැටි හෝ පර්යන්ත බදු පදනම මත හෝ වෙනත් පදනමක් මත විවිධ පෞද්ගලික සමාගම් සඳහා ලබාදී තිබේද;

[ගරු කංචන විජේසේකර මහතා]

(iii) එසේ නම්, එම සමාගම් කවරේද;

(iv) ඉහත සමාගම් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හෝ වෙනත් ගෙවීම් නිසි පරිදි ගෙවා තිබේද;

(v) එසේ නම්, වර්ෂ 2005 සිට 2024 දක්වා එම ගෙවීම් සම්බන්ධ තොරතුරු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට ත්‍රිකුණාමලය වරාය සතුව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ රජයේ හිමිකාරිත්වයක් සහිත ජැටි හෝ පර්යන්ත තිබේද;

(ii) එසේ නම්, එම ජැටි හෝ පර්යන්ත කවරේද;

(iii) ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை திருகோணமலை துறைமுகத்தின் தொழிற்பாட்டு இலாபம்/நட்டம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) திருகோணமலை துறைமுகத்துக்குச் சொந்தமான இறங்குதுறைகள் அல்லது முனையங்கள் குத்தகை அடிப்படையில் அல்லது வேறு அடிப் படை\யில் பல்வேறு தனியார் கம்பனிகளுக்கு வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அந்தக் கம்பனிகள் யாவை என்பதையும்;

(iv) மேற்படி கம்பனிகளால் இலங்கை துறைமுக அதிகாரசபைக்குச் செலுத்த வேண்டிய வரி அல்லது வேறு கட்டணங்கள் முறையாகச் செலுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(v) ஆமெனில், 2005ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை அந்தக் கொடுப்பனவுகள் பற்றிய தகவல்கள் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் திருகோணமலை துறைமுகத்துக்குச் சொந்தமான முழுமையாக அல்லது பகுதியாக அரசாங்கத்துக்கு உரித்துடையதான இறங்கு துறைகள் அல்லது முனையங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய இறங்குதுறைகள் அல்லது முனையங்கள் யாவை என்பதையும்;

(iii) திருகோணமலை துறைமுகத்தை அபிவிருத்தி செய்வது தொடர்பில் உள்ள திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the operating profit/loss of the Trincomalee Port in each year, separately from 2010 to 2024;

(ii) whether the jetties or terminals owned by the Trincomalee Port have been given to various private companies on lease or on any other basis;

(iii) if so, the names of the companies referred to above;

(iv) whether the said companies have properly paid the taxes or other payments owed to the Sri Lanka Ports Authority; and

(v) if so, the details of the above payments from 2005 to 2024, separately for each year?

(b) Will he also inform this House -

(i) whether the Trincomalee Port currently has any jetties or terminals that are fully or partially owned by the Government;

(ii) if so, the said jetties or terminals; and

(iii) the plans available for the development of the Trincomalee Port?

(c) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පවතින වාර්තාවලට අනුව මෙහෙයුම් ලාභය/(පාඩුව) පහත දැක්වෙන ආකාරයට වාර්තා කරනු ලැබේ.

| වර්ෂය | රු. (මිලියන) |
|---|---|
| 2010 | (382.94) |
| 2011 | (532.28) |
| 2012 | (248.91) |
| 2013 | (242.26) |
| 2014 | (220.64) |
| 2015 | (229.07) |
| 2016 | 139.32 |
| 2017 | 317.46 |
| 2018 | 160.22 |
| 2019 | 278.37 |
| 2020 | 96.49 |
| 2021 | (111.91) |
| 2022 | 1,176.09 |
| 2023 | 479.32 |
| 2024 | 926.03 |

(ii) වරාය අධිකාරිය සතු ජැටි පෞද්ගලික සමාගම් වෙත බදු දී නොමැත.

නමුත් ඇතුළත වරාය පාර පිහිටි වරාය මෙහෙයුම් කටයුතු සඳහා යොදා නොගත් අත්හැර දමන ලද Vegetable Jetty

සංචාරක ආකර්ෂණය ලැබෙන පරිදි අලංකරණය කර සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා නැඟෙනහිර පළාත් සංචාරක කාර්යාංශය වෙත තාවකාලික පදනමක් මත කෙටි කාලීනව බදු දී ඇත.

(iii) පැන නොනඟී.

(iv) 2025 නොවැම්බර් මාසයේ සිට 2026 පෙබරවාරි මාසය දක්වා කාල සීමාව සඳහා වන මාසික බදු මුදල හැර, බදු කුලිය සහ බදු මුදල් මෙම ආයතනය විසින්ම ගෙවා ඇත.

(v) බදු ආදායම - 2024-2025

| වර්ෂය | බදු කුලිය | 2.50% ස.ආ.දා. බද්ද | 18% වැට්බදු | එකතුව |
|---|---|---|---|---|
| 2024 (සැප්.-දෙසැ.) | 400,000.00 | 10,256.40 | 73,846.12 | 484,102.52 |
| 2025 | 1,250,000.00 | 32,051.28 | 230,769.14 | 1,512,820.42 |

(ආ) (i) ඔව්.

(ii) අශ්රොෆ් ජැටිය, පරණ ජැටිය (කස්ටම් ජැටි) - භාවිතයේ නැත. වෙජිටබල් ජැටි (භාවිතයේ නැත), තෙල් ජැටිය, TTA ජැටිය, ලංකා පාලම (භාවිතයේ නැත), මඩකෝ ජැටිය, ටවුන් ජැටිය, මුතූර් ජැටිය (භාවිතයේ නැත)

(iii) ඇමුණුමෙහි** සඳහන් වේ.

(ඇ) පැන නොනඟී.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව: වැඩ තහනම් වූ නිලධාරි මහතා
## தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்: பணி இடைநிறுத்தப்பட்ட அலுவலர்
## DPARTMENT OF CENSUS AND STATISTICS: OFFICER INTERDICTED

1716/2025

**7. ගරු කංචන වැලිපිටිය මහතා (ගරු ආර්.ජී. විජේරත්න මහතා වෙනුවට)**

(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய - மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன சார்பாக)

(The Hon. Kanchana Welipitiya on behalf of the Hon. R.G. Wijerathna)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2012 හා 2013 වර්ෂයන්හි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ සේවය කළ නිලධාරියෙකුගේ වැඩ තහනම් කළ බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරියාගේ නම කවරේද;

(iii) එම නිලධාරියාට යුක්තිය හා සාධාරණත්වය ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ආර්ථිකය පිළිබඳ අධි සංවේදී දත්ත විකෘති කිරීම වළක්වා ගැනීම සඳහා වන වත්මන් රජයේ වැඩපිළිවෙළ කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012 மற்றும் 2013ஆம் ஆண்டுகளில் தொகை மதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களத்தின் தேசியக் கணக்கீட்டுப் பிரிவில் கடமையாற்றிய அலுவலர் ஒருவரின் பணி இடைநிறுத்தப் பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி அலுவலரின் பெயர் யாது என்பதையும்;

(iii) குறித்த அலுவலருக்கான நீதி மற்றும் நியாயம் பெற்றுக் கொடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) பொருளாதாரம் பற்றிய மிகவும் கூருணர்வுமிக்கதான தரவுகள் திரிபுபடுத்தப்படுவதைத் தடுப்பதற்காகத் தற்போதைய அரசாங்கத்திடம் காணப்படுகின்ற வேலைத்திட்டம் யாது என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House-

(i) whether he is aware that an officer who served in the National Accounts Division of the Department of Census and Statistics during the years 2012 and 2013 was interdicted;

(ii) if so, the name of the said officer; and

(iii) whether justice and fairness be served to the said officer?

(b) Will he also inform this House of the procedure to prevent the distortion of highly sensitive data on the economy of the current Government?

(c) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) එච්.එස්. වනසිංහ මහතා.

(iii) මෙම නිලධාරියා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ සේවය කරමින් සිටියදී සහ ඉන් පසුව එම දෙපාර්තමේන්තුවේ සිතියම් විද්‍යා අංශයේ සේවය කරමින් සිටියදී විෂමාචාරයන් සිදු කරන ලද්දේ යැයි මූලික විමර්ශන දෙකක් සිදුකර ඇත. එම මූලික විමර්ශනයන්ගෙන් හෙළි වූ කරුණු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/DIS/030/2014

[ගරු නිශාන්ත ජයවීර මහතා]

දරන 2014.04.24 දිනැති ලිපිය අනුව එච්.එස්. වනසිංහ මහතාගේ වැඩ තහනම් කර ඇත.

එයට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/DIS/030/2014 හා 2014.08.14 දිනැති ලිපිය අනුව එච්.එස්. වනසිංහ මහතා හට චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත. එච්.එස්. වනසිංහ මහතා විසින් 2014.09.16 දිනැතිව සිදු කරන ලද අභියාචනය සැලකිල්ලට ගෙන චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණයට අගතියක් නොවන පරිදි කොන්දේසිවලට යටත්ව 2015.04.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවා ඇත.

එච්.එස්. වනසිංහ මහතා වැඩ තහනමට ලක්ව සිටි 2014.05.09 සිට 2015.04.27 දක්වා කාලයේ නොගෙවා රඳවා ගත් පාරිශ්‍රමික ගෙවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද නියෝග අනුව එම ගෙවීම් කටයුතු සිදු කර ඇත.

වනසිංහ මහතාට නිකුත් කරන ලද චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවැති විධිමත් විනය පරීක්ෂණයට අනුව ඔහු චෝදනාවන් 3ක් සඳහා වැරදිකරු බවත්, චෝදනාවන් 4ක් සඳහා නිවැරදිකරු බවටත් තීරණය කර දඬුවම් ලෙස තරවටු කිරීමකට නියෝග කර ඇති අතර ලිපිය මඟින් විනය නියෝගය ක්‍රියාත්මක කර ඇත.

නියෝජ්‍ය අධ්‍යක්ෂ එච්.එස්. වනසිංහ මහතා රා.ප.ච. 16/95 යටතේ 2016.05.10 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇත. එම නිලධාරියා විශ්‍රාම ගැනීමෙන් පසු එච්.එස් වනසිංහ මහතා 2015.10.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට පත් කර ඇත.

(ආ) මෙම දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර ප්‍රකාශයට පත් කරනු ලබන ආර්ථිකය සම්බන්ධ ඇතැම් දර්ශක, බිම් මට්ටමේ දත්ත රැස්කිරීම් මඟින් ලබා ගන්නා දත්ත භාවිත කර පිළියෙල කරනු ලබන අතර ඇතැම් දර්ශක/ඇස්තමේන්තු විවිධ දත්ත මූලාශ්‍ර මඟින් ලබා ගන්නා තොරතුරු පදනම් කර ගනිමින් ඇස්තමේන්තුගත කෙරේ.

හැකි උපරිම නිරවද්‍යතාවයකින් රැස්කරනු ලබන දත්ත පදනම්ව ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේද භාවිත කර සකස් කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනු ලබන බැවින් මෙසේ දත්ත විකෘති කිරීම් සිදුවීම මෙම දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන දත්ත/දර්ශක/ ඇස්තමේන්තු සම්බන්ධයෙන් අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

## 2008/04 චක්‍රලේඛය යටතේ ඉඩම් බලපත්‍ර අයදුම්කරුවන්: ලාහුගල සහ පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාස

## 2008/04ஆம் இலக்க சுற்றுநிருபத்தின் பிரகாரம் காணி அனுமதிப்பத்திரத்துக்காக விண்ணப்பித்தோர்: லாஹுகல மற்றும் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவுகள்

## LAND PERMIT APPLICANTS UNDER CIRCULAR NO. 2008/04: LAHUGALA AND POTTUVIL DS DIVISIONS

1757/2025

**8. ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා (ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා වෙනුවට)**

(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன் - மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித் சார்பாக)

(The Hon. Kathiravelu Shanmugam Kugathasan on behalf of the Hon. M.S. Abthul Wazeeth)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2008/04 චක්‍රලේඛය යටතේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් අයදුම් කළ ගොවීන් සංඛ්‍යාව සහ එම අයදුම්කරුවන් අතර පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගොවීන් සංඛ්‍යාව;

(ii) එම ගොවීන්ට ලබාදුන් නව ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව;

(iii) ඉහත චක්‍රලේඛය අනුව පසුගිය වසර 17ක කාලය තුළ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබාදුන් මුළු නව බලපත්‍ර සංඛ්‍යාව;

(iv) එම චක්‍රලේඛය යටතේ ඉල්ලුම් කර ඇති, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව;

(v) නැගෙනහිර පළාත් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමුකර ඇති නමුත්, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව;

කොපමණද යන්න ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ඉඩම් බලපත්‍ර නිකුත් නොකර රඳවා තබා ගැනීමට බලපෑ හේතු කවරේද;

(ii) එම බලපත්‍ර සුදුසු පුද්ගලයන් වෙත කඩිනමින් නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008/04ஆம் இலக்க சுற்றுநிருபத்தின் பிரகாரம் லாஹுகல பிரதேச செயலாளர் பிரிவில் விண்ணப்பித்த விவசாயிகளின் எண்ணிக்கை மற்றும் அவ்விண்ணப்பதாரர்களுள் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவைச் சார்ந்த விவசாயிகளின் எண்ணிக்கை;

(ii) மேற்படி விவசாயிகளுக்கு வழங்கிய புதிய காணி அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை;

(iii) மேற்படி சுற்றுநிருபத்தின் பிரகாரம் லாஹுகல பிரதேச செயலகத்தால் கடந்த 17 வருடங்களில் வழங்கப்பட்ட மொத்த புதிய அனுமதிப் பத்திரங்களின் எண்ணிக்கை;

(iv) மேற்படி சுற்றுநிருபத்தின் பிரகாரம் விண்ணப் பித்துள்ளபோதும் இதுவரை வழங்கப்படாத அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை;

(v) கிழக்கு மாகாணத்தின் காணி உரித்து நிர்ணயத் திணைக்களத்தின் பரிந்துரையின் பிரகாரம், லாஹுகல பிரதேச செயலகத்துக்குச் சமர்ப்பிக் கப்பட்டுள்ளபோதும் இதுவரை வழங்கப்படாத அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை;

மேற்படி பிரதேச செயலாளர் பிரிவு வாரியாக வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி காணி அனுமதிப்பத்திரங்களை வழங் காமல் நிறுத்தி வைத்தமைக்கு ஏதுவாக அமைந்த காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி அனுமதிப்பத்திரங்களை தகுதிவாய்ந்த ஆட்களுக்குத் துரிதமாக வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House, separately in relation to the below mentioned Divisional Secretaries' Divisions -

(i) the number of farmers who have submitted applications under Circular No. 2008/04 from the Lahugala Divisional Secretary's Division and out of them, the number of those who belong to the Pottuvil Divisional Secretary's Division;

(ii) the number of new land permits that had been issued to the above-mentioned farmers;

(iii) the total number of new permits that had been issued by the Lahugala Divisional Secretariat during the last 17 years in accordance with the said circular;

(iv) the number of land permits that have been applied for under the said circular, but have not yet been issued; and

(v) the number of permits that have been recommended by the Land Title Settlement Department of the Eastern Province and have been forwarded to the Lahugala Divisional Secretariat, but have not yet been issued?

(b) Will he also inform this House -

(i) the reasons that have led to the retention of the said land permits without being issued; and

(ii) whether steps will be taken to issue the said land permits to the eligible persons expeditiously?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් අයදුම් කළ ගොවීන් සංඛ්‍යාව චක්‍රලේඛය අනුව (අයදුම් පත් යොමු කළ පිරිස) - 938

එම අයදුම්කරුවන් අතර පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගොවීන් සංඛ්‍යාව - 286

(ii) බලපත්‍ර නිකුත් කර නොමැත.

(iii) ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබා දුන් මුළු බලපත්‍ර සංඛ්‍යාව - 1,478

(iv) බලපත්‍ර සංඛ්‍යාව - 712

(v) නැඟෙනහිර පළාත් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවක් නොමැත.

(ආ) (i)
- වනජීවී දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල මායිම් ගැටලු පැවතීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල මායිම් ගැටලු පැවතීම.
- කාර්ය මණ්ඩල නිලධාරීන් හිඟවීම.
- ඉඩම් කච්චේරියේ අවසන් තේරීම් ලැයිස්තු ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබෙන විට එම ඉඩම් සඳහා ආරවුල් හටගෙන තිබීම.
- අදාළ ඉඩම් අන් සතු කර තිබීම.

(ii) ජංගම සේවාවක් ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවත්වා ලබා දිය හැකි බලපත්‍ර නියමිත පුද්ගලයින්ට ලබා දීමට කටයුතු කිරීම.

(ඇ) අදාළ නොවේ.

## ගොරකා වගාකරුවන්: මුහුණ දෙන ගැටලු
## குடம்புளிச் செய்கையாளர்கள்: முகங்கொடுக்கும் பிரச்சினைகள்
## GARCINIA CULTIVATORS: ISSUES FACED

1908/2026

**9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බී. ආරියවංශ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு பி. ஆரியவங்ஷ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. B. Ariyawansha)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොරකා වගාකරන බිම් ප්‍රමාණය කොපමණද;

(ii) ගොරකා මිල නිරන්තරයෙන් උච්චාවචනය වීම හේතුවෙන් වගාකරුවන් පීඩාවට පත්වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඔවුන් මුහුණ දෙන ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் குடம்புளி (கொரக்காய்) செய்கை மேற்கொள்ளும் காணியின் அளவு எவ்வளவு என்பதையும்;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) குடம்புளி விலை தொடர்ச்சியாக தளம்பல் நிலையில் காணப்படுவதன் காரணமாக செய்கை யாளர்கள் பாதிக்கப்படுகின்றமையை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், அவர்கள் எதிர்கொள்ளும் பிரச்சினை களைத் தீர்ப்பதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land under Garcinia (Goraka) cultivation in Sri Lanka;

(ii) whether he admits that cultivators are adversely affected by the frequent fluctuations in the price of Garcinia; and

(iii) if so, the measures that will be taken to address the issues faced by them?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2025 වසර වනවිට වගා කරන ලද ගොරකා වගා බිම් ප්‍රමාණය ඇමුණුම මගින් දක්වා ඇත.

ඇමුණුම

Estimated Extent (ha) of Garcinia by Districts

| District | 2025 |
|---|---|
| Colombo | 18 |
| Gampaha | 38 |
| Kalutara | 217 |
| Kandy | 270 |
| Matale | 115 |
| Nuwara Eliya | 41 |
| Galle | 93 |
| Matara | 100 |
| Hambantota | 222 |
| Jaffna | 3 |
| Mannar | 3 |
| Vavuniya | 3 |
| Mullaitivu | 3 |
| Kilinochchi | 10 |
| Batticaloa | 10 |
| Ampara | 14 |
| Trincomalee | - |
| Kurunegala | 217 |
| Puttalam | 12 |
| Anuradhapura | 20 |
| Polonnaruwa | 13 |
| Badulla | 149 |
| Monaragala | 85 |
| Ratnapura | 229 |
| Kegalle | 310 |
| Sri Lanka | 2,195 |

(ii) ඔව්.

(iii) a) අපනයන කෘෂි ගම්මාන පිහිටුවීම.

b) ගොරකා වෙළෙඳ පොළ මිල ගණන් පිළිබඳ තොරතුරු පුවත්පත්වල පළ කිරීම හා වෙබ් අඩවිය හා වෙනත් මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කිරීම.

c) නව වගා වැඩසටහන යටතේ ගොවීන් වෙත ගොරකා පැළ නොමිලයේ ලබා දීම හා ආයෝජන ආධාර ලබා දීම.

d) ගෙවතු වගා වැඩසටහන යටතේ ගොරකා පැළ ලබා දීම.

e) ගොරකා වගාව පිළිබඳ රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් මගින් තාක්ෂණික තොරතුරු ලබා දීම.

f) ගොවි පුහුණු, ආදර්ශන හා පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම.

g) ගොරකා වගාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා තාක්ෂණික දැනුම ලබා දීම.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1990/2026- (1), ගරු තිළිණ සමරකෝන් මහතා.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු කථානායකතුමනි, ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## 2029 වන විට සෙස් බද්ද ක්‍රමයෙන් ඉවත් කිරීමෙන් ඇතිවිය හැකි ආර්ථික බලපෑම
2029இல் செஸ் வரி நீக்கத்தால் ஏற்படக்கூடிய பொருளாதாரத் தாக்கம்
PROJECTED ECONOMIC IMPACT OF PHASING OUT CESS BY 2029

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ස්ථාවර නියෝග 27(2) යටතේ මම මේ වැදගත් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා, ගරු කථානායකතුමනි.

රටේ අපනයන තරගකාරිත්වය වැඩි කිරීමේ අපේක්ෂාවෙන් 2029 වන විට CESS බද්ද සම්පූර්ණයෙන් ඉවත් කිරීමට රජය තීරණය කර තිබුණ ද, එම තීරණය දේශීය කර්මාන්ත, රැකියා, රජයේ බදු ආදායම සහ වෙළෙඳ සමතුලිතතාවට ඇති කළ හැකි බලපෑම පිළිබඳ බරපතළ ප්‍රශ්න මතු කරනවා.

විශේෂයෙන්ම, 2026-2029 අතර ලබා දී ඇති කාල සීමාව දේශීය කර්මාන්ත තරගකාරී මට්ටමකට ගෙන ඒම සඳහා ප්‍රමාණවත්ද යන්න සහ අවසානයේ ශ්‍රී ලංකාව "නිෂ්පාදන ආර්ථිකයකින් ආනයන ආර්ථිකයකට" තල්ලු වීමේ අවදානමක් පවතින්නේද යන්න පිළිබඳ රටට පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. එම නිසා විශේෂයෙන්ම දේශීය කර්මාන්තකරුවා සුරක්ෂා කිරීම උදෙසාත්, ඒ වාගේම අපනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම උදෙසාත්, පාරිභෝගික අයිතිය සුරක්ෂිත කිරීම උදෙසාත් මෙම වැදගත් ජාතික ප්‍රශ්නය අසන්නට මම යොමු වෙනවා.

1. වර්ෂ 2029 වන විට CESS බද්ද සම්පූර්ණයෙන් ඉවත් කිරීමට පෙර, දේශීය කර්මාන්ත චීනය සහ ඉන්දියාව වැනි රටවල් සමඟ තරග කළ හැකි මට්ටමකට ගෙන ඒම සඳහා 2026-2029 කාලය ප්‍රමාණවත් බවට මුදල් අමාත්‍යාංශය සිදු කළ ආර්ථික ඇගයීම කුමක්ද?

2. CESS බද්ද ඉවත් කිරීම හේතුවෙන් රජයට අහිමි විය හැකි බදු ආදායම පිරවීම සඳහා මුදල් අමාත්‍යාංශය සතුව ඇති නිශ්චිත ආදායම් සැලැස්ම කුමක්ද? නැතහොත්, බදු බර නැවත ජනතාව මත පටවන්නට කටයුතු කරන්නේද?

3. සිමෙන්ති, ටයර්, ටයිල්, ඇඟලුම් ඇතුළු කර්මාන්ත සඳහා 2029 දක්වා ලබා දී ඇති ආරක්ෂණ කාලය තුළ ඒවා නවීකරණය කිරීමට සහ තරගකාරී තත්ත්වයකට පත් කිරීමට රජය ලබා දෙන මූල්‍ය සහන මොනවාද?

4. ගෘහස්ථ ඇඟලුම්, ගෘහ භාණ්ඩ, පාවහන්, කෘෂි නිෂ්පාදන සහ වෙනත් නිෂ්පාදන ආදියෙහි දේශීය කර්මාන්ත අඩු මිල ආනයන හමුවේ බිඳ වැටීමෙන් රැකියා අහිමි වීම වළක්වා ගැනීමට මුදල් අමාත්‍යාංශය ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

5. පසුගිය දශකයේ අපනයන වර්ධනය සීමිතව පැවැති පසුබිමක, CESS ඉවත් කිරීම පමණක් අපනයන ඉහළ යෑමට හේතුවක් වන බවට රජය සතුව ඇති ආර්ථික සාක්ෂි කවරේද?

   ඇත්ත වශයෙන්ම අපනයන ප්‍රවර්ධනය කරන්නට ඕනෑ. ඒ ප්‍රතිපත්තිය අපි පිළිගන්නවා. ඒ වාගේම දේශීය කර්මාන්ත සුරක්ෂා කිරීමත් අපි කරන්නට ඕනෑ. CESS එක ඉවත් කිරීම තුළින් කොහොමද කියන්නේ, අපනයන ප්‍රවර්ධනය සිදු වෙනවා කියලා?

6. CESS එක, PAL එක ඉවත් කිරීමෙන් නිමි භාණ්ඩ ආනයනය වැඩි වී වෙළෙඳ ඟිහය තවත් වර්ධනය වීමේ අවදානම පිළිබඳ රජය සිදු කළ බලපෑම් ඇගයීම කුමක්ද?

   රජය දැනටමත් IMF එකට පොරොන්දුවක් දීලා තිබෙනවා CESS එකයි, PAL එකයි 2026 - 2029 කාලය තුළ සම්පූර්ණයෙන්ම ඉවත් කරනවා කියලා. ඒ පිළිබඳව කරපු ආර්ථික බලපෑම් සමීක්ෂණය - Economic Impact Assessment එක - මොකක්ද?

7. දශක ගණනාවක් CESS ආරක්ෂාව යටතේ තිබූ කර්මාන්ත නවීකරණය කිරීමට රජයන් අසමත් වූ පසු, අද ඒවා විදේශීය දැවැන්ත කර්මාන්ත සමඟ ඍජුව තරග කිරීමට බල කිරීම "ප්‍රතිසංස්කරණයක්" ද, නැතහොත් දේශීය කර්මාන්තවල "අවසානය" ද?

   ගරු කථානායකතුමනි, අපි දේශීය කර්මාන්ත ශක්තිමත් කරන්නට ඕනෑ; අපනයනය ප්‍රවර්ධනය කරන්නටත් ඕනෑ; ඒ වාගේම පාරිභෝගිකයා ආරක්ෂා කරන්නටත් ඕනෑ. මේ හැම ඉලක්කයක්ම සම්පූර්ණ කර ගන්න විධිමත් සාර්ව ආර්ථික සැලැස්මක් අවශ්‍යයි. අප ඒ පිළිබඳව මේ අහපු ප්‍රශ්නවලට රජයෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම කල් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කල් ඉල්ලීම එතුමාගේ අයිතියක්. නමුත් මේ CESS එක, PAL එක ගැන දැනටමත් බරපතළ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. එතුමා කල් ඉල්ලන කොට නැවත සති දෙකකින් පසුව පැවැත්වෙන පාර්ලිමේන්තු සැසි වාරයේදී තමයි මේකට උත්තරය ලැබෙන්නේ. ඇත්ත වශයෙන්ම අප අද දවසේ IMF එකටත් කියන්නේ, දෙන්න තිබෙන ඩොලර් මිලියන 700 කොන්දේසි විරහිතව මේ රටට ලබා දෙන්න කියලායි. හැබැයි, මේ CESS එක, PAL එක ඉවත් කිරීම තුළ අසහනයට පත් වන කර්මාන්තකරුවන්ට ඉක්මන් විසඳුමක් අවශ්‍යයි; ඉක්මන් උත්තරයක් අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

## II

## රුපියල අවප්‍රමාණය වීම සහ ඉන්ධන මිල ඉහළ යාමේ බලපෑම අවම කිරීම සඳහා ගෙන ඇති පියවර
ரூபாயின் தேய்மானம் மற்றும் எரிபொருள் விலை உயர்வால் ஏற்படும் தாக்கத்தைத் தணிப்பதற்கான நடவடிக்கை
MEASURES TAKEN TO MITIGATE IMPACT OF RUPEE DEPRECIATION AND RISING FUEL PRICES

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම මේ ප්‍රශ්නය ගරු ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගෙන් අහනවා.

2026 ජනවාරි 01වැනිදා සිට මේ දක්වා ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව දළ වශයෙන් සියයට 6කින් අවප්‍රමාණය වී ඇති අතර, 2026 මැයි 18වැනි දා වන විට එය රුපියල් 327.60ක් දක්වා පහත වැටී ඇත.

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරපු දවසේ average එක විධියට තිබුණේ රුපියල් 327යි. නමුත්, අද වෙනකොට ඇත්ත average එක රුපියල් 354 ද, රුපියල් 356 ද, රුපියල් 360 ද කියලා දන්නේ නැහැ. නමුත්, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරපු දවසේ තිබුණු rate එක තමයි කලින් කිව්වේ.

මෙය 2022 අර්බුදය පැවැති කාලයෙන් පසුව වාර්තා වූ දුර්වලම මට්ටමකි.

ඔබතුමාත් දකින්න ඇති, බ්ලූම්බර්ග් වාර්තාවේ තිබෙනවා, ආසියාවේ දුර්වලම currency එක බවට ශ්‍රී ලංකා රුපියල පත් වෙලා තිබෙන බව.

මෑත කාලීන විචල්‍යතා දර්ශකයන්ට - rolling window volatility measuresවලට - අනුව රුපියල දකුණු ආසියාවේ නිරන්තරවම උච්චාවචනය වන, එනම් ස්ථාවර නොවන මුදල් ඒකකවලින් එකක් බවට පත්ව තිබේ. මෙම අවප්‍රමාණය වීම, පොදුවේ ජීවන වියදමෙහි ශීඝ්‍ර ඉහළ යැමක් සමඟ සමපාත වේ. මේ වන විට අප්‍රේල් මාසයට අදාළ මූලික උද්ධමනය - headline inflation එක - සියයට 5.4ක් වන අතර, අමෙරිකා-ඉරාන ගැටුම මධ්‍යයේ ඉන්ධන මිල දළ වශයෙන් සියයට 35කින් ඉහළ ගොස් ඇත; ගෘහස්ථ විදුලි ගාස්තු ද සියයට 18කින් ඉහළ ගොස් ඇත.

ගරු කථානායකතුමනි, ඒ අනුව මේ පොඩි කාලය තුළ විදුලිය ගාස්තු ඊට වඩා වැඩි ගණනකින් ඉහළ ගොස් තිබෙනවා.

නිල දරිද්‍රතා මට්ටම 2009 වසරෙන් පසු ඉහළම අගයක් ගෙන ඇති පසුබිමක, ගරු අමාත්‍යවරයාගෙන් මම පහත සඳහන් පැහැදිලි කිරීම් අපේක්ෂා කරමි.

1. ආනයනික උද්ධමනය, රුපියල අවප්‍රමාණය වීම සහ ඉහළ යන ඉන්ධන මිල හේතුවෙන් ඇති වන ඒකාබද්ධ බලපෑමෙන් අඩු සහ මධ්‍යම ආදායම්ලාභී කුටුම්භ ඉදිරි මාස හය තුළ ආරක්ෂා කිරීම සඳහා රජය ගන්නා නිශ්චිත පියවර මොනවාද?
2. "අස්වැසුම" වැඩසටහන පුළුල් කිරීම, අත්‍යවශ්‍ය සේවකයින් සඳහා ප්‍රවාහන සහනාධාර ලබා දීම හෝ අත්‍යවශ්‍ය භාණ්ඩ මත තාවකාලික VAT සහන ලබා දීම වැනි අමතර ඉලක්කගත සහන හඳුන්වා දෙනු ලබන්නේද? එසේ නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත මූල්‍ය පිරිවැය කොපමණද?
3. රුපියලේ උච්චාවචනය පාලනය කිරීම සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කුමක්ද?
4. සෘජු විදේශ ආයෝජන - FDIs - රජයට අදාළව ප්‍රධානතම සැලකිල්ලක් දැක්විය යුතු වන කරුණක් වන බැවින්, පවතින විනිමය අනුපාතික උච්චාවචනයන් මධ්‍යයේ වුවද, 2026 වර්ෂයේදී අපේක්ෂිත ආයෝජන ළඟා කර ගැනීමට සහ තවත් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජය ගන්නා ප්‍රායෝගික පියවර මොනවාද?
5. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් - IMF - වැඩසහනේ ඉතිරි කාල සීමාව සඳහා ජීවන වියදම කෙරෙහි ඇති වන බලපෑම පිළිබඳ තක්සේරු වාර්තාවක් ගරු අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ සභාගත කරන්නේද?

ගරු කථානායකතුමනි, මම ඉංග්‍රීසියෙන් ලියපු එකේ සිංහල පරිවර්තනය කියවපු නිසා සමහර වචන කියවන කොට මට පොඩි අපහසුතාවක් තිබුණා. මම හිතන විධියට, මේ ප්‍රශ්නයේ පිටපතක් ගරු ඇමතිතුමාට ලැබිලා ඇති.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට මම මේ ප්‍රශ්නය යොමු කරන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ රුපියල ඉතාම දුර්වල තත්ත්වයක, භයානක තත්ත්වයක තිබෙන බව අපි සියලුදෙනාම දන්නා කාරණයක්. මේ වෙනකොට black market එකේ පවා US Dollars ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. සාමාන්‍යයෙන් විදේශ රැකියාවල නිරතව සිටින අය පවා මේ වෙනකොට තමන් ළඟ තිබෙන US Dollars එවන්නේ නැතුව තබාගෙන ඉන්නවා. මම කියන්නේ විශාල companies ගැන නොවෙයි. පොඩි පොඩි ඩොලර් ප්‍රමාණයන් පවා ලංකාවට එවන්නේ නැතුව තබාගෙන ඉන්නවා. ලංකාව තුළ ඩොලර් පොඩි ප්‍රමාණයක් හෝ තබාගෙන සිටින මිනිස්සු වුණත් ඒවා මාරු කරන්නේ නැති තත්ත්වයක් තුළ, අපි ඉතාම භයානක තැනකයි ඉන්නේ, ගරු අමාත්‍යතුමනි. පසුගිය කාලයේ කළා වාගේ නරක අදහසින් "ලංකාවට ඩොලර් එවන්න එපා" කියන කථා අද විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් වශයෙන් අපි කියන්නේ නැති වුණත්, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය ඉතා ඉක්මනින් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. මම මේ ප්‍රශ්නය ලබා දුන්නේ මැයි මාසයේ 18වැනි දා. එතැනින් පසුවත් වෙනස් වීම් සිදු වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් පොඩි ප්‍රශ්නයක් එකතු කරන්නම්. පුළුවන් නම් විතරක් ඔබතුමා පිළිතුරු දෙන්න.

ගරු අමාත්‍යතුමනි, දැනට අපි ඩීසල් සහ පෙට්‍රල්වලට දරන වියදම ගත්තොත්, රජය මැදිහත් වෙලා රුපියල් 100ක් වාගේ ප්‍රමාණයක් ඩීසල්වලටත්, රුපියල් 20ක් වාගේ ප්‍රමාණයක් පෙට්‍රල්වලටත් subsidize කරනවා. එතකොට LIOC, Sinopec සහ RM Parks (Private) Limited - සියයට 21ක් LIOC, සියයට 9ක් Sinopec, සියයට 9ක් වාගේ ප්‍රමාණයක් Shell Company එකට තියනකොට - කියන ආයතනවලට විශාල පීඩනයක් එල්ල වෙනවා. අපේ ඇමතිතුමන්ලාගේ බලාපොරොත්තුව, "කවදා හරි තෙල් මිල අඩු වෙච්ච දවසක ඒගොල්ලන්ට ඒ ලාභ ටික ලබා ගන්න ඉඩ අරිමු" කියලා ඒගොල්ලන්ට අද පාඩු ලබන තත්ත්වයක ඉඳලා තෙල් විකුණන්න කියන්නද? එහෙම නැත්නම් රජයෙන් ඒගොල්ලන්ට ගෙවනවාද? රජයෙන් ගෙවනවා නම්, මේවාට මුදල් වෙන් වෙන්නේ කොහෙන්ද ? ඒකට මේ Budget එක හරහාද, කොහෙන්ද මුදල් එන්නේ? විශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේවාට ඇමතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த )
(The Hon. (Dr.) Anil Jayantha )

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ මොහොත වෙනකොට රුපියල අවප්‍රමාණ වීම හේතුකොට ගෙන රජය විධියට ගනු ලබන ක්‍රියාමාර්ග සියල්ලක්ම තොරතුරු - මේ සිද්ධ වෙන්නේ මොකක්ද, විදේශ විනිමය අනුපාතය මේ ආකාරයට ඉහළ ගියේ ඇයි කියන කාරණය - පාදකව සිදු කරලා තිබෙන්නේ. පළමුකොටම කියන්න අවශ්‍යයි, මේ තත්ත්වය ඇති වුණේ කිසිදු ආකාරයක දේශීය ආර්ථික ප්‍රතිපත්තියේ හෝ ආර්ථික ක්‍රියාකාරකම්වල හෝ රාජ්‍ය මූල්‍ය අවකාශය පිළිබඳ තත්ත්වයක් නිසා නොවෙයි කියන එක. මෙයට හේතුව බාහිර යුද්මය තත්ත්වයක්. මෙය අපේ රටට විතරක් නොවෙයි, ලෝකයේ හැම රටකටම බලපා තිබෙනවා. විශේෂයෙන් ඉන්ධන ආනයනය කරන රටවල - අපේ කලාපයේ ඉන්දියාව, ඉන්දුනීසියාව, තායිලන්තය ආදි හැම රටකම - මුදල් ඒකක අවප්‍රමාණය වෙලා තිබෙනවා, මේ කාරණය නිසා.

ඊට අමතරව රුපියල අවප්‍රමාණ වීමට තවත් හේතුවක් බලපා තිබෙනවා. ඩොලරයේ ඉපැයුම් ඵලදාව - yield එක - වැඩිවීම නිසා, ඒ කියන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ ක්‍රියාකාරකම්වලදී ඒගොල්ලන්ගේ ඩොලරයේ ප්‍රතිලාභය වැඩි කිරීම නිසා ඩොලර් ආයෝජන සඳහා පෙලඹීම නිසා ඩොලරයේ අගය වැඩි වෙලා තිබෙනවා. ඒ සියලු කාරණා එක්ක තමයි මේ තත්ත්වය ඇවිල්ලා තිබෙන්නේ. මම එතුමා මතුකරපු ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්නම්.

එහිදී රුපියල අවප්‍රමාණ වීම වෙනුවෙන් අපි ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියන එක ඉදිරියේදී පැහැදිලි කරන්නම්.

1. අපි රටක් විධියට ක්‍රමයෙන් ආර්ථික අර්බුදය යථා තත්ත්වයට පත් කරමින් සිටින වෙලාවක තමයි මේ බාහිර කම්පනය - 2026 වර්ෂයේ පෙබරවාරි 28වැනි දා උත්සන්න වෙච්ච මැද පෙරදිග අර්බුදය - ඇති වෙන්නේ. එහි ප්‍රතිඵලයක් විධියට අපේ ආර්ථිකයට යම් බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ Brent බොර තෙල් බැරලයක මිල 2026 වර්ෂයේ මාර්තු 2වැනි දා වෙනකොට පැවති ඩොලර් 74.24ක අගය, මැයි මාසයේ 18වැනි දා වෙනකොට ඇමෙරිකානු ඩොලර් 116.73ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. එය සියයට 50කට වැඩි අගයක්. මෙහි සෘජු ප්‍රතිඵලයක් විධියට ඉන්ධන මිල වැඩි වෙලා තිබෙනවා.

   ඒ වාගේම තමයි ඉන්ධන පරිභෝජනයත්. අපේ රටේ ඉන්ධන හිඟ වෙයි කියලා හිතපු නිසා මිනිස්සු වැඩි වැඩියෙන් පරිභෝජනය කරන්න ගිහිල්ලා, මුල් සතියේ දෙකේදී ඉන්ධන පරිභෝජනය දෙගුණයක් වුණා. දැන් එය නැවත සාමාන්‍ය තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ නිසා ඉන්ධන ආනයන වියදම, 2025 වර්ෂයේ මාර්තු මාසයේදී පැවැති ඇමෙරිකානු ඩොලර් 360.7 සිට 2026 මාර්තු මාසයේදී ඇමෙරිකානු ඩොලර් 630ක් දක්වා සියයට 75කින් ශීඝ්‍රයෙන් ඉහළ ගිහින් තිබෙනවා.

   යුද්ධයේ බලපෑම හේතුවෙන් පිරිවැය පිළිබිඹු වන පරිදි දේශීය බලශක්ති අංශයේ සිදු කරන ලද මිල සංශෝධන නිසා 2024 වර්ෂයේ මාර්තු මාසයේ පැවැති සියයට 2.2 උද්ධමනය 2026 අප්‍රේල් මාසයේදී සියයට 5.4 දක්වා වැඩිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම, ආහාර නොවන උද්ධමනය 2026 වර්ෂයේ මාර්තු මාසයේදී සියයට 2.9 සිට අප්‍රේල් වන විට 6.8 දක්වා වර්ධනය වීමක් පෙන්නුම් කරනවා. බාහිර වෙළඳාම් අංශය 2025 වර්ෂයේදී කාර්තුව තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් ලෙස පැවැති වෙළෙඳ හිඟය 2026 වසරේදී සමාන කාල පරිච්ඡේදය තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 දක්වා පුළුල් වෙලා තිබෙනවා. මේ ගෝලීය තත්ත්වයත් එක්කම විශේෂයෙන් මේ රට ඇතුළේ ඇති වෙච්ච අර speculation, කලබල වීම - panicking - නිසාම ආනයනකරුවන් හිතනවා තව තවත් ඩොලරයේ මිල වැඩි වේවි, ඒ නිසා වැඩිපුර ආනයනය කරන්න ඕනෑ කියලා. ඒකට හොඳම උදාහරණය තමයි, අවසාන මාස දෙකේ එක් මාසයක ආනයන වියදම ඩොලර් බිලියන 2 ඉක්මවා තිබීම. කෙසේ වෙතත්, අපට ඩොලර් උත්පාදනය වන මාර්ගවල - අපනයන ආදායමේ - ඊට කලින් මාසයට සාපේක්ෂව වර්ධනයක් තිබුණත් යම් අඩුවීමක් තිබෙනවා. සංචාරක කර්මාන්තයේත් වැඩිවීම සාපේක්ෂව අඩු වී තිබෙනවා. කෙසේ වෙතත්, විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව වර්ධනය වෙලා තිබෙනවා. පළමු මාස 4 වෙනකොට ඩොලර් බිලියන 3ක් දක්වා එය වර්ධනය වෙලා තිබෙනවා. මේ නිසා ගෙවුම් ශේෂ තුලනයට, ජංගම ගිණුමට ඇති විය හැකි බලපෑම අවම වෙලා තිබෙනවා. එය අපි අපේක්ෂා කළ මට්ටමට වඩා හොඳ මට්ටමක තිබෙන්නේ. ඒ බලපෑම අවම වෙලා තිබෙනවා. ඒ අනුව මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වය මත ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මෙය නිවේදනය කරනවා. මේ තිබෙන තත්ත්වයේදී දැනට උද්ධමනය තිබෙන්නේ රාමුවක් ඇතුළේ. අපි flexible inflation targeting framework එකක ඉන්නේ. ඒ framework එක ඇතුළේ අපට අවශෝෂණය කරගන්න පුළුවන් මට්ටමක තමයි දැනට තිබෙන්නේ.

   කෙසේ වෙතත්, විශේෂයෙන් ඩොලරයේ මිල වැඩිවීම නිසා ආනයන භාණ්ඩවල මිල ඉහළ යෑමත්, ඉන්ධන මිල ඉහළ යෑමත් නිසා රජය විසින් පොදුවේ රට ඇතුළේ ක්‍රියාත්මක කරන සහන ක්‍රියාමාර්ගවලට අමතරව, අතිරේකව රුපියල් බිලියන 100ක් මේ සඳහා වෙන් කරමින් විශේෂ සහන පැකේජයක් ඉදිරිපත් කළා. එයින් රුපියල් මිලියන 57,000ක් - රුපියල් බිලියන 57ක් - වෙන් වෙනවා ඉන්ධන සහනාධාරය ලබා දීම සඳහා.

2. ඒ වාගේම, අපි අඩු ආදායම් ලබන කණ්ඩායමට "අස්වැසුම" වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ඔවුන්ට හිමි අස්වැසුම දීමනාව මේ අවුරුද්දේදීත් අපි වැඩි කර තිබුණා. ඒ කියන්නේ, 2026 අය වැයෙන්. ඊට අමතරව මේ මොහොතේදී විශේෂ මැදිහත්වීමක් කරනවා, අන්ත දිළිඳු, දුප්පත්, අවදානමට ලක් වූ කියන කාණ්ඩ 03ටම. පවුල් 1,700,000කට ආසන්න ප්‍රමාණයකට රුපියල් බිලියන 8.5ක් වෙන් වෙලා තිබෙනවා.

   ඒ වාගේම මිල සංශෝධනය වීම නිසා අවසාන වතාවේදී විදුලි පාරිභෝගිකයන්ට සියයට 18කින් විදුලි බිල සංශෝධනය වුණා. කෙසේ වුවත්, සමස්ත පාරිභෝගිකයන්ගෙන් සියයට 95ක් පමණ ඒකක 180ට වඩා අඩුවෙන් විදුලිය පාවිච්චි කරන අය. ඒ, ඒකක 180ට අඩු අය වෙනුවෙන් මේ සහනාධාරය ලබා දෙනවා. ඒ අනුව රුපියල් බිලියන 15.3 ක් මේ සඳහා වෙන් වෙනවා.

   ඒ වාගේම අපේ කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවීන්ට සහන සැලසීම සඳහා වැඩසටහන් 3ක් යටතේ මේ මැදිහත්වීම සිද්ධ කරනවා. එකක්, පොහොර සහනාධාරය ලබා දීම. අනෙක, යල කන්නය සඳහා ස්ථාවර මිලකට යූරියා පොහොර සැපයීම. ඒ වාගේම කුඩා තේ වැවිලිකරුවන් සඳහා සහන වශයෙන් රුපියල් බිලියන 6.35 ක් -මිලියන 6,350 ක්- වෙන් කර තිබෙනවා. ධීවර කර්මාන්තයේ යෙදෙන අය වෙනුවෙන්, එක්දින යාත්‍රා සහ බහුදින යාත්‍රා වෙනුවෙන් රුපියල් මිලියන 4,121ක් - රුපියල් මිලියන 3,281කුත් මිලියන 840කුත් එකතුව - වෙන් කර තිබෙනවා. මේ වැඩසටහන් සියල්ලේම එකතුව ගත්තාට පස්සේ ඒ රුපියල් බිලියන 100න් දැනටම නිශ්චිත

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

වැඩසටහන් විධියට රුපියල් බිලියන 92ක් වෙන් කර තිබෙනවා. ඉතිරි රුපියල් බිලියන 8ත් යොදාගෙන විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය සහ අනෙකුත් කණ්ඩායම් ඉලක්ක කරගෙන ඊට අදාළ කාරණාවලට අපි ප්‍රවිෂ්ට වෙනවා.

3. රුපියල අවප්‍රමාණය වීමේ දී - මම කලින්නුත් කරුණු පැහැදිලි කළා - අපිට පිටින් තිබෙන සාධකයක් නිසා මේ speculations, ඒ සමපේක්ෂණ චේතනාව වැඩිවීමත්, ඩොලරයේ ඉපැයීම වැඩිවීමත් නිසා ඇති වෙච්ච තත්ත්වය හේතුවෙන් කෙටි කාලයක් ඇතුළතදී රුපියල ශීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. මෙවැනි තත්ත්වයකදී අපට හැසිරෙන්නට වෙන්නේ තිබෙන තොරතුරු මත.

ගරු මන්ත්‍රීතුමනි, ඔබ සඳහන් කරපු ප්‍රශ්නයේදී මතු කළ කාරණය හරි. ඒකට සම්බන්ධ වන ආනයනකරුවන්, ඒ වාගේම අපනයනය කරන අය, මෙයට මුදල් නොයවන්න තිබෙන පමාවන් වාගේම මුදල් ප්‍රේෂණය කරන අය හිතනවා, "ඩොලර් එක තව වැඩි වෙයි; ඩොලර් එක තව වැඩි වෙයි" කියලා. ආර්ථික අර්බුදයක් රටක නිර්මාණය වෙලා තිබෙන තත්ත්වයකදී තමයි මේ අනවශ්‍ය සමපේක්ෂණ තත්ත්වය බොහෝ දුරට අදාළ වෙන්නේ. මෙය සුවිශේෂී තත්ත්වයක්. කෙටි කාලයක් පවතින දෙයක්. ඒ අනුව අපි ආණ්ඩුව විධියට, පවතින තත්ත්වය අත්හදා බලමින් මේ වෙනකොට ගන්න ඕනෑ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ එකින් එක ගනිමින් සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතුව, අපි මේ ගන්න තීන්දුව විසින් කිසිම ආකාරයකට ආර්ථිකය අඩපණ නොවිය යුතුයි. ආර්ථිකය හකුලන්නේ නැතිව ඒ වර්ධනය පවත්වාගෙන යා යුතුයි.

මීට අමතරව, මහ බැංකුව විසින් මූල්‍ය ස්ථාවරත්වය අත්පත් කර ගැනීමට විවිධ වූ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. අපි සංචිත ගොඩ නඟාගෙන තිබෙනවා. ඒ සංචිතවලින් සැලකිය යුතු ප්‍රමාණයක් වෙළඳ පොළට නිදහස් වෙලා තිබෙනවා. හැබැයි, කිසිම පදනමක් නැති තොරතුරු මත, සමපේක්ෂණ චේතනාව මත panic වෙලාම කටයුතු කිරීමෙන් සමහර වෙලාවට අවාසි සිද්ධ වෙන්නත් ඉඩ තිබෙනවා. මොකද, මෙය අසාමාන්‍ය ඉහළ යාමක් නම්, විදේශ විනිමය අනුපාතය නැවත පහළට එන්නත් ඉඩ තිබෙනවා. විදේශ විනිමය අනුපාතය ඉහළ පහළ යාම තීරණය වෙන්නේ, අසාමාන්‍ය විධියට ඉහළ ගියොත් හෝ පහළ ගියොත් විතරයි. එහෙම නැත්නම්, සාමාන්‍යයෙන් විදේශ විනිමය අනුපාතයේ හැසිරීම අපි කළමනාකරණය කරමින් ඉන්නවා. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය හැසිරවීමේදී අපි අමතක නොකළ යුතු ප්‍රධාන සාධකය තමයි ශ්‍රී ලංකාවේ රුපියල්වලට ලැබෙන පොලී අනුපාතය. එය සියයට 10ක්, ඒ ආසන්න ප්‍රමාණයක තිබෙන්නේ. එය ඩොලරයට ලැබෙන පොලී අනුපාතයට වඩා වැඩි අගයක්. පොලී අනුපාත අතර වෙනසම සියයට 5ක් විතර තිබෙනවා. ඒ නිසා වර්ෂයක් ඇතුළතදී ඩොලරයට සාපේක්ෂව රුපියල ක්‍රමිකව සියයට 5කින්, 6කින් අවප්‍රමාණය වීම ගැටලුවක් වෙන්නේ නැහැ. එතකොට මේ සුවිශේෂී තත්ත්වයේදී, අවුරුද්දකට වඩා අඩු කාලයකදී සියයට 5කින් විතර අවප්‍රමාණය වීමක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. තොරතුරු පාදකව අපි ඒ කාරණයට මැදිහත් වෙනවා.

4. ගරු මන්ත්‍රීතුමනි, මේක ඔබතුමා ආයෝජන සම්බන්ධව අහපු ප්‍රශ්නය. ආර්ථිකය ස්ථාවර කිරීමේදී මේ ආයෝජන කැඳවීමේ වැඩසටහන් ගණනාවක් තිබෙනවා. ආයෝජන මණ්ඩලය තිබෙනවා, කොළඹ වරාය නගරය තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය හවුල්කාර තත්ත්වයන් යටතේ අනෙකුත් වැඩසටහන් තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම ආයෝජන මණ්ඩලය 2025 වර්ෂයේදී ඩොලර් මිලියන 1,062ක ආයෝජන කැඳවන්න සමත් වෙලා තිබෙනවා. 2026 වර්ෂය වෙනුවෙනුත් ඩොලර් බිලියන 2ක් කැඳවා ගැනීම සඳහා මේ මූලික තත්ත්වයේදී ඔවුන් සැලසුම් සකස් කරලා තිබෙනවා. ඊට අමතරව කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් කියනවා නම්, ඒ සඳහා සහන ලබා දීමේදී අභිමතාර්ථය - discretion - මත දෙනවා වෙනුවට අපි දැන් රීති පාදක - rule-based - කරලා තිබෙනවා. එහිදී ගෙනෙන ලද ආයෝජනයේ ප්‍රමාණය, ඒ වාගේම උපාය මාර්ගිකව එය කොච්චර වැදගත් වෙනවාද, ඒ මඟින් රැකියා සම්පාදනය වෙනවාද කියන කාරණා මත දැනට තිබෙන තත්ත්වයන් යටතේ Primary Businesses of Strategic Importance - PBSIs - වෙනුවෙන් සමාගම් 7කට අවසරය ලැබී තිබෙනවා. ඒ අනුව අවසරය ලබා දීපු - authorized - සමාගම් විධියට, residential developments විධියට දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ආයෝජන මේ වෙනකොට commit කරලා තිබෙනවා. ඒ වාගේම mixed developmentsවලට තවත් ඩොලර් මිලියන 142ක්, ඊට අමතරව අනෙකුත් ක්ෂේත්‍ර වෙනුවෙන් ඩොලර් මිලියන 130ක් සහ ඩොලර් මිලියන 150ක් වශයෙන් මේ වෙනකොට ඒ ඒ ක්ෂේත්‍රවල ආයෝජන commit වෙලා තිබෙනවා.

5. ඔබතුමාත් අහපු විධියට, මේ IMF වැඩසටහන යටතේ මිනිසුන්ට පීඩනයක් ඇති වෙලා තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙනුත් මම පැහැදිලි කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

අපි මුල සිටම IMF වැඩසටහන ඇතුළේ, ඒ performances, criteria අනුව වැඩ කටයුතු කරමින්, ඒ සෑම දර්ශකයකින්ම අපේක්ෂා කළාට වඩා වැඩි තත්ත්වයක් අත්පත් කර ගත් නිසා තමයි 2025දී ආර්ථික ස්ථාවරත්වය අත්පත් කර ගත්තේ. මේ මැයි මාසයේ 27වැනි දා වෙනකොට පස්වැනි සහ හයවැනි සමාලෝචනවලට අදාළ වාරිකය වන ඩොලර් මිලියන 700, ඒ විධායක අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලැබේවි කියලා අපි හිතනවා. ඒකට සාක්ෂියක් විධියට අපේ රට භාරව සිටින ඉවාන් පැපජෝර්ජියෝ, LinkedInවලට ඉදිරිපත් කරපු පණිවුඩය මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "Sri Lanka's reform programme continues to move forward, with the IMF Executive Board set to consider the combined Fifth and Sixth Reviews under the Extended Fund Facility next week (Wednesday, May 27).
>
> Over the past years, the authorities have made significant progress in restoring macroeconomic stability, ….."

අපි අත්පත් කරගෙන තිබෙන සාර්ව ආර්ථික ස්ථාවරත්වය දර්ශකවලින් පෙන්වන අතරතුර, එතුමාගේ පණිවුඩයෙනුත් ඉතා පැහැදිලිව කියැවෙනවා, significant progress එකක් strong macroeconomic stability එකෙන් පෙන්වලා තිබෙනවා කියලා. ඒ වාගේම සංචිත නැවත ගොඩනඟා ගැනීම තුළ - in rebuilding reserves - remarkable progress එකක් තිබෙනවා. ඒ වාගේම විශ්වාසය - strengthening confidence - කියන එක ඉතාම වැදගත් වෙනවා. එතකොට එම ක්ෂේත්‍රයේ සිටින සියලුම ආයෝජකයින්ගේ, කණ්ඩායම්වල විශ්වාසය ගොඩනැඟිලා තිබෙනවා, ලංකාව තුළ ඉන්න කිහිපදෙනෙකුගේ විශ්වාසය හැරෙන්න.

එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "These efforts have been recognized by the public, investors, and stakeholders, and have helped place the economy on a firmer footing."

ආර්ථිකය ඉතාම ස්ථාවර තැනක තිබෙනවා කියන එක.

> "Recent global developments have brought renewed pressures,…."

Yes, of course. ඒක ලෝකයේ ඇති වෙච්ච අලුත් තත්ත්වයක්, renewed pressure එකක්.

> "… as is the case for many economies in a challenging external environment. Navigating these shocks is never straightforward, …"

It is not a unique situation only for Sri Lanka. එතකොට මෙවැනි තත්ත්වයකදී, අවිනිශ්චිත තත්ත්වයකදී, බාහිර සාධකයකදී අපි ගනු ලබන මුල්‍ය තීරණ විනිමය අනුපාතයට මැදිහත්වීම, straightforward ලෙස සරල සමීකරණවලින්, වීජ ගණිතයෙන් පෙන්නුම් කරන්න පුළුවන් එකක් නොවෙයි කියන කාරණය තමයි මේ කියන්නේ.

> "… but Sri Lanka's policy framework today is considerably stronger than in the past."

අපිට වෙන සහතිකයක් ඕනෑ නැහැ. අතීතයට වඩා එය ඉතාම strong. මම ඒක reiterate කරනවා, "....Sri Lanka's policy framework today is considerably stronger than in the past." එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Maintaining a consistent policy course and continuing to allow the economy to adjust to evolving conditions will be key to sustaining the gains achieved so far."

ඉතාම කල්පනාවෙන්, බොරු තොරතුරු මත පදනම් වෙන්නේ නැතිව, අනවශ්‍ය කලබලයකින් තොරව - calmly - තමයි මේ වැඩ කරන්න ඕනෑ. Finally, it states, I quote:

> "We look forward to continued close engagement with the Sri Lankan authorities as the reform agenda advances."

Thank you very much.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can ask for an explanation.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Hon. Speaker.

ගරු ඇමතිතුමනි, මම අහපු තවත් කාරණයක් තිබෙනවා. නමුත් මම එය ලිඛිතව ලබා දුන් නැති නිසා වෙන්න ඇති, ඔබතුමා එයට පිළිතුරු ලබා නොදුන්නේ. Fuel prices සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නයට මට පැහැදිලි පිළිතුරක් ලැබුණේ නැහැ. ඔබතුමා කැමැති නම් විතරක් ඒක කියන්න. නැත්නම්, -

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමනි, fuel prices විධියට ඊට කලින් මාසයේ මිල ගණන් තමයි ඉදිරියට එන්නේ. ඒ නිසා මැයි මාසය අවසාන වෙනකොට Ceylon Petroleum Corporation - CPC - එකට ගෙවීමට සිදුවෙන ඩොලර් ප්‍රමාණයත් මිලියන 500 ඉක්මවා තිබෙනවා. සාමාන්‍යයෙන් CPC එකට ගෙවන්න තිබුණේ ඩොලර් මිලියන 100ක, 150ක වාගේ ප්‍රමාණයක්. ගරු මන්ත්‍රීතුමනි, මම පිළිතුරේදී කලින් සඳහන් කළා, ඉන්ධන මිල සියයට 50කට වැඩි ප්‍රමාණයකින් වැඩි වුණා කියලා. එහි බලපෑම ඇවිල්ලා තිබෙනවා. හැබැයි, එය ඉදිරියේදී සමනය වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. මොකද, ඩොලර් 280කට වාගේ තිබුණු පිරිපහදු කරපු ඩීසල් බැරලයක මිල දැන් පහළ බැස තිබෙනවා. ඒ වාගේම බොර තෙල් බැරලයක මිලත් පහළ බැස තිබෙනවා. ඒ වාගේම ලෝක පරිමාණයෙන් සංඥාවක් නිකුත් කර තිබෙනවා, සමහර සංවිධානවල රඳවා ගෙන තිබෙන ඉන්ධන සංචිත - reserves - එළියට එනවා කියලා. සමහර අවස්ථාවලදී මේවා වෙළෙඳ පොළ තුළ ව්‍යාපාරිකයින් වැඩි මිලට විකුණන්න උත්සාහ කරනවා. මේ තත්ත්වය ඉදිරියේදී සමනය වෙයි කියා අප බලාපොරොත්තු වනවා. කෙසේ වෙතත් අපි ඉදිරියේදී ඒ මිල ගණන්වල හැසිරීම අනුව අදාළ මිල වෙනස් කිරීම් කරනවාද, නැද්ද කියන තීන්දුව ඉදිරිපත් කරනවා. දැනට අතිරේක වෙනස් කිරීමකට තීන්දුවක් අරගෙන නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can get a further clarification.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දීපු පිළිතුර අනුව, ඩොලර් එක artificial ලෙස ඉහළ පහළ යෑමක් තමයි සිදු වන්නේ. ඒක ස්ථාවර වෙයි කියලා ඔබතුමා කියන දේ මහ පොළොවේ යථාර්ථයක් වෙන්න ඕනෑය කියලා මම ප්‍රාර්ථනා කරනවා, මේ රටේ ඉන්න සියලු ජනතාව වෙනුවෙන්. එහෙම වෙනවා නම් අපිත් සතුටුයි.

ගරු අමාත්‍යතුමනි, මේ පිළිබඳව කාරණා සහ යෝජනා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ආණ්ඩු පක්ෂයේ ඉන්න ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් පිළිගන්නවාද, නැද්ද කියන එක ඔබතුමන්ලාගේ වැඩක්. හැබැයි ඊයේ විපක්ෂ නායකතුමාත් සමඟ අපි සාකච්ඡා කළ වෙලාවේ මමත් කිව්වා, ඒ යෝජනා ඉදිරිපත් කරන්න සර්ව පාක්ෂික සමුළුවක් කැඳවන්න කියලා. ඒ යෝජනා පිළිගන්න එක, නොපිළිගන්න එක ඔබතුමන්ලාගේ කැමැත්තක්. ඒ යෝජනා කෙටි කාලීන සහ දිගු කාලීන යෝජනා වශයෙන් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, fuel සම්බන්ධ කාරණය මම මතු කළේ මේ නිසායි. ඩීසල් කියන්නේ ඇත්තටම මිනිස්සු කන්න බොන්න පාවිච්චි කරන දෙයක් නොවෙයි නේ. ඩීසල් මිලදී ගන්නේ අවශ්‍යතාව අනුව. ඩීසල්වලට රුපියල් 100කට අධික subsidy එකක් රජයෙන් ගෙවනවා. මෙහිදී රජයට යම් පාඩුවක් සිදු වනවා. මේ fuel import එකත් එක්ක තමයි ඩොලර් එක ඉහළ යෑම සහ රුපියල පහළ යෑම බැඳිලා තිබෙන්නේ. ඒ නිසා SLTB එක ඇතුළු transport sector එකට අවශ්‍ය ඩීසල්වලට වෙන ක්‍රමයකට සහනයක් දෙන්න පුළුවන් නම් හොඳයි. ඔබතුමාත් දන්නවා, දෙසැම්බර් සහ ජනවාරි මාසය අතර vehicle imports යම් ප්‍රමාණයකින් අඩු වුණු බව. රජයට විශාල ආදායමක් එන vehicle imports ඒ අනුව නතර කර තිබෙනවා. ඒ, ඩොලර් එළියට යනවා කියලායි. එතකොට ඒකෙන් රජයට එන ආදායමත් අඩු වනවා. LCs open කරපු සිද්ධියේදීත් 5,000ක් වැඩිපුර open කළා කියලා සැකයක් මතු වනවා. අස්වැසුම වැඩ පිළිවෙළේ basis එක ගත්තාමත්, මම පෞද්ගලිකව ඒකේ selection criteria එක පිළිගන්නේ නැති වුණාට, අඩුම තරමේ ඒ vulnerable communitiesවලට directly යන විධියට දෙන්නේ නැතුව දැන් අපි මේ ගෙවන fuel subsidy එකේ යම් වෙනසක් කරන්න ඕනෑ. Range Rover එකක් පාවිච්චි කරන මනුස්සයාටත් fuel subsidy එක දෙනවා, factoriesවල මුදල් උපයන අයටත් fuel subsidy එක දෙනවා, ඩීසල්වලට රජය විසින් ලබා දෙන සහනාධාරය හරහා. ඉතින් මේ fuel subsidy එක හරි, එහෙම නැත්නම් luxury goods import කරන එක හරි තාවකාලිකව නවත්වන්න ඕනෑ. දෙකෙන් එකක්, එක පැත්තක් තෝරාගන්න ඕනෑ.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු ඇමතිතුමනි, FDIs පිළිබඳව ඔබතුමා දන්නවා. ඒ පිළිබඳව මම ඔබතුමාත් එක්ක පෞද්ගලිකව දෙපාරක් කථා කර තිබෙනවා. ලංකාවේ Development Fund එකක් හදන්න අවම වශයෙන් ඩොලර් මිලියන 200ක ආයෝජනයක් ආරම්භයේදී අවශ්‍යයි. ඒ ගැන කථා කරලා අවුරුද්දක් වෙනවා. මන්ත්‍රීවරයෙකු වශයෙන් අපි ඉදිරිපත් කරන යෝජනාවක්වත් අපට ඉදිරියට අරගෙන යන්න බැරි තත්ත්වයක, පිටරට ආයෝජනයක් ගෙනැල්ලා කරගෙන යන්නේ කොහොමද? මම කියන්නේ ඔබතුමන්ලාගේ අඩුපාඩුවක් ගැන නොවෙයි. ඒ සම්බන්ධයෙන් යම් ක්‍රමවේදයක් අපි හදන්න ඕනෑය කියන එකයි මම කියන්නේ.

ඒ වාගේම තමයි, tourism. ඉරානයේ ප්‍රශ්නය අද ශ්‍රී ලංකාවේ tourismවලටත් බලපා තිබෙනවා. ඉන්දියාවේ ශෂී තරූර් මහත්මයාගේ statement එකක තිබෙනවා මම දැක්කා, යම් කාල සීමාවක් තුළ ඉන්දියාවෙන් මිලියන 3කට අධික touristsලා ප්‍රමාණයක් එළියට එනවා කියලා. නමුත්, ලංකාවෙන් එන්නේ සොච්චමක්. ඒ නිසා Iran-Israel යුද්ධයත් සමඟ ඒ රටවල touristsලා ලංකාව තුළට ගේන්න හරි යම් ක්‍රමවේදයක් සැදිය යුතුයි. මේවා ගැන අපි සාකච්ඡා කරමු. මේ, ස්ථාවර නියෝග 27 (2) හරහා අහන ප්‍රශ්නවලින් විතරක් සාකච්ඡා කළ යුතු එකක් නොවෙයි. අපි බලාපොරොත්තු වනවා, ඔබතුමන්ලාට සහයෝගය දීලා, ඔබතුමන්ලාත් එක්ක වැඩ කරලා මේ රට නැවත වාරයක් economic crisis එකකට නොයවන්න. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුදෙනාම එකතු කරගෙන වැඩ කරගෙන යන්න කියන එක තමයි මගේ ඉල්ලීම වන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, පළමුකොටම, විදේශ විනිමය ගැන, ඩොලරයේ ඉහළ යෑම ගැන මම සඳහන් කළේ නැහැ, කෘත්‍රිම - artificial - කියලා. මම කිව්වේ, නිශ්චිතයි කියලා. *[බාධා කිරීමක්]* මම ප්‍රශ්නය මතු කළේ speculations පිළිබඳව. ඊට ප්‍රතිචාර දක්වන්න යෑමේදී ඇති වන ගැටලුව තමයි මේක ඇතුළේ තිබෙන්නේ. ලංකාවේ තිබෙන්නේ ස්ථාවර විනිමය අනුපාතයක් නොවෙයි, විචල්‍ය විනිමය අනුපාතයක්. එය පාලනය කිරීම, පාලනය වීමට අදාළ මැදිහත්වීම් මම පිළිතුරේ සඳහන් කළා වාගේම ඉදිරියටත් අනුගමනය කරනවා.

ඒ වාගේම වාහන ආනයනය නතර කරයි කියන එක ගැනත් මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එහෙම කිසිදු තීන්දුවක් අරගෙන නැහැ, වාහන ආනයනය නතර කරන්නට. මේ විනිමය අනුපාතය පාලනය කර ගැනීම සඳහා පෞද්ගලික වාහන ඇණවුම් කිරීම මාස කිහිපයකට පමා කර ගැනීමක් පමණයි කර තිබෙන්නේ. ඒ නිසා නැවතත් මම අවධාරණය කරනවා, වාහන විතරක් නොවෙයි, කිසිදු ආකාරයක ආනයන සීමා කිරීමකට, ආර්ථිකය හැකිළීමට තීන්දුවක් ගන්නේ නැහැ කියන එක. තොරතුරු පාදකව මේ සඳහා මැදිහත්වීම තමයි කරන්න බලාපොරොත්තු වන්නේ. අර විදේශ ආයෝජන ඇතුළු කතන්දර වෙනමම අපි සාකච්ඡා කර බලමු. අපේ වුවමනාව තිබෙන්නේත් ආයෝජන කැන්දවීම සඳහා පුළුවන්තරම් දුරට ආර්ථිකය ප්‍රසාරණය කිරීමයි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන් ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය ගරු එරංග වීරරත්න මහතා, 2026.05.19වන දින ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම.

## රාජ්‍ය ආයතන සහ මූල්‍ය පද්ධති සයිබර් ප්‍රහාරවලින් ආරක්ෂා කිරීම: ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## அரச நிறுவனங்கள் மற்றும் நிதியியல் முறைமைகளை சைபர் தாக்குதல்களிலிருந்து பாதுகாத்தல்: டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சரினது கூற்று
## SAFEGUARDING PUBLIC INSTITUTIONS AND FINANCIAL SYSTEMS FROM CYBERATTACKS: STATEMENT BY DEPUTY MINISTER OF DIGITAL ECONOMY

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

Hon. Speaker, on behalf of the Minister of Digital Economy, I answer that Question raised by the Hon. Ravi Karunanayake and also thank him for raising this important matter.

The Government acknowledges that cybersecurity has now become a matter of national security and is also important for maintaining economic stability, public trust and digital sovereignty. With the acceleration of digitalizing public services - digital payments, identity systems, Cloud infrastructure and online citizen services - Sri Lanka's exposure to cybercrime has increased. However, the Government has moved from a reactive model to a coordinated national cyber resilience model through various policy developments, implementation of cybersecurity systems and guidelines and awareness-building.

1. Based on Sri Lanka CERT's Annual Reports and recent public communications, Sri Lanka has experienced a significant increase in reported cyber incidents in recent years. The following statistics represent cybersecurity-related incidents recorded through official reporting channels.

   - 2023

     Sri Lanka CERT recorded a total of 408 cybersecurity-related incidents, out of which 58 were financial scams, 98 non-financial scams, 61 phishing attacks, 31 ransomware incidents, 37 website

compromises, 11 server compromises, two malicious software-related incidents and 45 were DDoS and Cloud-related incidents. Additionally, there were approximately 56 other incidents.

• 2024

Sri Lanka CERT recorded a significant increase, with a total of 4,347 cybersecurity-related incidents reported, which comprised 2,241 financial scams, 926 non-financial scams, 79 phishing attacks, 22 ransomware incidents, 11 website compromises, four database compromises, six malware infections, four malicious software-related incidents and 42 data breaches. Furthermore, there were approximately 800 other incidents.

• 2025

Sri Lanka CERT recorded a total of 12,650 social media-related and cybersecurity-related incidents. Of those, the technically classified cybersecurity-related incidents recorded under CERT amounted to 3,284. The difference reflects the distinction between broad public complaints and technically classified cybersecurity incidents. The cybersecurity-related incidents included 1,817 financial scams, 523 non-financial scams, five ransomware incidents, 10 data breaches, seven website compromises, four malicious software-related incidents, two DDoS attacks and nine malware infections. Also, there were 551 other incidents.

At present, there is no mandatory legal requirement to report cybersecurity incidents to Sri Lank CERT, since the proposed Cybersecurity Law is still in the drafting stage. Therefore, cybersecurity incidents reported to Sri Lanka CERT may not fully reflect the total number of cyberattacks, attempted breaches, ransomware incidents, phishing attacks, hacking attempts and digital fraud incidents occurring within the country.

2. Cyber intrusions are unauthorized activities carried out by attackers to access, disrupt, damage or steal information from computer systems or networks. Over the past three years, several government institutions and public digital systems had faced cyber intrusions, attempted breaches, ransomware-related incidents, website compromises, phishing, email compromises and other cyber-related incidents. Three of the most significant public incidents include,

   i. The August 2023 ICTA Ransomware Attack: The LGC was compromised, encrypting the gov.lk email network. This resulted in the permanent loss of emails for approximately 5,000 government email addresses (including those of Cabinet of Ministers) between 17th May and 26th August, 2023 due to the lack of offline backup systems.

   ii. The cyberattack on the Department of Pensions was reported in 2025 and is considered one of the notable cybersecurity incidents affecting a government institution in the recent history.

   iii. The 2025/2026 Ministry of Finance, Planning and Economic Development/ ERD-related incident presently under investigation appears to involve suspected e -mail compromise or e-mail impersonation/ Business Email Compromise techniques that resulted in diversion of payment instructions. Final attribution, technical root cause and accountability should be stated subject to the findings of the official investigation, forensic review and the law enforcement process.

3. Presently, operational safeguards include the Cabinet-approved information and Cyber Security Policy for Government organizations, Sri Lanka CERT's incident response and advisory services, NCSOC-based national monitoring, threat intelligence, SIEM/EDR-related capabilities, vulnerability assessment services, website security guidelines, technical web application security guidelines and incident reporting mechanisms.

Sri Lanka CERT's technical guidelines outlined and approved by the Cabinet of Ministers for the Information and Cybersecurity Policy for Government Organizations also require Government web systems to be regularly patched, monitored, subjected to annual vulnerability assessments and supported by backup and restoration arrangements. This include regular scheduled backups, offsite storage, annual restoration testing, incident registers, evidence preservation and depending on criticality, alternative processing facilities at geographically separate locations.

In accordance with the Cabinet decision on Information and Cybersecurity Policy, all government organizations defined as "Public Authorities" under the Right to Information Act, No. 12 of 2016 are required to implement the Policy, while heads of organizations are required to allocate the necessary financial and operational resources for its implementation.

As part of strengthening national cyber defence capabilities, the National Cyber Security Operations Centre - NCSOC - had been established to provide centralized cyber threat monitoring, threat detection, incident response coordination and security event analysis at the national level. The Cabinet has further directed 37 critical government institutions to obtain services from the NCSOC to improve the cyber resilience of critical government infrastructure. With the support of funding from the Asian Development Bank, the number of institutions connected to the NCSOC is expected to be increased further.

[ගරු එරංග වීරරත්න මහතා]

Furthermore, in January, 2026, Sri Lanka CERT procured advanced cybersecurity monitoring and threat intelligence solutions to strengthen national cyber threat detection capabilities. Those solutions support deep and dark web monitoring, attack surface monitoring, vulnerability identification and cyber threat intelligence analysis, covering approximately 150 government organizations.

4. According to Sri Lanka's Government Digital Blueprint and national digital transformation initiatives, there is a clear requirement to modernize and strengthen the country's digital infrastructure across all government institutions. The continued use of outdated legacy systems has increased exposure to cybersecurity threats such as financial frauds, theft of identity and so on. Many of these legacy systems no longer receive vendor security updates or patches, which significantly increases their vulnerability to modern cyberattacks.

In line with the Government Digital Blueprint, the Government has emphasized the need to develop secure, scalable and interoperable digital infrastructure that supports efficient public service delivery while ensuring strong cybersecurity controls. Accordingly, institutions are expected to migrate from legacy platforms to modern, secure systems and adopt standardized cyber security frameworks to reduce risk and improve resilience across the public sector digital ecosystems.

5. Annual cybersecurity audits, vulnerability assessments and risk evaluations are required for critical systems and government web applications under the Cabinet-approved policy framework and Sri Lanka CERT technical guidelines. In particular, government web applications are required to undergo vulnerability assessments, at least, annually and after major functional changes. A consolidated compliance status of all institutions is being compiled through Sri Lanka CERT, the relevant Line Ministries and the National Audit Office. Where institutions have not completed the required assessments, they will be prioritized for NCSOC onboarding, vulnerability assessment and compliance monitoring.

6. Accountability operates at multiple levels. The head of institution is responsible for ensuring implementation of the Cabinet-approved cybersecurity policy. The Chief Innovation Officer, Director IT, Information Security Officer or an equivalent designated officer is responsible for operational implementation, incident reporting, access control, backup, patching and compliance actions. Sri Lanka CERT provides technical guidance, incident response support and other national coordination. Where any negligence, fraud, unauthorized access, data protection violation or financial misconduct is suspected, the matter must be referred to the relevant disciplinary audit, law enforcement, financial crime and data protection authorities.

7. As per the Cabinet-approved Information and Cybersecurity Policy for Government Organizations, all government institutions are advised to promptly report cybersecurity incidents to SLCERT to facilitate coordinated incident response. However, there is currently no mandatory legal obligation requiring organizations to report cybersecurity incidents to SLCERT.

That is why we are now in the process of drafting the Cybersecurity Law to establish a Cybersecurity Regulatory Authority to mandate the implementation and reporting of all cybersecurity-related incidents.

In addition, incidents involving financial cybercrimes, fraud and related criminal activities are generally reported to the Computer Crimes Investigation Division or if it is related to the financial sector, it should primarily be reported to FINCSIRT operating under the Central Bank. Therefore, information relating to financial losses and operational impacts may be distributed across multiple agencies and reporting mechanisms.

That is why we are introducing this overarching regulatory law to establish the Cybersecurity Regulatory Authority so that all the incidents would be reported to a single entity.

8. The Government of Sri Lanka is expected to implement several urgent coordinated measures to strengthen national resilience against future cyber warfare, cyber threats and organized cybercrime. Those measures include the following, which I will briefly refer to:

i. Mandatory NCSOC onboarding for critical institutions starting with finance, identity, immigration, inland revenue, customs, health, police, transport, social protection and payment-related systems:

ii. Enhancement of Threat Hunting and Malware Analysis Capabilities:

iii. Priority Implementation of the Information and Cybersecurity Policy:

iv. Strengthening Cybersecurity Awareness and Capacity-building:

v. Audit and Compliance Monitoring:

vi. Allocation of Dedicated Cybersecurity Resources:

vii. Strengthening the Legal and Regulatory Framework:

viii. The National Cybersecurity Strategy: (2025 -2029)

ix. Signing the United Nations Convention against Cybercrime (2025)

The Government of Sri Lanka had signed the United Nations Convention against Cybercrime in October, 2025 in Hanoi, reinforcing its commitment to strengthening global cooperation on cybercrime matters. Steps are now being initiated to conduct a comprehensive gap analysis to support the ratification process.

x. Improve other technical measures such as,

a. Mandatory Multi-Factor Authentication - MFA - for all government email and privileged accounts, especially finance/ payment workflows.

b. Payment verification protocol for foreign and high-value payments, including out-of-band confirmation, maker-checker approval, beneficiary change control and bank callback verification.

c. Backup hardening, including immutable/offline backups and annual restoration drills.

d. Legacy system risk register with priority replacement or compensating controls.

e. Compulsory annual vulnerability assessment/penetration testing for public- facing and critical systems.

f. Incident reporting SLA, for example critical incidents to be reported to CERT/NCSOC within a fixed number of hours.

g. Cybersecurity clauses in all ICT procurements, including secure coding, logging, audit trails, MFA, vulnerability disclosure, patching SLA, backup, DR and PDPA compliance.

h. Legal strengthening, including cybersecurity legislation and clearer institutional mandate for CERT/ NCSOC.

i. Public awareness-building, because the 2025 spike in complaints shows scams and social media-based fraud are now a mass public risk.

Sir, I would like to **table*** the detailed answer to question No. 8.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

These combined measures are expected to significantly strengthen Sri Lanka's national cyber resilience, enhance the protection of critical information infrastructure and reduce the risks posed by cyber warfare, cyber espionage, ransomware and organized cybercrime.

Thank you.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I thank the Hon. Deputy Minister for giving a very comprehensive Answer. My cybersecurity knowledge is at infancy state compared to your knowledge, Hon. Deputy Minister. But still, on behalf of the country, there is a necessity to check on certain matters that are happening. Theoretically, you did explain, covering certain areas. And, I asked this Question on the 23rd of October, 2025 because there was an apparent cyber threat at that time.

Firstly, I am astonished that there is no legal base to take any legal action on matters relating to cybercrime and cyber attacks. But, there must be a general law which could be taken into consideration when a breach of law takes place. So, I am sure that there must be some law covering these malpractices that are going on, even though there is no specific law which covers cybercrimes. Also, unlike under the traditional accounting system, there is no audit trail left behind in manual form. So, that makes it much more difficult for things to be tracked. In auditing the annual accounts of government institutions and others, how does the Auditor-General go into the cybercrimes that are happening? They are still in the dotage doing manual auditing. And, that process has not gone into further, which is certainly a very concerning area because there is a huge digital gap between what they are performing now and what they are expected to perform in the world.

Hon. Deputy Minister, The UN Global Dialogue on Artificial Intelligence Governance is scheduled for 06 and 07th July, 2026. I hope you or some one from your Ministry would attend that session because I am made to understand that this is the first time an international arm is looking into digital frauds that are going on and there are a lot of cyber attacks taking place in the world. So, I am sure you would look into that, Hon. Deputy Minister.

In your Answer, you did mention about three specific cyber attacks. One was in 2023. Then, the cyber attack on the Ministry of Finance happened just about two months ago. How do you basically reconcile what has been revealed and what has not been revealed? At the moment, it has been revealed is that about Rs. 80 billion had been siphoned, hacked or whacked, whatever the terminology that is used for that. How do you assess what has not been reported? Now, it is also said that US Dollars 600,000 had been paid to US Postal Service and that there are some other incidents involving French and Australian documents et cetera. So, I would appreciate if you would brief the House.

[ගරු රවී කරුණානායක මහතා]

The most important thing is the financial system, Sir. The NDB has basically got attacked. We still do not know what had happened. It is said that it is an internal attack on the general ledger. Then, out of the 30 banks in the country, three big banks, which have over three trillion rupees in asset reserves, have got attacked. The Digital Manager of one bank had gone to Negombo and reported that there had been a cyber attack on almost Rs. 900 million of their assets.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, අපට ශෝක යෝජනා පිළිබඳ කථා කරන්න තිබෙනවා. So, please be brief.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
This is an important matter.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can shorten your clarification. Now, you have already taken three minutes.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I know that you allow me to ask only one question, Sir and it is a very important matter.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can seek only one clarification. Now, you have taken almost three minutes.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Otherwise, we will have to express the condolence of the country over cybercrimes.

So, Sir, there had been two accounts of attacks on two commercial banks. One is, the NDB and the other is another commercial bank. I would not name it because that bank has not revealed it to the public as yet.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now, you can seek your clarification.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
And the third one relates to the Central Bank. So, please look into that.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now, I will have to stop you.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the interference -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That interference is because you have already taken four minutes.

Hon. Deputy Minister, you can clarify.- *[Interruption.]* No.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Hon. Speaker, currently there is no legal framework in the country which mandates the reporting of cyber attacks on government institutions relating to the financial law and other related matters. Currently, it is under the purview of that particular institution or it is their discretion whether to report it or not. That is why we are bringing in - *[Interruption.]* That is why a new legal framework - the Cyber Security Bill of Sri Lanka - is currently being drafted to form the National Cyber Security Regulatory Authority, which would mandate what sort of reporting should be made on such crimes and what sort of cybersecurity guidelines should be followed. So, the Bill would mandate all that. Thereafter, we would be able to enforce that.

Currently, if there are any cybersecurity incidents at any particular institution, it is on their own that they will have to report it to SLCERT to get their assistance to do the investigations. Thereafter, if there had been any crime, then, they would report it to the Computer Crimes Investigation Division of the CID for further investigations. So, again, I would say that, currently, it is not mandatory to report such incidents. And, the new Bill that is being drafted would resolve the issues that are currently there in the legal system. So, we are hopeful that in the course of the year, we would be able to establish the National Cyber Security Regulatory Authority.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු එස්.සී. මුතුකුමාරණ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු වි. කනගසබෙයි මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා.

## ශෝක ප්‍රකාශ: ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා, ගරු එස්.සී. මුතුකුමාරණ මහතා, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මහතා, ගරු නන්දන ගුණතිලක මහතා, ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මහතා සහ ගරු ටී. කනගසබෙයි මහතා

அனுதாபத் தீர்மானங்கள்: மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண, மாண்புமிகு எஸ்.சீ. முதுகுமாரண, மாண்புமிகு சந்திரதாச கலப்பத்தி, மாண்புமிகு நந்தன குணதிலக, மாண்புமிகு ஜனக் மஹேந்திர அதிகாரி மற்றும் மாண்புமிகு ரீ. கனகசபை

VOTES OF CONDOLENCE: HON. (PROF.) TISSA VITARANA, HON. S. C. MUTHUKUMARANA, HON. CHANDRADASA GALAPPATHTHI, HON. NANDANA GUNATHILAKE, HON. JANAK MAHENDRA ADHIKARI AND HON. T. KANAGASABAI

[පූ.භා. 11.12]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සේවය කරන ලද ගරු මන්ත්‍රීවරුන් හයදෙනෙකුගේ අභාවය සම්බන්ධයෙන් වූ ශෝක යෝජනා අද දින මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ලබනවා. මේ අවස්ථාවට සහභාගි වී සිටින එතුමන්ලාගේ පවුල්වල සියලු ඥාතීන් අපි ඉතාම ගරුත්වයෙන් ඔබතුමා සහ පාර්ලිමේන්තුව වෙනුවෙන් පිළිගනු ලබනවා.

ගරු කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් 2004 වර්ෂයේදී පළමුවරට ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පිවිසුණු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මුලින්ම මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා ඉංජිනේරුවරයෙකු වූ පීරිස් විතාරණ මැතිතුමාට සහ මැගී පෙරේරා මැතිනියට දාව 1934 වසරේදී නුවරඑළියේදී ජන්ම ලාභය ලැබුවා.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් සිය පාසල් අධ්‍යාපනය හැදෑරූ එතුමා, 1959දී ලංකා විශ්වවිද්‍යාලයෙන් MBBS උපාධියද, 1965දී ලංකා විශ්වවිද්‍යාලයෙන් සායනික වෛද්‍ය විද්‍යාව පිළිබඳ MD උපාධියද, 1968දී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් බැක්ටීරියා විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවද, 1971 වර්ෂයේදී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් වයිරස් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියද ලබා වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ වියතකු බවට පත් වූවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු දෙස් විදෙස් ආයතන ගණනාවක සේවය කළ එතුමා විද්‍යාජෝති, විශ්ව ප්‍රසාදිනී ඇතුළු දේශීය හා විදේශීය සම්මාන ගණනාවකින් පිදුම් ලැබූ විද්වතෙකු වූවා.

අභාවප්‍රාප්ත ගරු මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා 1974 වර්ෂයේදී ලංකා සමසමාජ පක්ෂයට සම්බන්ධ වෙමින් දේශපාලනයට පිවිසි අතර, පසුව එම පක්ෂයේ නායකත්වයටද පත්වූවා. 2004දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පිවිසුනු එතුමා, 2004 සිට 2015 දක්වා වූ කාලවකවානුව තුළ විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය හා විද්‍යාත්මක කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර හොබවනු ලැබුවා. ඉන්පසු 2017දී උතුරු මැද පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ලෙස ද පත් වුණා. කාමිණි මිද්දෙනිය විතාරණ මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවන් දෙදෙනෙකුගේ සහ එක් දියණියකගේ දයාබර පියෙකි.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 15ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා, අවුරුදු 91ක් ආයු වළඳා 2026 පෙබරවාරි මස 13 දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමාට එතුමා ප්‍රාර්ථනා කළ පරිදි නිවන්සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, පෞද්ගලික සටහනක් එකතු කරමින්, එතුමා දිගු කාලයක් තිස්සේ කියුබාවට එරෙහි අමෙරිකානු සම්බාධක වෙනුවෙන් හඬ නඟපු ක්‍රියාධරයෙකු ලෙසද මේ වෙලාවේදී සිහිපත් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊළඟට මා එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් 2010 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාවැව ආසනයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

සරත් චන්ද්‍රසිරි ප්‍රැන්සිස් අප්පුහාමි මැතිතුමාට සහ තෙන්නකෝන් මුදියන්සේලාගේ බණ්ඩාර මැණිකා මැතිනියට දාව 1953 වසරේ කැකිරාවේදී ජන්ම ලාභය ලැබූ ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා, කාගම යාය නවය විදුහලෙන් සහ අනුරාධපුර මධ්‍ය විද්‍යාලයෙන් සිය අධ්‍යාපන කටයුතු හැදෑරුවා.

ගරු මුතුකුමාරණ මහතා 1977 වර්ෂයේදී දේශපාලනයට පිවිසි අතර, 1999දී උතුරු මැද පළාත් සභාවට තේරී පත්වුණා. 2010දී කලාවැව ආසනය නියෝජනය කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා, 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ධුරය හෙබවූවා. 1974දී හේරත් ඒකනායක මුදියන්සේලාගේ ලසදා මැණිකා මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවන් දෙදෙනෙකුගේ සහ එක් දියණියකගේ දයාබර පියෙක්.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 10ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා, අවුරුදු 72ක් ආයු වළඳා 2025 දෙසැම්බර් මස 17 දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමාට නිවන්සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 1989 වර්ෂයේදී දිගාමඩුල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මා ඊළඟට මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ඩැනීපාල ගලප්පත්ති මැතිතුමාට සහ එස්.එච්. ලුසිනෝනා මැතිනියට දාව චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා 1948 වසරේ දෙවුන්දරදී ජන්ම ලාභය ලැබුවා. එතුමා අම්පාර ඩී.එස්. සේනානායක මහා විද්‍යාලයෙන් සිය අධ්‍යාපන කටයුතු හැදෑරුවා.

චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා 1979 වර්ෂයේදී දේශපාලනයට පිවිසි අතර, එම වසරේ පැවැති අම්පාර පළමු නගර සභා මැතිවරණය ජයග්‍රහණය කරමින් එහි පළමු නගරාධිපති ලෙස තේරී පත්ව, 1989 තෙක් දෙවරක්ම නගරාධිපති ධුරය හෙබවූවා. 1989 වසරේදීම දිගාමඩුල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා 1989 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළා. ඉන් පසුව 2008දී පළාත් සභා මැතිවරණයෙන් ජය ලබා නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා ලෙස මිය යන තෙක්ම කටයුතු කළා.

1978දී දෝන මාලනී අල්විස් ජයසිංහ මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවන් තිදෙනෙකුගේ දයාබර පියෙක්. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 13ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා අවුරුදු 78ක් ආයු වළඳා 2026 පෙබරවාරි මස 13වන දින අප අතරින් සදහටම සමු ගත්තා.

අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාට එතුමා විශ්වාස කළ පරිදි නිවන් සුව ප්‍රාර්ථනය කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ හා දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් ප්‍රථම වතාවට 2000 වර්ෂයේදී කළුතර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තම දිස්ත්‍රික්කයට මෙන්ම රටට ද සේවයක් ඉටු කළ ගරු නන්දන ගුණතිලක මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මා මෙම අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මැස්ටියගේ දොන් සුමනපාල ගුණතිලක මැතිතුමාට සහ පල්ලෙවත්තගේ දෝන පුන්‍යාවතී මැතිනියට දාව එම්.ඩී. නන්දන ගුණතිලක මැතිතුමා 1962 වසරේ වාද්දුවේදී ජන්ම ලාභය ලැබුවා. පානදුර ශ්‍රී සුමංගල පිරිමි විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූ එතුමා උසස් අධ්‍යාපන කටයුතු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යාපීඨයට ඇතුළුව ඉන් පසුව දේශපාලනයට පිවිසියා.

එතුමා 1999දී ජනාධිපති ධුර අපේක්ෂකයෙකු ලෙස ද ඉදිරිපත් වුණා. 2000 වසරේ සිට සිව්වන, පස්වන හා හයවන පාර්ලිමේන්තු නියෝජනය කළ එතුමා, 2004 සිට 2010 දක්වා පැවැති එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ කෙටි කලකට සංචාරක අමාත්‍යවරයා ලෙසත්, පසුව වැඩබලන තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා ලෙසත් කටයුතු කරන ලද අතර, 2011 සිට 2023 දක්වා කාලය තුළ දෙවරක්ම පානදුර නගර සභාවේ නගරාධිපති ධුරය හොබවමින් දේශපාලනයේ නිරත වුණා. එතුමා අභාවප්‍රාප්ත වන විට එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායකවරයෙකු ලෙස ද කටයුතු කළා.

2000 වර්ෂයේදී කේ. ප්‍රියානි පෙරේරා මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවකුගේ දයාබර පියෙක්.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 9ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා, අවුරුදු 63ක් ආයු වළඳා 2026 ජනවාරි මස 18වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර දරුවා සහ ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 1989 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව ද මා මෙම අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

1977 වර්ෂයේ කැකිරාව ආසනය නියෝජනය කළ මහජන මන්ත්‍රීවරයෙකු වූ අධිකාරි මුදියන්සේලාගේ ජිනදාස මැතිතුමාට සහ නම්බුකාර ලියනගේ ලිලියන් පෙරේරා මැතිනියට දාව ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා 1965 වසරේ අනුරාධපුරයේදී ජන්ම ලාභය ලැබුවා. කැකිරාව ප්‍රාථමික විද්‍යාලයෙන්, කැකිරාව මධ්‍ය විද්‍යාලයෙන්, ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් සහ නාරම්මල මයුරපාද මධ්‍ය විද්‍යාලයෙන් සිය අධ්‍යාපන කටයුතු හැදෑරූ එතුමා, ඉන්පසුව දේශපාලනයට පිවිසියා.

1989 වර්ෂයේදී පළමුවරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වීමෙන් පසු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා, 1999 වසරේදී නැවත වරක් අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත්වූවා. ඊට අමතරව, 2012 වසරේදී, උතුරු මැද පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ එතුමා 1997 සහ 2018 වසරවලදී කැකිරාව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස ද කටයුතු කළා.

දිගු කලක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කැකිරාව ආසන සංවිධායක ලෙස කටයුතු කළ එතුමා, 1992 වසරේදී එම පක්ෂයේ තරුණ සංවිධානයේ භාණ්ඩාගාරික තනතුර ද හෙබවූවා.ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 6ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ජනතාවට සේවය කළ එතුමා, අවුරුදු 60ක් ආයු වළඳා 2025 දෙසැම්බර් මස 17වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාට එතුමා විශ්වාස කළ පරිදි නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂය නියෝජනය කරමින්, 2004 වර්ෂයේදී මඩකලපුව මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කනගසබෙයි තම්මන්පිල්ලෙයි මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මා මෙම අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරනවා.

තම්මන්පිල්ලෙයි මැතිතුමාට සහ තම්මන්පිල්ලෙයි වලයාපිල්ලෙයි මැතිනියට දාව කනගසබෙයි තම්මන්පිල්ලෙයි මැතිතුමා 1939දී මඩකලපුවේදී ජන්ම ලාභය ලැබුවා. කලුතාවලෙයි රාමක්‍රිෂ්ණා විද්‍යාලයෙන් සහ මඩකලපුවේ ශිවානන්ද ජාතික විදුහලෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ තම්මන්පිල්ලෙයි මැතිතුමා පේරාදෙණිය කුණ්ඩසාලේ කෘෂිකර්ම

පීඨයෙන් උසස් අධ්‍යාපනය හදාරා කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු ලෙස විවිධ තනතුරු දරමින් කෘෂිකර්ම ක්ෂේත්‍රය නඟා සිටුවීමට තම දායකත්වය දැක්වූවා.

2004 සිට 2010 දක්වා වූ කාල වකවානුවේ පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා තම ප්‍රදේශයේ අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, අධ්‍යාපන යටිතල පහසුකම් නඟා සිටුවීම සඳහාත්, සෞඛ්‍ය යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහාත් කැප වී සේවය කළා.

1969දී ශාන්තාගුණම් මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවන් තිදෙනෙකුගේ සහ එක් දියණියකගේ දයාබර පියෙක්. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 6ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා අවුරුදු 86ක් ආයු වළඳා 2025 සැප්තැම්බර් මස 19වන දින අප අතරින් සදහටම සමු ගත්තා.

අභාවප්‍රාප්ත කනගසබෙයි තම්මන්පිල්ලෙයි මැතිතුමාගේ ආගමික විශ්වාසයන්ට අනුව එතුමා අපේක්ෂා කළ තත්ත්වය අත් කර ගනිත්වායි අප ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Gayantha Karunathilleka.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.25]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින්, විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරමින්, විවිධ වකවානුවල මේ සභාව ශෝභාවත් කළ අභාවප්‍රාප්ත දේශපාලනඥයන් හයදෙනෙකු ගැන අපේ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ මම පළමුවෙන්ම කැමැතියි, මහාචාර්ය තිස්ස විතාරණ හිටපු ඇමතිතුමා ගැන යමක් කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ජීවන චරිතාපදානය දෙස බලන විට එතුමා මහා පුදුමාකාර කුසල ශක්තියක් ඇතිව උපන් කෙනෙකු ලෙස මම දකිනවා. අවුරුදු 91ක් වැනි දීර්ඝ ආයු වින්දනයක් කර එතුමා තමන්ගේ ජීවිතයේ හැම වකවානුවකම, හැම තිස්සේම කැපී පෙනෙන, සුවිශේෂී චරිතයක් බවට පත් වුණා. එතුමා ළමා විය ගත කරද්දීත්, තරුණ විය ගත කරද්දීත්, ජීවිතයේ සැඳෑ සමය ගත කරද්දීත් එතුමා සතු විවිධ කුසලතා කාටත් හොඳින් දැක ගන්න ලැබුණා. තමන් ශ්‍රී ලංකාව බිහි කරපු විශිෂ්ට ගණයේ බුද්ධිමතකු බව නිර්ලෝභීව ප්‍රකාශ කිරීමේ හැකියාව එතුමා අපට ලබා දුන්නා. ඒ බව අධ්‍යාපනයෙන්, ක්‍රීඩාවෙන්, පරිපාලනයෙන්, දේශපාලනයෙන් හැම විටම තිස්ස විතාරණ හිටපු ඇමතිතුමා සනාථ කළා.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබද්දී, එතුමා අධ්‍යාපනයට වාගේම ක්‍රීඩාවට ද විශේෂ දක්ෂතා දැක්වූ හැටි ඒ කාලයේ හැමෝම දැක්කා. එතුමා ඉස්කෝලේ යන කාලයේ හොඳ ක්‍රිකට් ක්‍රීඩකයෙක්. එතුමා හොකී ක්‍රීඩාවේත් නිරත වුණා, ඒ වාගේම රගර් ක්‍රීඩාවේත් නිරත වුණා. වෛද්‍යවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ තිස්ස විතාරණයන් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් වයිරස් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් පවා ලබා ගන්න සමත් වුණා.

කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ලෙසත් තම වෘත්තීය දැනුම හරහා අති විශාල සේවයක් එතුමා විසින් ඉෂ්ට කළා. එතුමා වෘත්තීයවේදියකු හැටියටත්, දේශපාලනඥයකු හැටියටත් එතුමාගේ දැනුමෙන් උපරිම සේවයක් ලබා දුන් කෙනෙක්. එතුමා කළ විශිෂ්ට විද්‍යාත්මක සේවය අගය කරමින් 2017 අවුරුද්දේ විද්‍යාජෝති සම්මානයෙන්ද තිස්ස විතාරණ මැතිතුමා පුදනු ලැබුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා සමසමාජ පක්ෂයේ ඉතාම ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස දේශපාලනයට ප්‍රවිෂ්ට වෙච්ච තිස්ස විතාරණ හිටපු ඇමතිතුමා මිය යනකොට එම පක්ෂයේ නායකයා ලෙසිනුත් කටයුතු කළා. පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වෙලා විද්‍යා හා තාක්ෂණ වැනි වැදගත් අමාත්‍යාංශ දරමින්, අවස්ථා කිහිපයකදීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දරමින්, විවිධ පාර්ලිමේන්තු කාරක සභාවල කටයුතු කරමින්, පරිණත, දැන උගත්, පළපුරුදු කෙනකු ලෙස එතුමාගේ සේවය මේ රටට උපරිමයෙන්ම ලබා දුන් හැටි අපි දැක්කා. අපි මේ සභාවේ දෙපැත්තක හිටියත් එතුමා වැනි පරිණත, නිහතමානී, පළපුරුදු දේශපාලනඥයෙක් අපටත් ඇසුරු කරන්නට භාග්‍ය ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ පසුබිම බැලුවොත්, ඉතා සම්භාවනීය දෙමව්පිය යුවළක් තමයි එතුමාට හිටියේ. එතුමා ඉතා සෙනෙහෙබර භාර්යාවක් ලැබුවා. ඒ වාගේම දැන උගත්, වටිනා දරුවන් තිදෙනෙකුගේ පියෙකු හැටියට එතුමා කටයුතු කළා. වටිනා සේවයක් ඉෂ්ට කරපු වෘත්තීයවේදියෙක් හා දේශපාලනඥයෙක් වෙච්ච තිස්ස විතාරණ අපේ හිටපු ඇමතිතුමාගේ අභාවය ගැන සාතිශය සංවේගය ඒ දරුවන් වෙත පුද කරන ලෙස ඉල්ලා සිටිමින්, එතුමාට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ කටයුතු කරපු, රටේ ප්‍රචලිත පුද්ගලයෙක් වෙච්ච අභාවප්‍රාප්ත නන්දන ගුණතිලක හිටපු මන්ත්‍රීතුමා ගැනත් ශෝකය පළ කරන වෙලාවේ අපි කැමැතියි, ඒ පවුලේ උදවියට අපේ සංවේගය පිරිනමන්න. නන්දන ගුණතිලක මැතිතුමා කියන්නේ පානදුරේ ශ්‍රී සුමංගල පිරිමි විද්‍යාලයෙන් බිහි වෙච්ච වටිනා පුද්ගලයෙක්. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයට ඇතුළත් වුණා. එතුමා ශිෂ්‍ය ව්‍යාපාරයෙන් තමයි දේශපාලනය ආරම්භ කළේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය කෙළවර කරනවාට වඩා එතුමාගේ අවධානය පක්ෂයේ කටයුතු කෙරෙහි යොමු කරලා පූර්ණ කාලීනව දේශපාලනයට යොමු වුණා. එතුමා අධ්‍යාපනයට වඩා දේශපාලනය ගැන හිතුවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එතුමා 2000 වසරේදී තමයි පාර්ලිමේන්තුවට ආවේ. එතුමා අපි බොහෝදෙනෙක් එක්ක එකට පාර්ලිමේන්තුවට ආපු හැටි මට මතකයි. එතුමා දස වසරක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ කාලය තුළ සංචාරක අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශවල ඇමතිකම් දැරුවා. පසුව එතුමා එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වුණාම පානදුර නගර සභාවේ නගරාධිපති ධුරය දරමින් ඉතා ගෞරවනීය නගරාධිපතිවරයකු හැටියට ක්‍රියා කළා. එතුමාට පුළුවන්කම ලැබුණා තමන්ගේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කරවීම සඳහා ලොකු කැපවීමක් කරන්න.

මට මතකයි, 1999දී ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා හැටියට පත් වුණේ එතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එයින් පෙන්නුම් කරනවා, පක්ෂය කෙරෙහි තිබුණු එතුමාගේ කැප වීම. ඒ වාගේම එතුමාගේ පක්ෂයෙන් එතුමාට එදා තිබුණු පිළිගැනීමත් ඒ තුළින් අපට පෙන්නුම් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා සතුව පුළුල් දැනුමක් තිබුණා. එතුමා යම් අදහසක් ප්‍රකාශ කරනකොට හැම තිස්සේම ඒ තුළ යම් හරයක් තිබුණා. ඒ වාගේම එතුමා සුවිශේෂ පෞරුෂයක් තිබුණු දේශපාලනඥයෙක්. එතුමා කථා කරනකොට නිතරම එතුමාගේ මුහුණේ හිනාවක් තිබුණා. ඒ වාගේ ප්‍රියමනාප පුද්ගලයකු හැටියට තමයි අපි එතුමා දැක්කේ. එතුමා දේශපාලනයේ පසුබෑම්වලටත්, ජයග්‍රහණවලටත් එක ලෙස ඔරොත්තු දුන්නු පුද්ගලයෙක්. වැටි වැටී නැඟිටීමේ ආත්ම ශක්තියක් තිබුණු කෙනෙක් තමයි අපි අද ශෝකය පළ කරන නන්දන ගුණතිලක මැතිතුමා. එතුමාගේ අභාවය ගැන ඒ පවුලේ සියලුදෙනා වෙත අපේ සංවේගය පළ කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිත් එක්ක එකට කටයුතු කරපු තවත් වටිනා මන්ත්‍රීවරයෙක් වන අභාවප්‍රාප්ත චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා. දකුණු පළාතේ මාතර, දෙවුන්දරදී තමයි එතුමා උපත ලැබුවේ. එතුමා ඉගෙන ගත්තේ අම්පාර ඩී.එස්. සේනානායක විද්‍යාලයෙන්. එතුමා අම්පාර විවිධ සේවා සමුපකාර සංගමයේ සභාපතිවරයා ලෙස දේශපාලන කටයුතු හා සමාජ කටයුතු ආරම්භ කළා. ඊට පස්සේ එතුමා අම්පාර නගරාධිපතිවරයා ලෙස දීර්ඝ කාලයක් කටයුතු කළා.

1989දී එක්සත් ජාතික පක්ෂයෙන් දිගාමඩුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එතුමා පාර්ලිමේන්තු වරම් හිමි කරගත්තා. ඊට පස්සේ එතුමා අවස්ථා කිහිපයකදී පාර්ලිමේන්තුවට ආවා. එතුමා මිය යනතුරුම නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා විධියට කටයුතු කරලා හොඳ නායකත්වයක් ලබා දුන්නා. එතුමා පළාත් සභාවෙන් විශාල වැඩ කොටසක් කළා. පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් වැඩ කළා. ඒ වාගේම එතුමා ප්‍රදේශයේ විහාරස්ථානවලට -පන්සල්වලට-, ආගමික සිද්ධස්ථානවල, ධර්මශාලා ගොඩනැඟිලි ඉදිකරන්න, දහම් පාසල් ගොඩනැඟිලි ඉදිකරන්න, ප්‍රවේශ මාර්ග ලබා දෙන්න ලොකු කාර්යභාරයක් ඉෂ්ට කළා.

එතුමා අවසන් කාලයේ අසනීපගතියෙන් පසු වෙද්දිත් පුළුවන් හැටියට දේශපාලන කටයුතුවල නිරත වුණා. එතුමා අපි සමඟ මේ සභාවේ කටයුතු කරද්දි බොහොම ළෙන්ගතුව කටයුතු කළා. අපි නොයෙක් අවස්ථාවලදීත් දේශපාලන කටයුතුවලදීත් ළඟින් ඇසුරු කළා. එතුමාගේ අභාවයෙන් සංවේගයට පත් වී සිටින ඒ මැතිනියටත්, එතුමාගේ දරුවන් තිදෙනාටත් අපේ සංවේගය පළ කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊළඟට කියන්න ඕනෑ, අභාවප්‍රාප්ත ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා ගැන. එතුමා පාසල් කිහිපයක ඉගෙන ගත්තා. විශේෂයෙන්ම කැකිරාව ප්‍රාථමික විද්‍යාලය, කැකිරාව මධ්‍ය විද්‍යාලය, නාරම්මල මයුරපාද මහා විද්‍යාලය කියන පාසල්වල විතරක් නොවෙයි, ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙනුත් එතුමා අධ්‍යාපනය ලැබුවා. ඒ වාගේම, එතුමා පක්ෂයේ තරුණ සංවිධානයෙන් දේශපාලනය පටන් ගත්තා. ඒ අනුව කැකිරාවේ ආසන සංවිධායකවරයෙකු ලෙසත් එතුමා කටයුතු කළා. ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා; පළාත් සභාව නියෝජනය කරලා; පාර්ලිමේන්තුව නියෝජනය කරපු, පුළුල් සමාජ ධාරිතාවක් තිබුණු පුද්ගලයෙක් තමයි ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා කියලා කියන්නේ. එතුමාගේ කෙටි ජීවිත කාලය තුළ ක්ෂේත්‍ර ගණනාවක්ම ස්පර්ශ කරපු කෙනෙකු හැටියට තමයි අපි එතුමාව දකින්නේ. ඒ නිසා ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අය වෙත අපගේ සංවේගය පළ කර සිටිනවා.

මේ පාර්ලිමේන්තුවේ අපිට ආශ්‍රය කරන්න ලැබුණු තවත් වැදගත් චරිතයක් තමයි, එස්.සී. මුතුකුමාරණ මැතිතුමා. එතුමා ගැමිකම හොඳට හඳුනන, ජනතා නියෝජිතයකු හැටියට හැම තිස්සේම පෙනී හිටපු පුද්ගලයෙක්. එතුමා කාගම යාය නවය මහා විද්‍යාලයෙනුත්, අනුරාධපුර මධ්‍ය විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලැබුවා. දේශපාලනයේ පහළම ස්ථරයෙන් තමන්ගේ දේශපාලන කටයුතු ආරම්භ කරපු එතුමා දේශපාලන ගමනේ පියවරෙන් පියවර ඉදිරියට ඇවිත් ප්‍රාදේශීය සභාවෙන්, පළාත් සභාවට තේරී පත් වුණා. ඉන් පසු එතුමා පළාත් සභාවේ ඇමති ධුර දරලා, පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා, පාර්ලිමේන්තුවේත් නියෝජ්‍ය ඇමති ධුර දැරුවා. එතුමා කලක් පාර්ලිමේන්තුවේ නොසිටියත්, නැවත පාර්ලිමේන්තුවට එන්න වාසනාව ලැබුවා.

ඒ විධියේ විශාල සේවයක් ඉෂ්ට කරපු, දේශපාලනයේදී පියවරෙන් පියවර ඉදිරියට ආපු චරිතයක් හැටියටයි අපි එතුමාව දකින්නේ. අපිත් එක්ක එකට කටයුතු කරපු කෙනෙක් හැටියට එස්.සී. මුතුකුමාරණ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් එම මැතිනිය වෙතත්, දුවණිය සහ පුතණුවන් දෙපල වෙතත් අපගේ සංවේගය පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අවසාන වශයෙන් අපි සංවේගය පළ කරන වටිනා චරිතය තමයි, ටී. කනගසබෙයි මැතිතුමා. එතුමා තමන්ගේ භාෂා ඥානය හොඳට ප්‍රදර්ශනය කරමින්, ඉතාම ලස්සනට ඔබතුමා සිටින මූලාසනයේ කටයුතු කරපු පුද්ගලයෙක්. එතුමා මඩකලපුවේ තමයි ඉපදුණේ. එතුමා සෞඛ්‍ය සමුළුවට අනුබද්ධව කටයුතු කරලා කෘෂිකර්මය පිළිබඳ රජයේ ඩිප්ලෝමාධාරියෙක් හැටියට විශාල සේවයක් කළා. ඒ වාගේම, එතුමා බොහොම විනයක් තිබුණු කෙනෙක්. එතුමා තමන්ගේ පක්ෂය තුළ කටයුතු කරද්දි වුණත් හැම තිස්සේම විනයට මුල් තැන දුන්නා. එතුමා දේශපාලනයට එනකොට, පාර්ලිමේන්තුවට තේරී පත් වෙනකොට "මම නිශ්චිත කාලයකට විතරයි මේ මන්ත්‍රීකම දරන්නේ" කියලා තමන්ගේ පක්ෂයට දැනුම් දුන්නා. එතුමා ඉතා ජනප්‍රිය චරිතයක්. පාර්ලිමේන්තුවට තේරී පත් වෙන හැම වෙලාවකම විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවක් එතුමා ලැබුවා. නමුත් එතුමා, එතුමාගේ ප්‍රතිපත්ති වෙනස් කළේ නැහැ. ඉදිරියටත් මන්ත්‍රීකම් දරන්න එතුමාට ඕනෑතරම් අවස්ථාව තිබුණා. නමුත් එතුමා කියපු වචනයට ගරු කරමින්, ඒ නිශ්චිත කාලය අවසන් වන විට වෙනත් අයට ඉදිරියට පැමිණීමට අවස්ථාව සලසා දෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වුණා.

එතුමාගේ මන්ත්‍රී ධුර කාලය තුළ කරපු සේවාවන් අතර කැපී පෙනෙන වැදගත්ම සේවාව තමයි, අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉටු කළ සේවය. මඩකලපුව දිස්ත්‍රික්කයෙන් විශ්වවිද්‍යාල වරම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වෙනවා දැකලා එතුමා සතුටු වුණා. ඒ වාගේම එතුමාට හැම තිස්සේම අනාගත පරපුර ගැන හිතලා තීන්දු-තීරණ ගන්න පුළුවන්කම තිබුණා. සෞඛ්‍ය යටිතල පහසුකම් දියුණු කරන්න; කලවංචිකුඩි රෝහල උසස් තත්ත්වයකට ගෙනැල්ලා එම රෝහල විශේෂඥ වෛද්‍ය ඒකක සහිත රෝහලක් බවට පත් කරන්න එතුමා ලොකු කැපවීමක් කළා. ශ්‍රී ලංකා නැඟෙනහිර

විශ්වවිද්‍යාලය තුළ වෛද්‍ය පීඨයක් ස්ථාපනය කරනකොට එතුමා ඒකට සුවිශේෂ දායකත්වයක් ලබා දුන්නා. කලවංචිකුඩි ප්‍රදේශයේ වෘත්තීය පුහුණු ආයතනයක් ස්ථාපනය කරද්දි වාගේම, මඩකලපුව උසස් තාක්ෂණ ආයතනය වෙනුවෙන් ඉඩමක් වෙන් කිරීමේ කටයුතුවලදීද කැප වෙලා වැඩ කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා.

එතුමා සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට වරදින්නේ නැතුව සහභාගි වුණා. එතුමා ඒවාට සහභාගි වෙලා තමන්ගේ පළාත වෙනුවෙන් යම් සේවාවක් කරගත්තා. ඒ හරහා මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා MRI scan යන්ත්‍රයක් ලබාගන්න එතුමා දක්ෂ වුණා. ඒ වාගේම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කරන කාලයේදීත් රටවල් ගණනාවක අධ්‍යයන සංචාරවල නිරත වෙලා ලබා ගත් දැනුම අපේ රටේ කෘෂිකර්මාන්තයේ දියුණුව වෙනුවෙන් ලබා දෙන්නටත් එතුමාට පුළුවන්කම ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අභාවප්‍රාප්ත ටී. කනගසබෙයි මැතිතුමාගේ ආගමට අනුව එතුමා බලාපොරොත්තු වන පරිදි එතුමාට **මෝක්ෂ සුවය** ප්‍රාර්ථනා කරමින්, එතුමා වෙනුවෙන් එතුමාගේ පවුලේ අය වෙත අපගේ සංවේගය පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශෝක යෝජනා සම්බන්ධයෙන් මගේ අදහස් පළ කිරීම මෙතැනින් නිම කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rauff Hakeem. Hon. Hakeem, the Floor is yours to express the condolences on the passing away of the Members of Parliament listed for today.

[11.39 a.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Speaker, being called upon to pay tribute to the listed past Members of the House, I would like to begin with one of my former Cabinet Colleagues and a fellow Party Leader in this Parliament, the Hon. (Prof.) Tissa Vitarana. In this House, he gave leadership to the Lanka Sama Samaja Party, which was part of the then People's Alliance as well as its successor coalitions, of which I, too, was a member several times.

The Lanka Sama Samaja Party is one of the oldest parties in Parliament. It has a pre-Independence history. It had celebrated leaders of the calibre of Dr. Colvin R. de Silva, Dr. N.M. Perera, his own uncle, as well as other members like Mr. Batty Weerakoon and Mr. Bernard Soysa, who was also a Member of Parliament for the Colombo District, several times representing the Colombo Central.

The Lanka Sama Samaja Party has had such a long history in this House. Though the left politics has seen many ups and downs, the Hon. (Prof.) Vitarana remained very forthright and committed to the ideals of his party and his anti-imperial attitude in this House would always be remembered. He took that fight even in the Cabinet against many policy decisions which seemed to favour the capitalist class.

I remember his contribution to some of the Committees in Parliament. While I served as the Chairman of the Public Accounts Committee, he was a Member. Then, subsequently, when he served as the Chairman of the Public Accounts Committee, I was a Member and he took his work so seriously and made sure that he brought a very conscientious approach to all decisions that were taken.

More than anything else, I would remember him as someone who stood for devolution of power for minorities. His served as the Chairman of the All Party Representative Committee, which was set up by the then President Mahinda Rajapaksa to resolve the ethnic conflict, and to date, its Report is considered one of the best reports that had been submitted on resolving the ethnic crisis. That report is referred to as the "Tissa Vitarana Report". His contribution to the deliberations of that Committee, to which my party, too, was a party, and several other All Party Conferences and Select Committees in Parliament would be very fondly remembered.

Also, being a medical professional and a scientist, his contribution had been unparalleled. He pioneered the establishment of the SLINTEC in the nanotechnology sector of this country while he was the Minister of Science and Technology.

He also made an immense contribution to the scientific sector in the country. At one time, he was the Director of the Medical Research Institute and being there, he looked into epidemics such as cholera and various other epidemics and had been involved in serious research, contributing immensely in that area.

As far as my community is concerned, he is fondly remembered for the forthright stand he took while several epidemiologists and virologists remained silent when our community was traumatized by a policy decision taken to cremate all the COVID-19 corpses - *janazahs* - of the Muslims against their religious faith. The Hon. (Prof.) Tissa Vitarana was one of those people who were very vocal. Though he was part of the then coalition in this House, he was very open with his comments and publicly criticised the Government's racist policy in deciding to cremate those Muslims who succumbed to the horrible COVID-19 pandemic. So, such was his contribution that we can go on talking about Hon. (Prof.) Tissa Vitarana, but since there are others to whom we have to pay tribute, I would stop at that, conveying my condolences to his family members.

Then, I will move on to the next Hon. Member. The late Hon. Chandradasa Galappaththi was a Member who came to this House when I entered Parliament way back in 1994, almost 32 years ago. We came to this House as freshers and since then, we had been friends.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

Having originally worked in the Gal Oya Project, which was initiated by the late Hon. D. S. Senanayake, he got into politics. He entered local government politics and became the first Chairman of the Ampara Urban Council. Thereafter, he contributed towards making the United National Party win the Ampara Electorate, which was unable to be won ever since it was created in 1960 upto 1977 as it was the bastion of the Sri Lanka Freedom Party. But, it was the late Hon. Chandradasa Galappaththi and the late Hon. P. Dayaratne who pioneered in making the United National Party win the Ampara Electorate. Since then, he had been a member continuously for several years, perhaps for 15 to 20 years, representing the Ampara District and I had the privilege of being elected for the Ampara District once, where he was my co-candidate. Then, he also served the provincial council system and we had the pleasure of having him as the Chairman of the Eastern Provincial Council while the member from my party was the Chief Minister. He had served the Ampara District with such a faithful dedication and I would convey my condolences to his wife and children.

Now, I would like to move on to two other Members, the Hon. S.C. Muthukumarana as well as the Hon. Janak Mahendra Adhikari, both of whom represented the Anuradhapura District. Both of them represented two elctorates in the Anuradhapura District, in which I have lived during my childhood. My late father was a principal in the Kalawewa Muslim Central College and also in the Horapola Muslim Vidyalaya. The Kalawewa Muslim Central College was in the Kalawewa Electorate and the Horapola Muslim Vidyalaya was in Kekirawa Electorate. Those two gentlemen lately represented both these electorates. I had been with them in this House and I had always mentioned it to them. Whenever we met, I always shared fond memories of my childhood with them in those two lovely Muslim villages, Kalawewa and Horapola. As a matter of fact, on the 06th of next month, the Horapola Muslim Vidyalaya is completing 75 years and they have invited me as a special guest. As I was there in the primary classes, the School Development Society has extended an invitation to me, and I would certainly remember those two gentlemen who had served in this House.

The Hon. Janak Mahendra Adhikari, when he got elected in 1989, was the youngest Member of Parliament in the SLFP formation at that time. Though he served only for one term, he was a very popular politician and served his people well, and so did the Hon. S.C. Muthukumarana. Sir, to both those Members' families, I extend my kind condolences.

இறுதியாக, 2004ஆம் ஆண்டு உறுப்பினராகத் தெரிவு செய்யப்பட்டு இந்தச் சபையில் நுழைந்த மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கனகசபை அவர்கள் குறித்தும் ஒருசில வார்த்தைகள் பேச வேண்டும். அவர் இலங்கைத் தமிழரசுக் கட்சியைப் பிரதிநிதித்துவப்படுத்தினார். 2002ஆம் ஆண்டு தமிழீழ விடுதலைப் புலிகள் இலங்கை அரசாங்கத்துடன் சமாதானப் பேச்சுவார்த்தைகளில் ஈடுபட்ட பொழுது, அதில் அரசாங்கக் குழுவின் உறுப்பினராக நானும் பங்குகொண்டிருந்தேன். ஈற்றிலே சமாதானப் பேச்சுவார்த்தை முடிவுறாதிருந்த நிலையில், தமிழீழ விடுதலைப் புலிகள் பல்வேறு கட்சிகளாகப் பிரிந்துநின்ற தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களை தமிழ்த் தேசியக் கூட்டமைப்பு - TNA - என்ற ஓர் அணிக்குள் ஒன்றாகச் சேர்த்து, சமாதானப் பேச்சு வார்த்தையில் தமிழர்களின் வகிபாகத்தை சரிவர பாராளு மன்றத்தில் பிரதிநிதித்துவப்படுத்துவதற்காக எடுத்த ஒரு முயற்சியின் ஓரங்கமாக கனகசபை அவர்களை ஒரு புதிய பாராளுமன்ற உறுப்பினராக 2004ஆம் ஆண்டு நாங்கள் இந்த அவையில் கண்டோம். அவருடைய அமைதியான சுபாவம், அதேநேரம் பொறுப்புணர்ச்சியுடன் தன்னுடைய மாவட்ட மக்களுக்காகச் செய்த சேவைகள் இன்றும் நினைவு கூரப்படுகின்றன. இச்சந்தர்ப்பத்தில் அவருடைய குடும்பத் தினருக்கும் என்னுடைய கட்சி சார்பில் அனுதாபங்களைத் தெரிவித்து, எனது இந்த உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Nihal Abeysinghe .

[පූ.භා. 11.52]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු මන්ත්‍රීවරුන් වන ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ, ගරු එස්.සී. මුතුකුමාරණ, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති, ගරු නන්දන ගුණතිලක, ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි සහ ගරු පී. කනගසබෙයි යන මැතිතුමන්ලාගේ අභාවය වෙනුවෙන් අද දිනයේ අපි ශෝකය ප්‍රකාශ කරනවා. මේ අවස්ථාවේදී මමත් පළමුවෙන්ම කැමැතියි, අභාවප්‍රාප්ත වූ මේ සියලු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්න. ඒ අනුව අපට ඇහුම්කන් දෙන එතුමන්ලාගේ ඥාතීන්, හිතවතුන්, සමීපතමයින්ට එතුමන්ලාගේ අභාවය පිළිබඳව අපේ ශෝකය පළ කර සිටිනවා.

මම හිතනවා, පෞද්ගලිකවම මම ඉතාම ළඟින් ඇසුරු කළ අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) උපාලි තිස්ස විතාරණ මැතිතුමා පිළිබඳ යමක් මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කර සිටීම මගේ වගකීමක් සහ යුතුකමක් කියලා. ගරු උපාලි තිස්ස විතාරණ මැතිතුමා කෘතහස්ත, කීර්තිමත් වෛද්‍යවරයෙක්. බැක්ටීරියා, වයිරස් රෝග පිළිබඳව පසුගිය දශක කිහිපය තුළ අපේ රටින් මතු වුණු විශේෂඥ වෛද්‍යවරයෙක්. ඒ වාගේම එතුමා වාමාංශික දේශපාලනඥයෙක්. ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගෙන් පසුව ලංකා සමසමාජ පක්ෂයේ නායකයා හැටියට එතුමා කටයුතු කළා. වසර 15කට වැඩි කාලයක් එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා ලෙස එතුමා වාර කිහිපයක් - 2004-2010, 2010-2015 දක්වා කාල සීමාවන්හි - කටයුතු කළා. එතුමා අපේ රටේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහාත්, ඊට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම සඳහාත් වෙහෙස වුණු අමාත්‍යවරයෙකු හැටියට නම් කරන්න පුළුවන්. ඒ වාගේම එතුමා 2019-2020 වැනි කෙටි කාල සීමාවක් තුළ උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවරයා ලෙසත් සේවය කළා.

එතුමා උපත ලැබුවේ 1934 අගෝස්තු 30වන දා මහනුවරදීයි. එතුමා අවුරුදු 91ක් ආයු වළඳා 2026 පෙබරවාරි 13වන දා අභාවයට පත් වුණා. එතුමාගේ පියා පීරිස් විතාරණ, රජයේ වැඩ

දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙක්. එතුමාගේ මව මැගී පෙරේරා, ආචාර්ය එන්.එම්. පෙරේරා මහතාගේ සහෝදරියයි. එතුමා විවාහ වුණේ කාමිණී මීද්දෙණිය විතාරණ මහත්මිය සමඟයි. එතුමා පුතණුවන් දෙදෙනෙකුගේ සහ එක් දියණියකගේ දයාබර පියතුමෙක්. එතුමා පාසල් අධ්‍යාපනය ලැබුවේ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන්. එතුමා පාසල් ජීවිතයේදී ඉතාම දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක්. එතුමා පාසල් ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළා. 1959දී එතුමා කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් MBBS උපාධිය ලැබුවා. ඒ වාගේම එතුමා විශ්වවිද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමත් නියෝජනය කළා. විශ්වවිද්‍යාලයේ සිටියදී එතුමා 1957, 1958 වසරවලදී පළමු පෙළ සරා ක්‍රිකට් තරගාවලියටත් සහභාගි වුණා.

එතුමා 1959 සිට 1964 දක්වා කොළඹ මහ රෝහලේ වෛද්‍යවරයෙක් හැටියට සේවය කළා. 1965දී Bacteriology සඳහා ඩිප්ලෝමාවක් එතුමා London School of Hygiene and Tropical Medicine වෙතින් ලබා ගත්තා. ඒ වාගේම 1968 වසර වනවිට එතුමා University of London වෙතින් PhD උපාධියක් Virology සඳහා ලබා ගත්තා. එතුමා Bacteria and Virology පිළිබඳව මේ රටේ පහළ වුණු දක්ෂ විද්‍යාඥයෙක්. 1972දී එතුමා වෛද්‍ය පර්යේෂණ ආයතනයට ඇතුළු වුණා. 1983 - 1994 කාලයේදී එතුමා වයිරස් පිළිබඳව පරීක්ෂණ කරන දෙපාර්තමේන්තුවේ - Virology Department එකේ - ප්‍රධානියා බවට පත් වුණා. ඒ වාගේම එම කාල සීමාව තුළ එතුමා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ බවට පත් වුණා විතරක් නොවෙයි, Japan International Cooperation Agency - JICA - එකේ ආධාර යටතේ වෛද්‍ය පර්යේෂණ ආයතනයට නව ගොඩනැඟිල්ලක් ලබා දීමටත් කටයුතු කළා. එමෙන්ම වෛද්‍ය පර්යේෂණ ආයතනය නවීකරණය කරන්නත් එතුමා මැදිහත් වුණා. අද පවතින ඒ නවීකරණය වූ වෛද්‍ය පර්යේෂණ ආයතනය එතුමාගේ මහන්සියෙන් ගොඩනැඟුණු ආයතනයක්.

1980 ගණන්වල එතුමා Virology පිළිබඳව විශේෂඥ වෛද්‍යවරයෙක් හැටියට Edinburgh City Hospital එකේ Regional Virus Laboratory එකේ සේවය කළා. ඒ වාගේම 1991 -1993 කාල සීමාවේදී එතුමා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්වල පිහිටි Victorian Infectious Disease Reference Laboratory එකේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස සේවය කළා. විශ්‍රාම යාමෙන් පසු එතුමා 1995 සිට 2000 දක්වා කාලය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්ෂුද්‍ර ජීව විද්‍යාව - Microbiology - පිළිබඳ මහාචාර්යවරයා හැටියට කටයුතු කරමින් ඒ ඒකකයේ ආරම්භක මහාචාර්යවරයා බවට පත් වුණා. එතුමා අපට ඇසුරු කරන්න ලැබුණු, අපේ කාලයේ අද්විතීය විද්වතෙක්; චරිතයක්.

එතුමා වසර 15කට වඩා පාර්ලිමේන්තුව නියෝජනය කළ සහ දශක 6කට වැඩි කාලයක් ජීව විද්‍යාත්මක පර්යේෂණ, මහජන සෞඛ්‍ය, උසස් අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණයට අදාළ ජාතික ප්‍රතිපත්ති, නවෝත්පාදනය, ආණ්ඩුකරණය පිළිබඳ දැනුම රටේ සංවර්ධනයට යොදා ගැනීමට දායක වූ, ජාතික සමගිය වෙනුවෙන් පෙනී සිටි විද්වතෙක්. ඒ වාගේම විද්‍යාව, රසායනාගාර සහ පර්යේෂණ පත්‍රිකා ඉක්මවා රටේ සාමාන්‍ය ජනයා වෙත ඒවා ගෙන යාමට මූලික වූ මානව සංවර්ධනය සඳහා දේශපාලනය භාවිත කළ විද්වතෙක්.

පරම්පරා කිහිපයක විද්‍යාව හදාරන්නන්ට, වෛද්‍යවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට ගුරුවරයෙක්, උපදේශකයෙක් සහ බුද්ධිමය මහ පෙන්වන්නෙක් හැටියට අපට එතුමා මතකයේ තිබෙනවා. එතුමා අපේ රටේ වෛද්‍ය රසායනාගාර සේවාව, බෝ වන රෝග ආවේක්ෂණය සහ අපේ රටේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා යටිතල පහසුකම් සැපයීමට පුරෝගාමී වූවෙක්. ඒ වාගේම එතුමා වෛද්‍යවරුන් සිය ගණනකට ඉගැන්වූ ගුරුවරයෙක්. එතුමා අපි බොහෝ දෙනෙකුට උපදේශකයෙක් - mentor කෙනෙක් - වුණා.

මට තිස්ස විතාරණ මැතිතුමාව මුණ ගැහුණේ 1985දී. ලංකාවේ ප්‍රථම වරට 1985දී තමයි Japanese encephalitis රෝගය වසංගතයක් හැටියට වාර්තා වුණේ, අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල. මම ඒ කාල සීමාවේදී අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි. අපට ඒ කාල සීමාවේදී මඟ පෙන්වූයේ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂව සිටි අපේ මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමායි. 1986දී මා ප්‍රජා වෛද්‍යකරණය පිළිබඳව පශ්චාත් වෛද්‍ය විද්‍යාවේ විද්‍යාපති උපාධිය - MSc උපාධිය - හදාරන කොට මා තෝරා ගත් විෂයය වුණේ, අනුරාධපුරයේ ඒ කාල සීමාවේ පැවති Japanese encephalitis රෝගය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එතුමා මට ඒ අවස්ථාවේදී මඟ පෙන්වූවා. මගේ අධීක්ෂකයා - supervisor - වුණේ එතුමායි. අවුරුද්දක් විතර අපි ඉතාම සමීප ඇසුරක් පැවැත්වූවා.

මට මතකයි, ඒ කාල සීමාවේදී යටියන්තොටින් සහ නොයෙක් ප්‍රදේශවලින් ලංකා සමසමාජ දේශපාලන පක්ෂයට සම්බන්ධ විවිධ අය එතුමාගෙන් උපදෙස් ගන්නට සහ ප්‍රතිකාර ලබා ගන්නට එතුමා සොයාගෙන එතුමාගේ කාර්යාලයට ආපු ආකාරය.

ඒ වාගේම එතුමා වයිරස් සහ බැක්ටීරියා මඟින් පැතිරුණු බෝවන රෝග ගණනාවක රසායනාගාර පරීක්ෂණ සහ ආවේක්ෂණයට සුවිශේෂ දායකත්වයක් ලබා දුන්නා. වසූරිය, පෝලියෝ, diphtheria, pertussis, tetanus, rubella සහ Japanese encephalitis වැනි රෝගවල රසායනාගාර පරීක්ෂණවලදී එතුමා අපට සහ මේ රටට විශාල මඟ පෙන්වීමක්, දායකත්වයක් සැපයුවා. ඒ වාගේම වසූරිය, පෝලියෝ මෙරටින් තුරන් කිරීමටත්, Japanese encephalitis සහ measles මහජනයාට තවදුරටත් ගැටලුවක් නොවන ලෙස පාලනය කිරීමටත් එතුමා සෘජුවම මැදිහත් වුණා. Dengue hemorrhagic fever, hantavirus ආවේක්ෂණය ආරම්භ කළේත්, ඒවා මේ රට තුළ හඳුනා ගැනීමට සහ පාලනයට පුරෝගාමී වූයේත් එතුමායි.

1988දී වසංගත රෝග විද්‍යා අංශයේ මා සේවය කරමින් සිටියදී එතුමාගේ මඟ පෙන්වීමෙන් Japanese encephalitis රෝගය පාලනය සඳහා ජපන් රජයෙන් අපට ප්‍රදානයක් ලෙස ලැබුණු සීමිත එන්නත් ප්‍රමාණය ලබා දිය යුත්තේ කුමන වයස් කාණ්ඩයට දැයි හඳුනා ගැනීමට අපි රුධිර සාම්පල පරීක්ෂා කිරීම මඟින් සමීක්ෂණයක් සිදු කළා. මා අනුරාධපුර, පොළොන්නරුව, පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල රුධිර සාම්පල් එකතු කර වෛද්‍ය පර්යේෂණ ආයතනයට භාර දුන්නා. සමීක්ෂණයෙන් පසු ශ්‍රී ලංකාව තීරණය කළා, වයස අවුරුදු 10න් පහළ දරුවන්ට Japanese encephalitis එන්නත ලබා දිය යුතුයි කියලා. ලංකාව තමයි, ජපානය, චීනය සහ දකුණු කොරියාවට පසුව ආසියාවේ Japanese encephalitis රෝග පාලනයට එන්නත හඳුන්වා දුන්නේ. අනෙකුත් ආසියානු රටවල් අපව අනුගමනය කළා. කෙටි කලකින් අපි එම රෝගය පාලනය කළා.

එතුමා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සිටි කාල සීමාවේදී මා සේවය කළ වසංගත රෝග විද්‍යා අංශයේ නිලධාරින් සමඟ සහ අප සමඟ ඉතාම සමීපව කටයුතු කළා. මහජන සෞඛ්‍යයට අදාළ රාජ්‍ය ආයතන සියල්ලම ඒ කාල සීමාව තුළ ඉතාම සමීපව කණ්ඩායමක් හැටියට එකතු වෙලා මේ රටේ රෝග නිවාරණයට මැදිහත් වුණා. ඒ නිසා තමයි අපි ඒ තුළින් විශිෂ්ට ප්‍රතිඵල ලැබුවේ.

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

එතුමා කෘතහස්ත දේශපාලනඥයෙක්. ගරු තිස්ස විතාරණ මැතිතුමා ලංකා විශ්වවිද්‍යාලයේ සිටියදීම ලංකා සමසමාජ ව්‍යාපාරයේ දේශපාලනයට සම්බන්ධ වුණා. එංගලන්තයේ අධ්‍යාපනය ලැබීමෙන් පසු ලංකාවට පැමිණි එතුමා ලංකා සමසමාජ පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වුණා. එතුමා එම පක්ෂයේ දේශපාලන මණ්ඩල සභිකයෙකු ලෙස ක්‍රියා කළා. රාජ්‍ය සේවයේ විධායක තනතුරක් දැරූ නිසා එතුමා පක්ෂය තුළ පෙනී සිටියේ "තිස්ස පීරිස්" නමින්. පක්ෂය තුළ සෞඛ්‍ය අංශයේ කටයුතුවලදී ක්‍රියාකාරීව මැදිහත් වූ එතුමා බෝගල මිනිරන් පතලේ කම්කරුවන්ට ක්ෂය රෝගය පැතිරී ගිය වෙලාවේදී එය මර්දනය කිරීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් වුණා.

මහාචාර්ය කාලෝ ෆොන්සේකා, මහාචාර්ය සේනක බිබිලේ වැනි කීර්තිමත් වෛද්‍ය වෘත්තිකයින් සමඟ එක්ව අපේ රටේ ඖෂධ ප්‍රතිපත්තිය සකස් කිරීමට එතුමා මැදිහත් වුණා. වෛද්‍ය අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට එරෙහිව එතුමා ක්‍රියාකාරී මැදිහත් වීමක් කළා.

මෙල්බර්න්හි වික්ටෝරියා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරන විට එතුමාට එම විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු දිගටම එහි රැඳී සිටින ලෙස ඉල්ලීම් කළත්, "මා ලංකාවේ නිදහස් අධ්‍යාපනය ලැබූ කෙනෙක් බැවින් මගේ මව් රටට නැවත යා යුතුයි" කියා එතුමා නැවත මෙරටට පැමිණ පූර්ණ කාලීනව දේශපාලන ව්‍යාපාරයේ යෙදුණා. ලංකා සමසමාජ පක්ෂයේ නායකත්වයට පත් වූ එතුමා අමාත්‍ය ධුර ගණනාවක් හෙබවූවා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරද්දී ගමට විද්‍යාව හා තාක්ෂණය ගෙන යෑම සඳහා විදාතා මධ්‍යස්ථාන පිහිටුවීමට එතුමා පුරෝගාමී වුණා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා ලෙස එතුමා මූලිකව පිහිටු වූ වැදගත් ආයතන තමයි, Sri Lanka Institute of Nanotechnology, Sri Lanka Institute of Biotechnology සහ Sri Lanka Accreditation Board කියන ඒවා. මේවා මේ රටට තාක්ෂණය කැඳවීමට, කර්මාන්ත ආයතන සහ පෞද්ගලික අංශය සමඟ සම්බන්ධීකරණයට, නවෝත්පාදන වාණිජකරණයට ඉතාම වැදගත් කාර්යයක් කරනු ලබන සහ කළ හැකි ආයතන.

එතුමා විවිධ ජාත්‍යන්තර ආයතනවල උපදේශකවරයෙක් ලෙස විටින් විට සේවය කර ලංකාවට විශාල කීර්තියක් ලබා දුන්නා. එතුමා ලෝක සෞඛ්‍ය සංවිධානය, United Nations Educational, Scientific and Cultural Organization - UNESCO, South Asian Association for Regional Cooperation - SAARC, the World Academy of Sciences for the Advancement of Science in developing countries - TWAS - සහ UN Conference on Trade and Development - UNCTAD - කියන ආයතනවල උපදේශකවරයෙකු වශයෙන් වරින්වර සේවය කරමින් මේ රටට විශාල කීර්තියක් ගෙන දුන්නා. ගරු තිස්ස විතාරණ මැතිතුමාගේ අභාවය නිසා එතුමා දශක ගණනාවක් මේ රටට කළ සේවය අහිමි වුණා. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ අයටත්, ඥාතීන්ටත්, හිතවතුන්ටත් අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

මේ තොරතුරු ලබා ගැනීමේදී එතුමාගේ පුත් රනිල් විතාරණ මහතා, ජාතික ජන බලවේගයේ විධායක කමිටු සාමාජික පියල් රාජකරුණා සහෝදරයා, මහාචාර්ය අනුජී ගමගේ මහත්මිය අපට උදවු කළා. ඒ වාගේම මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය සකස් කළ සහ වෛද්‍ය ගීතානි ගලගොඩ මහත්මිය මට ලබා දුන් තොරතුරු මා මේ සඳහා පාවිච්චි කළා. ඒ සියලු දෙනාට මා ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන්, අද දින ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙන සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් එතුමන්ලාගේ පවුල්වල ඥාතීන්ට, හිතවතුන්ට නැවතත් ශෝකය ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

[අ.භා. 12.07]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමන්ලා හය දෙනෙකුගේ අභාවය සම්බන්ධයෙන් ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ මම කැමැතියි පළමුවෙන්ම අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා ගැන වචන ස්වල්පයක් කථා කරන්න.

1994දී එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන අවස්ථාවේ මටත් තරුණයෙකු හැටියට එතුමා සමඟ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. එතුමාට අම්පාර දිස්ත්‍රික්කයෙන් තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ. එතුමා දකුණේ ඉපදිලා දිගාමඩුල්ලට - අම්පාරට - ගිහින් දිගාමඩුල්ල ජනතාවට විශිෂ්ට සේවාවක් කරපු මහජන නියෝජිතයෙකු හැටියටයි අපි හඳුනාගෙන තිබෙන්නේ. එතුමාගේ භාර්යාව වන දෝන මාලනි අල්විස් ජයසිංහ මහත්මිය වෙත සහ දිල්රුක්ෂි, ප්‍රියදර්ශන, උදේෂ් සඳරුවන්, ධනුෂ්ක ටිරාන් යන දූ දරුවන් වෙත අපේ බලවත් ශෝකය ප්‍රකාශ කරන ගමන් විශේෂයෙන් මතක් කළ යුතු කාරණා ටිකක් තිබෙනවා.

ගරු චන්ද්‍රදාස මැතිතුමා දේශපාලනයට එන්නේ අම්පාර විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා හැටියට කටයුතු කරමින්. එතුමා 1960-70 දශකයේ අම්පාර දිස්ත්‍රික්කය තුළ එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කරන්න විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. 1979-89 කාල සීමාව තුළ අම්පාර නගර සභාවේ ප්‍රථම නගරාධිපතිවරයා හැටියට පත්වෙලා එතුමා අම්පාර නගරයට, අම්පාර ප්‍රදේශයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. පී. දයාරත්න මැතිතුමා 1977 වසරේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට, ඇමතිවරයෙක් හැටියටත් වැඩ කළ කාලයේ ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා එතුමාට විශිෂ්ට සහයෝගයක් ලබා දෙමින්, එතුමාගේ මඟ පෙන්වීම යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ - දිගාමඩුල්ලේ - ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළා. එතුමා නගරාධිපතිවරයා හැටියට හිටියත් මුළු දිස්ත්‍රික්කයේම වැඩකටයුතුවලට පී. දයාරත්න මැතිතුමා එක්ක සම්බන්ධ වෙමින් එතුමාට විශාල සහයෝගයක් ලබා දුන්න බව අපි දන්නා කාරණාවක්.

එතුමා 1989 වසරේ සිට 2001 දක්වා දිගාමඩුල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඉන්පසුව පාර්ලිමේන්තු මැතිවරණයෙන් එතුමා පරාජයට පත් වුණත් දේශපාලනය අතහැරියේ නැහැ. එතුමා අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් දිගටම වැඩකටයුතු කළා. නැඟෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියටත් කටයුතු කළා. මිය යන තෙක්ම නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරන්න එතුමාට අවස්ථාව ලැබුණා.

දකුණේ ඉපදිලා, දිගාමඩුල්ලට - අම්පාරට - ගිහිල්ලා, ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්, ගොවි ජනතාව වෙනුවෙන්, ඒ ප්‍රදේශය දියුණු වන කාල සීමාව තුළ ඒ යටිතල පහසුකම් ලබා දීම

සඳහා විශාල කාර්යභාරයක් ඉෂ්ට කළ මහජන නියෝජිතයෙක්, එතුමා. මොකද, 1977 කාලයේ දිගාමඩුල්ල ජනතාවට විදුලිය, මාර්ග පහසුකම් විශාල වශයෙන් තිබුණේ නැහැ. ඒවා ලබා දීම සඳහා විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු පුද්ගලයෙක් හැටියට අපට ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාව හඳුන්වන්න පුළුවන්. එතුමාගේ වියෝව අම්පාර දිස්ත්‍රික්කයේ සියලු දෙනාටම වාගේම අපටත් ශෝකයක්. එතුමාගේ භාර්යාව ඇතුළු දූ දරුවන් වෙත අපගේ ශෝකය නැවතත් ප්‍රකාශ කරන අතර, එය දන්වන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට මම කැමැතියි, අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මැතිතුමා ගැන කථා කරන්න. එතුමා පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා, ඊට පසුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙලා කෘෂිකර්ම අංශයෙන් අධ්‍යාපනය ලබා තිබෙනවා. එතුමා විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු හැටියට, ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණකාලීන දේශපාලනඥයෙකු ලෙස ක්‍රියා කර, වාමාංශික දේශපාලනය තුළ, එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය තුළ දිගු ගමනක් ආරම්භ කළ පුද්ගලයෙක්. ඒ වාගේම තමයි, එතුමාගේ කැපවීම තුළ ඉතාම අමාරු කාලයක -විශේෂයෙන් 1989න් පසු 1991, 1992, 1993 වැනි කාලවල - ජනතා විමුක්ති පෙරමුණට තිබුණු අවාසනාවන්ත තත්ත්වයත් එක්ක, ජනතා විමුක්ති පෙරමුණ නැවත ගොඩ නඟන්න විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු පුද්ගලයෙකු හැටියටයි අපි එතුමාව හඳුනාගෙන තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ ලේකම්වරයා හැටියට එම පක්ෂය නියෝජනය කරමින් 1999දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා, එම මැතිවරණයෙන් තුන්ලක්ෂ ගණනක් ඡන්ද අරගෙන තුන්වැනි ස්ථානයට එන්න එතුමාට හැකි වුණා. 2000 සිට 2010 වෙනකල් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, මන්ත්‍රීවරයෙකු හැටියටත්, ඇමතිවරයෙකු හැටියටත් එතුමා කටයුතු කර තිබෙනවා. ඉන්පසුව එතුමා එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා පානදුර නගර සභාවේ නගරාධිපතිවරයා හැටියට පානදුර ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉතාම කෘතහස්ත දේශපාලනඥයෙකු හැටියට වැඩකටයුතු කළා කියන එක අපි දන්නා කාරණාවක්. එතුමා හදිසියේ රෝගාතුර වෙලා ජීවිතක්ෂයට පත් වුණා. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ භාර්යාව, දූ දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

මේ අවස්ථාවේ මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා පිළිබඳව. එතුමා දේශපාලනයට එන්න ප්‍රථම තමන්ගේ අධ්‍යාපනය ඉතාම ඉහළ මට්ටමෙන් හදාරා තිබෙනවා. විශේෂයෙන් පාසල් අධ්‍යාපනයෙන් පසුව ලංකා විශ්වවිද්‍යාලයෙන් සහ ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා විද්‍යාඥයෙකු හැටියට අපේ රට වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු පුද්ගලයෙක් හැටියට තමයි අපි එතුමාව හඳුනා ගන්නේ. ඉන්පසුව එතුමා ලංකා සමසමාජ පක්ෂයට සම්බන්ධ වෙමින් දේශපාලනයට පිවිසියා. විශේෂයෙන්ම, එතුමාගේ මාමා තමයි එන්.එම්. පෙරේරා මැතිතුමා. ඒ ආභාසය තුළින් ලංකා සමසමාජ පක්ෂයේ දක්ෂිණාංශික දේශපාලනයට ඇවිල්ලා ක්‍රියාකාරී සාමාජිකයෙක් හැටියට එතුමා වැඩ කළා. එතුමා 1994දී බලයට පත් චන්ද්‍රිකා මැතිනියගේ රජයේ මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ ඇමතිවරයා හැටියටත් අපේ රට වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු පුද්ගලයෙක් හැටියට තමයි තිස්ස විතාරණ මැතිතුමාව අපි හඳුන්වන්නේ. එතුමාගේ වියෝව රටටම විශාල පාඩුවක්, ශෝකයක්. එතුමාගේ පවුලේ සියලු දෙනාටත් මේ අවස්ථාවේදී අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරපු අභාවප්‍රාප්ත ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා ගැන කථා කළොත්, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කර, 1991දී තලාව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ක්‍රියාකාරී දේශපාලනයට එකතු වුණා. 1993දී උතුරුමැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියටත් කටයුතු කළ එතුමා 2010දී පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඒ අවස්ථාවේදී නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියටත් එතුමා කටයුතු කළා. 2021දී නැවත වතාවක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා.

එතුමා රජරට ප්‍රදේශයට, විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු මන්ත්‍රීවරයෙකු හැටියට අපට හඳුන්වන්න පුළුවන්. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලු දෙනාටත් අපගේ බලවත් ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඊළඟට අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අපේ ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාව. එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින්, 1989දී කැකිරාව ආසනයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා ඉතාම ළා බාල තරුණයෙකු හැටියටයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින්, 1989දී මන්ත්‍රීවරයකු විධියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කළේ. ඒ වාගේම, එතුමාට අවස්ථාව ලැබුණා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධායකවරයෙකු හැටියට ඉදිරියට ඇවිත් වැඩ කටයුතු කරන්න. එතුමා ඉන් පසුවත් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් තමන්ගේ ප්‍රදේශයට, දිස්ත්‍රික්කයට දේශපාලන නායකත්වයක් ලබා දෙමින් විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. එතුමාගේ අභාවය වෙනුවෙනුත් අපගේ බලවත් ශෝකය එතුමාගේ පවුලේ සියලු දෙනාට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අවසාන වශයෙන්, මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු කනගසබෙයි මැතිතුමා පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. එතුමා මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් රාජ්‍ය සේවකයෙකු හැටියට දේශපාලනයට ආපු කෙනෙක්. එතුමා ඒ ප්‍රදේශයටත්, රටටත් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු මන්ත්‍රීවරයෙකු බවත් මතක් කරමින්, එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලු දෙනාටත් අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා. මෙම ශෝක ප්‍රකාශ යෝජනා අවස්ථාවේදී මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Gnanamuththu Srineshan. The time is yours to express your condolences.

[பி.ப. 12.18]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில், மறைந்த ஆறு முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் தொடர்பில் அனுதாபப் பிரேரணை இடம்பெறுகின்றது. முதலில், எமது கட்சியின் சார்பாக பாராளுமன்ற உறுப்பினராக இருந்த தம்மன்பிள்ளை கனகசபை ஐயா அவர்களின் வாழ்க்கைக் குறிப்புகள் பற்றி உரையாற்றலாமென நினைக்கின்றேன்.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

கனகசபை ஐயா அவர்கள் உண்மையிலேயே மனிதாபிமானமுள்ள ஓர் அரசியல்வாதியாக இருந்தார். இவருடைய தந்தையின் பெயர் தம்மன்பிள்ளை; தாயின் பெயர் பாலாயபிள்ளை. இவர் தனது சொந்த மைத்துனியான சாந்தகுணம் என்பவரையே கரம்பிடித்திருந்தார். கனகரத்தினமும் சந்தனப்பிள்ளையும் அவரது மனைவியின் பெற்றோர்களாவர். கனகசபை ஐயா அவர்களுக்கு யசோதரன், அகல்யா, வினோதரன், கிரிதரன் என நான்கு பிள்ளைகள் இருக்கிறார்கள். இவருக்கு சகோதர, சகோதரிகள் மொத்தம் எட்டு பேர் இருக்கிறார்கள். இவரே குடும்பத்தில் மூத்தவர். இவர் என்னோடு அதிகமாக, அன்பாக பழகுபவராகவும் இருந்தார். இவருடைய தம்பியாக இருக்கின்ற சுந்தரலிங்கம் ஆசிரியர் அவர்கள் எங்களோடு மிகவும் பவ்வியமாக பழகக்கூடியவர்.

குடும்பத்தில் மூத்த மகனாக இருந்த இவர், மிகவும் முக்கியமான பாத்திரத்தை ஏற்று, தன்னுடைய குடும்பத்துக்கு வழிகாட்டிய ஒரு கனவான் என்றுகூட கூறலாம். இவர் கனவான் ரகமான அரசியலைச் செய்தாரே ஒழிய, எந்தவொரு சந்தர்ப்பத்திலும் கீழ்த்தரமான, அசிங்கமான அரசியலைச் செய்யவில்லை. இவர் அரசியல்வாதியாக வருவதற்கு உண்மை யிலேயே அவர் காரணமாக இருக்கவில்லை. இவர் கடந்த காலத்தில் விவசாயத்துறை சார்ந்து பணியாற்றியவர். இறுதியாக மாகாண விவசாய பிரதிப் பணிப்பாளராக இருந்து தன்னுடைய அருமையான கடமையை மக்களுக்காகச் செய்தவர். சொந்த வாழ்க்கையில் ஒழுக்கசீலராக, விழுமியங் களைப் பின்பற்றுகின்ற ஒரு நல்ல மனிதராக இவர் இருந்தார். 2004ஆம் ஆண்டு தேர்தலில் இவர் தனது முதலாவது பிரசாரத்தை மேற்கொண்டபோது, நான் அதை காந்தி சதுக்கத்தில் கேட்டுக்கொண்டு இருந்தேன். அப்போது அவர், "ஏன் என்னை அரசியலுக்கு அழைத்தார்கள் என்று தெரியவில்லை. அவர்கள் என்னைத் தேடிவந்து இந்தத் தேர்தலில் வேட்பாளராக நிற்குமாறு கேட்டுக் கொண்டார்கள்" என்று குறிப்பிட்டிருந்தார். அப்படியென்றால், இவர் அரசியலுக்கு விரும்பி வரவில்லை. இவருடைய நல்ல பண்புகளை, ஒழுக்கசீலத்தை பார்த்தவர்கள், இப்படிப்பட்ட ஒரு மனிதரைத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் ஊடாகக் கொண்டுவர வேண்டுமென்ற அடிப்படையிலேயே இவரை அரசியலுக்கு அழைத்திருந்தார்கள். இவர் மூன்று மொழி களையும் சரளமாகப் பேசக்கூடியவராக இருந்தார். இவரைப் பற்றி சுருக்கமாகச் சொல்வதென்றால், அன்பானவர், பண்பானவர், அடக்கமானவர், ஆணவமற்றவர், ஆன்மீகத் துறையில் நாட்டம் கொண்டவர். இவர் இத்துறை சார்ந்து 40 ஆண்டுகளுக்கும் மேலாக உழைத்திருக்கிறார். அதுமட்டுமல்ல, எந்தவொரு சந்தர்ப்பத்திலும் அறவழி, அகிம்சை வழியிலிருந்து பிசகாமல் தன்னுடைய பணியைச் செய்திருந்தார்.

2004ஆம் ஆண்டு தேர்தல் நடைபெற்ற காலப்பகுதியானது, மிகவும் துயரமான ஒரு காலப்பகுதியாக இருந்தது. அந்தத் தேர்தலில் மட்டக்களப்பு மாவட்டத்திலிருந்து நான்கு பேர் பாராளுமன்ற உறுப்பினர்களாகத் தெரிவு செய்யப்பட்டு இருந்தார்கள். அவர்களில் அதிகூடிய விருப்பு வாக்குகளைப் பெற்று அதாவது, 56,000க்கும் மேற்பட்ட விருப்பு வாக்குகளைப் பெற்று மாவட்டத்தில் முதலாவது இடத்தை கனகசபை ஐயா அவர்கள் பெற்றிருந்தார். இவ்வாறு மக்களால் நேசிக்கப்படுகின்ற, மக்களால் கணிக்கப்பட்ட ஒரு தலைவராக இவர் தெரிவானார். இவரோடு தங்கேஸ்வரி அம்மையார், ஜெயானந்தமூர்த்தி, அரியநேந்திரன் ஆகியோரும் தேசியப் பட்டியல் மூலமாக ஜோசப் பரராஜசிங்கம் ஐயா அவர்களும் இந்தப் பாராளுமன்றத்தை அலங்கரித்தார்கள். அந்தக் காலம் என்பது அராஜகமான, மிக மோசமான கொடிய ஆட்சி நடைபெற்ற காலம். அந்தக் காலத்தில் ஓர் அப்பாவியான, அகிம்சைவாதியான எங்களுடைய கனகசபை ஐயா அவர்கள் மரணத்தை மடியில் சுமந்துகொண்டுதான் அரசியல் செய்தார். அந்தக் காலத்தில்தான் எங்களுடைய ஜோசப் பரராஜசிங்கம் ஐயா அவர்கள் சுட்டுக்கொலை செய்யப்பட்டார். ரவிராஜ் அவர்கள் கொலை செய்யப்பட்டார்; சிவநேசன் அவர்கள் கொலை செய்யப்பட்டார். அதேபோன்று, அம்பாறையைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் கோடீஸ்வரன் அவர்களது பெரியப்பாவும் சுட்டுக் கொலை செய்யப்பட்டார். இவ்வாறு நான்கு முக்கிய தூண்களை நாங்கள் இழந்தோம். அந்த நேரத்தில், மிகக் கொடுமையான, வக்கிரமான ஆட்சி நடைபெற்றது. அதனை 'காட்டாட்சி' என்றுகூட சொல்லலாம். அப்படிப்பட்ட மோசமான ஓர் ஆட்சி நடைபெற்ற காலத்தில் உயிரைப் பாதுகாத்துக் கொள்வதே மிகக் கடினமாக இருந்தது. அந்தக் காலகட்டத்தில், சாந்தமான, சாணக்கியமான, பண்பான அரசியலைச் செய்தவர்தான் எங்களுடைய கனகசபை ஐயா அவர்கள்.

கனகசபை ஐயா அவர்கள் ஆன்மீகத் துறையில் அதிக நாட்டம் கொண்டிருந்தார். களுதாவளையிலுள்ள ஆலயத்தின் தொண்டனாக, ஆலய வண்ணக்கராக, ஆலயத் தலைவராக 40 ஆண்டுகள் இவர் பணியாற்றி இருக்கிறார். இவர் ஆன்மீகத்தின்மீது அசையாத நம்பிக்கை கொண்டவர்; வன்முறையில் நாட்டம் அற்றவர்; பழக இனியவர். இங்கிதமாகப் பேசுவதில் இவரைப் போன்று எவரும் இருக்க முடியாது. எந்தவோர் இடத்திலும் சினம் கொள்ளாமல், பெரியவர், சிறியர் என்ற பேதம் இல்லாமல், எல்லோரையும் அன்பாக அரவணைத்து, ஆலோசனை சொல்லக்கூடிய பக்குவமும் பண்பும் பகுத்தறிவும் இவரிடம் காணப்பட்டது. இவர் ஆன்மீகத்தில் ஈடுபாடு கொண்டிருந்தாலும், அறிவியல் சார்ந்த விவசாயத்துறையை வளர்த்தெடுப்பதிலும் அதன் பொருண்மியத்தை மேம்படுத்துவதிலும் மிகவும் மும்முரமாகச் செயற்பட்டவர்.

இவரது கிராமம் களுதாவளை. இன்று களுதாவளைக் கிராமம் ஒரு விவசாயக் கிராமமாகக் காணப்படுகின்றது. அங்கு படித்தவர்கள், பாமரர்கள் இருக்கின்றார்கள். அந்தக் கிராமத்தை தற்சார்புப் பொருளாதாரம் உடைய, தங்கிவாழாத கிராமமாக மாற்றக்கூடிய வகையில், அங்கு பல்வேறுபட்ட பயிர்ச்செய்கைகளைச் செய்வதற்கு அறிவியல் ரீதியாக வழிகாட்டிய ஓர் உத்தமர்தான் கனகசபை ஐயா அவர்கள். இவர் விவசாயம் சார்ந்த டிப்ளோமா கற்கை நெறியைக் கற்றிருந்தாலும், அனுபவத்தையும் பட்டறிவையும் அதிகமாகப் பெற்றிருந்தார். இவர் அமெரிக்காவுக்குச் சென்றுகூட கல்வியைப் பயின்றிருந்தார் என்பது குறிப்பிடத்தக்கது.

இவர் அடுத்த தடவை பாராளுமன்றத் தேர்தலில் போட்டியிட்டாலும், மக்கள் அவரை வெற்றிகொள்ளச் செய்திருப்பார்கள். ஆனால், அந்தக் காலப்பகுதியில் நிலவிய காட்டாட்சியில் கண்ட அனுபவத்தின் காரணமாக இவர் அரசியலை விரும்பவில்லை. ஏனெனில், இவர் பண்பான, பக்குவமான, மற்றவர்களை நேசிக்கின்ற இங்கிதமான அரசியலைத்தான் செய்ய விரும்பினார். எனினும், இவர் பாராளுமன்றத்துக்கு வந்த காலத்தில் மிக மோசமான நிலைமையே இருந்தது. அப்போது இவரது கட்சி சார்ந்து 22 பாராளுமன்ற உறுப்பினர்கள் இந்த அவையைப் பிரதிநிதித்துவப்படுத்தி இருந்தாலும்கூட, அந்தக் காலச் செயற்பாடுகள் இவரை மிகவும் பாதித்திருந்தது. அதனால் இவர் அடுத்த பாராளுமன்றத் தேர்தலில் போட்டியிடாமலே

இருந்துவிட்டார். அப்போதிருந்த அரசியல் இவருக்குப் பிடிக்கவில்லை என்றுதான் சொல்ல வேண்டும். ஏனெனில், வக்கிரமான அந்தக் காலப்பகுதியில் எங்களுடைய ஊடகவியலாளர்கள் பலர் கொல்லப்பட்டார்கள். குறிப்பாக, சிவராம், நடேசன், சுகிர்தராஜன், எக்னெலிகொட, லசந்த விக்ரமதுங்க போன்றோர் கொல்லப்பட்டார்கள். அது மாத்திரமன்றி, எங்களுடைய பேராசிரியர் இரவீந்திரநாத் அவர்கள் கடத்திச் செல்லப்பட்டு கொல்லப்பட்டார். தம்பையா என்று சொல்லக்கூடிய ஏழை மக்களோடும் இறங்கிப் பழகக்கூடிய, பொருளாதாரம் சார்ந்த சிரேஷ்ட விரிவுரையாளர் சுட்டுக் கொல்லப்பட்டார். அந்தக் காலத்தில் அரசியல் தலைவர்கள், ஊடகவியலாளர்கள், கல்விமான்கள் எனப் பலரும் கொல்லப்பட்டதன் காரணமாக அந்த அரசியல் இவருக்குப் பிடிக்கவில்லை.

இவர் நினைத்திருந்தால் இறுதிவரை அரசியலில் பயணித்திருக்க முடியும். இவர் அரசியலிலிருந்து ஒதுங்கிக் கொண்டதற்கு கெடுபிடியான, மோசமான அரசியல்தான் காரணமாக இருந்தது. இவர் மரணத்தை மடியில் சுமந்துகொண்டுதான் மக்கள் பணி செய்தார். அந்தக் காலப் பகுதியில் இன்னுமொரு பாராளுமன்ற உறுப்பினரை வீட்டில் வைத்து குடும்பத்தோடு அழித்துவிடும் நோக்கில் ஒரு தாக்குதலும் மேற்கொள்ளப்பட்டது. நகர்ப்பகுதிகளில் எல்லா இடங்களிலும் அரச கட்டுப்பாடு இருந்தது. அங்குகூட பயணிக்க முடியாத மிக மோசமான, துர்ப்பாக்கிய நிலைமை காணப்பட்டது. அந்த அரசியலுக்கு ஏற்றவாறு தன்னை மாற்றாது, தனது இயல்பை மாற்றாது, தன்னுடைய பண்பை மாற்றாது, ஒழுக்கமான, பண்பான அரசியலைச் செய்து மட்டக்களப்பு மாவட்டத்துக்குப் புகழைச் சேர்ந்துத் தந்தவர்தான் எங்களுடைய கனகசபை ஐயா அவர்கள்.

நான் பாராளுமன்ற உறுப்பினராகத் தெரிவு செய்யப் படுவதற்கு முன்பு, கனகசபை ஐயாவிடம் சென்று ஆசீர்வாதம் பெற்றேன். அப்போது அவர் என்னிடம், "தம்பி! அரசியல் என்பது மிக மோசமான பிரிவு. அதற்குள் ஊழல், மோசடி, கையூட்டு முதலான பிழையான செயற்பாடுகள் நிரம்பிக் காணப்பட்டாலும், அந்தச் செயற்பாடுகளில் ஈடுபடக் கூடாது. நீங்கள் கல்வித்துறையில் எவ்வாறு கண்ணியமாகப் பணியாற்றினீர்களோ, அதேபோன்று அரசியல் துறையிலும் பணியாற்ற வேண்டும். எந்தவொரு சந்தர்ப்பத்திலும் ஊழல், மோசடி, இலஞ்சம் போன்ற மோசமான செயற்பாடுகளில் ஈடுபடக்கூடாது" எனச் சொன்னார்.

நானும் அவருடைய வழிமுறையைப் பின்பற்றுகின்றவன் என்ற அடிப்படையில், அந்த அரசியலைத்தான் 2015இலிருந்து இற்றைவரை செய்து வருகின்றேன். கனகசபை ஐயா அவர்களுடைய பிள்ளைகளுள் ஒருவரான வினோதன் அவர்கள் என்னிடம் கல்வி கற்றவர். தற்பொழுது அவர் பிரான்சில் இருக்கிறாரென நினைக்கின்றேன். கனகசபை ஐயா அவர்களுடைய குடும்பம் மிகவும் அன்புக்குரியதாகக் காணப் பட்டது. நல்ல துணைவியார், நல்ல சகோதரர்கள், நல்ல பிள்ளைகள் என்று அவர் எல்லா வகையிலும் சிறந்தவர்களைப் பெற்றிருந்தார். அவர் விவசாயத்துறை சார்ந்த பிரதிப் பணிப்பாளர் பதவியை வகித்த காலத்தில், எந்தவோர் இடத்திலும் அந்தப் பதவியை விட்டுக் கொடுக்கவில்லை. அவர் மட்டக்களப்பு மாவட்டத்தின் விவசாயத்துறையை வளர்த்தெடுப்பதற்குப் பாடுபட்டார். அவர் கிழக்கு மாகாண பிரதி விவசாயப் பணிப்பாளராக இருந்தபோது, அங்கு விவசாயத்துறையை நன்கு கட்டியெழுப்ப வேண்டும் என்ற அடிப்படையில், தொழில்வாண்மையுடன் செயற்பட்டார் என்பதை மறுக்கவோ, மறைக்கவோ முடியாது.

கனகசபை ஐயா அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் இருந்த கிட்டத்தட்ட 6 ஆண்டு காலத்தில் ஒரு கனவானாக, கௌரவம் மிக்கவராக, பண்பாளனாக, எல்லோரையும் கவரத்தக்கவராக இருந்ததுடன், எங்களுக்கும் நல்லதொரு வழிகாட்டியாக விளங்கினார். அவர் இறந்த காலத்தில் நான் ஒரு விபத்தில் சிக்கியிருந்த காரணத்தால், அவருடைய இறுதிச் சடங்கில் என்னால் கலந்துகொள்ள முடியவில்லை. இருந்தாலும், அவருடைய பண்புகளை இங்கு எடுத்துரைக்க வேண்டுமென நினைத்தேன். அதற்கான சந்தர்ப்பம் இன்றைக்கு எனக்குக் கிடைத்திருக்கிறது. கனகசபை ஐயா அவர்கள் உரிமைக்காகக் குரல்கொடுத்தவர்; நீதிக்காகக் குரல்கொடுத்தவர். இந்த நாட்டில் நிரந்தரமான ஓர் அரசியல் தீர்வு கிடைக்க வேண்டும், சகல இன மக்களும் நிம்மதியாக வாழ வேண்டும் என்பதற்காக உழைத்த ஒரு பெருமகனாகவே நான் அவரைப் பார்க்கின்றேன். இந்த நாடு சௌபாக்கியமிக்க, அமைதி நிலவக்கூடிய, சகல மக்களும் சமத்துவமாக, சம உரிமையோடு வாழக்கூடிய ஒரு நாடாக இருக்க வேண்டுமென அவர் கனவு கண்டார். அந்தக் கனவு நிறைவேறும்போதுதான் அவருடைய ஆத்மாகூட சாந்தியடையுமென நான் நினைக்கின்றேன். இவ்வாறாக நான் கனகசபை ஐயாவின் பண்புகளையும் அவர் பற்றிய பக்கங்களையும் புரட்டி யிருக்கிறேன். அன்னாரின் குடும்பத்தினருக்கு எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்வதுடன், அவரது ஆசீர்வாதம் என்றும் எமக்கு வழிகாட்டியாக இருக்குமெனவும் கூறிக்கொள்கின்றேன்.

அடுத்து, காலஞ்சென்ற கௌரவ பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்கள் பற்றி கூற வேண்டும். இவரை எனக்கு அறிமுகம் செய்து வைத்தவர், கிரான் பிரதேசத்தில் இருக்கும் இவருடைய நண்பரான 'சபா ஐயா' என அழைக்கப்படுகின்ற சண்முகம் சற்குணாந்தம் என்பவர். அவரும் ஒரு சமவுடமைவாதி. அவர் இப்போதும் உயிருடன் இருக்கிறார். அவர் பெட்டி வீரக்கோன், கொல்வின் ஆர். டி சில்வா, கலாநிதி என். எம். பெரேரா போன்றவர்களோடு பழகியவர். திஸ்ஸ விதாரண அவர்கள் கிழக்கு மாகாணத்தின் ஆளுநராக வரவிருக்கின்றார் என்று அவர்தான் எனக்கு அறிமுகப் படுத்தினார். அப்போது நான் இவரோடு பேசினேன். சமத்துவவாதிகள், சமதர்மவாதிகள், பொதுவுடமைவாதிகள் புனிதமானவர்களாக இருப்பதால், நான் அவர்களோடு நண்பராகப் பழக வேண்டுமென நினைக்கின்றவன். அந்த அடிப்படையிலேயே நான் பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்களோடு கதைத்தேன். அவருடைய குறுகிய நேரப் பேச்சுக்கூட அவருடைய நல்ல பண்புகளை வெளிப்படுத்தும் வகையில் இருந்தது.

லங்கா சமசமாஜ கட்சி என்பது இலங்கையின் அரசியல் வரலாற்றில் முதலாவது தோன்றிய கட்சியாகும். இது 1935ஆம் ஆண்டில் தோன்றியது. 'சூரியமல்' இயக்கத்திலிருந்துதான் இந்தக் கட்சி ஆரம்பிக்கப்பட்டது. இந்தக் கட்சியில் கலாநிதி கொல்வின் ஆர். டி. சில்வா, கலாநிதி என். எம். பெரேரா என கல்வித்துறை சார்ந்த அறிஞர்கள் பலர் இருந்தார்கள். 1970ஆம் ஆண்டு காலத்தில் சிறிமாவோ அம்மையாரின் ஆட்சியில் இவர்கள் பங்குதாரர்களாக இருந்தமையானது, இவர்களுடைய பண்புகளை மக்கள் குறைத்து மதிப்பிடுவதற்குக் காரணமாக இருந்தது. இதனால் லங்கா சமசமாஜ கட்சியால் 1977ஆம் ஆண்டு நடைபெற்ற தேர்தலில் ஓர் ஆசனத்தைக்கூட கைப்பற்ற முடியாமல் போனது. அதுவரை லங்கா சமசமாஜ கட்சி, இலங்கை கம்யூனிஸ்ட் கட்சி போன்ற பொதுவுடமைக் கட்சிகளை வடக்கு, கிழக்கு மக்கள் ஓரளவுக்கு நம்பக்கூடிய கட்சிகளாக, இனவாதமற்ற கட்சிகளாகப் பார்த்தனர். அவை இனவாத ரீதியான கட்சிகளுடன் கூட்டணி சேர்ந்ததால், அந்த

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

நம்பிக்கை படிப்படியாகச் சிதைந்து போனது. காலஞ்சென்ற பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்கள் உண்மையிலேயே கற்றறிந்த ஒரு மேதாவி; ஒரு மேதை; ஓர் அறிவியல் சிந்தனையாளர்; வைத்தியராகப் பணியாற்றியவர். நாட்டில் அமைதி நிலவ வேண்டும், மக்கள் மிகவும் பக்குவமாகவும் பண்பாகவும் வாழ வேண்டும் என்பதற்காக உழைத்தவர். அவருடைய குடும்பத்தினருக்கும் இந்த இடத்தில் எனது அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, காலஞ்சென்ற நந்தன குணதிலக அவர்கள் பற்றி கூற வேண்டும். இவர் JVPஇன் ஆரம்பகால உறுப்பினராக இருந்தவர். அது மாத்திரமன்றி, சனாதிபதித் தேர்தலிலும் போட்டியிட்டவர். இவரும் ஒரு சமத்துவவாதியாக இருந்தவர் என்பது குறிப்பிடத்தக்கது. இவரும் பண்பான அரசியலை வெளிப்படுத்தியவர் என்ற வகையில், இவருக்கு எனது அஞ்சலியைச் செலுத்துவதுடன், இவரது குடும்பத்தினருக்கு எனது அனுதாபங்களையும் தெரிவித்துக் கொள்கின்றேன். அதேபோன்று, காலஞ்சென்ற கௌரவ எஸ். சீ. முதுகுமாரண, கௌரவ சந்திரதாச கலப்பத்தி, கௌரவ ஜனக் மஹேந்திர அதிகாரி ஆகியோரின் சேவைகளைப் பாராட்டுவதோடு, அவர்களுடைய குடும்பத்தினருக்கும் எனது அனுதாபங்களைத் தெரிவித்துக்கொண்டு, நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 1.00]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන් හය දෙනෙකුගේ අභාවය සම්බන්ධයෙන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී, පළමුවෙන්ම දිවංගත ගරු නන්දන ගුණතිලක මැතිතුමා පිළිබඳව ගුණ කථනයක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

නන්දන ගුණතිලක මැතිතුමා පානදුරේදී උපත ලබා, පානදුර නගරයේ ඇති දීප්තිමත්ම පාසලක්, ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් ඇති පාසලක් වන ශ්‍රී සුමංගල පිරිමි විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඉහළින්ම උසස් පෙළ සමත් වෙලා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයට තේරී පත් වුණා. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයකු හැටියටත්, ශිෂ්‍ය නායකයකු හැටියටත් කැපී පෙනුණා. 1988-89 කැරැල්ල අවස්ථාවේ ඒ කැරැල්ලට නායකත්වය දෙමින් විප්ලවකාරී නායකයකු හැටියට, ඉදිරි පෙළ නායකයකු හැටියට එතුමා කටයුතු කළා. අද දින මේ සභාව තුළ ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළ සිටින බොහෝ දෙනෙක්; ජනතා විමුක්ති පෙරමුණේ බොහෝ දෙනෙක් එතුමාට වඩා කනිෂ්ඨයන්, නැත්නම් සමකාලීනයන්.

මම හිතන විදියට, එතුමා විශ්වාස කරපු ප්‍රතිපත්ති මත, විශ්වාස කරපු මූලධර්ම මත සටන්කාමියෙකු ලෙස එතුමා විප්ලවීය ව්‍යාපාරයකට නායකත්වය දුන්නා. කෙසේ වෙතත්, නන්දන ගුණතිලක මැතිතුමා කියන්නේ ඒ සන්නද්ධ, විප්ලවීය ව්‍යාපාරය අසාර්ථක වූ විට නැවත වරක් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට ගොඩනඟන්නට ඉතිරි වුණු කිහිපදෙනා අතරින් කෙනෙක්. එහි ප්‍රධාන ලේකම්වරයා හැටියටත් එතුමා කටයුතු කළා. ඒ වාගේම සන්නද්ධ ව්‍යාපාරයක මුහුණුවරින් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් බවට ජනතා විමුක්ති පෙරමුණ ගොඩනඟලා, අද වෙනකොට මේ රටේ පාලන බලය හොබවන පක්ෂය බවට පත් වෙන්නට එයට අවශ්‍ය කරන පදනම සකස් කළේත්, නන්දන ගුණතිලක මැතිතුමා. එතුමා ගැන, ඒ ඉතිහාසය තවමත් මේ සභාවේ නොකියවීම ඌනතාවක් හැටියටයි මා දකින්නේ. එවකට එතුමාගේ කඳවුරේ නොහිටපු කෙනෙක් වුණත්, එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජනතා විමුක්ති පෙරමුණේ ශිෂ්‍ය ව්‍යාපාරයට සහභාගි වෙනකොට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනතා විමුක්ති පෙරමුණට එරෙහි ශිෂ්‍ය කණ්ඩායම්වලට නායකත්වය දීපු පුද්ගලයකු හැටියට මට ඒ ඉතිහාසය අමතක කරන්නට බැහැ.

දේශපාලනය කාලයෙන් කාලයට වෙනස් වෙනවා. දේශපාලනය තුළ ගොඩනැඟෙන ඒ අවස්ථා, ලෝකයේ ගොඩනැඟෙන ප්‍රතිපත්තිමය කාරණා සියල්ලත් එක්ක නන්දන ගුණතිලක මැතිතුමා විප්ලවය අත්හැරලා, ප්‍රජාතන්ත්‍රවාදී විදියට ජනතා විමුක්ති පෙරමුණ ගොඩනැඟුවා. 1999 වසරේදී එතුමා ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා තුන්වැනි ස්ථානය දිනා ගත්තා. එතුමා ඡන්ද 344,173ක් ලබා ගත්තා. රටේ තුන්වැනි ප්‍රජාතන්ත්‍රවාදී බලවේගය බවට ජනතා විමුක්ති පෙරමුණ පත් කරන්න කටයුතු කළ, ඒකට නායකත්වය දීපු, ඒ පක්ෂයේ සංකේතය වුණේ නන්දන ගුණතිලක මැතිතුමා. ඉන් පසුව එතුමා සන්ධානගත දේශපාලන ව්‍යාපාරයට එළැඹුණා. 2000 සිට 2010 දක්වා එතුමා කළුතර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ වාගේම එතුමා වැඩබලන තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා වශයෙනුත්, සංචාරක අමාත්‍යවරයා වශයෙනුත් කටයුතු කළා. එවකට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සමඟ ජාතික වශයෙන් දේශපාලන ව්‍යාපාරයක් මෙහෙයවපු ඉදිරි පෙළ නායකයකු වශයෙන් එතුමා කැපී පෙනුණා. ඉන් පසුව එතුමා දෙවරක් පානදුර නගර සභාවේ සභාපතිවරයා වශයෙන් තේරී පත් වුණා. දෙවැනි අවස්ථාවේ එතුමා තේරී පත් වුණේ, එක්සත් ජාතික පක්ෂයෙන්. එතුමාගේ ඡන්ද ව්‍යාපාරයට සහභාගි වෙච්ච, දායක වෙච්ච කෙනෙකු හැටියට මා ප්‍රථමයෙන්ම එතුමාව හඳුනා ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නන්දන ගුණතිලක මැතිතුමා සියයට 100ක්ම දූෂණයෙන් තොර, පිරිසිදු නායකයකු බව මට විශ්වාසයෙන් කියන්න පුළුවන්. මුළු ලෝකයේම මාක්ස්වාදී දේශපාලන ව්‍යාපාරය බිඳ වැටෙද්දී එතුමා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ඇතුව එක්සත් ජාතික පක්ෂයට

සම්බන්ධ වුණා. එවකට රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන තිබුණු පෞද්ගලික විශ්වාසයට එතුමා එම ව්‍යාපාරයට සම්බන්ධ වෙච්ච බව මට හොඳටම මතකයි. එතුමා එක්සත් ජාතික පක්ෂයට එකතු වීම සඳහා පැවැත්වූ පළමුවැනි සාකච්ඡාව රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පෞද්ගලික නිවසේ පැවැත්වුණා. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු ජ්‍යෙෂ්ඨ නායකයන් කිහිපදෙනෙකු සමඟ එතුමා එම සාකච්ඡාවට සම්බන්ධ වෙනකොට, ඒ සඳහා සහභාගි වෙන්න මටත් අවස්ථාව ලැබුණා. එතුමාගේ වෙනස්වීම පෞද්ගලික අභිලාෂයන් මත වූ වෙනස්වීමක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මාක්ස්වාදී දේශපාලන ව්‍යාපාරය ලෝකය පුරාම බිඳ වැටීමත් එක්ක, කාලීනව රට ඉදිරියට ගෙන යාමට හැක්කේ කුමන දර්ශනයක් මතද යන්න පිළිබඳව විශ්වාසය තබලා තමයි එතුමා එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමඟ එකතු වුණේ.

එතුමා පානදුර නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් දෙවරක් කටයුතු කළා. එතුමාට විරුද්ධව කවදාවත් දූෂණය සම්බන්ධයෙන් කිසිම චෝදනාවක් එල්ල වුණේ නැහැ. එතුමා හැම වේලාවෙම කාර්යක්ෂමව වැඩ කළා; හැම වෙලාවේම තමන්ගේ රාජකාරියේ යෙදිලා හිටියා; පූර්ණ කාලීනව දේශපාලනය කළා. ඒ වාගේම ප්‍රදේශයේ ජනතාවගේ දුක සැප පිළිබඳව සොයා බලමින්, නගරයේ යහපත පිළිබඳව සොයා බලමින් අවංකව දේශපාලනය කරපු, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහජන යහපත වෙනුවෙන් කැප වූ දේශපාලනඥයකු හැටියට කලක එතුමාට විරුද්ධව දේශපාලනය කර පසුව එතුමා සමඟ දේශපාලනය කරපු මට සහතියක් දෙන්න පුළුවන්. අද එතුමා අප අතර නැති වුණත්, ඒ ගෞරවනීය කීර්ති නාමය රැගෙනයි එතුමා අප අතරින් වෙන් වුණේ. එතුමාගේ අවමංගල්‍ය අවස්ථාවට පක්ෂ, පාට භේදයක් නැතිව පානදුර ජනතාව විතරක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව විතරක් නොවෙයි, මුළු රටේම යහපත් මිනිස්සු දහස් ගණනින් සහභාගි වුණේ, එතුමාගේ පිරිසිදු සහ ගෞරවනීය දේශපාලන ජීවිතයට සහතිකයක් වශයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පූර්ණ කාලීනව දේශපාලනය කිරීමේ හුරුව එතුමා ජනතා විමුක්ති පෙරමුණේ සිටියදීත් එතුමාට තිබුණා, ඉන් පසුවත් තිබුණා. පූර්ණ කාලීනව දේශපාලනයේ ඉන්නවා කිව්වාට, අද රජයේ ඉන්න සමහර නායකයින් එහෙම අය නොවෙයි කියලා ඔබතුමියත් හොඳාකාරවම දන්නවා ඇති. ඒ අය අද කෝටිපතියන්, ධනපතියන්. දේශීය මුදල් සහ cryptocurrency තිබෙන නායකයින් අද ඔබතුමන්ලාගේ පක්ෂයේ ඉන්නවා. ඒක සතුටට කරුණක්. නමුත් එතුමා ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ කාලීනයෙකුගේ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කරමින් ධනවාදී මතවාද දරන දේශපාලන පක්ෂයකට සම්බන්ධ වුණත්, තමන්ගේ පෞද්ගලික සුඛ විහරණය හෝ තමන්ගේ පවුලේ යහපත ගැන සොයා බලන්නේ නැතිව ජනතා සේවයට කැප වුණා. ඒ නිසා එතුමාට ජීවිතයේ අවසාන කාලයේ බොහෝ ආර්ථික දුෂ්කරතා තිබුණා. ඒ ආර්ථික දුෂ්කරතා පිළිබඳව එතුමා කථා කළා. ඒක, නුසුදුසුකමක් නොවෙයි, සුදුසුකමක්. පසු කාලයකදී එතුමා දුප්පතෙකු වීම ගැන, එතුමාගේ පෞද්ගලික ජීවිතය පවත්වාගෙන යාමට තරම්වත් වත්කමක් ඉතිරි කර නොගැනීම ගැන එතුමාගේ සගයන් විසින් එතුමාව හැල්ලුවට ලක් කළ බව අපට අහන්නට ලැබුණා. එතුමා මියගිය අවස්ථාවේදී එතුමාට ලකුණු බින්දුවක් ලබා දුන් එතුමාගේ සටන් සගයන්, සන්නද්ධ අරගලය කාලයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ එතුමා යටතේ හිටපු නායකයින් මේ පාර්ලිමේන්තුවේ හිටියා. නමුත් මම එතුමාට ලකුණු සියයක් දෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ, එතුමාගේ අවංකකමට, කාර්යක්ෂමතාවට සහ ප්‍රතිපත්තිගරුක බවට. එතුමා තමන්ගේ පෞද්ගලික ජීවිතය සහ වත්කම් ගොඩනැඟුවේ නැති වුණාට තමන්ගේ බිරිඳ සහ දරුවා ගැන සොයා බැලුවා. නමුත් එතුමා ඒ ජීවන සටන දෙවනුව තබලා රට වෙනුවෙන්, තමන් ඉපදුණු, ජීවත් වුණු පානදුර වෙනුවෙන් අන්තිම අවස්ථාව දක්වාම කටයුතු කළා.

නන්දන ගුණතිලක මැතිතුමා පසු කාලයකදී, අපි සමගි ජන බලවේගය ගොඩ නඟන විට අපත් සමඟ සම්බන්ධ වුණා. ඒ වාගේම අපි 2015දී ජනාධිපතිවරණය ජයග්‍රහණය කරපු අවස්ථාවේදී, පානදුර ආසනය එතුමාගේ නායකත්වයෙන් අපි ජයග්‍රහණය කළා. පසුව පාර්ලිමේන්තු මැතිවරණයට එතුමා මාත් සමඟ සහයෝගයෙන් තරග කළා. නමුත් එතුමාට ඒ මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වෙන්න බැරි වුණත් එතුමා අවංකව සහ ගුණගරුකව ඡන්ද ව්‍යාපාරය කරපු නිසා එතුමාට සැලකිය යුතු ජන වරමක් ලැබුණා. එතුමා කළකිරුණේ නැහැ. එතුමා තවදුරටත් ජනතා සේවය ඉදිරියට කරගෙන ගියා. ඒ නිසා දේශපාලන අවංකභාවයේ ප්‍රතිමූර්තිය, තමන් විශ්වාස කරපු දේශපාලනඥයෙකු කෙලෙස විය යුතුද, දේශපාලනඥයෙකු කටයුතු කළ යුත්තේ කුමන මූලධර්ම අනුවද, පූර්ණ කාලීනව දේශපාලනය වෙනුවෙන් කැපවෙන දේශපාලනඥයෙකුගේ පරමාදර්ශී ජීවිතය කෙසේ විය යුතුද යන්න පිළිබඳව පාඩමක් උගන්වමින් තමයි එතුමා අප අතරින් වෙන් වුණේ.

එතුමා සමඟ එකට සන්නද්ධ අරගලයේ හිටපු, එතුමා සමඟ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය අරගලයේ හිටපු, එතුමා සමඟ 1999දී ජනාධිපතිවරණ ව්‍යාපාරයේ වැඩ කරපු, ඉන් පසුව සන්ධාන ආණ්ඩු ගොඩනඟනකොට අමාත්‍ය මණ්ඩලයේ හිටපු සාමාජිකයින් මේ සභාවේ ඉන්නවා. නමුත්, එතුමා ගැන සහතික දෙන්නට අප පමණක් සිටීම කනගාටුවට කරුණක් කියලා හිතන්නත් පුළුවන්; එක අතකින් එය සතුටක් කියලා හිතන්නත් පුළුවන්. මොකද, පෞද්ගලිකව එතුමා වර්ණනා කිරීමෙන් අපට යහපතක් වන්නේ නැහැ. නමුත්, මේ රටේ ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයන් ඉන්නවා. හැම දේශපාලනඥයෙක්ම හොරෙක් නොවෙයි. මේ රටේ දේශපාලනය වෙනුවෙන් පූර්ණ ලෙස කැපවෙච්ච දේශපාලනඥයන් හැම කඳවුරකම ඉන්නවා කියන කාරණය සනාථ කරමින් එතුමා හදිසියේම අප අතරින් වෙන් වෙලා ගියා. එතුමාගේ මරණය අනපේක්ෂිතයි. එතුමා රෝගාතුරව සිටියත්, මරණාසන්න තත්ත්වයක නොහිටපු බව අප හොඳින්ම දන්නවා. නමුත්, හදිසියේම සිදු වුණු එතුමාගේ මරණය පිළිබඳව මුළු රටම කම්පාවට පත් වුණා. ඒ පිළිබඳ ප්‍රශ්නය තවමත් ඉතිරි වෙලා තිබෙනවා. ඒ කෙසේ වෙතත්, නන්දන ගුණතිලක කියන්නේ, ප්‍රතිපත්තිගරුකව දේශපාලනය කරපු, ප්‍රතිපත්තිය ජීවිතයේ අවසාන මොහොත දක්වාම අරගෙන ගිය, අවංකව කථා කරපු, අවංකව වැඩ කරපු, පානදුරට, කළුතරට, රටට වැඩ කරපු අවංක දේශපාලනඥයෙක්. එතුමාට නිවන් සැප ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු කනගසබෙයි තම්මන්පිල්ලෙයි මැතිතුමා කියන්නේ, ITAK පක්ෂය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුව වසර පහකට වැඩි කාලයක් නියෝජනය කරපු, අවස්ථා ගණනාවකම පාර්ලිමේන්තුවේ සභාපති නාමාවලියේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරපු ගරු කටයුතු, ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයෙක්. එතුමාවත් අපි ආදරයෙන් සිහිපත් කරනවා. මා අදහන ආගම අනුව එතුමාට නිවන් සැප ලැබේවා කියා මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනක් මහේන්ද්‍ර අධිකාරි කියන තරුණ දේශපාලනඥයා මේ පාර්ලිමේන්තුවට ආවේ අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින්. වසර හයක කාලයක් මේ පාර්ලිමේන්තුවේ ගත කරපු එතුමා දිගටම පළාත් සභාව නියෝජනය කළා. අනුරාධපුරයේ ගොවි ජනතාව නියෝජනය කරපු වාමාංශික දේශපාලනය ඔස්සේ ප්‍රතිපත්තිමය දේශපාලනය කරපු ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාවත් මේ අවස්ථාවේදී අපි සිහි කරන්නේ ආදරයෙන්.

ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මන්ත්‍රීතුමා ගැන කිව්වොත්, එතුමා ගල්ඔය නිම්නයේ ජනතාවට දේශපාලන නායකත්වය දුන් වීරෝදාර යුග පුරුෂයෙක්. ඒ වාගේම එතුමා රටේ දුෂ්කරම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ප්‍රදේශයක ජීවත් වෙමින්, විශේෂයෙන් අම්පාර නගරයේ සහ පොදුවේ අම්පාර දිස්ත්‍රික්කයේ ජයග්‍රහණය වෙනුවෙන්, දුක් විඳින මිනිස්සු වෙනුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ කැපවෙච්ච ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක්. එතුමා දිවංගත පී. දයාරත්න මැතිතුමා සමඟ එක්ව කටයුතු කළා. එතුමා අම්පාර විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා වශයෙන් සමාජ කටයුතුවලදී ඉදිරියට පැමිණියා. ඒ වාගේම 1979 වසරේ පැවති අම්පාරේ පළමු නගර සභා මැතිවරණය ජයග්‍රහණය කරලා එහි පළමු නගරාධිපති බවටත් පත්වුණා. ඉන් පසුව එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. වසර ගණනාවක් පාර්ලිමේන්තුව නියෝජනය කරපු එතුමා නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉතාම දීර්ඝ කාලයක් කටයුතු කළා. සුන්දර හිනාවක් හැම විටම මුහුණට නඟා ගත්, අම්පාර ප්‍රදේශයේ ජීවත් වන මිනිස්සුන්ගේ දුක, වේදනාව හොඳින් හඳුනපු, අම්පාර දියුණු නගරයක් බවට පත් කරන්න කටයුතු කරපු, විශේෂයෙන්ම අම්පාර රෝහල ගොඩනඟන්න විශාල කැප කිරීමක් කරපු එතුමා පළමුව එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා අපි සමඟි ජන බලවේගය ගොඩනඟන විට අපත් සමඟ දේශපාලනය කරන්න එක් වුණා. එතුමා දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුවත්, පළාත් සභාවත් නියෝජනය කරමින් අම්පාර දිස්ත්‍රික්කයේ මිනිස්සු වෙනුවෙන් අම්පාරේ ජීවත් වෙමින් මහජනතාව සමඟ අවසාන මොහොත දක්වාම එකට සිටිමින් කරපු කැපවීම අතිමහත් බව ඒ ප්‍රදේශය ගැන පෞද්ගලිකව දැනුමක් තිබෙන මා හොඳින් දන්නවා. ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා සුන්දර මනුෂ්‍යයෙක්, දක්ෂ නායකයෙක්, ගැඹුරු කැපවීමක් ඇති නායකයෙක්, දුක් විඳින මිනිසුන් සමඟ ජීවත් වෙමින් ඔවුන්ට නායකත්වය දුන් නායකයෙක් බව මේ අවස්ථාවේ මා සිහිපත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමා මට මුණ ගැසුණේ මේ පාර්ලිමේන්තුවේදීයි. එතුමා 2010දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් තේරී පත් වෙලා මේ පාර්ලිමේන්තුවට එනකොට මමත් පළමු වතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් පැමිණියා. ඒ කාලයේ ආණ්ඩු පක්ෂයේ සංඛ්‍යාව අද වාගේම ගොඩක් වැඩි නිසා පළමුවර තේරී පත් වෙච්ච මන්ත්‍රීවරුන් හිටියේ විපක්ෂය පැත්තේ. මගේ ආසනයට ඉතාම ආසන්නයේ තිබුණු ආසනයක තමයි එතුමා හිටියේ. කාලයක් තිස්සේ දැන හඳුනා ගැනීමෙන් අප අතර මිත්‍රත්වයක් ගොඩනැඟුණා. එතුමා ගැමි නායකයෙක්; විශේෂයෙන්ම ගොවි ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව ගැඹුරු අවබෝධයක් තිබුණු, ප්‍රායෝගික අවබෝධයක් තිබුණු නායකයෙක්. පසු කාලයක එතුමාට නියෝජ්‍ය ඇමතිකමක් ලැබිලා එතුමා ආණ්ඩු පක්ෂය පැත්තට ගියා. ඒත් අප අතර තිබුණු ඒ මිත්‍රත්වය කාලයක් තිස්සේ තිබුණා.

මේ රටේ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන ජනතාව ගැන, විශේෂයෙන්ම වියළි කලාපයේ ගොවිතැන ගැන මම එතුමා එක්ක කථා කරලා තිබෙනවා. අපට පහතරට තෙත් කලාපයේ ගොවිතැන ගැන අවබෝධයක් තිබුණත්, වියළි කලාපයේ ගොවියා ගැන තිබෙන ප්‍රායෝගික අවබෝධය අඩුයි; දැනුම අඩුයි. මම විවේකය ලැබුණු හැම වේලාවේම වියළි කලාපයේ ගොවියා මුහුණ දෙන අභියෝග ගැන එතුමා එක්ක සාකච්ඡා කළා. එතුමාගෙන් මා ඒ දැනුම ලබා ගත්තා; දැනුම හුවමාරු කර ගත්තා. එතුමා තමන්ගේ ජනතාව වෙනුවෙන් කැප වෙච්ච, විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කැප වෙච්ච විශිෂ්ටතම නායකයෙකු බව සිහි කරමින් මේ අවස්ථාවේ මා එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දිවංගත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉගෙනුම ලබපු ශ්‍රේෂ්ඨ උගතෙක්. එතුමා ලංකා විශ්වවිද්‍යාලයෙනුත්, ඉන් පසුව ලන්ඩන් විශ්වවිද්‍යාලයෙනුත් උසස් අධ්‍යාපනය ලැබුවා. එතුමාත්, මමත් ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින් වීම නිසා අප අතර ඉතිහාසය පිළිබඳ විවිධ කථා, සාකච්ඡා තිබුණා. එතුමාත් මාත් අතර වයසින් ලොකු පරතරයක් තිබුණත්, අත්දැකීම්වල ලොකු පරතරයක් තිබුණත්, මේ පාර්ලිමේන්තුව තුළ එතුමා සමඟ ගොඩනැඟුණු මිත්‍රත්වය පාර්ලිමේන්තුවෙන් එළියටත් ගියා. වාමාංශික දේශපාලන ඉතිහාසය පිළිබඳව, ලංකා සමසමාජ පක්ෂයේ ඉතිහාසය පිළිබඳව එතුමා සමඟ මා කථා කරලා තිබෙනවා. මාක්ස්වාදය කොච්චර දුරට ප්‍රායෝගිකව රටක ඉදිරි ගමනට අදාළ කර ගත හැකිද, ලිබරල්වාදී අදහස් තුළින් රට ගොඩනැඟීමේ තිබෙන දුෂ්කරතා මොනවාද කියන කාරණා ගැනත්, සන්ධාන දේශපාලනය තුළ මේ රටේ වාමාංශික දේශපාලනය කඩා වැටීම ගැනත් එතුමාත්, මාත් කථා කරලා තිබෙනවා. අපි යුග දෙකක් නියෝජනය කළ දේශපාලනඥයින් වුණත්, එතුමාගේ උගත්කම, ඉතාම පුළුල් වූ දේශපාලනික පරිචය, විද්‍යාඥයෙකු හැටියට එතුමා සතුව තිබුණු අපරිමිත දැනුම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට එතුමා විසින් කරන ලද සේවය, එතුමා විසින් ගොඩනඟන ලද ශිෂ්‍ය පරම්පරාව සහ එතුමා විසින් ගොඩනඟන ලද ආයතන පිළිබඳව අද දින ගරු රවුෆ් හකීම් මැතිතුමා ඉතා විශිෂ්ට වූ ගුණ කථනයක් කළා. මම ඒ කරුණු නැවතත් මතක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙකු හැටියට ගරු රවුෆ් හකීම් මැතිතුමා ගරු තිස්ස විතාරණ මැතිතුමා පිළිබඳව සඳහන් කළ කරුණු මා ද අනුමත කරනවා. ඒ වාගේම එතුමා විසින් මේ රටට කරපු සේවය පිළිබඳව මේ වෙලාවේ නැවත නැවත මතක් කරනවා. මොකද, එවැනි උගත්, ගුණවත් දේශපාලනඥයින් මේ සභාවට, මේ පාර්ලිමේන්තුවට අවශ්‍ය වී තිබෙනවා. ප්‍රායෝගික දැනුම තිබෙන, සත්‍ය වශයෙන්ම ප්‍රායෝගික අත්දැකීම් තිබෙන ජාත්‍යන්තර මට්ටමේ උගතුන්ගේ අඩුවක් මේ පාර්ලිමේන්තුව තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එවැනි මොහොතක ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා පිළිබඳ ඒ මතකය අලුත් කරමින්, එතුමාට නිවන් සැප ලැබේවා කියා පතමින් මා නතර වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 1.22]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මැති ඇමතිවරු වශයෙන් මේ රටට දීර්ඝ කාලයක් සේවය කර අභාවප්‍රාප්ත වූ ගරු මන්ත්‍රීවරුන් ගණනාවක් පිළිබඳව ශෝක යෝජනා ගෙනෙන මේ අවස්ථාවේදී එතුමන්ලා ගැන කථා කරන්න මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මම මේ අවස්ථාවේදී මුලින්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ කෘතහස්ත දේශපාලනඥයෙක් වශයෙන් වෛද්‍ය විද්‍යාව තුළිනුත්, දේශපාලනය තුළිනුත් මේ රටට විශාල සේවාවක් කරපු අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා ගැනයි. මීට ඉස්සෙල්ලා කථා කරපු මැති ඇමතිවරු එතුමා ගැන

දීර්ඝ වශයෙන් කථා කළා. මම එතුමාව දැන හඳුනා ගත්තේ 2004දී එතුමා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මේ පාර්ලිමේන්තුවට පත් වුණු අවස්ථාවේදීයි. අපි දන්නා පරිදි එතුමා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් හා කොළඹ ආනන්ද විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා වෛද්‍ය විද්‍යාව සඳහා උපාධියක් ලබා ගත්තා. ඊට අමතරව එතුමා ආචාර්යවරයෙක් වශයෙන් උපාධිය ලබා ගත්තේ ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳවයි. එතුමා ඒ උගත්කම උපයෝගී කරගෙන මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල, අමිල සේවාවක් කරන්න කටයුතු කළ බව අපි දන්නවා. ඊට පස්සේ තමයි එතුමා දේශපාලනයට සම්බන්ධ වුණේ. දේශපාලනයට සම්බන්ධ වෙන්නත් එතුමාට බලපෑ හේතුවක් තිබුණා.

කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රදේශයේ දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලනය කරපු ගරු ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගේ ඥාති පුත්‍රයෙක් හැටියට තමයි එතුමා දේශපාලනයට සම්බන්ධ වුණේ. එතුමා මුලින්ම එන්.එම්. පෙරේරා මැතිතුමා සමඟ ලංකා සමසමාජ පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වුණා. නමුත්, එතුමාගේ අභාවයෙන් පස්සේ ගරු තිස්ස විතාරණ මැතිතුමා දේශපාලන නායකයෙක් හැටියට ලංකා සමසමාජ පක්ෂය තුළ කටයුතු කළා. ඒ අතරතුර තමයි එතුමා 2004දී මුලින්ම ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් පාර්ලිමේන්තුවට ආවේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් වෙලා ආවත්, කෑගල්ල දිස්ත්‍රික්කය තමයි නියෝජනය කළේ. එතුමාගේ විමධ්‍යගත වැඩසටහනේදීත්, අමාත්‍යවරයෙක් හැටියට පත් වුණාට පසුවත් කරන්න ඕනෑ සේවාවන්වලදී හුඟක් දුරට එතුමා කේන්ද්‍ර කර ගත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයයි කියන එක මේ අවස්ථාවේදී මම සිහිපත් කරන්න ඕනෑ. එතුමා යටියන්තොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළා. ඊට අමතරව, එතුමා දැරණියගල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේත් සභාපතිවරයා වශයෙන් කටයුතු කළා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කරන්න වාගේම ඒ ප්‍රදේශවල සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් මේ හිටපු අමාත්‍යවරයා ලබා දුන්නා කියන එක එතුමාට කළගුණ සැලකීමක් වශයෙන් මේ අවස්ථාවේදී මම සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, එතුමා අමාත්‍යවරයෙක් වශයෙන් පත් වුණාම තාක්ෂණය, විද්‍යාව දියුණු කරන්න, ලංකාව පුරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විද්‍යාත මධ්‍යස්ථාන ආරම්භ කරන්න ලොකු කැප කිරීමක් කළ බව. එතුමාගේ සංකල්පයක් හැටියට තමයි එතුමා ඒක ක්‍රියාත්මක කළේ.

ඒ වාගේම එතුමා වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් කළ සේවය ගත්තොත්, විශේෂයෙන්ම බෝ නොවන රෝග සම්බන්ධව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව සම්බන්ධව, සෞඛ්‍ය ක්ෂේත්‍රයට දුන්නු දැනමුතුකම්, ගුරුහරුකම් වාගේම විශ්වවිද්‍යාල මට්ටමින් අධ්‍යාපනය ලබා දෙන්න දැක්වූ දායකත්වය මේ අවස්ථාවේදී එතුමා ගැන සිහිපත් කරද්දී මම කථා කරන්න අවශ්‍ය වෙනවා.

මේ අවස්ථාවේදී මම තවත් කාරණාවක් කියන්න ඕනෑ. අද වනකොට විශාල වශයෙන් ප්‍රයෝජනවත් වෙලා තිබෙන නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානය හෝමාගම ප්‍රදේශයේ ඉදි කරන්න එතුමාගේ දායකත්වය ලබා දුන්නා. මම එතුමා ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කලක් කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරපු, ඒ වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයට විශාල සේවාවක් කරපු අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමාට ගරු කිරීමක් වශයෙන් තමයි මම මේ අවස්ථාවේදී ඒ අදහස් පළ කළේ. එතුමාගේ දයාබර බිරිඳ කාමිණී විතාරණ මහත්මිය ඇතුළු පවුලේ සියලුදෙනාට එතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ ශෝකය දන්වා යවන හැටියට මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඊළඟට මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ කලක් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරලා, පසුව සමගි ජන බලවේගය නියෝජනය කරපු අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා ගැනයි. ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා දීර්ඝ දේශපාලන ඉතිහාසයක් තිබෙන නායකයෙක්. අපි දන්නා පරිදි, එතුමා අම්පාර ප්‍රදේශයට ගියේ ගල්ඔය ව්‍යාපාරයත් එක්කයි. එදා ඩී.එස්. සේනානායක මැතිතුමා ආරම්භ කරපු ගල්ඔය ව්‍යාපාරයත් එක්ක විශාල පිරිසකට ඉඩම් ලබා දුන්නු බව අපි දන්නවා. එලෙස ඉඩම් ලබා දීලා විශාල සේවාවක් සිද්ධ වන අතරතුර තමයි, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා ඇතුළු පවුලේ අය අම්පාර ප්‍රදේශයට ගිහිල්ලා පදිංචි වුණේ. ඒ දුෂ්කර කාල පරිච්ඡේදයේ එතුමා තමන්ගේ දෙමාපියන් එක්ක අම්පාර ප්‍රදේශයට ගිහිල්ලා, දේශපාලන නායකයන් එක්ක එකතු වෙලා ඒ ප්‍රදේශය සංවර්ධනය කරන්න විශාල වැඩ කොටසක් කළා. ඒ පන්නරය සහ සමාජ සේවා කටයුතු නිසාම එතුමාට දේශපාලනයට එන්න විවිධ ඇරයුම් ලැබුණාය කියා මම හිතනවා. අපට මතකයි, 1977න් පසුව එතුමා අම්පාර නගර සභාවේ නගරාධිපති හැටියට මුලින්ම දේශපාලනයට අවතීර්ණ වුණු බව, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතුමා අම්පාර නගරය ඉහළින් ඔසවා තබන්න, එම නගරය සංවර්ධනය කරන්න විශාල සේවයක් ඉටු කළා. නැඟෙනහිර පළාතේ හොඳම නගර සභාව බවට අම්පාර නගර සභාව පත් කරන්න එතුමා නගරාධිපති හැටියට කටයුතු කළ කාලයේ හැකි වුණා කියන එක මේ අවස්ථාවේදී එතුමාට ගෞරවයක් හැටියට මම සිහිපත් කරන්න ඕනෑ.

1989දී එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පළමුවන වතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වුණා. පාර්ලිමේන්තුවට ආවාට පස්සේ එතුමා නගර සභාව මඟින් ගෙන ගිය ඒ සේවාව මුළු අම්පාර දිස්ත්‍රික්කයටම ව්‍යාප්ත කළා. ඒ වාගේම, අම්පාර දිස්ත්‍රික්කයේ සංවර්ධනය වෙනුවෙන් එතුමාට කරන්න පුළුවන් උපරිම දායකත්වය එතුමා ලබා දුන්නා. ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කළ, යටිතල පහසුකම් දියුණු කරන්න විශාල කැපවීමක් කළ නායකයෙක් හැටියට තමයි අපට ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාව හඳුන්වන්න පුළුවන් වෙන්නේ.

එතුමා වරක් නොවෙයි, 1989 වර්ෂයේ ඉඳන් 2001 වර්ෂය වෙනකම්ම පාර්ලිමේන්තුව නියෝජනය කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එලෙස පාර්ලිමේන්තුව නියෝජනය කරමින් විශාල සේවාවක් කළ එතුමා ඉන් පසුව පළාත් සභාවට ගියා. අපි දන්නවා, නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් එතුමා මිය යන තුරුම සේවය කළ බව. අම්පාරට විතරක් නොවෙයි, නැඟෙනහිර පළාතේම සංවර්ධනය සඳහා පළාත් සභාවේ අමාත්‍යවරයෙක් හැටියට එතුමා දීර්ඝ කාලයක් තිස්සේ වැඩ කටයුතු කළා. අපි දන්නවා, පළාත් සභාව ක්‍රියාත්මක නොවුණත් පළාත් සභා ව්‍යවස්ථාව අනුව එතුමාට පළාත් සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කිරීමේ හැකියාව තිබුණාය කියන එක. ඒ අනුව එතුමා මිය යනකම්ම පළාත් සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කළා.

අපි දන්නා තරමින් ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාගේ පුතුන් තිදෙනා සමාජයේ බොහොම කැපී පෙනෙන, සමාජශීලී වැඩ කටයුතු කරගෙන යන දරුවන්. මම මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ බිරිඳ වන මාලනී ගලප්පත්ති මහත්මියටත්, පුතුන් තිදෙනාටත්, ප්‍රදේශවාසී සියලුදෙනාටත් අපගේ ශෝකය ප්‍රකාශ කරන හැටියට මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින අපි මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේම අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරනු ලබනවා. ඒ අතරින් හිටපු අමාත්‍යවරයෙක් සහ වැඩබලන අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කළ අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මැතිතුමා ගැනත් මේ අවස්ථාවේදී මම වචන කීපයක් කථා කරන්නට ඕනෑ. විශේෂයෙන් අජිත් පී. පෙරේරා මැතිතුමා ගරු නන්දන ගුණතිලක මැතිතුමා ගැන බොහොම දීර්ඝ විස්තරයක් කළා. අපි දන්නවා, එතුමා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් තමයි මුලින්ම දේශපාලනයට ආවේ කියන එක. එතුමා ජනාධිපතිවරණ අපේක්ෂකයෙක් හැටියට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් ඉදිරිපත් වුණු 1999 කාල වකවානුව අපට මතක් වෙනවා. පසුව එතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ නැතිව අතරමඟදී ජනාධිපති සටනින් ඉවත් වුණු බව අපි දන්නවා. ඊට පස්සේ තමයි එතුමා 2000 වසරේදී පාර්ලිමේන්තුවට ආවේ. 2000 වසරේ ඉඳන් 2010 දක්වාම එතුමා කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරලා තිබෙනවා. අවස්ථානුකූලව එතුමා ඒ ප්‍රදේශයේ ජනතාවගේ හිත දිනා ගනිමින් වැඩ කටයුතු කළ බව අපි දන්නවා. නමුත්, ඒ වෙලාවේදී එතුමා නියෝජනය කළ පක්ෂයෙන් යම්කිසි ගැටලු සහගත තත්ත්වයක් ආපු නිසා එතුමා බලාපොරොත්තු වන සංවර්ධනය ප්‍රදේශයේ ජනතාවට ලබා දෙන්න බැහැ කියලා හිතෙන්න ඇති. ඒ අනුව එතුමා කල්පනා කළා, නැවත වරක් එක්සත් ජාතික පක්ෂයත් සමඟ එකතු වෙලා මේ රටට, එහෙම නැත්නම් කළුතර ප්‍රදේශයට සේවය කරන්න ඕනෑ කියලා. ඒ අනුව 2015දී එතුමා එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා පානදුර නගර සභාවේ සභාපතිවරයා වශයෙන් පත් වුණා. අපි අහලා තිබෙන හැටියට, පානදුර නගර සභාවේ සභාපතිවරයා බවට පත් වෙලා ඒ නගර සභාව ආදර්ශවත් ප්‍රාදේශීය සභාවක් බවට පත් කරන්න එතුමා විශාල කැප කිරීමක් කළා. මිය යන්න ආසන්න වෙනකොට එතුමාට බොහෝ දුෂ්කරතා, අසීරුතා තිබුණු බව අපට මතකයි.

ඔබතුමන්ලා අපට වඩා හොඳට දන්නවා ඇති, එතුමාගේ දේශපාලන ඉතිහාසය පිළිබඳව. එතුමා මිය යන තුරුම දේශපාලනයෙන් මුදල් හම්බ කළ පුද්ගලයෙක් නොවෙයි. එතුමා නගර සභාවේ කටයුතු කළේත් එහෙමයි. එතුමා හැම අවස්ථාවකදීම කිව්වා, එතුමාට තිබෙන ආර්ථික දුෂ්කරතා ගැන. ඒ වාගේම එතුමා කිව්වා, එතුමාට බෙහෙත් හේත් ටික ගන්න තිබෙන අපහසුතා ගැන.

මම හිතන විධියට, වර්තමාන රජයේ නායකයින්ටත් කිව්වා. ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහිමි කරද්දි එතුමා එකහෙළාම කථා කළා මට මතකයි. අපි වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් එතුමා එකහෙළාම කථා කළා. "අපි මුදලක් හම්බ කරපු මිනිස්සු නොවෙයි, ඒ නිසා විශ්‍රාම වැටුප අයින් කරන්න එපා, අපි ජීවත් වෙන්නේ ඒකෙන්, බෙහෙතක් හේතක් ගන්නේ ඒකෙන්" කියලා එතුමා කිව්වා. ඒ සම්බන්ධව එතුමා ඉල්ලීම් කළාට, ඒ වාගේ දුෂ්කර තත්ත්වයකින් ජීවත් වන මන්ත්‍රීවරුන් ගැනවත් කල්පනා කරන්න කිව්වාට, ආණ්ඩුව ඒ වෙලාවේ ඒක ගැන කල්පනා කළේ නැහැ. ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කිසිම තීන්දුවක් ගන්නේ නැතිව විශ්‍රාම වැටුප අහෝසි කරන්න කටයුතු කළා. ඒ වාගේ තත්ත්වයක ඉන්න මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. අසනීප තත්ත්වයෙන් ඉන්න මන්ත්‍රීවරු ගණනාවක් පසුගිය දවස්වල අපට කථා කරලා කියා තිබෙනවා, "අපට බෙහෙත් හේත් ටික ගන්න විධියක් නැහැ, ජීවත් වෙන්න විධියක් නැහැ, අපි මුදල් හම්බ කරපු මන්ත්‍රීවරු නොවෙයි" කියලා. නමුත්, ඒ සම්බන්ධව සැලකිල්ලක් කළේ නැහැ කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු නන්දන ගුණතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය පළ කරමින්, එතුමාටත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමා බොහොම පොඩි තැනක - ප්‍රාදේශීය සභාවේ - ඉඳලායි දේශපාලනයට ඇවිල්ලා තිබුණේ. ප්‍රාදේශීය සභාව නියෝජනය කළ එතුමා 1993දී උතුරු මැද පළාත් සභාවට තේරී පත් වුණා. ඉන් අනතුරුව 1999දී නැවතත් උතුරු මැද පළාත් සභාවට තේරී පත්ව එම පළාත් සභාවේ කෘෂිකර්ම ඇමතිවරයා හැටියට පත් වුණා. එතුමා පාර්ලිමේන්තුවට පත් වනකල් එම පළාතේ කෘෂිකර්මය දියුණු කිරීම සඳහා විශාල වැඩ කොටසක් කළාය කියලා තමයි අපට දැන ගන්න ලැබුණේ. ඒ වාගේම ගරු මුතුකුමාරණ මැතිතුමා ඒ ප්‍රදේශයේ දුගී ජනතාවත් එක්ක ඉතා කිට්ටුවෙන් වැඩ කරපු නායකයෙක්. ඊට පස්සේ තමයි එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කළේ. එතුමා කළ සේවයත් මේ අවස්ථාවේදී සිහිපත් කරමින්, එතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය එතුමාගේ බිරිඳ, දියණිය, පුතණුවන් දෙදෙනාට දන්වා යවන ලෙස ඉල්ලා සිටිනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාගේ අභාවය පිළිබඳවත් අද දවසේ ශෝක යෝජනා ගෙනැවිත් තිබෙනවා. 1989 වසරේ තමයි එතුමා පළමු වරට පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. එවකට සිටි ළාබාලතම මන්ත්‍රීවරයා හැටියට තමයි ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා පාර්ලිමේන්තුවට ආවේ. 1989දී එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටයි බලයට පත් වුණේ. ඒ අවස්ථාවේදී එතුමාට විශාල වැඩ කොටසක් කරන්න බැරි වුණා. නමුත්, නැවත වරක් එතුමා මම හිතන විධියට 1994දී හෝ 2000දී පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ කාලසීමාවේදී එතුමා යම් කිසි සේවාවක් ඒ ප්‍රදේශයට කළ බව අපි දන්නවා. ඒක ග්‍රාමීය ප්‍රදේශයක්, දුෂ්කර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට විශාල සේවාවක් ඉටු කළ ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාවත් මේ අවස්ථාවේදී සිහිපත් කරමින්, එතුමාගේ අභාවය වෙනුවෙනුත් අපේ ශෝකය පළ කරනවා.

ඊළඟට, මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු කනගසබෙයි තම්මන්පිල්ලෙයි මන්ත්‍රීතුමා ගැන කියනවා නම්, එතුමා 2004 සිට පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා යුද්ධය තිබුණු අවස්ථාවේ නොයෙකුත් දුෂ්කරතා මැද්දේ, අභියෝග මැද්දේ තමයි මඩකලපුව ප්‍රදේශය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, තමන්ගේ ජනතාවට යම් කිසි සේවාවක් ඉටු කරන්න කැප වෙලා කටයුතු කළේ. මේ අවස්ථාවේදී අපි එතුමාවත් සිහිපත් කරනවා.

අද දින ශෝක යෝජනා ඉදිරිපත් කරන තිස්ස විතාරණ මැතිතුමා ප්‍රමුඛ ඒ මන්ත්‍රීවරුන්ගේ පවුල්වල සියලුදෙනාට අපගේ ශෝකය දන්වා යවන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආචාර්ය නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා.

[අ.භා. 1.35]

**ගරු (ආචාර්ය) නන්දන මීල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අභාවප්‍රාප්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කිහිපදෙනෙකු සම්බන්ධයෙන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අද දවස යොදාගෙන තිබෙනවා. ඒ අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා, ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා, ගරු නන්දන ගුණතිලක මැතිතුමා, ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා, ගරු කනගසබෙයි තම්මන්පිල්ලෙයි මැතිතුමා යන මැති ඇමතිවරු හයදෙනා සම්බන්ධයෙන් අද දවසේ ශෝක යෝජනා ඉදිරිපත් කරනවා. අද උදේ වරුවේ මේ සියලුදෙනාගේ පවුල්වල උදවිය වාගේම එතුමන්ලාගේ හිතෛෂීන්, අසල්වාසීන් පාර්ලිමේන්තුවේ මහජන ගැලරියට පැමිණ තිබුණා. අපි ප්‍රථමයෙන් ඒ සියලුදෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම අභාවප්‍රාප්ත ඒ ගරු මන්ත්‍රීවරුන්ගේ ආගමානුකූල ප්‍රාර්ථනාවන් අනුව පරලොව ජීවිතය යහපත් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

විශේෂයෙන් මම මේ වෙලාවේ ටිකක් විස්තරාත්මකව අදහසක් ප්‍රකාශ කරන්න කැමැතියි, ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා පිළිබඳව. එතුමා "විද්‍යාජෝති" කියන සුවිශේෂී සම්මානයෙන් පිදුම් ලැබූ දේශපාලනඥයෙක්. 1934 අගෝස්තු 30වැනි දින - බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය පවත්නා අවස්ථාවේ - තමයි එතුමා මධ්‍යම කඳුකරයේ නුවරඑළිය නගරයේදී ජන්ම ලාභය ලබා තිබෙන්නේ. එතුමාගේ පවුල් පසුබිම සලකා බැලුවොත්, ශ්‍රී ලංකාවේ පරිපාලන සහ දේශපාලන ඉතිහාසය සමඟ දැඩිව බද්ධ වී තිබුණක් විධියට තමයි අපට හඳුනා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කළ පීරිස් විතාරණ මහතා එතුමාගේ පියා වූ අතර, එන්.පී. මැගී පෙරේරා මහත්මිය එතුමාගේ මව වුණා. මෙම පවුල් ව්‍යුහයේ වඩාත්ම තීරණාත්මක සාධකය වන්නේ එතුමාගේ මව වන මැගී පෙරේරා මහත්මිය ශ්‍රී ලංකාවේ මාක්ස්වාදී දේශපාලනයේ පීතෘවරයා ලෙස සැලකෙන, ලංකා සමසමාජ පක්ෂයේ නිර්මාතෘවරයකු මෙන්ම හිටපු මුදල් අමාත්‍යවරයකුද වූ ආචාර්ය එන්.එම්. පෙරේරා මහතාගේ සහෝදරිය වීමයි. මේ ඥාති සම්බන්ධතාව නිසාම දෝ පසුකාලීනව ගරු තිස්ස විතාරණ මැතිතුමාගේ දේශපාලන ජීවිතයට සමාජවාදී, කොමියුනිස්ට්වාදී මතවාදයන් නැඹුරුවීම දකින්න ලැබෙනවා. පසුකාලීනව එතුමා ලංකා සමසමාජ පක්ෂයේ නායකත්වයට පත්වීමට පවා මේ කාරණාව බලපා තිබෙනවා.

ගරු තිස්ස විතාරණ මැතිතුමා සිය මූලික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පාසල් දෙකක් තෝරාගෙන තිබෙනවා. ඒ, මහනුවර ත්‍රිත්ව විද්‍යාලය සහ කොළඹ ආනන්ද විද්‍යාලය. මේ කීර්තිමත් පාසල් දෙකෙන් අධ්‍යාපනය ලැබූ එතුමා අධ්‍යාපනයට පමණක් නොවෙයි, විශේෂයෙන් ක්‍රීඩා කෞශල්‍යය අතින්ද දක්ෂතා දැක්වූ අයෙක් විධියටයි සඳහන් වෙන්නේ.

පාසල් අධ්‍යාපනයෙන් පස්සේ එතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් වෙලා 1959 වසරේදී වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය සාර්ථකව ලබාගෙන තිබෙනවා. එතුමා විශ්වවිද්‍යාල සමයේදීත් ක්‍රීඩා කෞශල්‍යය අඛණ්ඩව පවත්වාගෙන යමින් 1957, 1958 වසරවලදී විශ්වවිද්‍යාල ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දැරීමට පවා සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම එතුමා කීර්තිමත් "සරා" කුසලාන තරගාවලියටද සහභාගි වෙමින් තමන්ගේ ක්‍රීඩා කෞශල්‍යයෙන් මේ රටට යම් සේවාවක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

පළමු උපාධියෙන් පසුව එතුමා වෛද්‍ය විද්‍යාවේ විශේෂඥතාවන් ලබා ගැනීමේ අරමුණින් එක්සත් රාජධානියට ගිහිල්ලා 1971 වසරේදී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් වයිරසවේදය - Virology- පිළිබඳ ආචාර්ය උපාධියත් ලබා ගෙන, දේශපාලනඥයෙක් වීමට පෙර වෛද්‍යවරයෙකු විධියට මේ රටට සුවිශාල සේවාවක් ඉටු කර තිබෙනවා. ඒ වාගේම එතුමා එම විෂය ක්ෂේත්‍රයේ දැවැන්ත ප්‍රාමාණිකයෙක් බව අද උදෑසන කථා කළ විශේෂඥ වෛද්‍ය ගරු නිහාල් අබේසිංහ මැතිතුමාගේ දීර්ඝ පැහැදිලි කිරීමේදී අපට දැන ගන්න පුළුවන්කම ලැබුණා.

එතුමා දේශපාලනඥයෙක් විධියට මාක්ස්වාදී ප්‍රවේශයක් සහිතව දේශපාලනයට පිවිසෙන්නේ ශ්‍රී ලංකාවේ පැරණිතම වමේ දේශපාලන පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂයෙන්. ශ්‍රී ලංකාවේ මැතිවරණ දේශපාලනය තුළ 70 දශකයෙන් පසුව තනි වාමාංශික පක්ෂයකට රජයක් පිහිටුවීමේ හැකියාව ගිලිහී ගිය බැවින් ප්‍රධාන ධාරාවේ පක්ෂ සමඟ සන්ධානගත වීමේ උපායමාර්ගයක් අනුගමනය කිරීමට එතුමාට සිදු වුණා. අන්න ඒ තත්ත්වයට අනුව (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා එම සම්මුතිවාදී දේශපාලන භාවිතය ඉතා ප්‍රායෝගිකව ඉදිරියට ගෙන ගිය කෙනෙකු විධියට තමයි හඳුනා ගැනීමට පුළුවන් වන්නේ.

එතුමා විශේෂයෙන් දේශපාලනඥයෙකු විධියට - මන්ත්‍රීවරයෙකු විධියට වාගේම, ඇමතිවරයෙකු විධියටත් - සුවිශාල සේවාවක් සිදු කර තිබෙනවා. (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය ධුරය දැරූ කාලය මෙරට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සහ ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනයේ කැපී පෙනෙන යුගයක් විධියට හඳුන්වන්න පුළුවන්කම තිබෙනවා. අපට අමතක කරන්න බැහැ, ශ්‍රී ලංකාවට ඩිජිටල් යුගයේ දොරටු විවර කිරීමේදී, e-Sri Lanka වැඩසටහන යථාර්ථයක් බවට පත් කිරීමේදී එතුමා එයට නායකත්වය දීපු දේශපාලන චරිතයක් වූ බව. එතුමා එම දැවැන්ත ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමීන් රැසක් සමඟ සමීපව කටයුතු කරපු බව එතුමාගේ ජීවන චරිතය හදාරන විට අපට හඳුනා ගන්න පුළුවන්කම තිබෙනවා. එම වැඩසටහනෙහි ප්‍රධානතම දැක්ම වුණේ, බෙදාගත් ජනගහන දත්ත ගබඩාවකට සම්බන්ධ කරන ලද පරිගණකගත ජාතික හැඳුනුම්පත් ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දීමයි. 1990 දශකයේ මැද භාගයේදී SLINTEC එක විසින් ආරම්භ කරන ලද දත්ත ඒකාබද්ධ කිරීමේ සාකච්ඡා පෙරට ගෙන යෑම සඳහා එතුමා විශේෂයෙන් සම්බන්ධ වෙලා තිබෙනවා. එහිදී බදු ගෙවන්නන්ගේ තොරතුරු ලුහු බැඳීම, බදු ගෙවීම් පහසු කිරීම සහ මරණ ලියාපදිංචිය වැනි රාජ්‍ය ක්‍රියාවලි විධිමත් කිරීම සඳහා එම e-NIC අංකය භාවිත කිරීමේ වැදගත්කම එතුමා විශේෂයෙන් අවධාරණය කර තිබෙනවා. මෙම ප්‍රතිපත්තිමය දැක්මේ දෙවැනි මට්ටමේ බලපෑම වන්නේ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දේශපාලන නායකයෙකු විධියට විද්‍යාත්මක සහ තාක්ෂණික ඥානය යොදා ගැනීමට කටයුතු කිරීමයි. ඒ නිසා සැබෑ වශයෙන්ම (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා තම ජීවිත කාලය තුළ දේශපාලනඥයෙකු විධියටත්, ප්‍රාමාණික විද්වතෙකු විධියටත් සුවිසල් මෙහෙවරක් ඉටු කිරීමට සමත් වී තිබෙන බව විශේෂයෙන් අපට පැහැදිලි වෙනවා.

(මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා ජාතික අර්බුදය කළමනාකරණය කිරීමේදී වාගේම, සුනාමි ව්‍යසනය සිදු වුණු අවස්ථාවේදීත් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කැපී පෙනෙන දායකත්වයක් ලබා දී තිබෙනවා. විශේෂයෙන් සුනාමි ව්‍යසනය අවස්ථාවේදී ක්ෂණික සහන සැලසීමේ අදියර නිම වීමත් සමඟ යළි ගොඩනැඟීමේ ක්‍රියාවලියේදී පාරිසරික ආරක්ෂාව තහවුරු කිරීමේ අභියෝගය රජය හමුවේ පැවතුණු අතර, ජාත්‍යන්තර ප්‍රජාවගේ සහ දායකයන්ගේ ප්‍රතිචාරය පෙර නොවූ

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

විරූ තරම් ඉහළ මට්ටමක පැවතුණත්, වෙරළබඩ කලාපය සංවර්ධනය කිරීමේදී විද්‍යාත්මක පදනමක් අවශ්‍ය වුණා. එම විද්‍යාත්මක පදනම ගොඩනැඟීමේදී එතුමා විශේෂයෙන් වෙරළ කලාපය ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂිත කලාපයක - buffer zone එකක - අවශ්‍යතාව තහවුරු කරමින් විවිධ අවස්ථාවල අදහස් පළ කර තිබෙනවා. ඒ වාගේම, ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි දූපත් රාජ්‍යයන්ට මුහුණ දීමට සිදු වන බලපෑම් සහ ඉන්දියානු සාගරයේ සුමාත්‍රා හා මක්‍රාන් හරහා දිවෙන භූමි කම්පා කලාපවල භූ කම්පන ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවේදී කළ අනාවරණවලදීත්, අනතුරු ඇඟවීම් සහ ජාතික ආපදා කළමනාකරණය සඳහා විද්‍යාත්මක දැනුම භාවිත කිරීමේදීත් එතුමා තම දැනුම ආයෝජනය කර තිබෙනවා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පැවැති ජන වාර්ගික අර්බුදය විසඳීම සඳහා දේශපාලන ක්‍රමවේදයක් සෙවීමේ අරමුණින් එකල සිටි පාලකයන් එක්ක එතුමා සර්ව පාක්ෂික නියෝජිත කමිටුවල සභාපතිවරයෙකු ලෙසත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මෙරට විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙන් ද කොමියුනිස්ට් රාජ්‍යවලට එල්ල වන්නා වූ විවිධ තර්ජන පිළිබඳව විරෝධය දක්වමින්, එම කොමියුනිස්ට් රාජ්‍යවල අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා සැලකිය යුතු මැදිහත්වීමක් සහ ජාත්‍යන්තර වශයෙන් අදහස් දැක්වීමක් සිද්ධ කළ දේශපාලනඥයෙකු, විද්වතෙකු විධියටත් එතුමා පිළිබඳව සඳහන් කරන්න අපට පුළුවන්කම තිබෙනවා.

අප සිදු කළ විමර්ශන තුළින් අපට පැහැදිලි වුණා, එතුමාගේ පාර්ලිමේන්තු සේවා කාලය තුළ කමිටු ගණනාවකට එතුමා තම දායකත්වය ලබා දී තිබෙන බව. එතුමා තේරීම් කාරක සභාව තුළ විවිධ ප්‍රවීණ දේශපාලනඥයන් සමඟ කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මෑත කාලීනව ඇති වුණු කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ පවා එතුමා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතුවලට සක්‍රියව දායකත්වය ලබා දී තිබෙනවා. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාවේ සිදු වී තිබුණු අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත් කළ විමර්ශන කමිටුවේදී එම විමර්ශන මෙහෙයවීම සඳහා ද එතුමා දායකත්වය සපයා දී තිබෙනවා. මේ විධියට බැලුවාම එතුමා පොදු ජන සේවාවේදී පමණක් නොව ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී ද, ජාතික සහ ජාත්‍යන්තර දේශපාලන භාවිතයේදී ද ඍජු ලෙස තමන්ගේ ඥානමය හැකියාවන් ආයෝජනය කළ ඉතා දක්ෂ වාගේම ප්‍රායෝගික තලයේ දේශපාලනඥයෙකු විධියටත් හඳුන්වන්න පුළුවන්.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක යෝජනාව ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ, එතුමාගේ පවුලේ උදවියටත්, ඒ වාගේම එතුමාගේ ඥාති හිතෛෂීන්, අසල්වාසීන් ඇතුළු සියලු දෙනාටත් අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව අත් වේවා කියාත් ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

[අ.භා. 1.49]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන අද දිනයේ මම මුලින්ම කැමැතියි, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා ගැන කථා කරන්න. ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා තමන්ගේ දේශපාලන ජීවිතය පළාත් පාලන ආයතන ක්ෂේත්‍රය තුළ දස වසරක නගරාධිපති සේවාවකින් ආරම්භ කළා. එතුමා 1989 වසරේදී දිගාමඩුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතැන් සිට 2001 වසර දක්වා අවස්ථා ගණනාවකදී පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට එතුමාට හැකියාව ලැබුණා. මට මතක් වෙනවා, විශේෂයෙන්ම දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ දයාරත්න මැතිතුමාගේ නායකත්වයෙන් චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාත්, බක්මීවැව මැතිතුමාත් අම්පාර ආසනය ඉතා විශිෂ්ට සංවර්ධනයක් කරා ගෙන යන්නට කටයුතු කළ ආකාරය. එහිදී ගලප්පත්ති මැතිතුමා ඒ සඳහා ඉහළින්ම දායකත්වය ලබා දුන්නා. ඉන් පසුව නැඟෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කළ එතුමා, පළාත් සභාවේ සභාපතිවරයා හැටියටත් විශිෂ්ට නායකත්වයක් ලබා දෙමින් අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාවට සුවිශේෂී සේවාවක් ඉෂ්ට කළා. පොඩි තැනින් ආපු පුද්ගලයකු හැටියට හැම මොහොතකදීම පොදු ජනතාවත් සමඟ ඉතාම සමීප සම්බන්ධතාවක් ඇති කරගෙන ජන සමාජයේ සියලු ක්ෂේත්‍ර නියෝජනය වන ආකාරයට විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරන්නට ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා කටයුතු කළා. එතුමාගේ හදිසි වියෝව පිළිබඳව අපගේ බලවත් කනගාටුව, සාතිශය සංවේගය ඒ පවුලේ සියලුදෙනාට මේ අවස්ථාවේ දී පළ කරන්නට අප කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මැතිතුමා ගැන කියනවා නම්, එතුමාගේ සමීපතමයන්ගෙන් ලැබුණු තොරතුරුවලට අනුව එතුමාගේ දේශපාලන මූලාරම්භය වෙන්නේ දකුණේ දේශපාලනය; දක්ෂිණාංශික දේශපාලනය. හැබැයි, ඒ මතවාදයෙන් ඉවත් වෙලා ශිෂ්‍ය දේශපාලනය තුළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රබල සාමාජිකයකු හැටියටත්, පසු කාලීනව ඒ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා හැටියටත් කටයුතු කරමින් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට ගෙන ඒමට ඒ කැපවීම කරපු පුද්ගලයා හැටියටත් එතුමා ජන සමාජයට ලොකු වටිනාකමක් - අගයක් - එකතු කළා. 1999 ජනාධිපතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයා බවට පත් වෙලා 344,000කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගෙන එතුමාගේ දේශපාලන ගමන, ඒ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ගමන තවදුරටත් ශක්තිමත් කර ගත්තා. 2000 වසරේදී පළමුවරට පාර්ලිමේන්තුවට පිවිසුණු එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟත් එකතු වෙලා, ඉන්පසුව එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකු හැටියට නගර සභාවේ සභාපති ධුරය හොබවමින් පානදුර පුරවරය කේන්ද්‍ර කරගෙන වැදගත් ජනතා සේවාවක් ඉෂ්ට සිද්ධ කරන්නට කටයුතු කළා. ගරු නන්දන ගුණතිලක මැතිතුමාගේ හදිසි අභාවය පිළිබඳව අපගේ සාතිශය සංවේගය සහ බලවත් කනගාටුව ඒ පවුලේ සියලු දෙනාට මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා මේ රටේ නිදහස් අධ්‍යාපනය තුළිනුත්, විදේශ අධ්‍යාපනය තුළිනුත් අපේ රටට බිහි වුණු උගත්, බුද්ධිමත් ජනතා පුත්‍රයකු හැටියට හඳුන්වන්න පුළුවන්.

වෛද්‍යවරයකු හැටියට, වෘත්තීයවේදියකු හැටියට වාගේම පසුකාලීනව විද්‍යා ක්ෂේත්‍රයේ වැඩ කටයුතු රැසක් කරමින්, අමාත්‍යවරයකු හැටියටත් සුවිශේෂී සේවාවක් ඉටු කරමින් අප රටේ ජන සමාජය සුඛිත මුදිත කරවන්නට වාම ව්‍යාපාරයේ නායකයකු හැටියටත් එතුමා කළ සේවාව අපි මේ අවස්ථාවේ ලොකු අගය කිරීමකට ලක් කරනවා. දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, අවස්ථා ගණනාවකදී රජය නියෝජනය කරමින් ඇමතිවරයකු හැටියට රටේ රාජ්‍ය පාලනය, ප්‍රතිපත්ති සම්පාදනය යහපත් දිශානතියකට යොමු කරන්නට එතුමා දැවැන්ත කාර්යභාරයක් ඉෂ්ට සිද්ධ කළා.

තිස්ස විතාරණ මැතිතුමාගේ හදිසි වියෝව පිළිබඳවත් අප සියලුදෙනාගේම බලවත් කනගාටුව, සාතිශය සංවේගය මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එස්.සී. මුතුකුමාරණ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් පළමුව කලාවැව ආසන බලමණ්ඩලයේ උපසභාපති හැටියට, ඉන් පසුව තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයකු හැටියට, ඉන් අනතුරුව උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට, සභානායක හැටියට, කෘෂිකර්ම ඇමතිවරයා හැටියටත්, ඉන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට හා නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හැටියටත් නියෝජිත දේශපාලනයේ පහළම තලයේ සිට ඉහළම තලයට පැමිණි පොදු ජනතාවගේ සිතුම්-පැතුම් හඳුනාගත් පුද්ගලයෙකු හැටියට කටයුතු කරමින් ලොකු සේවාවක් ඉෂ්ට සිද්ධ කළා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩකටයුතුවලදී බොහොම උනන්දුවෙන් කටයුතු කරමින් එතුමා වැදගත් සේවයක් ඉෂ්ට කළා. මුතුකුමාරණ මැතිතුමාගේ හදිසි වියෝව පිළිබඳවත් අප සියලුදෙනාගේ බලවත් ශෝකය සහ සාතිශය සංවේගය මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා 1988දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කැකිරාව ආසන සංවිධායක හැටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයේ භාණ්ඩාගාරික හැටියට, කැකිරාව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කළා. ඉන් පසුව 1989දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට පත් වෙලා කැකිරාව කේන්ද්‍ර කරගෙන අනුරාධපුර දිස්ත්‍රික්කයටත්, රජරට පුරවරයටත් ලොකු සේවාවක් ඉෂ්ට සිද්ධ කරපු ජනතාවාදී දේශපාලනඥයෙකු හැටියට අපට හඳුන්වන්නට පුළුවන්. හැම විටකදීම ජනතාවත් සමඟ කටයුතු කරමින් ජන දුක හඳුනාගෙන, ජනතාවගේ ගැටලු විසඳන්නට එතුමාගේ අවධානය යොමු කළා. ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාගේ අභාවය පිළිබඳවත් අප සියලුදෙනාගේම බලවත් කනගාටුව, සාතිශය සංවේගය මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයෙන් මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ කනගසබෙයි තන්මන්පිල්ලෙයි මැතිතුමාගේ හදිසි අභාවය පිළිබඳව අපි බලවත් සේ කනගාටු වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියටත්, ජනතාවට සමීපතම පුද්ගලයෙකු හැටියටත් එතුමා මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවට දැවැන්ත මෙහෙවරක් ඉෂ්ට සිද්ධ කළා. නැගෙනහිර විශ්වවිද්‍යාලය තුළ වෛද්‍ය පීඨයක් ස්ථාපනය කිරීමට, කලවංචිකුඩි ප්‍රදේශයේ වෘත්තීය පුහුණු ආයතනයක් USAID ආයතනයත් සමඟ ඒකාබද්ධ වී ස්ථාපනය කිරීමට, මඩකලපුව උසස් තාක්ෂණ ආයතනය වෙනුවෙන් ඉඩම් ලබා ගැනීමට එතුමා කටයුතු කළා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ නියෝජිතයකු හැටියට කටයුතු කරමින් මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා MRI scanners ලබා ගැනීම වැනි ජනතා කේන්ද්‍රීය වැඩසටහන් රැසකට එතුමා දැවැන්ත දායකත්වයක් ලබා දුන්නා.

එතුමා ඉෂ්ට සිද්ධ කරපු ඒ සේවාව අපි මේ අවස්ථාවේ බොහොම ගෞරවයෙන් මතක් කරමින් එතුමාගේ අභාවය පිළිබඳව අප සියලුදෙනාගේ සාතිශය සංවේගය සහ බලවත් ශෝකය මේ අවස්ථාවේදී පළ කරන්න කැමැතියි.

ඒ අතරම මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. ශ්‍රී ලංකා ජනරජ දිනය සෑම වසරකම මැයි මාසයේ 22වැනි දිනට යෙදී තිබෙන මොහොතේ බ්‍රිතාන්‍ය කිරීටයට යටත්ව පැවැති ඩොමිනියන් තත්ත්වයෙන් මිදී ශ්‍රී ලංකාව පූර්ණ ස්වාධීන සහ ස්වෛරී ජනරජයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් 1972 මැයි 22වැනි දින ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සම්මත කරගත් දිනය අද වාගේ දවසක්. අද දවස අපි බොහොම ගෞරවයෙන් මතක් කරන්නට ඕනෑ. 1815දී උඩරට ගිවිසුම හරහා ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් කර, එතැන් පටන් මෙරට පරමාධිකාරි බලය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය වෙත පැවරුණු අවස්ථාවේ විශේෂයෙන්ම රට පාලනය කෙරුවේ බ්‍රිතාන්‍ය සිහසුන දරන තැනැත්තා හෝ තැන්තිය විසින් පත් කර එවනු ලැබූ ආණ්ඩුකාරවරයෙක් මඟින්. 1948 පෙබරවාරි 4වැනි දින ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍යයෙන් ලැබුණු නිදහස ඩොමිනියන් තත්ත්වයේ නිදහසක් වුණා. තවදුරටත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා වුණේ බ්‍රිතාන්‍ය කිරීටයෙන් පත් කරන ලද ආණ්ඩුකාරවරයෙක්. මෙරට ඇතැම් කරුණු පිළිබඳව අවසන් බලය පැවරී තිබුණේ එංගලන්තයේ ආයතනවලට. බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් ආණ්ඩුකාරවරයා අත්සන් කරන තුරු පාර්ලිමේන්තුවේ ඒකමතිකව සම්මත කරන පනතක් වුවද නීතිගත වුණේ නැහැ. විශේෂයෙන්ම මහජන ආරක්ෂක පනත ක්‍රියාත්මක කර හදිසි නීතිය පැනවූ අවස්ථාවේදී සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වුණේ ඒ ආණ්ඩුකාරවරයා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ උපරිමාධිකරණ බලය පැවතුණේ එංගලන්තයේ Privy Council එකට. මෙම තත්ත්වයෙන් මිදී ශ්‍රී ලංකාව මුළුමනින්ම පූර්ණ නිදහස් හා ස්වාධීන රජයක් බවට පත් වුණේ 1972 මැයි 22වැනි දිනයි. ඒ, අද වගේ දවසකයි. ඒ, එවකට සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ප්‍රමුඛ රජය මඟින් සම්මත කරගත් ජනරජ ව්‍යවස්ථාව මඟින්. එම නිසා ශ්‍රී ලංකාව ජනරජයක් බවට ප්‍රකාශයට පත් කරලා අදට වසර 54ක් වන මොහොතක අපි අපේ රට පිළිබඳව බොහොම ගෞරවයෙන් හා ආඩම්බරයෙන් රටේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, දේශපාලන නිදහස, ඒකීයභාවය සුරක්ෂා කිරීමට කැප වෙනවාය කියා ප්‍රකාශ කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

[පි.ව. 2.03]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் இருவர் தொடர்பாக எங்களுடைய அனுதாபத்தைப் பதிவு செய்கின்ற நோக்கத்தோடு நான் பேச விரும்புகின்றேன். முதலாவதாக, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் மட்டக்களப்பு மாவட்ட முன்னாள் பாராளுமன்ற உறுப்பினர் ரீ. கனகசபை ஐயா சம்பந்தமாகக் குறிப்பிட விரும்புகின்றேன். அவர் முதல் தடவையாகப் பாராளுமன்றத்துக்கு தமிழ்த் தேசியக் கூட்ட மைப்பின் உறுப்பினராகத் தெரிவு செய்யப்பட்டபொழுது, நானும் கூட்டமைப்பில் அங்கம்வகித்த ஒரு பங்காளிக்

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

கட்சியின் உறுப்பினராக இருந்தேன். 2004ஆம் ஆண்டு நடைபெற்ற பாராளுமன்றத் தேர்தலில் மட்டக்களப்பு மாவட்டத்திலிருந்து அமோக வெற்றிபெற்ற ஓர் உறுப்பினராக அவர் தெரிவு செய்யப்பட்டிருந்தார். தேர்தல் அரசியலுக்குள் நுழைவதற்கு முன்பு, அவர் அரச சேவையில் நீண்ட காலமாக சேவையாற்றியிருந்தவர்.

அவருடைய அரச சேவைக் காலத்தை எடுத்துப்பார்த்தால், அவர் மக்களால் மிகவும் நேசிக்கப்பட்டவராக இருந்தார்; மக்களுக்கு இருக்கக்கூடிய சுமையைக் குறைக்க வேண்டு மென்ற நோக்கத்தோடு அவருடைய சீவிய காலம் முழுக்கப் பாடுபட்டவர். மக்களை நேசித்த சேவையாளன் என்ற அவருடைய அந்தப் பண்பு காரணமாக, தமிழ் தேசியக் கூட்டமைப்போடு அவரைக் கட்டாயம் சேர்க்க வேண்டும் என்ற சிந்தனை தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்துக்கு, குறிப்பாக தேசியத் தலைவர் மேதகு பிரபாகரன் அவர்களுக்கு இருந்ததன் காரணமாகவும், அத்தோடு ஏற்கனவே அவர் செய்த சேவைகள் காரணமாக அவர்மீது மிகப்பெரிய மதிப்பை தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பங்காளிக் கட்சிகள் அனைத்தும் வைத்திருந்ததன் காரணமாகவும் அவர் அக் கூட்டமைப்பில் சேர்க்கப்பட்டு, இறுதியில் அமோக வெற்றியும் பெற்றார்.

அவருடைய அரசியல் வாழ்க்கை என்பது உண்மை யிலேயே 2004ஆம் ஆண்டிலிருந்து 2010ஆம் ஆண்டு வரை மட்டும்தான் இருந்தது. அவர் பாராளுமன்ற உறுப்பினராக அந்த ஆறு வருடங்கள்தான் இருந்தவர். அந்த ஆறு வருடங்களை நீங்கள் எடுத்துப் பார்த்தால், அது தமிழ்த் தேசிய அரசியலில் மிகவும் சவாலுக்குரிய வருடங்களாகும். அதிலும் குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தைச் சார்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினராக அவர் இருந்த காலமானது, பிரதேசவாதம் தலைதூக்கியிருந்த ஒரு கால கட்டமாகும். "இணைந்த வட, கிழக்கு" என்ற தமிழ்த் தேசிய நிலைப்பாட்டுக்கு அல்லது தமிழர் தாயகக் கோட்பாட்டுக்கு நேர்மையாகவும் விசுவாசமாகவும் இருக்க விரும்பிய தரப்புகளை, அன்று தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தி லிருந்து பிரிந்து சென்ற தரப்புகள் - ஒட்டுக்குழுக்கள் - படுகொலை செய்துகொண்டிருந்த காலகட்டமாகும். அன்றைக்குத் தமிழ்த் தேசியச் சிந்தனைக்கு நேர்மாறாகச் செயற்படுவதற்கு பிரதேசவாதம் மிகப்பெரிய அளவில் தூண்டிவிடப்பட்டிருந்தது. அப்படிப்பட்ட ஒரு சூழலிலும், அமரர் கனகசபை ஐயா தமிழ்த் தேசியத்தை மிகவும் நேசித்த ஒருவர்; பிரதேசவாதத்தை முற்றாக நிராகரித்தவர். தமிழ் பேசும் மக்களுடைய அந்தத் தேசத்திற்குள்ளே வேறுபாடுகள் இருந்தும்கூட, குறிப்பாக எங்களுடைய முஸ்லிம் சகோதரர் களுடனும் ஏன், சிங்கள மக்களுடனும் எங்களுக்கு வேறுபாடுகள் இருந்தும்கூட, அந்த மக்களையும் மிகவும் மதித்த ஒரு நபர்தான் அமரர் கனகசபை ஐயா அவர்கள்.

அவர் எந்தளவு தூரத்துக்கு தமிழ்த் தேசமும் தமிழர் அடையாளமும் வட, கிழக்கில் பாதுகாக்கப்பட வேண்டும் என்பதில் உறுதியாக இருந்தாரோ, அதேபோன்று தமிழ்த் தேசம் சுதந்திரமடைகின்றபொழுது அல்லது அதனுடைய உரிமைகள் முழுமையாகப் பேணிப் பாதுகாக்கப்படுகின்ற போது அந்தத் தமிழ் தேசத்துக்குள்ளே -இணைந்த வட, கிழக்குக்குள்ளே -சில வேளைகளில் சிறிய எண்ணிக்கையில் இருக்கக்கூடிய முஸ்லிம் மக்களாக இருந்தாலும் சரி, அங்கு குடியேற்றப்பட்ட சிங்கள மக்களாக இருந்தாலும் சரி, அவர்கள் தமிழ்த் தேசத்தில் தொடர்ந்து வாழ விரும்புகின்ற பட்சத்தில் அவர்களுக்கும் அனைத்து உரிமைகளும் வழங்கப்பட்டு, அவர்கள் பாதுகாக்கப்பட வேண்டும் என்பதிலும் மிகவும் தெளிவாக இருந்தார். குறிப்பாகச் சொன்னால், அவர் மிகவும் மதிக்கப்படக்கூடிய ஒரு மிதவாத அரசியல் சிந்தனை கொண்ட நேர்மையான ஒருவராவர். நான் அவர்மீது கூடுதலான மதிப்பு வைத்திருப்பதற்கு பிரதான காரணம் அவருடைய நேர்மைத் தன்மையே ஆகும்.

2009ஆம் ஆண்டு மே மாதம் 18ஆம் திகதிக்குப் பிற்பாடு தமிழ்த் தேசியக் கூட்டமைப்புக்குள்ளே பல கருத்து வேறுபாடுகள், கொள்கை ரீதியான மாற்றங்கள் போன்றவை விவாதிக்கப்பட்ட ஒரு காலகட்டத்தில், அமரர் கனகசபை ஐயா அவர்களுடைய பங்களிப்பு மிகவும் பாரியளவில் இருந்தது. நீதி, நியாயத்தின் அடிப்படையிலேயே அவருடைய கருத்துகள் அமைந்திருந்தன. ஆனால், அந்தக் கொள்கை ரீதியான வேறுபாடுகள் காரணமாக பிளவுகள் ஏற்படத் தொடங்கிய சூழலில், அவர் தொடர்ந்தும் அரசியலில் குறிப்பாகத் தேர்தல் அரசியலில் ஈடுபட விரும்பாமல் ஒதுங்கிக் கொண்டார். ஏனென்றால், தமிழ்த் தேசியத்தை நேசித்த ஒருவர் என்ற வகையிலே, அந்தக் கொள்கை மாற்றங்களைத் தாங்க முடியாமல்தான் அவர் ஒதுங்கினார். அந்தப் பண்பும் நேர்மைத் தன்மையும்தான் எம்முடைய அமைப்பு அவர்மீது மதிப்பு வைத்திருப்பதற்கான பிரதான காரணம் என்று நான் நினைக்கிறேன். அந்த வகையிலே, தமிழ்த் தேசியத்துக்கு அவருடைய இழப்பு ஈடுசெய்ய முடியாத ஒரு பேரிழப்பாகும். அவருடைய குடும்பத்தினருக்கும் உறவினர்கள் அனைவருக்கும் எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களைப் பதிவுசெய்ய விரும்புகின்றோம்.

Now, Sir, I would like to pay my respects and express condolences on the death of the Hon. (Prof.) Tissa Vitarana. I happened to be a Member of Parliament when he was also a Member of Parliament during my first stint from 2001 to 2010.

Hon. Deputy Chairperson of Committees, the Hon. (Prof.) Tissa Vitarana was a colossus in the Left Movement as the long-time Leader of the Lanka Sama Samaja Party. But, I think he would, probably, be most known as the last of the old intellectuals within the Left Movement. He contributed well beyond his expertise professionally. Politically, he was someone who was so well-read that he could actually contribute intellectually well beyond the boundaries or what you would expect a Left leader to market.

Madam, for me, the key moment which made me respect him more - it might not be a very important event in the larger scheme of things - was this. I have known of him because of his interest in wanting to find a solution to the ethnic conflict, being a moderate amongst the Sinhala leaders who always tried to find common ground with the Tamil People. So, all of those qualities are things that we, as Tamil nationalists who have been trying hard in our own way to find a solution to our national question, would respect. But, the one incident that, I think, made him stand out was when - he was a very senior Minister during Gotabaya Rajapaksa's time and when the COVID-19 struck - because of his professional expertise, he did not agree with the Government's position at that time with regard to cremating COVID-infected bodies, especially Muslim *janazahs*. He was

someone who was very critical of that policy. At a time when Gotabaya Rajapaksa had made a resounding victory and when everyone, whether it be Government Members or even some Members in the Opposition, did not want to cross his path, the Hon. (Prof.) Vitarana was a man who was willing to stand up for what he believed in was something wrong that the Government was doing. I thought that was a quality that had the potential to do a lot of good, and true to those qualities of his and in that light, he would always be respected.

Madam, I would like to pay my respects to his family, his party and to all his supporters today.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 2.16]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණනක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු හිටපු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු පිළිබඳව අද දින ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

මුලින්ම මම කැමැතියි, අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා ගැන කථා කරන්න. චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා තමන්ගේ ජීවිත කාලය පුරාම දේශපාලනයේ නියැළුණු පුද්ගලයෙක්. එතුමා ඉස්සෙල්ලාම සමුපකාරයක සභාපතිවරයෙකු විධියට තමන්ගේ දේශපාලන ජීවිතය ආරම්භ කර, 1979 වර්ෂයේදී අම්පාර නගර සභාවේ සභාපතිවරයා විධියට පත් වුණා. එදා ඉඳලා අවසාන මොහොත දක්වා අවුරුදු 47ක් එතුමා දේශපාලනයේ නියැළී සිටියා. අම්පාර නගර සභාවේ නගරාධිපතිවරයා විධියට ඒ නොදියුණු අම්පාර දියුණු කරන්න එතුමා විශාල සේවයක් කළා. මට මතකයි, 1989දී එතුමා අපත් එක්කම පාර්ලිමේන්තුවට ආවා. අම්පාර දිස්ත්‍රික්කයට එදා නායකත්වය දුන් පී. දයාරත්න මැතිතුමාත්, නිහාල් බක්මීවැව මැතිතුමාත්, එතුමාත් එකට තරග කරලා ඒ තුන්දෙනාම පාර්ලිමේන්තුවට ආවා. එතුමා 2001 වෙනකල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කළා. ඒ කාලය තුළ එතුමා දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන කාර්යයන් විශාල ප්‍රමාණයක් ඉටු කළා. විදුලිය ලබා දීම, මංමාවත් හැදීම, පාසල් ඉදිකිරීම වාගේම ගල්ඔය ව්‍යාපාරය පුනරුත්ථාපනය කරන වැඩ පිළිවෙළටත් එතුමා සම්බන්ධ වුණා.

බොහොම හොඳ මිත්‍රයෙකු විධියට අපි එදා පාර්ලිමේන්තුවේදී එතුමාව ආශ්‍රය කළා. ඊට පසු එතුමා දේශපාලනය අත්හැරියේ නැහැ. එතුමා නැඟෙනහිර පළාත් සභාවට තේරිලා 2008 වර්ෂයේ ඉඳලා දිගටම නැඟෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කළා. නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා විධියට අවසාන මොහොත දක්වාම එතුමා කටයුතු කළා. මේ නිසා ඒ ප්‍රදේශයට විශාල සේවයක් කරපු මන්ත්‍රීවරයෙකු විධියට එතුමාව හඳුන්වන්න පුළුවන්. ගල්ඔය ව්‍යාපාරයත් එක්ක දකුණු පළාතෙන් අම්පාරට ඇවිල්ලා, අම්පාර ප්‍රදේශයේ දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළටම යන්න එතුමාට අවස්ථාව ලැබුණා. මම මේ වෙලාවේ එතුමාගේ ආදරණීය භාර්යාවටත්, දරුවන්ටත් අපේ කනගාටුව ප්‍රකාශ කරන ගමන්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා කියන්නේ, මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙනුත්, කොළඹ ආනන්ද විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලබා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහොම දස්කම් දක්වපු කෙනෙක්. එතුමා ලංකා විශ්වවිද්‍යාලයෙනුත්, ලන්ඩන් විශ්වවිද්‍යාලයෙනුත් මහාචාර්ය උපාධිය දක්වා ඉගෙන ගත්තා. එතුමා දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක්, හොකී ක්‍රීඩකයෙක්, රග්බි ක්‍රීඩකයෙක්. ඒ වාගේම රටට සේවයක් කරන්න ඕනෑය කියලා කල්පනා කළ එතුමා වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ නියැළුණා. එතුමා ජීවිතයේ අවසන් කාලය දක්වාම ලංකා සමසමාජ පක්ෂයේ නායකයා විධියට කටයුතු කළා. එතුමා අමාත්‍යවරයෙක් විධියට විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා.

ඒ වාගේම, අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මන්ත්‍රීමා පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. එතුමා දේශපාලනය පටන් ගත්තේ ජනතා විමුක්ති පෙරමුණෙන්. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්වරයා විධියටත්, ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපති ධුර අපේක්ෂකයා විධියටත් එතුමා කටයුතු කළා. අපි කනගාටු වෙනවා, එතුමාත් එක්ක සමකාලීන දේශපාලනයේ නියැළුණු එකම පුද්ගලයෙක්වත් එතුමා ගැන කථා කරන්න අද මේ ස්ථානයේ නොමැති වීම ගැන. දේශපාලනයේ සදාකාලික මිත්‍රයෝත් නැහැ, සදාකාලික හතුරෝත් නැහැ. හැබැයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ව සිටි එතුමා තමන් යන දේශපාලන මඟ වැරැදියි කියලා තේරුම් අරගෙන, තමන්ගේ අන්තිම කාලය වනවිට එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරලා නගරාධිපතිවරයෙක් වශයෙන් තේරී පත් වුණා. මෑත කාලයේදී එතුමා අවසන් ගමන් ගියා. ඒ සම්බන්ධවත් යම් කුතුහලයක් තිබෙනවා. කෙසේ වෙතත්, එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එම භාර්යාවටත්, දරුවාටත් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඊළඟට, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා පිළිබඳවත් මම වචන කිහිපයක් කථා කළ යුතුයි. එතුමා පළාත් සභාවේ විපක්ෂ නායක විධියටත්, සභානායක විධියටත්, ඒ වාගේම ඇමතිවරයෙක් විධියටත් කටයුතු කරලා, 2010 වර්ෂයේදී පාර්ලිමේන්තු

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

මන්ත්‍රීවරයෙක් විධියට තේරී පත් වුණා. පසුව එතුමා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළා. එතුමා 2025 වර්ෂයේදී ජීවිතයෙන් සමු ගත්තා. එතුමාගේ අභාවය පිළිබඳව එම පවුලේ උදවියට අපේ කනගාටුව ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

අභාවප්‍රාප්ත ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා ගැනත් මම කියන්න කැමතියි. එතුමා බොහොම තරුණ කාලයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට පත් වුණු බව මට මතකයි. එතුමාගේ පියාගේ ආභාසයෙන් එතුමා, අපිත් එක්ක පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ පියා වන ඒ.එම්. ජිනදාස මැතිතුමා 1970-77 කාලයේ මහජන මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කළා. ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා 1989 වර්ෂයේදී පළමු වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට පත් වුණා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ ක්‍රියාකාරී නායකයෙක් විධියට කටයුතු කළා. ඒ වාගේම එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයට විශාල සේවයක් කළා. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ අභාවය වෙනුවෙන් එම පවුලේ උදවියට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

අභාවප්‍රාප්ත ගරු ටී. කනගසබෙයි මැතිතුමා ගැනත් මම කියන්න කැමතියි. එතුමා රජයේ සේවකයෙක් විධියට කටයුතු කරලා, ඉන් පසුව දීර්ඝ කාලයක් දේශපාලනයේ නිරත වෙලා, 2004 සිට 2010 වනතුරු පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා ඒ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල සේවයක් කරපු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එම පවුලේ උදවියට කනගාටුව ප්‍රකාශ කරමින්, මගේ ආගමේ විධියට එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

[අ.භා. 2.23]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රථමයෙන්ම, අද දවසේ ශෝක ප්‍රකාශ ඉදිරිපත් වන අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාගේම පවුල්වල ඥාතීන්ට සහ හිතවතුන්ට මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

මම පළමුවෙන්ම කැමතියි, අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ හිටපු අමාත්‍යතුමා පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න. එතුමා පාසල් අධ්‍යාපනය ලැබුවේ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන්. මමත් ත්‍රිත්ව විද්‍යාලයටයි ගියේ. ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා මේ රටට කරපු සේවය පිළිබඳව සලකන විට එතුමා ගිය පාසලට මටත් යන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ගරු තිස්ස විතාරණ හිටපු ඇමතිතුමා කියන්නේ, 1948 වර්ෂයේ සිට පවතින දෙමළ ජනතාවගේ ජනවාර්ගික අර්බුදය පිළිබඳව ඉතාම ප්‍රගතිශීලී කෝණයකින් බලපු පුද්ගලයෙක්. ඒ, මම දේශපාලනයට පැමිණෙන්නත් පෙර සිටයි.

ගරු තිස්ස විතාරණ මැතිතුමාට APRC එකේ සභාපති ධුරයත් හිමි වුණා. මම හිතන විධියට දෙමළ පක්ෂවල නියෝජිතයන් නැතිව දකුණේ පක්ෂවල මතය සලකා බලන්න ඕනෑ කියලා එවකට සිටි ජනාධිපතිවරයා එම APRC එක පත් කළත්, මේ APRC එක හරහා ඉතාම ප්‍රගතිශීලී, හොඳ අදහස් ඉදිරිපත් වුණා; they expressed very positive ideas. The APRC Report was a very progressive report. The Hon. (Prof.) Tissa Vitarana was the Chairman of that Committee and that Committee came up with a very progressive report. However, unfortunately, later, he was not even allowed to publish some contents of that Report; එතුමා හදපු වාර්තාව ඉදිරිපත් කරන්න එතුමාට එවකට අවස්ථාව ලැබුණේ නැහැ. එතුමා වාගේ පුද්ගලයෙක් සකස් කරපු වාර්තාව ඉදිරිපත් කරලා, එම වාර්තාවේ recommend කර තිබුණු දේවල් කරලා තිබුණා නම් අදටත් විසඳිලා නැති යම් යම් ප්‍රශ්නවලට අපට උත්තර හොයා ගන්න තිබුණා. එපමණක් නොවෙයි, මම පාර්ලිමේන්තුවට පැමිණියාට පසුව 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එතුමාත් එක්ක පාර්ලිමේන්තුවේ එකට කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. මීට මොහොතකට පෙර කථා කළ ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමාත් මේ කාරණය මතු කරලා තිබුණා.

මම හිතන විධියට, ගරු තිස්ස විතාරණ මැතිතුමා, professionally, Epidemiologist කෙනෙක්. Epidemiologist කෙනෙක් හැටියට එතුමාට අත්දැකීම් රාශියක් තිබුණා, බෝවන රෝග - infectious diseases - පිළිබඳව. එම රජය සමයේදී එතුමාගෙන් මේ රටට ලබා ගන්න පුළුවන් දැනුම සහ සේවය හරියට ලබා ගත්තාද කියන කාරණය පිළිබඳව අපට විශාල සැකයක් තිබෙනවා. හැබැයි, මීට මොහොතකට පෙර කථා කළ ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා භය වුණේ නැහැ.

கோட்டாபய ராஜபக்ஷவுடைய ஆட்சிக் காலத்திலே, இஸ்லாமிய சகோதரர்களின் சடலங்களை எரிக்கும்போது, அது தவறான ஒரு விடயம் என்றும் அதற்கு விஞ்ஞான ரீதியான எந்தக் காரணமும் இல்லை என்றும் அவர்களுடைய ஜனாஸாக்களை அடக்கம் செய்ய முடியும் என்றும் துணிச்சலாகக் கூறியவர்தான் அமரர் திஸ்ஸ விதாரன அவர்கள். அவர் தேசியப் பட்டியல் ஊடாகத்தான் பாராளுமன்றம் வந்தார். மூத்த ஒரு பாராளுமன்ற உறுப்பினராக மட்டுமல்ல, இந்த நாட்டினுடைய சிறந்த ஒரு பிரஜையாகவும் அவர் இருந்தார். அரசியல் வேறுபாடுகளுக்கு அப்பால், அவர் பிரதிநிதித்துவப் படுத்திய அதே கட்சியின் தேசியப் பட்டியல் ஊடாக பாராளுமன்றத்துக்கு வந்தாலும் கூட, அந்த நேரத்திலே அந்தச் செயற்பாடு பிழையானது என்று சொல்லி, அரச தரப்பில் அவர் பின்வரிசையிலே அமர்ந்திருந்தார்.

Hon. Presiding Member, when we wanted the PTA repealed, the Hon. M.A. Sumanthiran and I led a campaign to collect signatures across the country. We travelled to all the 25 districts, across the country. We got signatures from leaders of political parties. So, I had the privilege of going to the Hon. (Prof.) Tissa Vitarana's house to get his signature and had a very cordial discussion with him. I still remember him highlighting the importance of repealing the PTA. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරන්න ඕනෑ, ඒක අහෝසි කරන්න ඕනෑ, ඒක වැරදි දෙයක් කියන එක එතුමා කිව්වා. එතුමා එවකට ආණ්ඩු පක්ෂයේ හිටියත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන්න ඕනෑ කියලා අපිත් එක්ක එකතු වෙලා අත්සන් තබන තරමට එතුමාගේ දේශපාලනය ඉතාම වැදගත් වුණා. He was an honest politician.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාත් නැඟෙනහිර පළාත් සභාවේදී මට අවස්ථා කිහිපයකදීම හමු වෙලා තිබෙනවා. මම නැඟෙනහිර පළාතේ දේශපාලන කටයුතු කරන නිසා එතුමා ගැන දන්නවා. එතුමාත් අපිත් එක්ක ඉතාම හිතවත්කමින්, ඕනෑකමින් වැඩ කරපු පුද්ගලයෙක්. මට මතක හැටියට, එතුමා ජීවිතක්ෂයට පත් වෙනකල්ම නැඟෙනහිර පළාත් සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කළා. ඒක බොහොම turbulent පළාත් සභාවක්. මොකද, ඒ පළාත් සභාවේ යම් කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ඇමති කෙනෙක් හිටියා. ඊට පස්සේ ඒ පළාත් සභාවේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ මහ ඇමති කෙනෙක් හිටියා. එවකට TNA පක්ෂයේ මන්ත්‍රීවරු අමාත්‍යාංශ දැරුවා. එවන් තත්ත්වයක් යටතේදීත් එතුමා ඒ සේවාව හරියාකාරයෙන් කළා කියන එකත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

அடுத்து, எங்களுடைய மட்டக்களப்பு மாவட்ட மூத்த பாராளுமன்ற உறுப்பினரான அமரர் கனகசபை ஐயா பற்றிக் குறிப்பிட வேண்டும். அவருடைய குடும்பத்தினர் இன்று பாராளுமன்றத்திற்கு வருகை தந்திருந்தார்கள். நாங்கள் அவர்களையும் சந்தித்திருந்தோம். அவர்கள் பார்வையாளர் கலரியிலே இருக்கிறார்கள். முன்னாள் பாராளுமன்ற உறுப்பினர் காலஞ்சென்ற கௌரவ கனகசபை ஐயாவைப் பற்றி பேசுவதாக இருந்தால், அவர் நான் வசிக்கும் களுவாஞ்சிக்குடி கிராமத்திற்கு அருகாமையில் இருக்கும் களுதாவளையைப் பிரதிநிதித்துவப்படுத்தியவர். அவர் 2004ஆம் ஆண்டு பாராளுமன்றத்துக்குத் தெரிவுசெய்யப் பட்டவர். விருப்பு வாக்குமுறை - Preferential Vote system - வந்த காலப்பகுதியில் இருந்து, கடந்த 2024ஆம் ஆண்டு பாராளுமன்றத் தேர்தல் வரையான காலப்பகுதியை எடுத்துக் கொண்டால், மட்டக்களப்பு மாவட்டத்தினுடைய வரலாற்றிலே, அதிகூடிய விருப்பு வாக்குகளைப் பெற்ற பெருமை - record - அவரைத்தான் சாரும். 2004ஆம் ஆண்டில் அவருக்குக் கிடைத்த வாக்குகளின் எண்ணிக்கையை, அதனைத் தொடர்ந்து வந்த 2010, 2015, 2020 ஆகிய 3 தேர்தல்களிலும் வேறு எவராலும் எட்ட முடியாமல் இருந்தது. உண்மையிலே அது மிகவும் முக்கியமான ஒரு விடயம்.

இன்னுமொரு விடயத்தையும் சொல்ல வேண்டும். முதல் தடவையாக 2004ஆம் ஆண்டு பாராளுமன்றத் தேர்தலில் வெற்றிபெற்று வந்த அவர், "இதற்கு மேல் நான் தேர்தலிலே போட்டிபோட மாட்டேன்; இது என்னுடைய இறுதித் தேர்தல்" என்று சொல்லியிருந்தார். நான் அறிந்த வகையிலே, பலர் அப்படித் தேர்தல் காலத்திலே சொல்லுவார்கள். ஆனால், அதை நடைமுறைப்படுத்த மாட்டார்கள். அவர் சொன்னது போலவே ஒரேயொரு தேர்தலில்தான் போட்டியிட்டிருந்தார். 2004ஆம் ஆண்டு தேர்தலில் ஒரு வரலாற்றுச் சாதனை படைத்த அவர், அதற்குப் பிறகு எந்தவொரு தேர்தலிலும் போட்டியிடவில்லை. அதுமாத்திரமல்ல, அவருடைய பின்னணியைப் பார்க்கின்றபோது, அவர் பல நாடுகளுக்குச் சென்று அனுபவங்களைப் பெற்றிருக்கிறார். அது தொடர்பான விடயங்களை இன்று இச்சபையிலே பலர் பேசியிருந்தார்கள்.

இன்னுமொரு மிக முக்கியமான விடயம் என்னவென்றால், அவரும் 3 மொழிகளிலும் பேசக்கூடிய ஒருவர். அன்று இந்தச் சபையிலே சபாநாயகரோ, பிரதிச் சபாநாயகரோ, குழுக்களின் பிரதித் தவிசாளரோ இல்லாதிருந்த நேரத்திலே அக்கிரா சனத்திலே அமர்ந்து இந்தச் சபைக்குத் தலைமைதாங்கும் பொறுப்பை ஆற்றுவதில் அவர் மிகச் சிறப்பாகச் செயற்பட்ட தாகப் பேசப்படுகின்றது. அக்கிராசனத்தில் இருந்து இந்தச் சபையை வழிநடத்தும் பொறுப்பை மிகச் சிறப்பாகச் செய்தவர் என்பதையும் குறிப்பிட வேண்டும். அவர் செய்த சேவைகளைச் சொல்லாவிட்டால், அது அவருக்குச் செய்யும் ஓர் அநீதியாகத்தான் இருக்கும். அந்த வகையில், அவர் செய்த சேவைகளில் ஒருசிலவற்றைக் குறிப்பிடலாம் என்று நினைக்கின்றேன்.

அவர் களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலையை ஒரு பிராந்திய வைத்தியசாலையாகத் தரமுயர்த்துவதற்குப் பல நடவடிக்கைகளை எடுத்திருந்தார். அதேபோல, கிழக்கு மாகாணத்திலே Faculty of Medicine ஒன்றை உருவாக்கு வதற்கு அவருடைய பணிகள் இருந்திருக்கின்றன. அதுமாத்திர மல்ல, USAIDஉடன் தொடர்புகொண்டு 100 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டின் மூலமாக களுவாஞ்சிக் குடியிலே தற்போது இருக்கும் Vocational Training Centreஐ உருவாக்குவதற்கான projectஐ நடைமுறைக்குக் கொண்டு வந்தார். அதேபோல, Batticaloa Advanced Technological Instituteக்குத் தேவையான காணிகளை அவர் எடுத்துத் தந்திருக்கிறார்.

இதையும்விட மிக முக்கியமாக ஒன்றைச் சொல்ல வேண்டும். 20 ஆண்டுகள் கடந்தும், புதிதாக MRI scanner ஒன்று மட்டக்களப்பு போதனா வைத்தியசாலைக்கு வேண்டும் என்ற நிலைப்பாட்டில் நாங்கள் இருக்கிறோம். 2004ஆம் ஆண்டு காலப்பகுதியிலே எமக்குத் தேவைப்பட்ட MRI scannerஐப் பெற்றுத்தருவதற்கு அவருடைய முயற்சிகள் காரணமாக இருந்திருக்கின்றன. சுகாதார அமைச்சராக நிமல் சிறிபால டி சில்வா அவர்கள் இருந்த காலப்பகுதியிலே, அவருடன் இணைந்து நிகழ்வு ஒன்றை நடத்தி, அன்று அந்தத் தேவை பூர்த்தி செய்யப்பட்டது. அதாவது, அமைச்சினுடைய - ceremony - நிகழ்வொன்றை நடாத்தித்தான் அது கையளிக்கப் பட்டிருந்தது. இன்று பலருடைய முயற்சிகளால் கொண்டு வரப்படுகின்ற விடயங்களுக்குப் பலர் உரிமை கோருவார்கள்.

கனகசபை ஐயா அவர்கள் மட்டக்களப்பு மாவட்டத்துக்குச் செய்த சேவைகளைப் பற்றி பேசுவதாக இருந்தால் இன்னும் எத்தனையோ விடயங்களைப் பேசலாம். எங்களுடைய நாட்டுக்குள்ளே மாத்திரமல்ல, சர்வதேச ரீதியாகவும் அவருடைய திறமைகளை எங்களால் காணக்கூடியதாக இருந்தது. அவர் தனது 29ஆவது வயதிலே அமெரிக்காவிலே விசேட பயிற்சி ஒன்றைப் பெற்றிருக்கிறார். அதேபோல, இலங்கைத் தமிழரசுக் கட்சியைப் பிரதிநிதித்துவப்படுத்தி அவர் பல நாடுகளுக்குச் சென்று சர்வதேச நிகழ்வுகளிலும் கலந்துகொண்டு இருக்கிறார். பிரித்தானியா, சுவிட்சர்லாந்து, பிரான்ஸ், ஜெனீவா, நெதர்லாந்து, நோர்வே, இந்தியா முதலான பல நாடுகளுக்கு அரசியல் ரீதியான செயற்பாடுகளுக்காகச் சென்றிருக்கிறார். இன்று அரசியலுக்கு வருகின்ற பலர் அரசியலையே ஒரு துறையாகக் கொண்டிருக்கின்றார்கள். விவசாயத்துறையில் சிறந்த ஓர் அரச ஊழியர் என்ற அடிப்படையில், Agriculture Departmentஇல் உயர் பதவி வகித்த காலத்தில் America, Thailand, India, the Philippines போன்ற நாடுகளில் training programmesஇல் கலந்துகொண்டு இருக்கிறார்.

இறுதியாக ஒரேயொரு விடயத்தை மாத்திரம் சொல்லி என்னுடைய உரையை முடிக்கலாமென நினைக்கின்றேன். நான் பாராளுமன்றத் தேர்தலில் போட்டியிடுவதாக முடிவு எடுத்தபொழுது, அவரை நான் சந்தித்திருந்தேன். அவர் என்னை ஆசீர்வதித்து, "நீங்கள் கட்டாயம் வெற்றி பெற வேண்டும்" எனச் சொன்னார். நான் களுவாஞ்சிக்குடி கிராமத்தையும், அவர் களுதாவளைக் கிராமத்தையும் சேர்ந்தவர்கள். களுவாஞ்சிக்குடி கிராமம் தனக்கு முழுமையாக ஆதரவளித்தைப்போல, களுதாவளைக் கிராமமும் உங்களை முழுமையாக ஆதரிக்க வேண்டுமெனத் தான் விரும்புவதாகச்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

சொல்லியிருந்தார். அதேபோல, பல சந்தர்ப்பங்களில் கட்சி சம்பந்தமான விடயங்களில் அவருடைய ஆலோசனையைப் பெற்றிருந்தேன். அவர் தேர்தல் அரசியலில் இருந்து ஒதுங்கி இருந்தாலும்கூட, ஓர் ஆலோசகராக இருந்து தேவைப்படும் பொழுதெல்லாம் எந்தத் தயக்கமுமின்றி ஆலோசனைகளை வழங்கினார். அவர் மட்டக்களப்பு மாவட்டத்துக்குப் பல சேவைகளை வழங்கியிருந்ததாக நான் ஏற்கெனவே சொல்லியிருந்தேன்.

2004-2010ஆம் ஆண்டு காலப்பகுதியில் எனக்கு 14-15 வயதிருக்கும் என்று நான் நினைக்கின்றேன். அந்தக் காலப் பகுதியில் அவர் எப்படிச் சேவை செய்திருப்பார் என்பதை நான் நேரடியாக ஒரு நிகழ்வின்மூலம் கண்டுகொண்டேன். Teacher Training Collegeஇல் ஒரு பிரச்சினை ஏற்பட்டபொழுது, அவர் என்னைச் சந்திப்பதற்காக ஓரிரு ஆசிரியர்களுடன் வந்திருந்தார். அப்போது ஒருசில ஆவணங்களையும் கொண்டு வந்திருந்தார். அந்த ஆவணங்களை வாசித்த ஐந்து நிமிடங் களுக்குள்ளேயே அந்தப் பிரச்சினை என்ன என்பதை என்னால் விளங்கிக்கொள்ளக் கூடியதாக இருந்தது. அதனை வாசித்த பின்னர், அடுத்த கட்டமாக என்ன செய்யலாம் என்பதையும் அவரே சொன்னார். "தம்பி, நீங்கள் இன்னாருக்கு call பண்ணி இதனைச் சொல்லுங்கள்" என்று சொன்னார். அவ்வாறே நான் call பண்ணி அதேமாதிரி சொன்னேன். குறிப்பிட்ட நபர் சொன்ன பதிலை, கனகசபை ஐயா அவர்களுக்குச் சொன்னதற்குப் பிற்பாடு, அவர் இன்னொரு விடயத்தையும் சொல்லியிருந்தார். அதையும் நான் அதேமாதிரி செய்திருந்தேன். அவர் தன்னுடைய மகன் கிரி அவர்களையும் கூட்டிக்கொண்டுதான் வந்திருந்தார். சகோதரர் கிரி அவர்கள் தற்போது பார்வையாளர் கலரியில் இருக்கின்றார். "You have to deal with it like this, *thambi"*, என்று ஆங்கிலத்தில் சொன்னார். அதேபோல, I dealt with it and I think we were able to resolve that issue. அவர் கூறியதன்படி மேற்கொண்டதால், அந்தப் பிரச்சினையை எங்களால் தீர்க்கக் கூடியதாக இருந்தது. இது ஒரு சிறிய உதாரணம். அந்த நகர்வுகளை வைத்துப் பார்க்கும்பொழுது, அவர் USஇலே funding எடுக்கும் அளவுக்கு எப்படிச் செயற்பட்டிருப்பார் என்பது உண்மையில் எனக்கு விளங்கிக் கொள்ளக்கூடியதாக இருந்தது. தமிழ்த் தேசிய அரசியலில் அவருடைய பங்களிப்பை பற்றி பலர் பேசியிருந்தபடியால் அதைப் பற்றி நான் மீண்டும் பேச வேண்டிய அவசியமில்லை. உண்மை யிலே அவருடைய இழப்பு எங்களுடைய மண்ணுக்கும் மக்களுக்கும் கட்சிக்கும் ஈடுசெய்ய முடியாத ஒரு பாரிய இழப்பாகவே அமையுமெனச் சொல்லி, என்னுடைய இந்த உரையை முடிக்கின்றேன். நன்றி!

[பி.ப. 2.38]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மறைந்த உறுப்பினர்களுக்கான அனுதாபப் பிரேரணை நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. அந்த வகையில், முன்னாள் பாராளுமன்ற உறுப்பினர் அமரர் கனகசபை ஐயா அவர்களின் மறைவு குறித்து இந்தச் சந்தர்ப்பத்தில் என்னுடைய பதிவுகளைச் செய்யக் கிடைத்த வாய்ப்புக்கு நன்றி! தான் உரையாற்றவிருந்த நேரத்தை எனக்கு வழங்கிய கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்களுக்கும் என்னுடைய நன்றி!

தமிழ்த் தேசியக் கூட்டமைப்பின் மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினராக 2004 தொடக்கம் 2010 வரை கடமையாற்றிய நேர்மையான மனிதரான மறைந்த தன்மன்பிள்ளை கனகசபை அவர்களின் இழப்பு எமக்கு மிகுந்த கவலையைத் தந்திருந்தது. அக்காலம் நெருக்கடிகள், அச்சுறுத்தல் நிலவிய காலப் பகுதியாகும். அந்த நேரத்தில் நான் பாராளுமன்றம் செல்லாவிட்டாலும் அவருடைய செயற்பாடுகள், அமைதியான நடத்தை தொடர்பாக நான் அறிந்துள்ளேன். கடந்த 2004ஆம் ஆண்டு மட்டக்களப்பு மாவட்டத்தில் இருந்து தெரிவான நான்கு பாராளுமன்ற உறுப்பினர்களில் அதிகூடிய விருப்பு வாக்குகளைப் பெற்றவராக கனகசபை ஐயா அவர்கள் இருந்தார். அவருடன் அரியநேத்திரன், ஜெயானந்தமூர்த்தி, தங்கேஷ்வரி மற்றும் தேசியப் பட்டியல்மூலம் மாமனிதர் ஜோசப் பரராசசிங்கம் அவர்களுமாக வரலாற்றில் தமிழ்த் தேசியக் கூட்டமைப்பில் முதல் தடவையாக மட்டக்களப்பு மாவட்டத்தில் ஐவர் பாராளுமன்றம் சென்ற வரலாறு அதுவாகும்.

அந்தத் தேர்தலில் வடக்கு மற்றும் கிழக்கில் உள்ள எட்டு மாவட்டங்களுக்கும் விடுதலைப் புலிகளின் தலைமையே வேட்பாளர்களைத் தெரிவு செய்திருந்தனர். அதில் ஒரு நிருவாக அதிகாரியாக இருந்த கனகசபை அண்ணாவையும் விடுதலைப் புலிகள் ஓர் ஆளுமை மிக்க தலைவராக அந்த நேரம் தெரிவு செய்திருந்தார்கள். அந்தக் காலம் கருணா விடுதலைப்புலிகளில் இருந்து பிரிந்த காலமாகும். கருணா, பிள்ளையான் ஆகியோரின் அச்சுறுத்தல் அதிகரித்த காலமும் அந்தக் காலம்தான். தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்களை இலக்குவைத்து கொலை அச்சுறுத்தல்கள் விடுக்கப்பட்ட ஒரு காலமாக அந்தக் காலம் இருந்தது. மாமனிதர்களான ஜோசப் பரராஜசிங்கம், ரவிராஜ், சிவநேசன் மற்றும் சந்திரநேரு ஆகிய முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் அப்போது சுட்டுக் கொல்லப்பட்டனர். அச்சம் காரணமாக தமிழ்த் தேசியக் கூட்டமைப்பின் 22 பாராளுமன்ற உறுப்பினர்களும் தமது சொந்த ஊர்களுக்கோ, மாவட்டங் களுக்கோ செல்ல முடியாமல் கொழும்பிலேயே முடங்கி யிருந்தனர். அந்த வகையில், மட்டக்களப்பு மாவட்டத்தில் தெரிவான பாராளுமன்ற உறுப்பினர்களும் சொந்த மாவட்டம் செல்ல முடியாமல் மாதிவெலவில் அமைந்துள்ள பாராளுமன்ற உறுப்பினர் விடுதியில் தங்கியிருக்க வேண்டிய ஒரு கட்டாய நிலை ஏற்பட்டது.

மஹிந்த அரசில் 2006ஆம் ஆண்டு நவம்பர் மாதம் இடம்பெற்ற வரவு செலவுத்திட்டத்திற்கு எதிராக வாக்களிக்க வேண்டாமென கனகசபை ஐயா அவர்கள் அச்சுறுத்தப் பட்டார். அவருடைய மருமகன், அரியம் அண்ணரின் சகோதரர், ஜெயானந்தமூர்த்தியின் சகோதரர், தங்கேஷ்வரி அக்காவின் செயலாளரான ஆரையம்பதி அன்புமணி ஐயா ஆகிய நால்வர் அப்போது கடத்தப்பட்டனர். இச்சம்பவத்தால் கனகசபை ஐயா அச்சத்தினால் மிகவும் சோர்வடைந்து, அரசியலே வேண்டாமென முடிவெடுத்தார். அந்தப் பயத்தினால், 2010 தேர்தலில் வேட்பாளராவதற்கு அவர் சம்மதிக்கவில்லை. அதற்குப் பின்னர் அவர் எந்தத் தேர்தல்களிலும் ஈடுபடவில்லை. அன்று அவருக்கு ஏற்பட்ட மனக்கவலை பல ஆண்டுகள் நீடித்திருந்ததை, நான் அவருடன் ஒருமுறை கதைக்கும்போது அவர் மனம் திறந்து கூறினார். அரசியலுக்கு வருவதற்கு முன்னர் மட்டக்களப்பு மாவட்ட விவசாயத் திணைக்களப் பணிப்பாளராகச் சேவையாற்றி, மக்களுடன் நேர்மையாகச் சிறந்த பணிகளைச் செய்த அவர், தனது 86ஆவது அகவையில் இறையடி சேர்ந்தார்.

அன்னாரின் பிரிவால் துயருற்றிருக்கும் குடும்பத்தினர் குறிப்பாக, அவருடைய மனைவி, பிள்ளைகள், குடும்பத்தார் அனைவருக்கும் எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை வரலாற்றில் தமிழர்கள் பல தடவை தங்களுடைய ஆணைகளை வழங்கியிருக்கின்றார்கள். மிக முக்கியமாக, தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய மக்கள் ஆணை என்பது 2004ஆம் ஆண்டு மிகத் தெளிவாக வழங்கப்பட்டிருந்தது. அவர்கள் முதலாவதாக 1977ஆம் ஆண்டு நடைபெற்ற தேர்தலில், பண்ணாகத்தில் மேற்கொள்ளப்பட்ட 'வட்டுக் கோட்டைத் தீர்மானத்தை' ஏற்று தமிழீழத்துக்காக வாக்களித் திருந்தார்கள். அதற்கான ஒரு ஜனநாயகப் பொது வாக்கெடுப்பாகவே அது இருந்தது. அதனால்தான் இன்று 50 ஆண்டுகள் கடந்தும்கூட 'வட்டுக்கோட்டைத் தீர்மானம்' என்பது தமிழீழத்துக்கான ஒரு தீர்மானமாகவே இருந்து வருகிறது. யுத்தம் முடிவுக்கு வந்த கையோடு, 2009ஆம் ஆண்டில் உலகெங்கும் வாழும் தமிழ் மக்கள் தேர்தல் மூலமாக நாடு கடந்த தமிழீழ அரசாங்கத்தைத் தேர்ந்தெடுத்தார்கள். அது மக்களால் அங்கீகரிக்கப்பட்ட ஒரு தேர்தலாக அமைந்தது. அதற்கு முன்னர் 2004ஆம் ஆண்டில் தமிழீழ விடுதலைப் புலிகளைத் தமிழர்களின் ஏகப் பிரதிநிதிகளாக ஏற்றுக் கொண்டு, அவர்களைத் தமிழர்களுடைய தலைமையாக முன்னிறுத்தி, நான்கு கட்சிகள் கூட்டாகத் தேர்தலைச் சந்தித்தன. அப்பொழுது தமிழ் மக்கள் 22 பாராளுமன்ற உறுப்பினர்களைத் தேர்ந்தெடுத்து பாராளுமன்றுக்கு அனுப்பித் தங்களுடைய ஆணையை வழங்கியிருந்தார்கள்.

இந்த வரலாறு மிக முக்கியத்துவமானது. நாங்கள் இப்பொழுதும் அதே நிலைப்பாட்டில்தான் இருக்கின்றோம். ஆனால், மாறி மாறி ஆட்சிக்கு வந்த சிங்கள அரசுகளிடமிருந்து இன்னும் ஒரு நேர்த்தியான பார்வை வெளிவரவில்லை. அதை எங்களால் புரிந்துகொள்ள முடியவில்லை. இப்பொழுதும்கூட டொலருக்கு எதிரான இலங்கை ரூபாயின் பெறுமதி வீழ்ச்சியடைந்து செல்கின்றது; பணவீக்கம் மிக மோசமாக உள்ளது. பொருளாதாரம் மிகப் பெரிய நெருக்கடியை எதிர்நோக்கியுள்ளது என மாண்புமிகு சனாதிபதி அவர்களே கூறுகின்ற ஒரு சூழலில், இனங்களை ஒற்றுமைப்படுத்தி, இனங்களுக்கிடையிலான பிரச்சினைகளைத் தீர்த்து, நியாயமான, கௌரவமான, நீடித்துநிலைக்கக்கூடிய அரசியல் தீர்வுக்காக உழைத்தவர்களில் கனகசபை ஐயாவும் ஒருவர் என்பதைக் கவனத்தில்கொண்டு, இந்த நாட்டின் பிரச்சினை யைத் தீர்ப்பதற்கு முயல வேண்டுமென்ற முக்கியமான கோரிக்கையை நான் முன்வைக்கின்றேன்.

மிக முக்கியமாக, பேராசிரியர் திஸ்ஸ விதாரண, எஸ். சீ. முதுகுமாரண, சந்திரதாச கலப்பத்தி, நந்தன குணதிலக, ஜனக் மஹேந்திர அதிகாரி போன்ற சிறந்த பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் சபையிலே இருந்திருக்கிறார்கள். அவர்களுடைய நல்லவை கெட்டவைகளுக்கு அப்பால், எல்லோரும் இணைந்திருந்தால் இந்த நாட்டின் பிரச்சினைக்கு இப்பொழுதும்கூட ஒரு தீர்வை எட்ட முடியும். எல்லோருக் குள்ளும் இருக்கின்ற அந்த நல்லுறவை வெளிப்படுத்தி சிறந்த தீர்மானங்களை எடுக்குமாறு இந்த அனுதாபப் பிரேரணையின் ஊடாக அமரர் கனகசபை ஐயா அவர்களினதும் இறந்துபோன ஏனைய ஆத்மாக்களினதும் பெயரால் நான் கேட்கிறேன்.

இந்தச் சபையிலே இருக்கின்ற சிங்களத் தலைவர்களே, சிங்களக் கல்விமான்களே மற்றும் சிங்களத் தனவான்களே, யோசியுங்கள்! இந்த நாட்டினுடைய பிரச்சினையைத் தீர்ப்பதற்கு நாங்கள் எவ்வளவுக்கு விட்டுக்கொடுத்துப் போக வேண்டும் என்பதற்கு ஒரு சிறந்த காலமாக இதை நீங்கள் எடுத்துக் கொள்ளுங்கள் என்று கூறி, அமரர் கனகசபை ஐயா அவர்களுடைய குடும்பத்தினருக்கும் பிள்ளைகளுக்கும் மீண்டும் என்னுடைய அனுதாபங்களைத் தெரிவித்து நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මහතා.

[අ.භා. 2.45]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ අවුරුදු ගණනක් සේවය කරපු මැති ඇමතිවරුන් කිහිපදෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා ගෙනැවිත් තිබෙන අද දවසේ එතුමන්ලා ගැන සිහිපත් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. පළමුවෙන්ම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න මම කැමැතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ළා බාලතම මන්ත්‍රීවරයා විධියට එතුමා එදා කැකිරාව ආසනයට නායකත්වය ලබා දුන්නා. පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් තමයි එතුමා පළමුවන වතාවට පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. මාත් අධ්‍යාපනය ලැබූ නාරම්මල මයුරපාද මධ්‍ය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්, එතුමා.

ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා ඉතාම චාම් ජීවිතයක් ගත කළ කෙනෙක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට තේරී පත් වුණාට පසුව එතුමා කැකිරාව ප්‍රදේශය ඇතුළුව අනුරාධපුර දිස්ත්‍රික්කයට විශාල සේවයක් ඉෂ්ට සිද්ධ කළා. ඒ වාගේම එතුමා දක්ෂ කවීකයෙක්. එතුමාගේ සහෝදරයාත් ඉන් පසුව දේශපාලනයට ආවා. දේශපාලන ක්‍රියාදාමය තුළ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටියදීත්, ඉන් පිටතදීත් විශේෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයටත් විශාල සේවයක් ඉටු කළ නායකයෙකු විධියට ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාව හඳුන්වා දෙන්න මා කැමැතියි. එතුමාට නිවන් සුව අත් වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් විශාල වැඩ කොටසක් කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තවත් නායකයෙක් තමයි, ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා. එතුමා 1991දී තලාව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා ලෙස පළමුවෙන්ම කටයුතු කළා. ඊට පසුව 1992දී උතුරු මැද පළාත් සභාවට තරග කරලා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වුණා. ඒ වාගේම උතුරු මැද පළාත් සභාවේ සභානායක ලෙසත් එතුමා කාලයක් කටයුතු කළා. ඊට පසුව එතුමා පළාතේ කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස විශාල වැඩ කොටසක් ඉෂ්ට කළා. මන්ත්‍රීවරයෙකු ලෙස එතුමා තුන් වතාවක් උතුරු මැද පළාත් සභාවට තේරී පත් වුණා. 2010දී එතුමා පළමුවැනි වතාවට මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. 2013 වසරේ සිට 2015 වසර දක්වා එතුමා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළා. ඒ වාගේම එතුමා දෙවරක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. 2024 වසරේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යටතේ නැවත එතුමා පාර්ලිමේන්තුවට පැමිණියා.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

එතුමා අවුරුදු 73ක් ආයු වළඳා අවසන් ගමන් ගියා. එතුමා මේ පාර්ලිමේන්තුවේ හිටපු දක්ෂ කථිකයෙකු වාගේම තමාගේ ප්‍රදේශය වෙනුවෙන් විශාල සේවයක් කළ අයෙක්. මට මතකයි, අවස්ථා ගණනාවකදී එතුමා එවකට කථානායකතුමා එක්ක විශාල වශයෙන් රණ්ඩු සරුවල් පවා ඇති කර ගත්තා. මොකද, එතුමා තමන්ගේ ප්‍රදේශයේ තිබුණු ප්‍රශ්න, විශේෂයෙන් ජලය පිළිබඳ ප්‍රශ්න, පොහොර පිළිබඳ ප්‍රශ්න, ගොවිතැන පිළිබඳ ප්‍රශ්න ගැන උද්දේට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්න විශාල මහන්සියක් ගත්තා. ඒ අනුව එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයට විශාල සේවයක් කළා. එතුමා තමාගේ ගම් ප්‍රදේශයට විශාල වැඩ කොටසක් කරපු කෙනෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයා ලෙස මම අපේ ගෞරවය, ආචාරය එතුමාටත් පිරිනමනවා.

ඊළඟට මම විශේෂයෙන් කථා කරන්න කැමැතියි, ගරු කනගසබෙයි තම්මන්පිල්ලෙයි මැතිතුමා පිළිබඳව. එතුමා අප සමඟ අවුරුදු කිහිපයක් සේවය කළා, හයවන පාර්ලිමේන්තුවේදී. එතුමා 2004දී තමයි අප සමඟ ඉස්සර වෙලාම පාර්ලිමේන්තුවට ආවේ. ඇත්තටම දෙමළ ඊළම් කොටි සංවිධානය විසින් ඒ වෙලාවේ මන්ත්‍රීවරු ගණනාවක් නම් කළා. ඒ නම් කළ එක මන්ත්‍රීවරයෙක් තමයි, එතුමා. දෙමළ ජාතික සන්ධානය විධියටයි එතුමන්ලා තරග කළේ. එතුමා මඩකලපුව දිස්ත්‍රික්කයේ හිටපු ඉතාම වැදගත් මන්ත්‍රීවරයෙක්. එතුමා සෑම රැස්වීමකටම අපත් සමඟ සහභාගි වුණා. මට හොඳට මතකයි, විවිධ කාරණා පිළිබඳව, තමන්ගේ ප්‍රදේශය පිළිබඳව එතුමා විශාල වශයෙන් කථා කළා; කටයුතු කළා. එතුමාගේ අභාවය පිළිබඳව කනගාටු වන ගමන් මගේ ආගමට අනුව මම එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම ගල්ඔය නිම්නයේ ජනතාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ නායකයෙකු විධියට අම්පාර - දිගාමඩුල්ල - දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා හඳුන්වන්න පුළුවන්. මිය යන තුරුම එතුමා ඒ පළාත් සභාවේ සභාපතිවරයා විධියට කටයුතු කළා.

විශේෂයෙන්ම ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කටයුතු කරපු එතුමාගේ පියාත් එක්ක තමයි එතුමා අම්පාර නගරයට යන්නේ. එතුමා මුලින්ම අම්පාර ප්‍රාථමික විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබලා, අනතුරුව අද ඩී.එස්. සේනානායක ජාතික පාසල නමින් හඳුන්වන අම්පාර මහා විද්‍යාලයෙන් තමයි ඉගෙනුම ලැබුවේ. එතුමා අම්පාර විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති ධුරය දැරුවා. ඒ වාගේම, අම්පාර නගර සභාවේ පළමු නගරාධිපතිවරයා විධියට එතුමා 1979දී තේරී පත් වුණා. ඒ වාගේම, දෙවන වරටත් එතුමා ඒ ජයග්‍රහණය කළා. ඊළඟට 1994, 2000, 2001 වසරවලදී එතුමා මන්ත්‍රීවරයකු විධියටත් පාර්ලිමේන්තුව නියෝජනය කළා. 2004 වර්ෂයේදී එතුමා පරාජයට පත් වුණා. 1960 සිට 1977 දක්වා එක්සත් ජාතික පක්ෂය වැටිලා තිබුණු වෙලාවේ ගල්ඔය නිම්නයේ ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන් එතුමා විශාල කැප කිරීමක් කළා. 1977දී ලැබූ ජයග්‍රහණයට චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා අම්පාර දිස්ත්‍රික්කය වෙනුවෙන් විශාල ශක්තියක් දුන්නු කෙනෙක්. එක මැතිවරණයකදී මටත් හැකියාව ලැබුණා ගිහිල්ලා එතුමාට උදව් කරන්න. ඒ පළාත් සභා මැතිවරණයක්. එතුමා දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න ඉතා දැඩි ලෙස මහන්සි වෙලා වැඩ කළා. එතුමා දක්ෂ කථිකයෙක්. පාර්ලිමේන්තුව තුළත්, එළියේදිත් එතුමා කථිකයකු ලෙස විශාල වැඩ කොටසක් ඉෂ්ට කළා. අවසාන වශයෙන් එතුමා සමඟි ජන බලවේගයේ සංවිධායකවරයකු විධියට කටයුතු කරමින් සිටියදී තමයි අභාවප්‍රාප්ත වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කථා කරන්න කැමැතියි, මෑතකදී අභාවප්‍රාප්ත වුණු අපේ නන්දන ගුණතිලක මැතිතුමා ගැන. 1962දී තමයි එතුමා ඉපදුණේ. එතුමා මුලින්ම අධ්‍යාපන ලැබුවේ පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයෙන්. එතුමා එම විද්‍යාලයේ කීර්තිමත් ආදිශිෂ්‍යයකු විධියට කටයුතු කළා. උසස් පෙළ විභාගය සමත් වුණු එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයට ඇතුළත් වුණා. විශේෂයෙන්ම 1989 කාලය තුළ ජනතා විමුක්ති පෙරමුණ කඩා වැටිලා, විනාශ වෙලා තිබුණු වෙලාවේ එම පක්ෂය නැවත ගොඩ නඟන්න කැප වුණු හතර පස්දෙනා අතරින් දැවැන්ත සේවයක් කරපු කෙනෙක් තමයි ගරු නන්දන ගුණතිලක මැතිතුමා. විශාල මර්දනයක් ක්‍රියාත්මක වුණු කාලවකවානුවක් තුළ එතුමාට හැකියාව ලැබුණා, ජනතා විමුක්ති පෙරමුණ විශාල තැනකට ගේන්න. ඒ වගකීම කරට අරගෙන එතුමා 1999දී ජනාධිපතිවරණයටත් ඉදිරිපත් වුණා. එම ජනාධිපතිවරණයෙන් එතුමා ඡන්ද 344,173ක් ලබා ගත්තා. එතැනදී ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ තුන්වැනි බලවේගය බවට පත් කළා. එතුමා ඒ වාගේ විශාල කැප කිරීමක් කරපු නායකයෙක්. ඒ වාගේම, 2000 සිට 2010 දක්වා කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වැඩ කටයුතු කළ එතුමා පාර්ලිමේන්තුවටත් තේරී පත් වුණා. මට මතක විධියට 2004දී ජනතා විමුක්ති පෙරමුණ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය ආණ්ඩුව හදන වෙලාවේ එතුමා තැපැල් හා විදුලි සන්දේශ වැඩ බලන අමාත්‍යවරයා විධියටත්, සංචාරක අමාත්‍යවරයා විධියටත් විශාල වැඩ කටයුතු රාශියකට කර දුන්නු, උර දුන්නු නායකයෙක්. අපි මේ වෙලාවේ එතුමා ගෞරවයෙන් සිහිපත් කරනවා. එතැනින් පස්සේ එතුමා ටික කාලයක් නිහඬව හිටියා. පසුව 2015දී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ යහපාලන ආණ්ඩුව ගොඩ නඟන්න විශාල කැප කිරීමක් කළා. ඊට පස්සේ නගරාධිපතිවරයා විධියට පානදුර නගරය ශක්තිමත් කරන්න විශාල කැප කිරීමක් කළා.

නන්දන ගුණතිලක මැතිතුමා කිසිම වෙලාවකදී විප්ලවවාදී අදහස් අතහැරියේ නැහැ. එතුමා මේ රටේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් විශාල කැප කිරීමක් කරපු නායකයෙක්. එතුමාට සටන්කාමී ඉතිහාසයක් තිබුණත්, ඒ සටනට පණ දුන්නත් පසුව මේ රටේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා. ඒ වාගේම විශේෂයෙන්ම මේ ආණ්ඩුව, මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කරපු වෙලාවේදී ඒ ගැන විශාල මහජන මතයක් ඇති කරන්නත් එතුමා විශාල කැප කිරීමක් කළා. ඒකම එතුමාගේ මරණයට හේතු වුණාද කියලා කියන්න මම දන්නේ නැහැ. නමුත් එතුමා විශාල මහන්සියක් සහ කැපවීමක් දැරුවා, මන්ත්‍රීවරු ගණනාවකට තිබිච්ච ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන්න. එතුමාගේ ආදාහන කටයුතුවලට සහභාගි වෙන්න අපටත් හැකියාව ලැබුණා. එතුමා, මම බොහොම ගරු කරන නායකයෙක්. අපි විවිධ අවස්ථාවලදී හම්බවෙලා කථා බහ කරලා තිබෙනවා. අපිත් එක්ක එක මතවාදයක් දරපු කෙනෙකු විධියට මම එතුමා ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා පානදුර නගරාධිපතිවරයා විධියට පත් වෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙන්. එතුමා මිය යනතුරුම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්, පානදුර ආසනයේ සංවිධායකවරයා විධියට වැඩ කටයුතු කළා. මම එතුමාට නිවන්සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

අවසාන වශයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දේශපාලනයේ නොමැකෙන සිහිවටන තබපු නායකයෙකු වන (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා මම ගෞරවයෙන් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. එතුමා උපදින්නේ 1934දී. ලංකා සමසමාජ පක්ෂයේ නිර්මාතෘවරයෙකු වූ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගේ සහෝදරියෙකුගේ පුත්‍රයකු විධියට තමයි එතුමා දේශපාලන කටයුතු පටන් ගන්නේ. කොළඹ ආනන්ද

විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති එතුමා ලංකා විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබාගෙන, පසුව ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ක්ෂුද්‍ර ජීවී විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක්ද ලබාගෙන තිබෙනවා. එතුමා ඉතාම දක්ෂ විද්‍යාඥයෙක්. ඒ වාගේම වයිරස් විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබාගෙන ජාත්‍යන්තර කීර්තියට පවා පත් වුණු කෙනකු විධියට අපි එතුමා ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමා ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා පදනම සකස් කරන්නත් විශාල කැප කිරීමක් කරපු නායකයෙක්. අද ඩෙංගු රෝගය යම්කිසි ප්‍රමාණයකට පාලනය වෙලා තිබෙනවා නම් ඒ සඳහා එතුමා විශාල දායකත්වයක් දක්වා තිබෙනවා. ඒ වාගේම කොවිඩ් වසංගතය පැවති 2020 කාල වකවානුවේ, එතුමා මන්ත්‍රීවරයකු විධියට කටයුතු කරපු කාලයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රැස්වීම්වලට සහභාගි වෙලා අදහස් විශාල වශයෙන් ඉදිරිපත් කළා, මේ රෝගය පාලනය කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනියන්න.

ඒ වාගේම එතුමා තමයි "විදාතා" වැඩසටහන යටතේ විදාතා මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටෙව්වේ. එතුමා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විධියට කටයුතු කරපු කාලයේ දේශීය පරීක්ෂණ දිරිගැන්වීම, විද්‍යාඥයන් සඳහා රජයේ අනුග්‍රහය ලබා දීම ඇතුළු කාරණා ගණනාවකට නායකත්වය ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි. ලංකාවට නැනෝ තාක්ෂණය හඳුන්වා දීමේ පුරෝගාමියා ලෙස ද එතුමා හඳුන්වන්න පුළුවන්. එතුමා හෝමාගම නැනෝ තාක්ෂණ ආයතනය පිහිටුවීමට ලබා දුන් සහයෝගය, දක්වපු සුවිශාල දායකත්වය අපි මේ වෙලාවේ ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ.

එතුමා සැමවිටම වාමාංශික ප්‍රගතිශීලී දේශපාලනයේ යෙදුණු කෙනෙක්. 2004 ඉඳලා විවිධ සහාග ආණ්ඩුවල කොටස්කරුවකු විධියට එතුමා වැඩ කළා. 1994දී පොදුජන එක්සත් පෙරමුණ හදන වෙලාවේ විශාල කැප කිරීමක් කළ නායකයෙක්, එතුමා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේදී ආර්ථික සහ සමාජයීය ගැටලු පිළිබඳව විද්‍යාත්මක විශ්ලේෂණ ඉදිරිපත් කරන්න පුළුවන් දක්ෂතාවක් තිබුණු කෙනෙකු විධියටත් අපි එතුමාව ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම මේ රටේ ජාතික ප්‍රශ්නයට - ජනවාර්ගික ගැටලුවට - දේශපාලන විසඳුමක් සෙවීම සඳහා පත් කළ සර්ව පාක්ෂික සමුළුවේ නායකත්වය ගෙන, "තිස්ස විතාරණ කමිටු වාර්තාව" සම්පාදනය කරන්නත් එතුමා විශාල කැප කිරීමක් කළා. එතුමා මේ රටේ තිබෙන සියලුම දේශපාලන පක්ෂවල අදහස් අරගෙන වැඩ පිළිවෙළ ගණනාවක් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කළා. විශේෂයෙන් බලය විමධ්‍යගත කිරීම කියන එක කෙරෙහි දැඩිව එල්බ ගෙන හිටපු කෙනෙකු විධියට එතුමාව මේ මොහොතේ මම ගෞරවයෙන් සිහිපත් කරනවා.

මෙරට වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ප්‍රධානියා විධියට එතුමා කාලයක් වැඩ කටයුතු කළා. එතුමාගේ ක්‍රියාදාමය පටන් ගන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන්. එතුමා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විධියට කටයුතු කළ කාල වකවානුවකුත් තිබුණා. මට මතකයි, අවසන් ජනාධිපතිවරණය දක්වාම තිබුණු හැම රැස්වීමකදීම එතුමා අපිත් එක්ක සාකච්ඡා කළා. එතුමා ඉතාම ප්‍රගතිශීලී, වාමාංශික අදහස් තිබුණු කෙනෙක්. විශේෂයෙන්ම එතුමාගේ ප්‍රතිපත්තිගරුක බව මම මෙතැනදී මතක් කරන්න කැමැතියි. මොකද, එතුමා ආණ්ඩුවේ සිටි කාලයේ එවකට අග්‍ර විනිශ්චයකාරවරිය වශයෙන් කටයුතු කළ ශිරානි බණ්ඩාරනායක මැතිනියව ඉවත් කරන්න එවකට ආණ්ඩුව කටයුතු කළා. අපි එතකොට විපක්ෂයේ ඉඳලා ඒකට දැඩි ලෙස විරුද්ධ වුණා. ඒ, ශිරානි බණ්ඩාරනායක මැතිනියව ඒ විධියට ඉවත් කිරීම සම්බන්ධයෙන් (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමාට පක්ෂ වෙන්න තිබුණු වෙලාවක්. මොකද, එතුමා ඒ අවස්ථාවේ සිටියේ ආණ්ඩුවේ. ආණ්ඩුවේ සිටියත් කොන්ද කෙළින් තියාගෙන එතුමා ඒකට විරුද්ධව ඡන්දය දුන්නා. ඒ වාගේම තමයි ඩිව් ගුණසේකර මැතිතුමාත්. එතුමාවත් මා ගෞරවයෙන් සිහිපත් කරනවා. ශිරානි බණ්ඩාරනායක මැතිනියව ඉවත් කිරීමට ආණ්ඩුව ගත්ත ක්‍රියාමාර්ගය දැඩිව විවේචනය කරපු දෙදෙනෙක් විධියට එතුමන්ලාව මා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමන්ලාට විශේෂ ගෞරවයක් ලබා දිය යුතුයි.

මේ කථා කරන වෙලාවේ අධිකරණ ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. විශේෂයෙන් අද අධිකරණ ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගත්තොත්, ඉහළ අධිකරණවල විනිසුරුවරුන්ගේ කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් හදන්න අද නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ගිහිල්ලා තිබෙනවා. ඒ පනත් කෙටුම්පත ඔබතුමන්ලා ගේනවාද කියලා මම ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි. අග්‍ර විනිශ්චයකාරතුමාගේ සේවා කාලය දීර්ඝ කිරීම සම්බන්ධව, විශේෂයෙන් අවුරුදු 63 ඉඳලා 65 දක්වා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සම්බන්ධව, අවුරුදු 65 ඉඳලා 67 දක්වා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සම්බන්ධව මේ ආණ්ඩුව දැන් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා; වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ දැන් ඒක සකස් වෙමින් තිබෙනවා. මෙම ක්‍රියාදාමය මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමාගේ ඉඳලා විනිශ්චයකාරවරුන්ට අල්ලස් ලබා දීමේ ක්‍රියාවලියක් වාගේයි පෙනෙන්නේ. අද දිනයේ තිස්ස විතාරණ මැතිතුමා පිළිබඳව කථා කරන මේ අවස්ථාවේත් අපි කියා සිටින්නේ, මේ ක්‍රියාදාමයට අත තියන්න ලැහැස්ති වෙන්න එපා කියන එකයි. මොකද, මේකෙන් විශාල අර්බුදයක් පැන නඟිනවා. පහළ අධිකරණවල සිටින විනිශ්චයකාරවරුන්ට ඉදිරියට එන්න තිබෙන අවස්ථාව නැති වෙනවා. ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ එම ක්‍රියාදාමයට පහළ අධිකරණවල සිටින විනිශ්චයකාරවරුන්ගෙන් අත්සන් ලබා ගැනීමේ ක්‍රියාවලියකුත් ලැහැස්ති කරගෙන තිබෙනවා කියලා අපට ආරංචියි. ඉතින් මෙහෙම ගිහිල්ලා මේ රට නතර වෙන්නේ කොතැනද? අධිකරණ ක්ෂේත්‍රයට ඇඟිලි ගහලා, තිබෙන නඩු කටයුතුවලට ඇඟිලි ගහලා, අග්‍ර විනිශ්චයකාරතුමාගේ කාලය දීර්ඝ කරන්නත් කටයුතු කරනවා.

අපි දැක්කා, අග්‍ර විනිශ්චයකාරතුමා යාඥා කරන වීඩියෝවක්. මට හිතාගන්න බැහැ, කොහොමද මේ වැඩ කටයුතු කෙරෙන්නේ කියලා. අපට ආගමක් අදහන්න පුළුවන් වුණාට ආගම්වලට මිනිස්සු හරවාගන්න, එහෙම නැත්නම් ආගම්වලට මිනිස්සුන්ව පොළඹවන්න වැඩ කරන්න බැහැ; එහෙම Promote කරන්න බැහැ. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. හැබැයි, අද ඒක සිද්ධ වෙමින් තිබෙනවා. මම ඉතාම කනගාටු වෙනවා, ඒ ගැන. එතුමාට ආගමක් ඇදහීමේ අයිතිය තිබෙනවා. කිසි ගැටලුවක් නැහැ. අපි කවුරුත් ඒකට තර්ක කරන්නේ නැහැ. හැබැයි, රෝගීන් සුවපත් කරන්න එහෙම කටයුතු කරනවා නම් ඒක විශාල අර්බුදයක්.

එම පනත් කෙටුම්පත දැන් සකස් වෙමින් තිබෙනවා. තිස්ස විතාරණ මැතිතුමා ගැන කථා කරපු මේ වෙලාවේ තමයි මට මේ කාරණය මතක් වුණේ. ආණ්ඩුවේ ඉඳලාත්, ශිරානි බණ්ඩාරනායක මැතිනියව එම තනතුරෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලියට විරුද්ධව කටයුතු කරන්න එදා එතුමාට කොන්ද පණ තිබුණා. ඒ කාරණය ගැන කථා කරන්න ගිහිල්ලා අපේ සුජීව සේනසිංහ මැතිතුමාත්, මමත් බැසිල් රාජපක්ෂ මහත්මයාත් එක්ක භෝජනාගාරයේදී හොඳටම රණ්ඩු වුණා. අපි එහෙම දෙන්නෙක්. රණ්ඩු වෙන්නත් ගියා, ශිරානි බණ්ඩාරනායක මැතිනියව

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

බේරාගන්න. එදත් අපි ඒ මතයේ හිටියා, අදත් අපි ඒ මතයේ ඉන්නවා. මතක තියාගන්න, ආණ්ඩුවට ගියත් අපි මේ රටේ අධිකරණයට අත තියන්න දෙන්නේ නැහැ කියන එක. අධිකරණ විනිශ්චයකාරවරු 40කට වඩා දැන් ඉවත් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඔවුන්ට සාධාරණයක් වෙන වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. මේ ආණ්ඩුව කිව්වේ, "අපට වඩා හොඳට කරන්න පුළුවන් ආණ්ඩුවක් පෙන්වන්න" කියලායි. දැන් අපට පෙනෙන්නේ, මේ වාගේ ආණ්ඩුවක් කොහේවත් තිබිලා නැහැ කියලායි. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා, අධිකරණ ඇමතිතුමා විධියට මේ ක්‍රියාදාමයට සාධාරණව මැදිහත් වෙන්න කියලා. මොකද, ඔබතුමා මේ අවුරුදු පහ පාර්ලිමේන්තුවේ හිටියාට පසුව ඊළඟට සේවය කරන්න උසාවියට යන්න සිද්ධ වෙනවා. එතකොට ඔබතුමා ගැන මිනිස්සුන්ට හිතන්න පුළුවන් වෙන්න ඕනෑ; අධිකරණයට හිතන්න පුළුවන් වෙන්න ඕනෑ, සාධාරණව වැඩ කරපු අධිකරණ ඇමතිවරයෙක් තමයි අද අපි ඉස්සරහ පෙනී සිටින්නේ කියලා.

ඒ නිසා, කරුණාකරලා නීතිඥ සංගමය පවා කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න ඕනෑ කියන එකත් විශේෂයෙන්ම මේ රටේ නීතිඥ සංගමයට මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය වයස අවුරුදු 65 සිට 67 දක්වාත්, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ සේවා කාලය වයස අවුරුදු 63 ඉඳලා 65 දක්වාත් දීර්ඝ කළාම අනික් ක්ෂේත්‍රවලත් ප්‍රශ්න ගණනාවක් මතු වෙනවා. එතකොට, සෞඛ්‍ය ක්ෂේත්‍රය වාගේ ක්ෂේත්‍ර ගැනත් අපි අහන්න කැමැතියි. මොකද, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්නවා විශේෂඥ වෛද්‍යවරු සහ වෛද්‍යවරු. ඔවුන් මේ අයට වැඩිය ගොඩක් වටිනා වැඩ පිළිවෙළක් සකස් කරන අය. ඒ නිසා ඒ අයගේ සේවා කාලය සම්බන්ධයෙනුත් අපි අහන්න කැමැතියි. ඒ වාගේම තවත් ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒගොල්ලනුත් ඉල්ලයි, අපෙත් සේවා කාලය වැඩි කරන්න කියලා. ඉතින්, මේ ප්‍රශ්නය ක්ෂේත්‍ර ගණනාවකට පුළුල්ව පැතිර යන තත්ත්වයක් තමයි දැන් ඇති වෙලා තිබෙන්නේ.

විශේෂයෙන් නීතිය හා සාධාරණත්වය පිළිබඳව, නීතියේ ආධිපත්‍යය පිළිබඳව කථා කරන මේ ආණ්ඩුවට අපි කියනවා, තිස්ස විතාරණ මැතිතුමාගේ ජීවිතයෙන් යමක් ඉගෙන ගන්න, ඉගෙන ගෙන ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න කියලා. එයත් මතක් කරමින්, එතුමාට නිවන් සුව අත්වේවායි කියා පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 3.04]

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරපු මැති ඇමතිවරු හය දෙනෙකුගේ අභාවය පිළිබඳව ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, එතුමන්ලා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමට මටත් අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මුලින්ම, අපේ චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාගේ අභාවය පිළිබඳව මගේ ශෝකය ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා දකුණු පළාතේ දෙවුන්දර තුඩුව ප්‍රදේශයේ උපත ලැබූ කෙනෙක්. ඩැනිපාල ගලප්පත්ති මැතිතුමාගේ සහ එස්.එච්. ලුසිනෝනා මැතිණියගේ ආදරණීය පුත්‍ර රත්නය වන එතුමා, 1948 අගෝස්තු මාසයේ 2වන දින දෙවුන්දර ග්‍රාමයේ උපත ලබලා, අම්පාර ඩී.එස්. සේනානායක මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබලා අම්පාර විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයෙකු ලෙස රාජකාරි කටයුතු කළා. 1979-1989 කාලසීමාව තුළ අම්පාර නගරයේ ප්‍රථම නගරාධිපතිවරයා හැටියට නගරයේ දියුණුව වෙනුවෙන් තරුණ නගරාධිපතිවරයෙක් හැටියට එතුමාට කටයුතු කරන්නටත් අවස්ථාව ලැබුණා. එතුමා අම්පාර නගරය දියුණු කිරීමේ ඒ සුවිශේෂී සේවාව ඉෂ්ට කරපු තරුණ නායකයෙක්. ඒ වාගේම 1989දී දිගාමඩුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්ව 1989 සිට 2001 දක්වා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් එතුමා කටයුතු කළා. එතුමා 2008 සිට 2015 දක්වා නැඟෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙසත් කටයුතු කළා. 2015 සිට 2026 පෙබරවාරි 13වන දා දක්වාම; එතුමා මියයන තුරුම පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා දකුණු පළාතේ දෙවුන්දර තුඩුව ප්‍රදේශයේ ඉපදිලා, අම්පාර ප්‍රදේශයට ගිහිල්ලා, ඩී.එස්. සේනානායක මැතිතුමා ආරම්භ කරපු දිගාමඩුලු සංවර්ධන ව්‍යාපෘතිය හරහා ගොවි ජනපද ඇති කරලා ඒ ජනතාවට විශාල සේවාවක් ඉෂ්ට කරපු ජ්‍යෙෂ්ඨ නායකයෙක් හැටියට අපට මේ අවස්ථාවේ සිහිපත් කරන්න පුළුවන්. ඒ වාගේම අපේ පී. දයාරත්න මැතිතුමා සමඟ දේශපාලන කටයුතු කරලා අම්පාර ප්‍රදේශයේ ගොවි ජනතාව ඇතුළු සියලු දෙනාට විදුලිය, මං මාවත්, ජලය ලබා දීමට විශිෂ්ට සේවාවක් ඉටු කළා. ඒ වාගේම සෑම ක්ෂේත්‍රයකටමත්, වෙහෙර විහාර, පූජනීය ස්ථානවලටත් විශාල මෙහෙවරක් ඉෂ්ට කළ නායකයෙක් හැටියට එතුමාව හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම තමයි සිංහල, දෙමළ, මුස්ලිම් සෑම ජන කොටසක්ම ජීවත් වෙන නැඟෙනහිර පළාතේ පළාත් සභාවේ සභාපතිවරයා හැටියට සෑම ක්ෂේත්‍රයක් හරහාම එතුමා විශාල මෙහෙවරක් ඉෂ්ට කළා. ඒ වාගේම පොතුවිල්, ආරුගම්බේ, පානම, ලාහුගල යන ප්‍රදේශවල සිංහල ජනතාව වෙනුවෙන්, ඔවුන්ගේ අයිතිය රැක ගන්නට විශාල මෙහෙවරක් ඉෂ්ට කරපු නායකයකු තමයි අපේ චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමා.

එතුමා මිය යන්නට මාසයකට විතර උඩදී මට හමු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා ඇස් රෝහලට ඇවිල්ලා තිබුණා, ඇස් operate කර ගන්න. අන්න ඒ වෙලාවේ ඒ අයියත්, අක්කත් දෙදෙනාම හමුවෙලා අපි කථා කළා. ඊට මාසයකට විතර පස්සේ තමයි එතුමා නැති වුණේ. මට මළ ගෙදරට සහභාගි වෙන්නත් බැරි වුණා, වයිරස් උණක් හැදුණු නිසා. මම ඒකත් මේ අවස්ථාවේදී ඒ පවුලේ ආදරණීය බිරිඳටත්, දරුවන්ටත් ප්‍රකාශ කරමින්, එතුමාට අමා මහ නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කයේ ජීවත් වන අපේ ආදරණීය ඥාතිවරුන්ගේත්, දෙවුන්දර ප්‍රදේශයේ ජීවත් වන ඥාතිවරුන්ගේත් ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, අපේ ඒ අයියාට අමා මහ නිවන් සුව අත්වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට, අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මැතිතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමාගේ දේශපාලන ඉතිහාසය ගැන අපේ නායකතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. එතුමා ජනතා විමුක්ති පෙරමුණේ රෝහණ විජේවීර මැතිතුමා සමඟ කටයුතු කරමින්, ඒ දේශපාලන ව්‍යාපාරය දියුණු කරන්න, ඒගොල්ලන්ගේ දේශපාලන ගමන දියුණු කරන්න කැප වෙච්ච නායකයෙක්.

එතුමා මේ යන ගමන හරි නැහැ කියලා පක්ෂයෙන් ඉවත් වෙලා දේශපාලන කටයුතු කළා. එතුමා පාර්ලිමේන්තුවට ආවේ 2000 වර්ෂයේදී. මමත් පාර්ලිමේන්තුවට ආවේ 2000 වර්ෂයේදීයි. අපේ මාදිවෙල මන්ත්‍රී නිල නිවාස දෙක එක තැන තිබුණේ. ගරු නන්දන ගුණතිලක මැතිතුමාත්, මමත් දේශපාලන වශයෙන් කඳවුරු දෙකක හිටියත්, එතුමාගේ ආදරණීය බිරිඳ හා මගේ ආදරණීය බිරිඳත්, එතුමාගේ දරුවන් හා මගේ දරුවනුත් සුහදව කථා බහ කළා. ඒ විධියට එතුමා අපිත් එක්ක කථා බහ කරගෙන සුහදශීලිව හිටපු දේශපාලන නායකයෙක්. එතුමාත් හදිසියේම නොසිතූ නොපැතූ විධියට ජීවිතක්ෂයට පත් වුණා. ඒකත් රහසක්. ඒ නිසා මේ අවස්ථාවේදී මගේ ශෝකයත්, මගේ පවුලේ බිරිඳගේ හා දරුවන්ගේ ශෝකයත්, එතුමාගේ බිරිඳටත්, දරුවන්ටත් පළ කරනවා.

ඒ වාගේම අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා ගැන අපේ සියලුම මන්ත්‍රීවරුන් විශේෂ වර්ණනාවක් කළා. එතුමා ජ්‍යෙෂ්ඨ දේශපාලන නායකයෙක්. චමල් රාජපක්ෂ මැතිතුමා කථානායක ධුරය හොබවන අවධියේ එතුමාත් සමඟ ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමාත්, මමත් ඇතුළු කණ්ඩායමක් දින දහයක සංචාරයකට වියට්නාමයට ගියා. එතුමා ඒ සංචාරයේදී දින දහයම අප සමඟ හිටියේ. ඒ අවස්ථාවේදී එතුමා ප්‍රකාශ කළා, එතුමා මීට ඉහතදී ආවේ යුද්ධය තිබෙන දවස්වල, එතකොට මේවා විනාශ වෙලා තිබුණේ, අද මේ රට සංවර්ධනය වෙලා තිබෙනවා කියලා. ඒ දවස් දහයේදීම වියට්නාමය ගැන අපට හොඳ දැනුවත් කිරීමක් එතුමා කළා. ඒ වාගේම අපේ රටේ වර්තමාන දේශපාලන තත්ත්වය ගැනත් එතුමා අපව දැනුවත් කළා. එතුමා ජ්‍යෙෂ්ඨ නායකයෙක්. පිරිපුන්, වැදගත්, රටට වැඩදායී, ඵලදායී වැඩ කරපු ජ්‍යෙෂ්ඨ නායකයෙකු හැටියට මං එතුමාව හඳුන්වන්න කැමැතියි. එතුමා සිහිපත් කරමින්, එතුමාගේ පවුලේ උදවියට මගේ ශෝකය මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අභාවප්‍රාප්ත ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා, අභාවප්‍රාප්ත ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා, අභාවප්‍රාප්ත ගරු ටී. කනගසබෙයි මැතිතුමා යන මන්ත්‍රීවරුන් සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ගෞරවනීය ශෝකය ප්‍රකාශ කරමින්, ඒ සියලුදෙනාට නිවන්සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 3.11]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ කලක් සේවය කළ, රටට, මහජනතාවට, ජාතියට අනුපමේය මෙහෙවරක් ඉෂ්ට කරපු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හයදෙනෙකුගේ අභාවය ගැන ශෝක යෝජනා අද ඉදිරිපත් කරනවා. මෙහිදී ප්‍රථමයෙන්ම මම කථා කරන්න ඕනෑ, අපි කවුරුත් දන්නා, හිටපු අමාත්‍යවරයෙකු වන අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා ගැන. එතුමා උගතෙක්, විද්වතෙක් විධියට වාමාංශික දේශපාලනයට ඇවිල්ලා, තමන්ට හැකි උපරිම ප්‍රමාණයෙන් රටට අනුපමේය සේවාවක් ඉෂ්ට කරපු නායකයෙක්. අපට දේශපාලන වශයෙන් එතුමා සමඟ සහ සම්බන්ධතා නොතිබුණත්, එතුමාට අජරාමර නිවන් සුව අත්වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට, ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා ගැන කථා කරන්න මම කැමතියි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ බොහොම පොඩි තැනක් වන තලාව ප්‍රාදේශීය සභාවෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු විධියට දේශපාලනය ආරම්භ කරලා, තලාව ප්‍රාදේශීය සභාවේ තවත් කාල සීමාවක් ඉඳලා, ඊට පස්සේ උතුරු මැද පළාත් සභාවෙන් දේශපාලනයට පිවිසුණු අපේ ගරු එස්.සී. මුතුකුමාරණ මැතිතුමා පළාත් සභාවේ හිටපු අමාත්‍යවරයෙකු විධියට කෘෂි කර්මාන්තයටත්, සභානායකවරයෙකු විධියටත් විශාල සේවාවක් කළා. ඒ වාගේම පාර්ලිමේන්තුවට ඇවිල්ලා නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හැටියට කටයුතු කරමින්, දිස්ත්‍රික්කයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු එතුමා ගමේ භාෂාවෙන්ම කියනවා නම්, ගමේ මිනිහෙක්. එතුමා හොඳ ගොවියෙක්. ප්‍රදේශයේ ගොවි ජනතාවට සේවාවක් කරමින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙන් සිටියත්, එතුමා ගමට යනකොට ගමේ කෙනෙකු විධියටයි කටයුතු කළේ. එතුමා තමන්ගේ යතුරුපැදියෙන් කුඹුරුවලට, කෙසෙල් වගාවන් කරපු තැන්වලට යන ගැමියෙකු විධියට ජනතාවගේ හිත දිනාගත් දේශපාලන නායකයෙක්. ඒ අනුව ගරු මුතුකුමාරණ මැතිතුමා කියන්නේ, පුළුවන් ප්‍රමාණයෙන් දේශපාලන ක්ෂේත්‍රය තුළ ප්‍රදේශයේ ජනතාවට, දිස්ත්‍රික්කයේ ජනතාවට සහ රටේ ජනතාවට විශාල මෙහෙයක් ඉෂ්ට කළ, මිල කළ නොහැකි චරිතයක්. මිය යන තුරුම ගැමිභාවය ආරක්ෂා කර ගත් අපේ නායකයෙක්, එතුමා. අපි හැම දාම දේශපාලනික වශයෙන් කඳවුරු දෙකක හිටියත්, අපේ අප්පච්චිගේ සමකාලීනයෙකු විධියට අපේ ගමට ආවොත් අප්පච්චිව හම්බ වෙලා කථා කරලා යන පුරුද්දක් ගරු මුතුකුමාරණ මැතිතුමාට තිබුණා. එතුමා හදිසියේ රෝගාතුර වී අභාවප්‍රාප්ත වුණා. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මම, එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයට සහ ජනතාවට ඉෂ්ට කළ අනුපමේය මෙහෙවර මේ වෙලාවේ ස්තුති පූර්වකව සිහි කරමින්, එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ බිරිඳ ඇතුළු දූ දරුවන්ටත්, පවුලේ ඥාතීන්ටත් අපගේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට අජරාමර නිවන් සුව අත්වේවා කියා මා ප්‍රාර්ථනය කරනවා.

අපි අද ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මැතිතුමාගේ අභාවය වෙනුවෙනුත් ශෝකය පළ කරනවා. එතුමා අපේ පළාත් සභාව නියෝජනය කළ, මිය යන තුරුම පළාත් සභාවේ හිටපු සභාපතිවරයෙක්. ජීවතුන් අතර හිටියා නම් එතුමා මේ වන විටත් පළාත් සභාවේ සභාපති, පළාත් සභාව විසුරුවා හැරියා වුණත්. මොකද, පළාත් සභාවක් විසුරුවා හැරියාම ජනතා නියෝජිතයන්ගෙන් ඉතිරි වන්නේ සභාපතිවරයා විතරයි. උතුරු මැද පළාතේ සභාපතිවරයා මිය ගියා, මේ වනකොට නැගෙනහිර පළාතේ සභාපතිවරයාත් මිය ගිහින් තිබෙනවා. ඒ අනුව ඒ පුරප්පාඩු සම්බන්ධයෙන් අපේ ව්‍යවස්ථාමය ගැටලුවකුත් තිබෙනවා. මට පෞද්ගලිකව මුණ නොගැසුණත්, අපිත් එක්ක දේශපාලනික ගමනක් ගිය ගරු ගලප්පත්ති මැතිතුමා ගැන අපි අහලා තිබෙනවා. එතුමාගේ බිරිඳ අපිත් එක්ක සංවිධායකවරියක් වශයෙන් කටයුතු කරමින් සිටියා. ඒ අනුව අපි එතුමාගේ ක්‍රියා කලාප ගැන අහලා තිබෙනවා, එතුමාගේ ගුණ අපි නිරන්තරයෙන් සිහිපත් කරලා තිබෙනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාට ශෝකය ප්‍රකාශ කරන ගමන්, එතුමාටත් අජරාමර නිවන් සුව අත්වේවා කියා මා ප්‍රාර්ථනය කරනවා.

ගරු නන්දන ගුණතිලක මැතිතුමා මට කිසිම දවසක මුහුණට මුණ නොගැසුණු නමුත් දේශපාලනික වශයෙන් අපි බොහොම කියවපු චරිතයක්. තම දේශපාලනය ජනතා විමුක්ති පෙරමුණෙන් ආරම්භ කරලා එක්සත් ජාතික පක්ෂයෙන් අවසන් කරන තැනට යනකම් දේශපාලනයේ විප්ලවවාදියෙකු විධියට හරි තැන ඉඳගෙන තීන්දු ගත් නායකයෙකු විධියටයි අපි එතුමාව දැක්කේ. ඒ

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

තීන්දු නිසාම එතුමාගේ වියෝව විවේචන, විවාද ගොඩනැඟෙන තත්ත්වයට පවා පත් වුණා. දේශපාලනික වශයෙන් මිතුරන් නොවුණත්, අපි හොඳ මිනිසුන් ඇඟැයීමට ලක් කරනවා. මොකද, එවැනි යහපත් මිනිසුන් ඇගැයීමට ලක් කළ යුතු වනවා. ඒ අනුව රටට, සමාජයට මෙහෙවරක් ඉෂ්ට කිරීමේ අරමුණ වෙනුවෙන් දේශපාලනික කටයුතුවල යෙදුණු ගරු නන්දන ගුණතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කරන ගමන්, එතුමාටත් නිවන් සුව අත්වේවා කියා මා ප්‍රාර්ථනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමාගේ අභාවය වෙනුවෙනුත් අපි ශෝක යෝජනා ගෙන එනවා. පියාගේ උරුමයෙන්, එහෙම නැත්නම් පවුලේ උරුමයෙන් තමයි එතුමා දේශපාලනයට ආවේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ආසනය නියෝජනය කරමින් 1989දී පාර්ලිමේන්තුවට ආ ළාබාලතම මන්ත්‍රීවරයා තමයි එතුමා. එතුමා 1994 වෙනකම් පාර්ලිමේන්තුවේ ඉඳලා, ඉන් පසුව 1999දී බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා පළාත් සභාවට ගියාට පස්සේ ඒ පුරප්පාඩුවට එතුමා නැවත පාර්ලිමේන්තුවට පිවිසුණා. මට මතක විධියට, 2000දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් එතුමාට පාර්ලිමේන්තුවට එන්න නොහැකි වුණා. නමුත් 2001දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයට එස්.බී. දිසානායක මැතිතුමන්ලා ඇතුළු කණ්ඩායම එක්සත් ජාතික පක්ෂයත් සමඟ අත්වැල් බැඳ ගන්නකොට එතුමාත් ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කැකිරාව ආසනය ජයග්‍රහණය කරලා, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් නිර්මාණය කරන්න විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. ඒ වාගේම 2005 ජනාධිපතිවරණය වෙනකනුත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙනුත් එතුමා විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. එතුමා 2005න් පස්සේ නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක, පොදුජන එක්සත් පෙරමුණත් එක්ක අත්වැල් බැඳ ගන්නවා. මට මතක විධියට, එතුමාට 2010දීත් පාර්ලිමේන්තුවට තරග කරන්න අපේක්ෂකත්වය ලැබුණේ නැහැ.

සමානුපාතික ක්‍රමය ආවාට පස්සේ මම දැනුවත්ව කිසිදු කෙනෙකුට සිංහල ජන ප්‍රදේශවලින් ස්වාධීනව තරග කරලා පාර්ලිමේන්තුවට එන්න තරම් තත්ත්වයක් උදා වුණේ නැහැ. හැබැයි, එතුමා විප්ලවීය චරිතයක් විධියට ඒ අභියෝගය භාර ගත්තා. එතකොට අපි ප්‍රාදේශීය සභාව නියෝජනය කරන තරුණ මන්ත්‍රීවරුන්. ඒ වනකොට අනුරාධපුරය පුරාම විශාල විප්ලවයක් ගෙන ගිය නිසා එතුමා ගැන කතිකාවක් ඇති වුණා. එතුමා ඒ මැතිවරණයෙන් මන්ත්‍රී ධුරය අබියසටම ආවා. මම හිතන විධියට, තව ඡන්ද 2,000කට ආසන්න ප්‍රමාණයක් ලබා ගන්න හැකි වුණා නම් එදා එතුමාට පළමු වතාවට සමානුපාතික නියෝජන ක්‍රමය තුළ සිංහල ජනතාව ජීවත් වන ප්‍රදේශයක් නියෝජනය කරමින් ස්වාධීනව පාර්ලිමේන්තු ආ ප්‍රථම මන්ත්‍රීවරයා බවට පත් වන්න හැකියාව ලැබෙනවා. ඒ තරමට ජනතාව ආදරය කළ දේශපාලනඥයෙක් තමයි ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මහතා. ජනතාව පක්ෂ භේද බලන්නේ නැතුව එතුමාට මනාප ලබා දුන්නා. මට මතක විධියට, එදා එතුමා තරග කළේ ගුවන් යානය ලකුණින්. එතුමාගේ අංකයට ඒ පළාතේ බොහෝ ජනතාව ඡන්ද ලබා දුන්නා. එතුමාටය කියලා හිතාගෙන, එතුමාගේ අංකයට විශාල මනාප ප්‍රමාණයක් ජනතාව ලබා දුන් නිසා ඒ අංකයෙන් පොදුජන එක්සත් පෙරමුණෙන් තරග කළ අපේක්ෂකයාටත් යම් මනාප ප්‍රමාණයක් ලැබුණා. මොකද, ජනතාවට පුරුද්ද තිබුණේ එතුමා තමන්ගේ පක්ෂයේ නායකයෙකු විධියටයි. හැබැයි, එතුමා තරග කළේ ස්වාධීන අපේක්ෂකයෙකු විධියටයි. ඒ ඡන්ද ලකුණ ගැන අවබෝධයක් නැතුව 5,000ක්, 6,000ක් මනාප ඒ විධියට ප්‍රකාශ කරලා තිබුණා. ජනතාව ලකුණ ගැන අවබෝධයක් ඇතුව මනාප දීලා තිබුණා නම් ඒ ඡන්ද ටිකත් එතුමාට ලැබිලා අර වාර්තාව එතුමාට තබන්න හැකියාවක් ලැබෙනවා.

එතුමා 2012දී පළාත් සභාව නියෝජනය කළා. ඒ අවස්ථාවේදී අපට එතුමාව ළඟින් ආශ්‍රය කරන්න ලැබුණා. අපි පළාත් සභාවේ ඉන්නකොට, අපට කොරියාවේ හා ඩුබායිවල සංචාරයකට යන්නත් අවස්ථාව හම්බ වුණා. එතුමා ඒ කාලයේත් රෝගාතුරව සිටියේ. එතුමා රෝද පුටුවෙන් තමයි අපත් එක්ක ඒ සංචාරයටත් සහභාගි වුණේ. රෝද පුටුවේ හිටියත් ඉතාම විනෝදකාමී පුද්ගලයෙකු විධියට ඒ සංචාරය පුරාම එතුමා කටයුතු කළා. එතුමා අපත් එක්ක බොහොම සුහදශීලිව කටයුතු කරපු නිහතමානී නායකයෙක්.

එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරලා ඉන් පසුවයි පළාත් සභාව නියෝජනය කළේ. සාමාන්‍යයෙන් අපි දැකලා තිබෙන්නේ, පහළ ඉඳලා උඩට එන දේශපාලනඥයෝ. ඉහළට ගියාට පසුව සමහර අය පහළට එන්න අදිමදි කරනවා. ඒ සඳහා ලජ්ජා වන, එය අවඥාවෙන් ප්‍රතික්ෂේප කරන දේශපාලනඥයෝ තමයි අපි දැකලා තිබෙන්නේ. හැබැයි, එතුමා එහෙම නොවෙයි. එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරලා පසුව පළාත් සභාව නියෝජනය කළා. එතැනින් නොනැවතී එතුමා 2018දී කැකිරාව ප්‍රාදේශීය සභාවට නැවත තරග කරලා, කැකිරාව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙසත් කටයුතු කළා. එතුමා ජීවිතයෙන් සමුගන්නා තෙක්ම පොදුජන එක්සත් පෙරමුණෙන් දේශපාලනයේ නියැළිලා හිටපු දේශපාලන චරිතයක්. එය නිහතමානී චරිතයක්. එතුමා බොහොම හිත හොඳ පුද්ගලයෙක්. යම්කිසි කෙනෙක් උදව්වක් ඉල්ලාගෙන ආවොත් එතුමා පසුනොබැස උදවු කරනවා. එතුමා දේශපාලනික වශයෙන් කැකිරාව ප්‍රදේශයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා, ජනතාවට සේවය කළ පුද්ගලයෙක්. එතුමාගේ පරම්පරාවම කැකිරාවේ ජනතාවගේ හදවත් තුළ අදටත් ජීවත් වනවා. එතුමන්ලා එක්ක සහ එතුමන්ලාගේ ආභාසයෙන් දේශපාලනය ආරම්භ කළ උදවිය අදටත් ඒ පවුලට ගරු කරමින් කටයුතු කරනවා. ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා වෙනුවෙන් ශෝක යෝජනා ගෙනෙන අද දවසේ මේ පාර්ලිමේන්තුවට පැමිණ සිටින එතුමාගේ පවුලේ සියලුදෙනාට එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, අපත් එක්ක කලක් එකට දේශපාලන කටයුතුවල නියැළුණු අප මිත්‍ර ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මන්ත්‍රීතුමාට නිවන් සුව අත්වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

අභාවප්‍රාප්ත ගරු ටී. කනගසබෙයි මන්ත්‍රීතුමා ගැනත් මම කියන්න ඕනෑ. එතුමා ද්‍රවිඩ ජාතික සන්ධානය නියෝජනය කළ මන්ත්‍රීවරයෙක්. එතුමාත් එක්ක මගේ විශාල දැන හැඳුනුම්කමක් නැහැ. මම එතුමාව දැකලාත් නැහැ. එතුමාගේ ආගම කුමක් වුවත්, මා බෞද්ධයකු හැටියට එතුමාට නිර්වාණය අත්වේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා.

[පි.ව. 3.20]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் எமது நாடாளுமன்ற வரலாற்றில் மக்கள் சேவையாற்றி, தற்போது நம்மை விட்டுப் பிரிந்திருக்கும் ஆறு முன்னாள் நாடாளுமன்ற உறுப்பினர்களின் மறைவு குறித்த அனுதாபப் பிரேரணையில் உரையாற்றுவதை நான் கடமையாகக் கருதுகிறேன். எமது நாட்டுக்காகப் பல்வேறு

காலகட்டங்களில் வெவ்வேறு களங்களில் பங்களிப்புச் செய்த இந்த உன்னதத் தலைவர்களுக்கு இச்சபையில் எனது ஆழ்ந்த அஞ்சலியைச் செலுத்த விரும்புகின்றேன்.

முதலாவதாக, அமரர் பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்கள் பற்றி பேசலாமென நினைக்கின்றேன். எமது நாட்டின் மருத்துவத்துறை, அறிவியல் ஆராய்ச்சி மற்றும் முற்போக்கு அரசியலில் மாபெரும் தடம்பதித்த பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்களின் மறைவு ஈடுசெய்ய முடியாத ஒரு பேரிழப்பாகும். புகழ்பெற்ற பேராசிரியராக மற்றும் மருத்துவ விஞ்ஞானியாக சர்வதேச அளவில் அங்கீகாரம் பெற்ற இவர், இச்சபையில் அமைச்சராகவும் நாடாளுமன்ற உறுப்பின ராகவும் ஆற்றிய பணிகள் வரலாற்றுச் சிறப்புமிக்கவை. குறிப்பாக, இந்த நாட்டில் புரையோடிப்போய் இருக்கின்ற தேசிய இனப் பிரச்சினைக்கு அரசியல் தீர்வு காண்பதற்கான அனைத்துக் கட்சிப் பிரதிநிதிகள் குழுவின் தலைவராக இவர் ஆற்றிய அர்ப்பணிப்புடன்கூடிய பணி, இவரது அரசியல் முதிர்ச்சிக்கும் நடுநிலைமைக்கும் சான்றாகும். இவரது அறிவுசார் அரசியல் எமக்கு என்றும் வழிகாட்டியாகும்.

நான் யாழ். போதனா வைத்தியசாலையின் பணிப்பாளராக இருந்தபொழுது, அந்த வைத்தியசாலைக்கு விஜயம் செய்த பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்களை வைத்தியசாலையின் ஆய்வுகூடப் பகுதிக்கு அழைத்துச் சென்றபொழுது, அங்கு அவர் தனது அனுபவங்களைப் பகிர்ந்தும் அறிவுரைகளை வழங்கியும் எமது வைத்தியசாலையின் ஆய்வுகூடத்தின் மேம்பாட்டுக்குத் தன்னாலான பங்களிப்பைச் செய்திருந்தார். அவரின் இந்தச் சேவை என்றும் மறக்க முடியாததாகும். எனவே, அவருக்கு நான் இந்தச் சபையில் அஞ்சலி செலுத்த விரும்புகின்றேன்.

அடுத்து, அநுராதபுர மாவட்ட விவாசாய பெருமக்களினதும் சாதாரண மக்களினதும் குரலாக நாடாளுமன்றத்தில் ஒலித்த அமரர் எஸ். சீ. முதுகுமாரண அவர்களின் சேவை என்றும் நினைவுகூரத்தக்கது. எளிய குடும்பப் பின்னணியிலிருந்து வந்து, மக்களின் அடிப்படைத் தேவைகளுக்காகவும் கிராமப்புற உட்கட்டமைப்பின் மேம்பாட்டுக்காகவும் அவர் இச்சபையிலும் சபைக்கு வெளியிலும் காட்டிய அர்ப்பணிப்பு, ஒரு மக்கள் பிரதிநிதி எவ்வாறு வாழ வேண்டும் என்பதற்குச் சிறந்ததோர் உதாரணமாகும். எனவே, அவரின் ஆன்மா சாந்தியடைய நான் பிரார்த்திக்கின்றேன்.

மாத்தறையில் பிறந்து, அம்பாறை மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தி நாடாளுமன்றத்துக்குத் தெரிவான கௌரவ சந்திரதாச கலப்பத்தி அவர்கள், மக்களின் சமூக - பொருளாதார மேம்பாட்டுக்குப் பாடுபட்ட ஓர் உன்னதத் தலைவராவார். அவர் தனது நாடாளுமன்றக் காலப்பகுதியில் கல்வி மற்றும் பிராந்திய அபிவிருத்தித் திட்டங்களுக்கு வழங்கிய பங்களிப்பு, அந்தப் பகுதி மக்களின் வாழ்வில் ஒளியேற்றியது என்றால் அது மிகையாகாது.

களுத்துறை மாவட்டத்திலிருந்து தீவிர மக்கள் அரசியல் மூலமாகத் தன்னை ஒரு சிறந்த நாடாளுமன்ற உறுப்பினராக நிலைநிறுத்திக் கொண்டவர் கௌரவ நந்தன குணதிலக அவர்கள். அவர் இச்சபையில் ஆற்றிய உரைகளும், மக்கள் சார்ந்த கொள்கைகளுக்காக அவர் எழுப்பிய குரலும் இன்றும் எமது நாடாளுமன்றப் பதிவுகளில் அழியாதவை. தொழிலா ளர்கள் மற்றும் ஒடுக்கப்பட்ட மக்களின் உரிமைகளுக்காக இறுதிவரை குரல்கொடுத்த ஒரு நேர்மையான அரசியல் வாதியை இந்த நாடு இழந்து நிற்கின்றது. அவருக்கு எனது அஞ்சலியை இந்தச் சபையில் செலுத்த விரும்புகின்றேன்.

குருநாகல் மாவட்டத்தின் பாரம்பரியமிக்க அரசியல் பின்னணியிலிருந்து வந்து, இளமைத் துடிப்புடன் மக்கள் சேவையாற்றிய கௌரவ ஜனக் மஹேந்திர அதிகாரி அவர்களின் மறைவும் எமக்கு மிகுந்த வருத்தத்தை அளிக்கிறது. வடமேல் மாகாண சபையின் அமைச்சராகவும் பின்னர் நாடாளுமன்ற உறுப்பினராகவும் அவர் ஆற்றிய பணிகள், பாராட்டத்தக்கவை. குறிப்பாக, கிராமியப் பொருளாதாரத்தை வலுப்படுத்துவதில் அவர் காட்டிய ஆர்வம் என்றும் பாராட்டத் தக்கது. அவருடைய ஆத்மா சாந்தியடைய வேண்டுமென வேண்டிக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நம்மிடையே மறைந்த முன்னாள் நாடாளுமன்ற உறுப்பினர் கௌரவ கனகசபை தன்மன்பிள்ளை அவர்களின் மறைவு குறித்த அனுதாபப் பிரேரணையை இந்த உயரிய சபையில் சமர்ப்பிப்பதில் மிகுந்த மனவருத்தத்துடனும் ஆழ்ந்த இரங்கலு டனும் நான் உங்கள் முன் நிற்கின்றேன். இலங்கைத் தமிழரசுக் கட்சியின் முக்கிய உறுப்பினராக விளங்கிய அன்னார், கடந்த 2004ஆம் ஆண்டு மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித் துவப்படுத்தி, அதிகூடிய விருப்பு வாக்குகளைப் பெற்று இந்த நாடாளுமன்றத்துக்குத் தெரிவானார். 2004 முதல் 2010 வரையான காலப்பகுதியில், சுமார் ஆறு ஆண்டுகள் சிறந்ததொரு நாடாளுமன்ற உறுப்பினராக அவர் இச்சபையில் ஆற்றிய பணிகள் என்றும் நினைவுகூரத்தக்கவை.

அன்னார் 1939ஆம் ஆண்டு மட்டக்களப்பில் திரு. தன்மன்பிள்ளை மற்றும் திருமதி தன்மன்பிள்ளை வளையாபிள்ளை ஆகியோருக்கு மகனாகப் பிறந்தார். மட்டக்களப்பு, களுதாவளை இராமகிருஷ்ண கல்லூரி மற்றும் சிவானந்தா தேசியப் பாடசாலை ஆகியவற்றில் தனது ஆரம்பக் கல்வியைக் கற்ற அவர், பின்னர் குண்டசாலையிலுள்ள இலங்கை விவசாயக் கல்லூரியில் தனது உயர் கல்வியைத் தொடர்ந்து, விவசாயத்தில் டிப்ளோமா கற்கைநெறியை நிறைவு செய்தார். விவசாயத்துறையில் அவர் கொண்டிருந்த ஆழ்ந்த அறிவின் காரணமாகப் பல்வேறு பதவிகளை வகித்து, நமது நாட்டின் விவசாயத்துறை மேம்பாட்டுக்காக மிக உன்னதமான பங்களிப்பை அவர் வழங்கியுள்ளார். 1969ஆம் ஆண்டு திருமதி சாந்தகுணம் அவர்களைத் தனது வாழ்க்கைத் துணைவியாக ஏற்றுக்கொண்ட அன்னார், மூன்று மகன்களுக்கும் ஒரு மகளுக்கும் அன்பான தந்தையாக விளங்கியதுடன், சிறந்ததொரு குடும்பத் தலைவராகவும் திகழ்ந்தார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவர் நாடாளுமன்ற உறுப்பினராகப் பணியாற்றிய காலகட்டத்தில், மட்டக்களப்பு மாவட்டத்தின் கல்வி, உயர் கல்வி மற்றும் கல்விசார் உட்கட்டமைப்பு வசதிகளின் முன்னேற்றத்துக்காக அர்ப்பணிப்புடன் பணியாற்றியிருந்தார். கல்வித்துறையில் மட்டுமன்றி, அப்பகுதி மக்களின் சுகாதார, உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்துவதிலும் அவர் காட்டிய அக்கறை போற்றுதலுக்குரியது. மேலும், அவர் கிழக்கு மாகாணத்தில் ஒரு வைத்திய பீடம் உருவாவதற்கு பாரிய பங்களிப்பை வழங்கியிருந்தார். அவர் ஆற்றிய சேவைகளை இங்கு உரையாற்றிய மட்டக்களப்பு மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ ஞானமுத்து ஸ்ரீநேசன் மற்றும் கௌரவ சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் மிகத் தெளிவாக எடுத்துக் கூறினார்கள். கனகசபை தன்மன்பிள்ளை அவர்களின் அரசியல் பயணம் எவ்வாறு அமைந்திருந்தது என்பதை அவரது கட்சியைச் சேர்ந்த கௌரவ சிவஞானம் சிறீதரன் அவர்கள் எடுத்துக் கூறினார்.

[ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී භවානන්දරාජා මහතා]

அவரது சிறந்த அரசியல் பண்பைப் பற்றி இன்றும் கிழக்கு மாகாண மக்கள் நினைவுகூர்கிறார்கள். நாடாளுமன்றத்தில் அங்கம்வகித்து மக்கள் சேவையாற்றிய கௌரவ தன்மன்பிள்ளை கனகசபை அவர்கள், 2025 செப்ரெம்பர் 19ஆம் திகதி தனது 86ஆவது வயதில் இயற்கை எய்தினார். மறைந்த கௌரவ கனகசபை அவர்கள், அவரது சமய நம்பிக்கைகளின்படி, அவர் விரும்பிய உன்னத நிலையை அடைய வேண்டுமென நாம் அனைவரும் பிரார்த்திக் கின்றோம். அன்னாரின் மறைவால் துயருற்றிருக்கும் அவரது அன்புப் பிள்ளைகளுக்கும் உறவினர்களுக்கும் அவரது மாவட்ட மக்களுக்கும் இந்த உயரிய சபை சார்பாக எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த ஆறு தலைவர்களும் வெவ்வேறு அரசியல் சித்தாந்தங்களைக் கொண்டிருந்தபோதிலும், எமது தாய்நாட்டின் இறையாண் மைக்கும் மக்களின் நல்வாழ்வுக்கும் ஆற்றிய உன்னத சேவைகள் பொதுவானவை. இவர்களின் மறைவால் துயருற்றிருக்கும் குடும்பத்தினருக்கும் உறவினர்களுக்கும் இவர்களைத் தேர்ந்தெடுத்த வாக்காளர் பெருமக்களுக்கும் நாடாளுமன்றத்தின் சார்பாகவும் தனிப்பட்ட ரீதியிலும் எனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக் கொள்கின்றேன். மறைந்த இந்த ஆறு முன்னாள் நாடாளுமன்ற உறுப்பினர்களின் ஆத்மாக்கள் சாந்தியடைய வேண்டுமென பிரார்த்திக்கின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

[பி.ப.3.30]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பாராளுமன்ற உறுப்பினர்களாகக் கடமைபுரிந்து, இந்த நாட்டுக்கும் தமது பிரதேசங்களுக்கும் அளப்பரிய பணிகளை ஆற்றிய, மறைந்த ஆறு தலைவர்கள் பற்றி இன்றைய தினம் நாங்கள் இந்தச் சபையில் பேசிக்கொண்டு இருக்கின்றோம்.

காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ பேராசிரியர் திஸ்ஸ விதாரண அவர்கள் பாராளுமன்றத்தில் என்னோடு மிகவும் நெருங்கிப் பழகி இருந்த ஒருவர். அவர் அமைச்சுப் பொறுப்புகளை வகித்த ஒருவர். Minister of Science and Technologyயாக அவர் இருந்தபோது, நான் அதன் Deputy Ministerஆகக் கடமையாற்றினேன். மிகப் பிரபல்யமான பல்வேறு விஞ்ஞான ஆய்வுகளுக்குச் சொந்தக்காரரான முன்னாள் அமைச்சர் கௌரவ திஸ்ஸ விதாரண அவர்கள், இன, மத, மொழி வேறுபாடுகளுக்கு அப்பால் இந்த நாட்டில் இனங்களுக்கு இடையில் ஒற்றுமை ஏற்பட வேண்டும் என்பதற்காகப் பாடுபட்ட ஒரு பெருந்தலைவர் ஆவார்.

லங்கா சமசமாஜ கட்சிமூலம் தனது அரசியல் பயணத்தை ஆரம்பித்த இவர், பல்வேறுபட்ட பணிகளைச் செய்தார். Minister of Science and Technology, Minister of Technology and Research, senior Minister for Scientific Affairs எனப் பல்வேறுபட்ட அமைச்சுப் பதவிகளை வகித்த ஒருவர். இலங்கையில் விஞ்ஞானம் மற்றும் மருத்துவத் துறைகளில் ஆராய்ச்சிகளை மேற்கொண்டு, பல புத்தகங்களை எழுதிய ஒருவர். இவர் மிகச் சிறந்த ஓர் அறிஞர். இவருக்கு 2017ஆம் ஆண்டு 'வித்தியா ஜோதி' என்ற தேசிய விருது வழங்கப்பட்டு கௌரவிக்கப்பட்டது. இந்த நாட்டில் இனங்களுக்கு இடையில் ஒற்றுமையை ஏற்படுத்துவதற்காக நியமிக்கப்பட்ட குழுவுக்குத் தலைமைதாங்கி இறுதி மூச்சுவரை பயணித்தார். இவர் எப்பொழுதும் மிகவும் அன்பாகவும் பக்குவமாகவும் பண்பாகவும் பேசக்கூடியவர். இவ்வாறான சிறந்ததொரு தலைவரை இந்த நாடு இழந்திருக்கின்றது. இவருடைய இழப்பானது, இந்த நாட்டின் விஞ்ஞானத்துறைக்கு ஏற்பட்ட மிகப் பெரிய இழப்பாகும். முன்னாள் பாராளுமன்ற உறுப்பினர் திஸ்ஸ விதாரண அவர்களின் மறைவால் துயருற்றிருக்கும் அவரது குடும்பத்தினருக்கும் உறவினர் களுக்கும் மட்டக்களப்பு மாவட்ட மக்கள் சார்பாகவும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பாகவும் எனது ஆழ்ந்த அனுதாபங்களை தெரிவித்துக் கொள்கின்றேன்.

காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ எஸ். சீ. முதுகுமாரண அவர்கள், வட மத்திய மாகாணத்தில் இருந்து பாராளுமன்றுக்குத் தெரிவாகி வந்து, அளப்பரிய பணிகளை ஆற்றிய ஒருவர். எங்களோடு மிக நெருக்கமாகச் செயற்பட்ட ஒருவர். இன, மத பேதங்களுக்கு அப்பால் எல்லா இன மக்களும் ஒன்றுபட்டு வாழ வேண்டுமென விரும்பிய ஒருவர். கௌரவ முதுகுமாரண அவர்களின் இழப்பானது, வட மத்திய மாகாண மக்களுக்கு மாத்திரமல்ல, முழு நாட்டுக்கும் பேரிழப்பாகும். அவரது இழப்பால் துயருற்றிருக்கும் அவரது குடும்பத்தினர், உறவினர்கள், நண்பர்கள் எல்லோருக்கும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் எங்களது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றோம்.

மறைந்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சந்திரதாச கலப்பத்தி அவர்கள் சிறந்த நாடாளுமன்ற உறுப்பினராக இருந்தவர். மிக எளிமையான வாழ்க்கை வாழ்ந்தவர். தனது தொகுதி மக்களுக்கு அதிக பணிகளைச் செய்தவர். வெள்ளப்பெருக்கு போன்ற கஷ்டமான நேரங்களில் எல்லாப் பிரதேசங்களுக்கும் சென்று உணவு வழங்குவது உள்ளிட்ட தன்னாலான அனைத்துச் சமூகப் பணிகளைச் செய்தவர். இன, மத, மொழி வேறுபாடுகளுக்கு அப்பால் அனைத்து மக்களுக்கும் சேவையாற்றியவர். அந்த வகையில், ஏழை மக்களோடு மிக நெருக்கமாக வாழ்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினர்தான் கௌரவ சந்திரதாச கலப்பத்தி அவர்கள். அவருடைய மறைவு உண்மையிலே பேரிழப்பாகும். அவரது மறைவால் துயருற்றிருக்கும் அவரது மனைவி, பிள்ளைகள் மற்றும் குடும்பத்தினருக்கு ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் எங்களது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கிறோம்.

காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் நந்தன குணதிலக அவர்கள் JVPஇன் ஆரம்பகால உறுப்பினராவார். அந்தக் கட்சியினூடாகப் பிரபல்யம் அடைந்தவர். இடதுசாரிக் கொள்கைகளை முன்னிறுத்தி தன்னுடைய அரசியல் பயணத்தை ஆரம்பித்த அவர், பாராளுமன்றத்துக்கு வந்து, அமைச்சராக இருந்து, அரசியல் அதிகாரங்களைப் பயன்படுத்தி, இந்த நாட்டில் பல மாற்றங்களைக்கொண்டு வருவதற்காகப் பல்வேறுபட்ட பணிகளைச் செய்தார். அதன் பின்னர் பாணந்துறை நகர சபையின் தலைவராக இருந்து பல்வேறு பணிகளைச் செய்தார். அவருடைய இழப்பு இந்த நாட்டுக்குப் பேரிழப்பாகும். அவருடைய இழப்பால்

துயருற்றிருக்கும் அன்னாரின் குடும்பத்தினருக்கு ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் என்னுடைய ஆழ்ந்த அனுதாபங்களை இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

முன்னாள் பாராளுமன்ற உறுப்பினர் ஜனக் மஹேந்திர அதிகாரி அவர்களுடைய மறைவு உண்மையிலேயே ஈடுசெய்ய முடியாத இழப்பாகும். அவர் இளம் வயதிலேயே என்னோடு பாராளுமன்றத்தில் இருந்தவர். 1994ஆம் ஆண்டு நான் பிரதி அமைச்சராக இருந்தபோது, எங்களோடு இணைந்து செயற்பட்டவர். குடும்ப அரசியல் பின்னணிமூலம் பாராளு மன்றத்துக்கு வந்த அவர், தனது இளம் வயதிலேயே அதிகமான பணிகளைச் செய்தார். அவர் என்னோடு நண்பராகப் பழகினார். நான் அமைச்சராக இருந்தபோது அநுராத புரத்துக்குச் சென்றிருக்கிறேன். அவரோடு சேர்ந்து அந்தப் பிரதேச மக்களுக்குப் பல பணிகளைச் செய்திருக்கின்றேன். கௌரவ ஜனக் மஹேந்திர அதிகாரி அவருடைய இழப்பானது, அநுராதபுர மாவட்ட மக்களுக்கு மட்டுமல்ல, இலங்கை வாழ் மக்களுக்கும் ஈடுசெய்ய முடியாத பேரிழப்பாகும். அவருடைய இழப்பால் துயருற்றிருக்கும் குடும்பத்தினருக்கும் நண்பர் களுக்கும் அநுராதபுர மாவட்ட மக்களுக்கும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ ரீ. கனகசபை அவர்களின் இழப்பானது, மட்டக்களப்பு மாவட்ட மக்களுக்கு ஈடுசெய்ய முடியாத பேரிழப்பாகும். கனகசபை தன்மன்பிள்ளை அவர்கள் 2004ஆம் ஆண்டு நடைபெற்ற பொதுத் தேர்தலில் மட்டக்களப்பு மாவட்டத்தில் போட்டியிட்டு கிட்டத்தட்ட 57,000 விருப்பு வாக்குகளைப் பெற்று இந்தப் பாராளுமன்றத்துக்கு வந்தவர். அவர் விவசாயத்துறையில் சிறந்த அனுபவமுள்ள ஒருவர். மட்டக்களப்பு மாவட்டத்தில் விவசாயத்துறையை முன்னேற்றுவதில் அதிக பங்களிப்புச் செய்த கனகசபை தன்மன்பிள்ளை அவர்கள், சுகாதாரத்துறை உட்பட பல்வேறு துறைகளிலும் அந்தப் பிரதேசம் முன்னேறுவதற்கு அதிக பங்களிப்புச் செய்தார்.

இலங்கைத் தமிழரசுக் கட்சி சார்பில் பாராளுமன்ற உறுப்பினராகத் தெரிவுசெய்யப்பட்ட அவர், அந்தக் கட்சியின் வளர்ச்சிக்காக மட்டக்களப்பு மாவட்டத்தின் பட்டிருப்புத் தொகுதியில் அதிக பணிகளைச் செய்தார். மேலும், களுவாஞ்சிக்குடி வைத்தியசாலையை Base Hospitalஆகத் தரமுயர்த்துவதிலும், கிழக்குப் பல்கலைக்கழகத்தில் உருவாக் கப்பட்டிருந்த Medical Facultyஐத் தரமுயர்த்தி, அதற்குத் தேவையான வசதிகளைச் செய்து கொடுப்பதிலும் அவர் அதிக பங்களிப்புச் செய்தார். 1994-2000 காலப்பகுதியில் சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க அவர்கள் சனாதிபதி இருந்தபோது, கிழக்குப் பல்கலைக்கழகத்தில் Medical Facultyஐ உருவாக்க வேண்டுமென நாங்கள் கோரிக்கை முன்வைத்தோம். அப்போது பிரதி அமைச்சராக இருந்த நான், அமைச்சராக இருந்த கௌரவ மங்கள சமரவீர அவர்களுடன் தொடர்புகொண்டு இது பற்றி கதைத்தன் அடிப்படையில், அவர் சமர்ப்பித்த அமைச்சரவைப் பத்திரத்தின் ஊடாகத்தான் கிழக்குப் பல்கலைக்கழகத்தில் Medical Faculty உருவாக்கப் பட்டது. அவ்வாறு உருவாக்கப்பட்ட Medical Facultyஐ வளர்த்தெடுப்பதற்கு காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ தன்மன்பிள்ளை கனகசபை அவர்கள் தன்னுடைய பாராளுமன்ற உறுப்பினர் பதவியைப் பயன்படுத்தி அதிக பணிகளைச் செய்திருக்கிறார். அது மாத்திர மல்ல, விவசாயத்துறையில் தனக்கிருந்த அனுபவத்தைக் கொண்டு, மட்டக்களப்பு மாவட்டத்தில் விவசாயத்துறையை முன்னேற்றுவதற்கு அவர் அதிக பங்களிப்புச் செய்திருக்கிறார்.

கௌரவ தன்மன்பிள்ளை கனகசபை அவர்களுடைய இழப்பானது, மட்டக்களப்பு மாவட்ட மக்களுக்கு குறிப்பாக கமநலத்தோடு தொடர்புபட்டவர்களுக்கும் பட்டிருப்புத் தொகுதி மக்களுக்கும் பாரிய இழப்பாகும். அவருடைய இழப்பால் துயருற்றிருக்கும் அவரது மனைவி, பிள்ளைகள் மற்றும் குடும்பத்தவர்களுக்கு மட்டக்களப்பு மாவட்ட மக்கள் சார்பிலும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பிலும் எனது ஆழ்ந்த அனுதாபங்களை தெரிவித்துக் கொள்கின்றேன். எங்களுடைய கட்சியின் தலைவரும் பாராளுமன்ற உறுப்பின ருமான சிரேஷ்ட சட்டத்தரணி கௌரவ ரஊப் ஹகீம் அவர்கள் அண்மையில் தன்மன்பிள்ளை கனகசபை தொடர்பில் ஒரு கட்டுரை எழுதியிருந்தார். தன்மன்பிள்ளை கனகசபை அவர்களுடைய குடும்பத்தினர் அவர் தொடர்பான ஒரு புத்தகத்தை வெளியிட்டபோது, அந்தப் புத்தகத்திலும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் சட்டத்தரணி கௌரவ ரஊப் ஹகீம் அவர்கள் தனது அனுதாபச் செய்தியை இட்டிருந்தார். அதில் அவர், கௌரவ தன்மன்பிள்ளை கனகசபை அவர்கள் தன்னோடு மிக நெருக்கமாகச் செயற்பட்டு பல்வேறு பணிகளைச் செய்தவர் என்றும், இனங்களுக்கு இடையில் ஒற்றுமை ஏற்பட வேண்டும், அதன் ஊடாகத்தான் எங்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வு காண முடியும், தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் ஒற்றுமைப் படுகின்றபோதுதான் எங்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வு காண முடியுமென்ற நிலைப்பாட்டில் செயற்பட்டவர் என்றும் குறிப்பிட்டிருக்கிறார். அவ்வாறான நல்லதொரு தலைவரை இன்று நாம் இழந்திருக்கின்றோம். கௌரவ தன்மன்பிள்ளை கனகசபை அவர்களுடைய இழப்பால் துயருற்றிருக்கும் அவரது குடும்பத்தவர்களுக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களை மீண்டும் தெரிவித்து, உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

[பி.ப. 3.42]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் நடைபெறுகின்ற காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ பேராசிரியர் திஸ்ஸ விதாரண, கௌரவ எஸ்.சீ. முதுகுமாரண, கௌரவ சந்திரதாச கலப்பத்தி, கௌரவ நந்தன குணதிலக, கௌரவ ஜனக் மஹேந்திர அதிகாரி, கௌரவ ரீ. கனகசபை ஆகியோர் தொடர்பான அனுதாபப் பிரேரணையில் கலந்துகொண்டு எனது கருத்துகளை முன்வைக்கலாமென எண்ணுகின்றேன். மேற்கூறிய காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் இந்த நாடாளுமன்றத்தில் கடமையாற்றி யவர்கள் என்ற அடிப்படையில், அவர்களை நான் நன்கறிவேன்; அவர்களோடு பணியாற்றியும் இருக்கின்றேன். அவர்களுடைய குடும்பத்தாருக்கும் உறவினர்களுக்கும் தொகுதி மக்களுக்கும் இந்த உயரிய சபையில் எங்களுடைய மக்கள் சார்பாக எனது அனுதாபத்தை தெரிவித்துக் கொள்கின்றேன்.

முதலில் கனகசபை ஐயா அவர்களை நினைவுகூர விரும்புகின்றேன். தமிழ்த் தேசியக் கூட்டமைப்பில் எங்களோடு இருந்த கனகசபை ஐயா அவர்களுக்கு அரசியலுக்கு வர வேண்டுமென்ற எண்ணம் துளியளவுகூட

[ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

இருக்கவில்லை. அரசியலுக்கு வருவதற்கு அவருக்கு விருப்பமும் இருக்கவில்லை. அவருடைய நடத்தை, அவர் எப்படி மக்களோடு பழகுகிறார், அவர் தொடர்பில் மக்கள் கொண்டிருந்த அபிப்பிராயம் என்பவற்றைக் கருத்திற்கொண்டுதான் நாங்கள் அவரை தமிழ்த் தேசியக் கூட்டமைப்பின் வேட்பாளராக நிறுத்தினோம். அவர் அண்ணன் போன்றுதான் என்னோடு பழகினார். அதனால் நான் அவரை அண்ணன் என்றுதான் அழைத்தேன். அவருடைய குடும்பத்தினரும் என்னோடு அன்னியோன்யமாகப் பழகினார்கள். நான் மட்டக்களப்புக்குச் சென்றால், அவருடைய பிள்ளைகள் என்னோடு நெருங்கிய உறவினர்கள் போல்தான் நடந்து கொள்வார்கள்.

கௌரவ கனகசபை ஐயா அவர்கள் நேர்மையானவர். நான் அவரிடமிருந்து பல விடயங்களைக் கற்றுகொண்டு இருக்கின்றேன். நேர்மைத் தன்மை, மக்களுடன் பழகுகின்ற விதம், மனிதநேயம், உதவி செய்யும் மனப்பாங்கு, தேசியத்தின் மீதான பற்று என்பவற்றை நாங்கள் அவரிடமிருந்து கற்றுக்கொள்ள முடியும். அவர் பொறுமையானவர். அவரைப் பார்த்தால் அப்பாவி போன்றுதான் இருப்பார். "சாது மிரண்டால் காடு கொள்ளாது" என்பதுபோல, சில சமயங்களில் எங்கள் எல்லோரையும் ஓர் இடத்தில் இருத்தி வைக்கின்ற வகையில் அவருடைய செயற்பாடு இருக்கும். நாங்கள் ஏதாவதொரு விதத்தில் தவறு செய்யும்பொழுது, அதை நியாயமான முறையில் உரத்த குரலில் தட்டிக் கேட்பார். அது மாத்திரமன்றி, தான் வைக்கும் கோரிக்கையை மற்றவர்கள் ஏற்றுக்கொள்ள வைக்கின்ற திறமை அவரிடம் இருந்தது. அவருடைய இழப்பானது மட்டக்களப்பு மாவட்ட மக்களுக்குப் பாரிய இழப்பாகும்.

அவருடைய வீட்டில் எந்த நேரமும் அவருடைய கிராம மக்களின் நடமாட்டம் இருப்பதை நான் பார்த்திருக்கிறேன். அப்படியான ஒரு செயல் வீரனையே நாங்கள் இழந்திருக்கின்றோம். இன்று இந்த உயரிய சபையில் கனகசபை ஐயா அவர்களை நினைவுகூர்வதற்கு அவருடைய தாய், மனைவி, பிள்ளைகள், அவருடைய கிராமத்து மக்களே காரணமாக இருக்கிறார்கள். அதையிட்டு நான் உண்மையிலேயே பெருமைப்படுகின்றேன். இருந்தாலும், அவருடைய இழப்பானது அவருடைய பாரியார், பிள்ளைகளுக்குப் பாரிய இழப்பாகும். அந்தளவுக்கு அவர் தனது குடும்பத்துடன் நெருக்கமாக இருந்தார். நாடாளுமன்ற அமர்வு முடிந்த உடனே வீட்டுக்குச் சென்று விடுவார். அவருடைய பிள்ளைகளோடுதான் அதிக நேரத்தைக் கழிப்பார்.

என்னைப் பொறுத்தமட்டில், கனகசபை ஐயா அவர்கள் மனிதாபிமானம் உள்ளவராக, தேசாபிமானியாக, இனத்தின் மீது பற்றுக் கொண்டவராக இருந்தார். கிழக்கு மாகாணத்திலுள்ள எல்லாத் தமிழ் மக்களிடமும் இனப்பற்று இருக்கிறது. வீரம் செறிந்த அந்த மண்ணில் வாழ்ந்த ஒருவர் இன்று இச்சபையில் நினைவுகூரப்படுகின்றார் என்றால், உண்மையிலேயே நாம் பெருமைப்பட வேண்டும். தமிழ்த் தேசியக் கூட்டமைப்பு உருவாகுவதற்கான அத்திவாரமும் மட்டக்களப்பில்தான் இடப்பட்டது. அந்த மட்டக்களப்பு மாவட்டத்தில் போட்டியிட்டு பெரும்பான்மை மக்களுடைய ஆதரவைப் பெற்று பாராளுமன்றத்துக்கு வந்தவர்தான் எங்களுடைய கனகசபை அண்ணன் அவர்கள்! அவரைப் பற்றி நிறைய விடயங்களைச் சொல்ல முடியும். இன்றைக்கும் அவருடைய இழப்பைத் தாங்கிக்கொண்டு இருக்கின்ற மட்டக்களப்பு மாவட்ட மக்களுக்கும் அவருடைய பாரியார் மற்றும் பிள்ளைகளுக்கும் இங்குள்ள 225 பாராளுமன்ற உறுப்பினர்கள் சார்பாக என்னுடைய அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்றைய தினம் அனுதாபப் பிரேரணை கொண்டுவரப்பட்டுள்ள அனைவரினது ஆத்மாக்களும் சாந்தியடைய வேண்டுமென நாங்கள் என்றைக்கும் பிரார்த்திப்போம் என்று சொல்லி, வாய்ப்பளித்ததற்கு நன்றி கூறி, விடை பெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මහතා.

[3.50 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Presiding Member, I am thankful that I have been given this opportunity to speak a few words about these great men who had left this House forever. I would not speak about every late Hon. Member, but about the late Hon. (Prof.) Tissa Vitarana.

Today, you would have seen a lot of Hon. Members from minority communities speaking about him. He was a true Sri Lankan. Unfortunately, today, politics is used to divide us by race and religion. But, the Hon. (Prof.) Tissa Vitarana stood up for what was right. He was a friend of the minority communities as well as of the majority community and was a true Sri Lankan. Sir, we need more people like the late Hon. (Prof.) Tissa Vitarana. Listening to the speeches today, I witnessed that the majority of the minority leaders here applauded him for what he had done. I, as a Sri Lankan and a Muslim, have to thank him for standing by us during one of the darkest periods, the COVID-19 pandemic. We were not fearful of the virus, but we were fearful of being cremated. He stood by us as a true Sri Lankan. I can remember, President Gotabaya Rajapaksa thought, because the Muslims did not vote for him, he could take revenge by cremating the Muslim COVID victims without giving us the opportunity to bury them. There was no scientific evidence at all for doing that, but he thought, “I will teach the Muslim community a lesson because they did not vote for me”. Finally, we saw the fate of propagating racism or using racism as a tool for politics: the Muslims, the Tamils and the Sinhalese chased him out. He was the first President in Sri Lanka who had to leave office before the end of his tenure. He also had to leave the country. People opposed his leadership. He thought, by propagating racism and hatred against the Tamils and the Muslims, he could become the hero of the Sinhalese.

The Sinhala community is the most compassionate community. I have witnessed that the Sinhalese do not accept racism; they like to live in harmony, respecting other religions. Unfortunately, certain politicians tried to use religion as a tool to draw hatred towards the other

communities, but the Hon. (Prof.) Tissa Vitarana always stood by us. When COVID-19 pandemic occurred, he told the then President and the Government, "Do not do this. There is no scientific basis for burying COVID victims." When 192 countries allowed their burial, Sri Lanka took the decision to cremate them. Subsequent to that, the current Minister of Health Minister and your Government apologized for what happened at that time. So, Sri Lankans are not racist.

Also, the Hon. (Prof.) Tissa Vitarana believed in the Executive, the Legislature and the Judiciary and he championed all forums. Many a time, he told President Mahinda Rajapaksa, "Appoint the most senior judges. If you would not give the promotion to the most senior judge, send him home because he also has a family and self-respect." He always wanted career judges to be looked after. There are various persons who come either from the Attorney-General's Department or the private bar, but career judges have chosen this as their career path. The Minister of Justice and National Integration is here. So, we have to see that career judges are always protected. They join the Judiciary as magistrates. Then, they want to go to the District Court, from there, to the High Court and thereafter, their aspiration is to go to the Court of Appeal and finally, to the Supreme Court. And, we, in this House, the Legislature, exercise judicial power through courts. So, therefore, every Member of this House has to be conscious about the Judiciary. I remember how the late Hon. (Prof.) Tissa Vitarana championed that cause. Even though during Mrs. Shirani Bandaranayake's time, we voted for for her Impeachment - I think that is one of the biggest mistakes we all did - he, being in Government, very strongly articulated against it.

So, I believe it is your legacy that is important. While you are alive, you can think of becoming a great man and be a great man. Today, in this House, all these condolence messages echo the sentiment how great all these men were. It is not what people say when you are alive, but what they say when you are dead that matters. Sir, I would like to end my speech by saying that this House has produced great men, this House will continue to produce great men and I think we should produce great men who believe in a Sri Lankan identity.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා, ගරු එස්.සී. මුතුකුමාරණ මහතා, ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මහතා, ගරු නන්දන ගුණතිලක මහතා, ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මහතා සහ ගරු ටී. කනගසබෙයි මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින්, එම ශෝක යෝජනාවලට ගරු කථානායකතුමා සමඟ මම ද එකතු වීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් එම පවුල්වල අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරියට මම නියෝග කරමි.

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

# කල්තැබීමේ ප්‍රශ්න
# ஒத்திவைப்பு வினாக்கள்
# ADJOURNMENT QUESTIONS

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පළමුවැනි ප්‍රශ්නය, ගරු කංචන වැලිපිටිය මහතා.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ ප්‍රශ්නය අහන්නේ, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 51ක් තිබෙනවා. එම ග්‍රාම නිලධාරි වසම් 51ම ජීවත් වන ජනතාවට පවතින ප්‍රධානම ගැටලුවක් තමයි ජල ගැටලුව. මෙම ගැටලුවට උත්තරයක් හැටියට 2021 මැයි මාසයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "විසල් ජල යෝජනා ක්‍රමය" කියලා ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කරලා තිබුණා. එය හැලමඩ ග්‍රාම නිලධාරි වසමේ බටුවත්ත කියන ප්‍රදේශයේ තමයි ආරම්භ කර තිබුණේ. හැලමඩ ජල පවිත්‍රාගාරයෙන් පිරිසිදු කරන ජලය වේරගොඩ ජල ටැංකියේ ගබඩා කරලා, එතැනින් කොබ්බෑවල ටැංකියටත්, නාරංගොඩ ටැංකියටත් ගිහිල්ලා තමයි ජනතාවට අවශ්‍ය ජලය බෙදා දීමට, ජනතාවගේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කටයුත්ත කාර්යක්ෂම බවක් නැතුව තමයි සිද්ධ වන්නේ. 2021 වසරේ ආරම්භ කළ එම ව්‍යාපෘතිය මේ වෙනකොටත් අවසන් කරන්න බැරිවෙලා තිබෙනවා. ඒ නිසාම ප්‍රාදේශයේ ජනතාව දැවැන්ත පීඩනයකට පත් වෙලා ඉන්නවා.

මේ විසල් ජල යෝජනා ක්‍රමයේ අරමුණ වී තිබුණේ නිවාස 13,000කට ජලය ලබා දීමයි. හැබැයි, නිවාස 4,037කට වතුර ලබා දෙන්න විතරයි සමත් වෙලා තිබෙන්නේ. තව නිවාස 9,000කට විතර වතුර ලබා දෙන්න අවශ්‍යයි. නමුත් මෙන්න මේ වැඩ පිළිවෙළ අවසන් කරගන්න බැරුව තමයි දැන් National Water Supply and Drainage Board එක ඉන්නේ. අපි මේ පිළිබඳව ප්‍රශ්න කරද්දී ඒගොල්ලන් කියන්නේ මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන

[ගරු කංචන වැලිපිටිය මහතා]

නැහැ කියලායි. ජල නළ ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන නැහැ කියන කාරණය ඒගොල්ලන් සඳහන් කරනවා. කෑගල්ල දිස්ත්‍රික්කය පිහිටා තිබෙන භූ විෂමතාවත් එක්ක ගුරුත්ව බලය අනුව ජලය ගලාගෙන යෑමට තමයි එම වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොඩක් කඳුකර ප්‍රදේශ තිබෙන්නේ. ඒ නිසා කඳුකර ප්‍රදේශවලට මේ ව්‍යාපෘතිය හරහා ජලය ලබා දෙන්න බැහැ. ඒ නිසාත් ජනතාවට අවශ්‍ය වතුර ටික ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ සඳහා අදාළ වැඩ පිළිවෙළකුත් හදාගන්න තවම බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 අවුරුද්දේ සිදුවුණු නාය යෑමට හසු වුණු ජනතාවක් කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉන්නවා. ඒ අවස්ථාවේදී පවුල් 35ක් ඒ ව්‍යසනයට මුහුණ දී තිබුණා. ඒ ජනතාවට නිවාස ලබා දී තිබෙන්නේ කෑගල්ල, ගලිගමුවේ, හැලමඩ ප්‍රදේශයේ රක්ෂපුර කියන ගම්මානයේ. එතැන තමයි ඒ ජනතාව පදිංචි කර තිබුණේ. ඒ ප්‍රදේශයත් කඳුකර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ සිටින ජනතාවටත් අවශ්‍ය වතුර ටික නැහැ. පිටින් අරගෙන ගිහින් පදිංචි කළ ඒ ජනතාවටත් වතුර නැහැ. ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පුරා පදිංචි වී සිටින ජනතාව දිගින් දිගටම මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්නයක් තමයි මේ ජල ගැටලුව. ඒ නිසාම තමයි මම ගරු ඇමතිතුමාට මේ ප්‍රශ්න යොමු කරන්නේ.

මම ගරු ඇමතිතුමාගෙන් පහත ප්‍රශ්න අහන්න කැමතියි.

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ආසනයේ ජල පරිභෝගික අවශ්‍යතාව සංඛ්‍යාත්මක වශයෙන් (දළ වශයෙන්) කොපමණ ද?
2. එම අවශ්‍යතාව මෙතෙක් සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව ඔබතුමා දන්නේද?
3. ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට මෙතෙක් ක්‍රියාත්මක ව්‍යාපෘති මොනවාද?
4. එම ව්‍යාපෘතිවල සාර්ථක, අසාර්ථක ප්‍රගතිය පැහැදිලි කරන්නේද?
5. ගලිගමුව ආසනයේ ජල පාරිභෝගික අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති මොනවාදැයි ඔබතුමා මෙම සභාවට දක්වන්නේද?
6. නොඑසේ නම් ඒ මන්ද?

මෙම ප්‍රශ්නාවලිය සඳහා ගරු ඇමතිතුමාගෙන් මා පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී කංචන වැලිපිටිය මහතා විසින් අසන ලද ප්‍රශ්නයට නිවාස, ඉදිකිරීම්, හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුරු ලබා දෙනවා.

1. ගලිගමුව ජල සම්පාදන ක්‍රමයේ පවතින ජල පිරිපහදුවේ ධාරිතාව දවසකට ඝන මීටර් 9,000ක් වන අතර, මෙයින් දිනකට ඝන මීටර් 1,000ක් කෑගල්ල ජල සම්පාදන ක්‍රමය වෙත මුදා හරී. ඉතිරි දවසකට ඝන මීටර් 8,000ක ප්‍රමාණය ගලිගමුව ජල සම්පාදන ක්‍රමය වෙත ලබා දෙයි. එහෙත් ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජනගහනය 79,043ක් - ආසන්න වශයෙන් පවුල් 19,000ක් පමණ - සිටින අතර, භූ විෂමතාව සහ අනෙකුත් තාක්ෂණික කරුණු සලකමින් වර්ෂ 2035 වන විට ගලිගමුව ජල සම්පාදන ක්‍රමය මඟින් ආවරණය කිරීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව 13,000කි. (නව ජල සම්පාදන සම්බන්ධතා13,000යි.)
2. ඔව්. ගලිගමුව ජල සම්පාදන ක්‍රමය (ජල පවිත්‍රාගාරය, බෙදා හැරීමේ ටැංකි - 3, සම්ප්‍රේෂණ නළ පද්ධතිය කිලෝමීටර 16ක් හා බෙදා හැරීමේ නල පද්ධතිය - කිලෝමීටර 124) ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - WaSSIP - යටතේ 2022 වර්ෂයේ නිම කරන ලදී. එමඟින් මේ වන විට ජල සම්බන්ධන 4,005ක් පමණ ලබා දී ඇත. එහෙත් අපේක්ෂිත ජල සම්බන්ධතා 13,000ක ප්‍රමාණයක් ලබා දීමට භූ විෂමතාව සමඟ තවදුරටත් බෙදා හැරීමේ/ සම්ප්‍රේෂණ නල පද්ධති සමඟ හා ජල ටැංකි ස්ථාපිත කළ යුතුය. (අපේක්ෂිත ග්‍රාම නිලධාරි වසම් 17යි.)
3. පළාත් සභා සහ මණ්ඩලයීය ප්‍රතිපාදන යටතේ පහත සඳහන් ජල නල දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ පිළිබඳව ඇමුණුම 1හි දක්වා ඇත.

   63 mm dia. HDPE - 3,995 m. ඒ කියන්නේ, කිලෝමීටර 4ක් විතර එළන්න අපේක්ෂිතයි.

   අපේක්ෂිත ජල සම්බන්ධතා ගණන - 95

   90 mm dia. HDPE - 2,550 m. ඒ කියන්නේ, කිලෝමීටර 2.5 ක් විතර, එළන්න අපේක්ෂිතයි.

   අපේක්ෂිත ජල සම්බන්ධතා ගණන - 63
4. කාලයත් සමඟ පවතින ප්‍රතිපාදන යටතේ පාරිභෝගික අවශ්‍යතාව සැපයීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව සාර්ථකත්වයක පවතී.
5. ව්‍යාපෘති අංක (1) - ඉහළ ප්‍රදේශයන් ආවරණය වන පරිදි ජලය රැස් කිරීමේ ටැංකි/පොම්පාගාර/බෙදා හැරීමේ ටැංකි/ පොම්පීය හා බෙදා හැරීමේ නල මාර්ග - දුර කිලෝමීටර 36.4 - ස්ථාපිත කිරීම තුළින් ජල සම්බන්ධතා 1,900ක් ලබා දීම සඳහා "කළුගල ව්‍යාපෘතිය" යෝජනා කර ඇත. ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 837කි.

   මෙහි හඳුනාගත් ඉඩම් ලබා දෙන ලෙස වැවිලි සමාගමෙන් ඉල්ලීම් කර ඇති අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට යොමු කර ඇත. පොම්පාගාරය දක්වා ජල නළ එළීම සැලසුම් කර ටෙන්ඩර් කැඳවීමට ප්‍රදානය කර ඇත.

   ව්‍යාපෘතිය අංක (2) - පවතින ජල නළ පද්ධතිය දීර්ඝ කිරීම තුළින් - කිලෝමීටර 43.2ක ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 829කි. - ජල සම්බන්ධතා 1,374ක් ලබා දීමට සැලසුම් කර ඇත. රජයේ ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. ඇමුණුම 2හි විස්තර දක්වා ඇත.

   ඇමුණුම් 1 සහ 2 **සභාගත*** කරමි.
6. අදාළ නැත.

ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ සමස්ත කාරණාව පිළිබඳව අපි දිස්ත්‍රික් කළමනාකාරතුමා ඇතුළු නිලධාරින් එකතු කරගෙන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් එකතු කරගෙන ඉදිරි මාසයේදී සාකච්ඡා කරලා, තවදුරටත් ජනතාව සහ රජය සම්බන්ධ කරගෙන අදාළ ප්‍රදේශයේ ජල නළ එළන්න - දීර්ඝ කරන්න - අපට සාකච්ඡා කර ගන්න පුළුවන්. ඔබතුමා විසින් නඟන ලද ප්‍රශ්නයට අදාළව මේ මොහොත වනකොට ගත්ත ක්‍රියාමාර්ග තමයි මම ප්‍රකාශ කළේ.

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ දෙවන ප්‍රශ්නය, ගරු අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රශ්නයක් මා ඉදිරිපත් කරන්නේ. පිළිතුරු ලබා දීමට පැමිණීම සම්බන්ධයෙන් ගරු අධිකරණ විෂය භාර ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා. එතුමාත් මා වාගේම නීතිඥ පවුලකින් පැවත එන්නේ. ගරු ඇමතිතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වාසුදේව නානායක්කාර මහත්මයාත් නීතිඥවරයෙක්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ඔව්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමාගේ නැන්දනිය මට හමු වෙලා තිබෙනවා. එතුමියත් නීතිඥවරියක්. ඔබතුමා නීතිඥ පවුලකින් පැවත එන්නේ. හොඳ පවුලකින් ඔබතුමා පැවත එන්නේ. හොඳ පවුලකින් පැවත එනවා කියන්නේ, ඔබතුමා ටයි කෝට් ඇඳලා පටිය දමන නිසා හෝ ඉංග්‍රීසි කථා කරන නිසා නොවෙයි. ගුණ යහපත් දෙමව්පියන් සිටින හොඳ පවුලකින් ඔබතුමා පැවත එන බව මා දන්නවා. දේශපාලන වශයෙන් අප අතර විරුද්ධ මත තිබුණත්, ඔබතුමා නීති වෘත්තිය, අධිකරණය සහ අධිකරණයේ ස්වාධිපත්‍යය රැකීම සඳහා කටයුතු කරයි කියලා මා බලාපොරොත්තු වනවා. සමහර වෙලාවට පක්ෂයකට නැඹුරුව දේශපාලනය කරනකොට අපට මේක අමතක වනවා, විශේෂයෙන්ම බලයේ ඉන්නකොට. බලය තබා ගන්නත්, බලය පතුරුවන්නත් අප වාගේ රටවල දේශපාලනඥයින් බොහෝ දේ කරනවා. අපේ රට දියුණු රටක් නොවෙයි. එංගලන්තය, අයර්ලන්තය වාගේ දියුණු නීති පද්ධතියක් තවම අපේ රටේ විශ්ලේෂණය වෙලා නැහැ, එය වෙමින් පවතිනවා. හැබැයි අපේ රටේ නීති පද්ධතිය ඉතා උසස් මට්ටමක පවතිනවා. ඉතින්, මේ වාගේ රටක අපි විශේෂයෙන්ම බලාගන්න ඕනෑ මොකක්ද?

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේ හා සම්බන්ධ ඉතිහාසය. විශේෂයෙන්ම මම අගවිනිසුරුතුමන්ලා දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්නම්. ඒ තමයි, සරත් එන්. සිල්වා මැතිතුමා සහ මොහාන් පීරිස් මැතිතුමා. ඒ කාලයේ මමත් මේ නීති වෘත්තියේ යෙදිලා හිටියා. ඔබතුමාත් පිළිගන්නවා ඇති, ඒ කාලයේ අධිකරණය විශාල ලෙස දේශපාලනීකරණයට ලක් කරනු ලැබූ බව. විශේෂයෙන් ඔවුන් පත් කිරීම තුළ විරුද්ධවාදීන්ට, විරුද්ධ පක්ෂයේ දේශපාලනඥයින්ට විශාල අඩන්තේට්ටම්, හිරිහැරවලට මුහුණ පාන්න සිදු වුණා. ඒ වාගේම රටේ ජනතාවටත් නීතියේ ස්වාධිපත්‍යය නැති වන තත්ත්වයක් නිර්මාණය වුණා.

ගරු ඇමතිතුමනි, කෙසේ වෙතත් මම රාජපක්ෂවරුන්ට විරුද්ධව විශාල සටනක් ඒ කාලයේ කළා, අවස්ථා දෙකකදීම මාව නීති විරෝධී ලෙස සිරගත කරන්න උත්සාහ කළාට. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඒ අගවිනිසුරුවරුන් ඉන්න කාලයේ වුණත් මට නීතියෙන් සහනයක් ලබා ගන්න අවස්ථාව ලැබුණා. ඒ තත්ත්වය උදා වුණත් සෑහෙන දුරට අපේ වෘත්තිය erode වුණා කියන්න පුළුවන්, එක එක අංශවලින්. හැබැයි, කෙසේ වෙතත් ඒ erosion එක ඇතුළේ පවා - මම කියන්නේ නැහැ, ඒක හොඳම තත්ත්වයක් කියලා - නීතියෙන් යම් සහනයක් ලබා ගන්න මට හැකියාව ලැබුණා.

ගරු ඇමතිතුමනි, මා මෙම කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ සමහර අයගේ අන්තිම අවුරුද්ද වාගේ කාලය තුළ මට අහන්න ලැබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ වෘත්තියේ යෙදෙන නීතිඥවරුන්ට නඩු පවා නැති වන තත්ත්වයක්, ශ්‍රේෂ්ඨාධිකරණයට යෑමට බැරි තත්ත්වයක් පවා උදා වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් නඩු කථා කරන්නත් කලින් පොඩ්ඩක් අහලා - විනාඩි 20ක්, විනාඩි 30ක්, සමහර විට පැයක් අහන්න පුළුවන් - විසි කරන තත්ත්වයක් දකින්න තිබුණා. ඔබතුමාත් දන්නවා, මානව හිමිකම්, එහෙම නැත්නම් මූලික අයිතිවාසිකම් නඩුවක් කියන්නේ අපේ පරම අයිතියක් බව. මේ අයිතිය නැත්නම් රටේ ජනතාවට විශාල හිරිහැරවලට මුහුණ පාන්න සිදු වනවා. මේක පසුකාලීනව develop වුණු law එකක්. මේක දිගටම තිබුණු එකක් නොවෙයි. කෙසේ වෙතත්, මේ ලෝකය දියුණු වනවාත් එක්කම ජනතාවගේ අයිතිවාසිකම්වලට වැදගත්කමක් ලැබෙනකොට නීති වෘත්තිය ලෝකයේ හැම රටකටම වාගේ ව්‍යාප්ත වන්න පටන්ගත්තා. මේක ඉතා වැදගත් දෙයක්, අපේ රට වාගේ රටකට.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, නඩුවක් file කරන්න කොච්චර අමාරුද කියලා. මගේ නඩුවක් file කරන්න පවා මම විශාල පරිශ්‍රමයක් යොදලා, විශාල මුදලක් යොදලා ජනාධිපති නීතිඥවරයකු මඟින්නුයි උසාවියට ගියේ. ඒ අවස්ථාවේදී කිව්වේ, නීති විරෝධී ලෙස මට හිරිහැර කරනවා කියලායි. මම උදාහරණයක් විතරක් දෙන්නම්. මා ගැන කථා කරන්න නොවෙයි මම මේ දේවල් කියන්නේ. ඒ එක අධිකරණයක හිටියා, කෝදාගොඩ විනිසුරුතුමා. අනෙක් එකේ නවාස් විනිසුරුතුමා මූලිකත්වය ගත්තා. කෝදාගොඩ මැතිතුමා කිව්වා, "This should be heard in the Chambers. It is very sensitive" කියලා. ඒ තිබෙන චෝදනා අභූත චෝදනා. මේ ආකාරයෙන් විනිසුරු මඬුලු දෙකකට ආවාට පස්සේ තව විනිසුරු මඬුල්ලකට ගියා. එහිදී, "පොලීසිය ඉන්නේ නඩු දමන්න, අපි ඉන්නේ හිරේ දමන්න කියලා" ඒ විනිසුරු මඬුල්ලේ හිටපු විනිසුරුතුමා විනාඩි දෙකෙන් නඩුව විසි කළා. එතකොට බලන්න, එච්චර අමාරුවෙන් දමන නඩුවකට වෙන දේ. මම මේ කියන්නේ උදාහරණයක්. අපේ සභානායකතුමා නම් හිනාවෙලා යනවා, දැන් ආණ්ඩු පක්ෂයේ ඉන්න නිසා. ඒ කාලයේ විරුද්ධ පක්ෂයේ ඉන්නකොට නම් එතුමා අපිත් එක්ක ඕවාට ලොකුවට සටන් කළා; ගිරිය පුප්පගෙන කෑ ගැහුවා. අපි අගය කරනවා, ඒ කාලයේ එතුමා අපිත් එක්ක සටන් කළ ආකාරය. මම ඒක තමයි කිව්වේ, ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට මේක දැනෙන්නේ නැහැ කියලා. ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට රාජපක්ෂවරුනුත් ඔහොමයි. හැබැයි දැන් ඔවුන්ට මේ තත්ත්වය දැනෙනවා ඇති, විරුද්ධ පක්ෂයේ ඉන්නකොට. ඒ නිසා අපි ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් මේ සම්බන්ධව ප්‍රශ්න කිහිපයක් අහලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මේ වකවානුව තුළම අධිකරණවල වැඩ කරන විනිසුරුවරුන් 40ක වාගේ පිරිසකගේ වැඩ තහනම් කරලා තිබෙනවා. අපට ලැබෙන තොරතුරු අනුව මූලික පරීක්ෂණයක් පවත්වලාත් නැහැ, විධිමත් විනය පරීක්ෂණයක් පවත්වලාත් නැහැ. අපි බලාපොරොත්තු වනවා, හරියාකාරව ඒ විනිසුරුවරුන්ට අවස්ථාවක් ලබා දෙයි කියලා, ඔවුන්ගේ නිරවද්‍යතාවක් තිබෙනවා නම් ඔප්පු කරන්න.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම දකිනවා, දේශපාලනීකරණය සහ ආගමත් සමහර විට මේකට ඇඳා ගන්නා ආකාරය. ඔබතුමා දන්නවා, ඔවුන් ස්වාධීන වෙන්න ඕනෑ බව. මේ විනිසුරුවරුන් මී පැණි වාගේ පිරිසිදු වෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ ස්වාධීන බව හැම අංශයකදීම තිබෙන්න ඕනෑ. ඔවුන් දේශපාලන වශයෙන් ගැත්තන් නොවිය යුතුයි, ආගමික වශයෙන් ගැත්තන් නොවිය යුතුයි, අනෙකුත් අංශවලිනුත් ගැත්තන් නොවිය යුතුයි.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්නම්, Justice Dheeraratne ගැන. ඒ මගේ සහෝදරයාගේ නෝනාගේ තාත්තා. එතුමා කීර්තිමත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙක්. මට මතකයි, අපි පොඩි කාලයේ එතුමා කිසිම විධියකින් කා සමහවත් පෞද්ගලික සම්බන්ධකම් පැවැත්වූයේ නැති බව; මිතුරන් එක්කවත් සම්බන්ධකම් පැවැත්වූයේ නැහැ. මම හිතන විධියට, විනිසුරුවරයෙක් බවට පත් වුණාම මහණ වුණා වාගේ ඒ වෘත්තියේ ගෞරවය රකින්න ඕනෑ. ගරු ඇමතිතුමනි, අපි දකිනවා, සමහර විනිසුරුවරුන් මේ ක්‍රමවේදයෙන් පොඩ්ඩක් බැහැර වන ආකාරය. අපි බලාපොරොත්තු වනවා, මේ සම්බන්ධයෙන් අධිකරණ ඇමතිවරයා වශයෙන් ඔබතුමාගේ මැදිහත් වීම.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම ඔබතුමාට මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. යසන්ත කෝදාගොඩ මැතිතුමා, නවාස් මැතිතුමා, ජනක් ද සිල්වා මැතිතුමා, අර්ජුන ඔබේසේකර මැතිතුමා, සෝභිත රාජකරුණා මැතිතුමා, කුමුදුනී වික්‍රමසිංහ මැතිතුමිය, මේනකා විජේසුන්දර මැතිතුමිය, අචල වෙංගප්පුලි මැතිතුමා, සම්පත් බී. අබේකෝන් මැතිතුමා යන විනිසුරුවරුන් ඉතාම ශ්‍රේෂ්ඨ ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු කරමින් ඉන්නවා. නීතිඥවරයෙකු වශයෙන් මා දකින විධියට මූලික අයිතිවාසිකම් නඩු ගොඩක් ඒ විනිසුරුවරුන්ගේ අධිකරණවලට වැටෙන්නේ නැහැ. විනිසුරුවරුන් කිහිපදෙනෙක් පමණක් තෝරාගෙන මූලික අයිතිවාසිකම් නඩු ගොනු කරනවා. මොකද, ආණ්ඩුවේ මර්දන කටයුතුවලට තමයි ගොඩක් වෙලාවට ඒවා යොදාගන්න උත්සාහ කරන්නේ.

ඒ වාගේම ඉතාම අවාසනාවන්ත සිදුවීමක යම් වීඩියෝ පටයක් මා දැක්කා. ඒ වීඩියෝ පටය අනුව යම් විනිසුරුවරයෙක් ආගමික ක්‍රියාවලියක යෙදෙන ආකාරයත්, ගයාන් සිරිමාන්න කියලා මිනීමරු චෝදනාවකට සහ තවත් යම් යම් චෝදනාවලට ලක් වුණු පුද්ගලයෙකුත් ඒ ස්ථානයේ ඉන්නා බවත් එහිදී මම දැක්කා. විශේෂයෙන්ම යම් යම් ආගමික සහ දේශපාලන සම්බන්ධකම් තිබෙනවා නම් ඒ විනිසුරුවරුන් අනිවාර්යයෙන්ම විනිසුරු වෘත්තියේ නොයෙදිය යුතුයි කියන එකත් මම කියනවා. මොකද, ඔවුන් ස්වාධීන වෙන්න ඕනෑ. ඔවුන් ඉතා පරිස්සමින් කටයුතු කරන්න ඕනෑ. තමන්ට පෞද්ගලික අදහස් තිබෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, හැබැයි විනිසුරුවරුන් වශයෙන් එහෙම නැත්නම් නීතියේ ස්වාධිපත්‍යය, අධිකරණයේ ස්වාධීන බව අගයන පුද්ගලයින් වශයෙන් ක්‍රියාත්මක වීමේදී ඔබතුමාත්, මමත් ස්වාධීන වෙන්න ඕනෑ. දේශපාලන වශයෙන් ලබන වාරයේ මම ඉන්න පුළුවන්, ආණ්ඩු පක්ෂයේ. එතකොට මට ඕක දැනෙන්නේ නැති වෙන්නත්, ඕක දැනෙන්නේ විරුද්ධ පක්ෂයේ අයට වෙන්නත් පුළුවන්. හැබැයි අපි එහෙම හිතන්නේ නැතුව මේක රැකගන්න ඕනෑ. මගේ පියාත්, මගේ ආච්චිත් මෙම වෘත්තියේ යෙදුණු නිසාත්, මගේ තවත් විශාල ඥාති පිරිසක් මේ වෘත්තියේ යෙදෙන නිසාත් අපේ වගකීම තමයි, මේක රැකගන්න එක. එහෙම නැතුව බැරි වෙලාවත් මේක දේශපාලනීකරණය වුණොත් යම් යම් ආකාරයේ වෘත්තිය උසස්වීම් සිදු කරන්න අවස්ථාව ලැබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දේශපාලන තීන්දු ලබා දුන්නොත්, ඇප ලබා නොදුන්නොත් එම විනිසුරුවරුන්ට උසස්වීම් හම්බ වෙනවා. නැත්නම් ඒ විනිසුරුවරුන් හොඳ අධිකරණවලට මාරු කරනවා. නමුත්, හොඳ විනිසුරුවරුන් විශාල පිරිසකට උසස්වීම් ලැබෙන්නේ නැහැ. මොකද, පක්ෂග්‍රාහී වෙන්නේ නැත්නම්, දේශපාලන ගැතිභාවය දක්වන්නේ නැත්නම් ඔවුන්ට ඒ උසස්වීම් ලැබෙන්නේ නැහැ. ඒ අනුව සියයට 98ක වාගේ ප්‍රමාණයකට ඒ උසස්වීම් ලැබෙන්නේ නැහැ; ඒ වාසි ලැබෙන්නේ නැහැ. දේශපාලන ගැතිභාවයෙන් නීති විරෝධී ලෙස රාජකාරි කරන ඉතා සීමිත පිරිසකට තමයි උසස්වීම් ලැබෙන්නේ. අපි බලාපොරොත්තු වනවා, ඊළඟට බලයට ආවාම මේවා සම්බන්ධයෙන් ව්‍යවහාරික පරීක්ෂණ පවත්වා, නීතිය ක්‍රියාත්මක කරන්න. විශේෂයෙන්ම ඒක අල්ලස් දීමක් වෙන්නත් පුළුවන්. මොකද, උසස්වීමක් - promotion එකක් - නැත්නම් කාලය දීර්ඝ කර ගැනීමක් ඒ මත වෙන්න පුළුවන්. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් කියනවා මම දැක්කා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ සේවා කාලයත් තව අවුරුදු දෙකකින් දීර්ඝ කරගන්න යම් යෝජනාවක් තිබෙනවා කියලා. මම හිතන්නේ ඒ වාගේ දේවල් සිදු වුණොත් මම කලින් කිව්වා වාගේ ඒක අල්ලස් දීමක් වෙන්නත් පුළුවන්. ඒ වාගේම විනිසුරුවරුන්ට බලපෑම් කිරීමක් වෙන්නත් පුළුවන්, ඒ ආකාරයේ සිදුවීම් වුණොත්. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය මා යොමු කරවනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමාට මේ ප්‍රශ්න 3 මා යොමු කරනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ සඳහන් වී ඇත්තේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරැකීමට ශ්‍රේෂ්ඨාධිකරණය බැඳී සිටිය යුතු බවයි. එවන් පසුබිමක් තුළ පැන නැඟී ඇති පහත ගැටලු සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගෙන් මා පිළිතුරු බලාපොරොත්තු වනවා.

01. 2021, 2022, 2023, 2024, 2025 සහ 2026 යන වසරවල මානව හිමිකම් - human rights, මූලික අයිතිවාසිකම් - fundamental rights - පිළිබඳ වෙන් වෙන් වශයෙන් කොපමණ නඩු ප්‍රමාණයක් පවරා තිබේද?

02. මූලික අවස්ථාවේදීම නඩු ඇසීම සඳහා අවසර ලබා නොදී කොපමණ ප්‍රමාණයක් ඉවත් කර තිබේද?

03. නඩුව පවත්වා ගැනීමට, තවදුරටත් ඇසිය යුතු නඩුවක් බවට තීරණය කරන ලද - leave to proceed granted - ඒ ඒ වසරවල නඩු ප්‍රමාණය කොපමණද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අද දින මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සූදානම්ව පැමිණියා. මට මේක විවාදයක් කරගන්න අවශ්‍ය නැහැ. නමුත් මූලික අදහසක් පමණක් දක්වා මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නවලට මම පිළිතුරු ලබා දෙන්නම්.

නීතියේ විධානයේ ආධිපත්‍යය සුරැකීම සඳහා අධිකරණයේ ස්වාධීනත්වය අත්‍යවශ්‍ය අංගයක්. අධිකරණයේ ස්වාධීනත්වය අවශ්‍ය වන්නේ නීතිඥවරුන්ට වඩා මේ රටේ පුරවැසියන්ටයි. මොකද, පුරවැසියන්ගේ ආරක්ෂාව තිබෙන්නේ අධිකරණයක් ස්වාධීන වනකොට පමණයි. නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු වෙන්නේ එවිටයි. මම ඉතිහාසය ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නඩුකාරතුමන්ලාගේ ගෙවල්වලට ගල් ගහපුවා, හිටපු අග්‍ර විනිශ්චයකාරවරුන්ට යම් අය සලකපු විධිය කියන මේ සියල්ලම ඉතිහාසයේ අපි ඇති තරම් දැකලා තිබෙනවා. ඒ නිසාම විපක්ෂයේ ඉන්නකොට නීතියේ විධානයේ ආධිපත්‍යය නොමැතිකම නිසා විඳවපු කොටසක් හැටියටත් අපි හිටියා. කෙසේ වෙතත්, මේ වනවිට අපේ රජය මඟින් නීතියේ විධානයේ ආධිපත්‍යය පිහිටුවීමටත්, අධිකරණයට

ස්වාධීනව කටයුතු කිරීමටත් සම්පූර්ණ අවස්ථාව ලබා දීලා තිබෙනවා. නමුත්, මම හිතන විධියට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට මම මේ කියන කාරණය ගැන පටලැවිල්ලක් නැහැ. නමුත්, බහුතරයක් දන්නේ නැහැ, අධිකරණ ඇමතිතුමාට කරන්න පුළුවන් සීමාව මොකක්ද, විධායකයේ සීමාව මොකක්ද, එතැනින් එහාට අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ ව්‍යවස්ථාවෙන්ම ආරක්ෂිත කරලා තිබෙන ස්වාධීන ආයතනයක් බව සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් මොනවාද කියන එක. ඔවුන්ට ඒ පිළිබඳව අවබෝධයක් නැහැ.

නමුත් ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඒක දන්නවා. ඒ වාගේම එතුමා දන්නවා, නඩුකාරතුමන්ලාගේ වැඩ තහනම් කිරීම, විමර්ශනය කිරීම, විනය බැලීම ආදී මේ සියල්ලම ස්වාධීනව අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් තමයි සිදු වෙන්නේ කියලා. මම තරයේ විශ්වාස කරනවා, වර්තමානයේ දේශපාලන අධිකාරියේ බලපෑමක් නොමැතිව අග්‍ර විනිශ්චයකාරතුමා සහ අධිකරණ පද්ධතිය ඉතා ස්වාධීනව කටයුතු කරගෙන යනවා කියලා. ඒක තමයි මට ඉස්සෙල්ලාම කියන්න වෙන්නේ. ඒ අනුව ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

| | | |
|---|---|---|
| 01. | 2021 | 443 |
| | 2022 | 399 |
| | 2023 | 319 |
| | 2024 | 351 |
| | 2025 | 301 |
| | 2026 මේ දක්වා | 25 |

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
In 2026, so far, how many cases have been filed?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
In 2026, to date, 25 cases have been filed.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Up to what time?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
That is not mentioned here, but you can take it that to date in the year 2026, 25 cases have been filed.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Okay, thank you.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

| | | |
|---|---|---|
| 02. | 2021 | 91 |
| | 2022 | 85 |
| | 2023 | 107 |
| | 2024 | 140 |
| | 2025 | 59 |
| | 2026 මේ දක්වා | 00 |

| | | |
|---|---|---|
| 03. | 2021 | 352 |
| | 2022 | 314 |
| | 2023 | 212 |
| | 2024 | 211 |
| | 2025 | 242 |

2026 අවුරුද්දේ ඒ සංඛ්‍යාව 25ක් වශයෙන්ම තිබෙනවා. මොකද, ඒ ටික තමයි ගොනු වෙලා තිබෙන්නේ, එකක්වත් ප්‍රතික්ෂේප වෙලා නැති නිසා. ඒ 25ම ඇසිය යුතු නඩු තත්ත්වයේ තිබෙනවා කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. මේවා තමයි ඔබතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු හැටියට මට කියන්න තිබෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මම ඔබතුමා කියපු දේ පිළිගන්නවා. ඇමතිවරයා වශයෙන් කරන්න පුළුවන් සීමාවන් තිබෙනවා. මම ඒක පිළිගන්නවා. ඇත්තටම මම සන්තෝෂ වෙනවා, ඔබතුමා වාගේ පුද්ගලයෙකු මේ තනතුරට පත් වීම ගැන. ඔබතුමාට යම් දේශපාලන බැඳීමක් තිබෙනවා කියන එක අපි පිළිගන්නවා. ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට මගේත් ඒ දේශපාලන බැඳීම තිබෙන්න පුළුවන්. මම ඔබතුමාට එක දෙයක් විතරක් කියනවා. කලින් හිටපු ඇමතිවරු වාගේම පාලකයෝත් කිව්වේ ස්වාධීනව තමන්ගේ අධිකරණය ක්‍රියාත්මක වෙනවා කියලා. ඔබතුමාත් ඒක සඳහන් කළා.

කෙසේ වෙතත්, ඔබතුමාගේ අවධානයට මේ කාරණය මම යොමු කරනවා. මේක ඉතාම වැදගත්, ගරු ඇමතිතුමනි. ඔබතුමාට මතක ඇති, අපි practise කරපු කාලයේ ඉතාම උද්‍යෝගයෙන් ඒ නඩුවලට පෙනී ඉඳලා ජනතාවට විශාල සහනයක් ලබා ගත්තා කියන එක. මොකද, මේ ජනතාවට එන්න පුළුවන් අන්තිම තැන තමයි ශ්‍රේෂ්ඨාධිකරණය. නඩු 400 ගණන්, 300 ගණන් තිබිලා තිබෙනවා. ඔබතුමා 2025 වර්ෂයේ පවරා තිබෙන නඩු ප්‍රමාණය අරගෙන බලන්න. එතකොට ඔබතුමාට මම මේ කියන දේ ඉතාම හොඳින් පැහැදිලි වෙනවා. 2026 අවුරුද්දේ මේ මාස 5ට, නඩු 25යි පවරා තිබෙන්නේ. ඒක ඉතාම පහළ මට්ටමක්; නඩු දමන්නේ නැති තරම්. ඒක නිසා තමයි මම ඔබතුමාට කිව්වේ නීතිඥවරු තමන්ගේ practice එක අත්හරින තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා. මම මේ ඔබතුමාට චෝදනාවක් කරනවා නොවෙයි. මම හිතන විධියට, ඒක ඉතාම ශෝචනීය තත්ත්වයක්. මොකද, ඒ නීතිඥවරු ගොඩක් වෙලාවට ශ්‍රේෂ්ඨාධිකරණයේ practise කරන්නේ fundamental rights නඩු හරහා. ඒ කට්ටියගේ practice එක ගැන නොවෙයි මම කියන්නේ. ඒකෙන් පිළිබිඹු වෙන්නේ මේ මාස 5ට පවරලා තිබෙන්නේ නඩු 25යි නම්, ඉතිරි මාස 7 ඉවර වෙනකොට තව නඩු 35ක් එකතු වුණොත්, 60ක් කියන එකයි. එතකොට මේ වර්ෂයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරපු මානව හිමිකම් නඩු ප්‍රමාණය 60යි. ඒක ලංකාවේ තිබුණු අඩුම නඩු ප්‍රමාණය. දැන් ඔබතුමාට පෙනෙනවා, අධිකරණය කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා. මම මේ කිව්ව දේ හරියටම හරි කියන එක මේකෙන් ඔප්පු වෙනවා. ඒකයි මම මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් ඇහුවේ. එතකොට කවුරුවත් නඩු දමන්නේ නැහැ. මොකද, රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරලා පවරන නඩු විසි කරනවා. ඒක මටත් වුණා. විනාඩි 5යි නඩුව ඇහුවේ. "පොලීසිය ඉන්නේ නඩු දමන්න, අපි ඉන්නේ හිරේ දමන්න" කියලා මාව එළියට දැම්මා.

හැබැයි, මගේ අනෙක් නඩුව ගත්තොත්, මගේ සියලු අයිතිවාසිකම් පිළිගෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරුවන් කිහිප දෙනෙක් නඩුව අහගෙන යනවා. මෙන්න මේ කාරණය

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

තමයි මම ඇහුවේ. මට විතරක් නොවෙයි, මේ රටේ දුප්පත් ජනතාවට, අපේ නිලධාරියෙකුට -අපේ පාර්ලිමේන්තුවේ නිලධාරියෙකුට, පොලීසියේ මහත්මයෙකුට - ඉහළ නිලධාරින්ගෙන් මොකක් හරි අඩන්තේට්ටමක් වෙනවා නම්, ඒ පුද්ගලයන්ට යන්න තිබෙන අන්තිම තැන තමයි ශ්‍රේෂ්ඨාධිකරණය. මේකට උත්තර දෙන්න ඕනෑ, අගවිනිසුරුතුමා. පවරන නඩු ප්‍රමාණය මෙහෙම පහත වැටුණේ කොහොමද කියන එක මම හිතන්නේ ඔබතුමා එතුමාට යොමු කරන්න ඕනෑ. නඩු 25 පවරලා තිබෙන්නේ, මේ අවුරුද්දේ මේ මාස 5ට. කවුරුවත් නඩු දමන්නේ නැහැ, නඩු වීසි කරන නිසා. මේක ඉතාම භයානක තත්ත්වයක්. මේක පොලිස් රාජ්‍යයක සලකුණක්. රුසියාවේ මෙහෙමයි, වෙනිසියුලාවේ මෙහෙමයි; නීතිය නොමැති අනෙකුත් රටවල තත්ත්වයත් මෙහෙමයි. මම ඒ දත්ත ඔබතුමාට මීන් පසු අවස්ථාවක ඉදිරිපත් කරන්නම්. මම හිතනවා, ඔබතුමා සභාවේ ඉන්න නිසා ඒ සම්බන්ධයෙන් යම්කිසි පණිවුඩයක් මේ අවස්ථාවේදී ලබා දෙයි කියලා.

රියෙන්සි අර්සකුලරත්න මහත්මයා ඔබතුමන්ලාගේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙක්. එතුමා අපේ Bar Association එක හරහා සඳහන් කරලා තිබුණා, විනිශ්චයකාරවරුන්ට උසස්වීම් දෙනකොට නිවැරදි ක්‍රමවේදයට, ඒ අයගේ seniority එක අනුව දෙන්න කියලා. එහෙම නැත්නම් දේශපාලනීකරණය වෙලා තමන්ගේ වුවමනාවලට මේ විනිසුරුවන් පාවිච්චි කරන්න පුළුවන් වෙන විධියට උසස්වීම්, මාරුවීම් ලබා දෙන්න පුළුවන් කියන දේ තමයි නීතිඥ සංගමයත් සඳහන් කළේ. ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ දත්ත ලබා දීම සම්බන්ධයෙන්. මම මේ දේවල් සම්බන්ධයෙන් මේ රටේ පාලකයන්ගේ අවධානය යොමු කරවනවා. පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කෙටියෙන් පැහැදිලි කිරීමක් පමණයි මම සිදු කරන්නේ. මා මෙය විවාදයක් කර ගන්න උත්සාහ කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මත ඉදිරිපත් කළා. ඔබතුමා ඉදිරිපත් කළ එක මතයක් ගැන මම කියන්නම්. ඔබතුමා නීතිඥවරයෙකුගේ නමක් කියලා කිව්වා, එතුමා අපේ පක්ෂයේ නීතිඥවරයෙක් කියලා. අපේ පක්ෂයට ගොඩක් නීතිඥවරු වැඩ කරනවා. ඒ නිසා රියෙන්සි මහත්මයා වුණත් කැමති වෙන එකක් නැහැ, අපි එතුමාට "පක්ෂයේ නීතිඥයා" කියනවාට. එහෙම කියන එක නිවැරදි නැහැ. ඒ නිසා අපි ඒක පොඩ්ඩක් නිවැරදි කර ගනිමු.

දෙවනුව ඔබතුමා ඉදිරිපත් කළ තර්කනය මේකයි. 2026දී නඩු ගොනු වෙලා තිබෙන්නේ 25යි, ඒ නිසා නඩු file කරන්න දෙන්නේ නැහැ, එක්කෝ lawyersලාට මේක එපා වෙලා, වීසි වන නිසා නඩු file කරන්නේ නැහැ වාගේ මතයක් තමයි මම හිතන විධියට ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ. ඒක ඔබතුමාගේ අදහස. නමුත් මම මෙහෙම කියන්නම්.

ඔබතුමා, 2021, 2022, 2023, 2024 සහ 2025 වර්ෂවල අහන්න නොදී වීසි කරපු නඩු සංඛ්‍යාව බලන්න. 2021 වර්ෂයේ අහන්න නොදී වීසි කළ නඩු සංඛ්‍යාව 91යි; 2022දී 85යි; 2023දී 107යි; 2024දී 140යි. ඔබතුමා දන්නවා, අපි 2024 නොවැම්බර් මාසයේ තමයි ආණ්ඩුව පිහිටෙව්වේ කියලා. රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව තිබුණු කාලයට, ගෝඨාභයගේ ආණ්ඩුව තිබුණු කාලයට තමයි අනෙක් අවුරුදු ටික අයත් වෙන්නේ.

අපි පාලනය කළ 2025 වර්ෂය උදාහරණයකට ගන්න. 2025 වර්ෂයේදී අහන්නේ නැතිව වීසි කරලා තිබෙන්නේ නඩු 59යි. එහෙම නම් 2021 වර්ෂයේ ඉඳලා අඩුවෙන්ම නඩු අහන්නේ නැතිව වීසි කරලා තිබෙන්නේ 2025 වර්ෂය කියන අපි හිටපු වර්ෂයේ; වර්තමාන අග්‍ර විනිශ්චයකාරයා හිටපු අවුරුද්දේ. නීතිඥවරයෙක් වශයෙන් ඔබතුමා දන්නවා, නීත්‍යනුකූලව ඉදිරියට යන්න බැරි නඩු dismiss වෙනවා කියලා. ඒ තත්ත්වය තමයි මෙතැන නිර්මාණය වෙලා තිබෙන්නේ.

ඒ වාගේම ඔබතුමා කිව්වා, නඩු අඩු වෙන්න හේතුව නීතිඥවරු නඩු file නොකිරීම කියලා. මම පොඩ්ඩක් ඒ මතයට එකඟ වෙන්නේ නැහැ. ඒකට හේතුව මේකයි. අපි මූලික අයිතිවාසිකම් නඩුවක් පවරන්නේ අපේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වෙනකොට නේ.

දැන් මේ දත්තයෙන්ම අපට තර්ක කරන්න බැරිද, මට කියන්න බැරිද, අපේ රජය විසින් ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය නොකරන නිසා මිනිස්සු නඩු පවරන්න එන්නේ නැහැ කියලා? ඒක හොඳ දෙයක්. එහෙම නැතිව සෘණාත්මක දෙයක් නොවෙයි. ඒ තර්කනය මට මේ දත්ත හරහා ඉදිරිපත් කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඔව්, රජය සහ රජයේ ආයතන. විධායකයට එරෙහිව නේ ගොඩක් වෙලාවට FR නඩු වැටෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. පොලීසිය වේවා, මොකක් හෝ ආයතනයක් වේවා, විධායකයේ යම් arm එකකට නේ, ඒ නඩු පවරන්නේ. නඩු පැවරීම අඩු වීම හරහා පෙන්වන දේ සෘණාත්මක නොවෙයි, ධනාත්මකයි. මොකද, මේ රජය මිනිස්සුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නේ නැහැ කියන තර්කනයත් මේ දත්තවලින් ගන්න පුළුවන්. හැබැයි, වඩාත් වටින්නේ ඒක නොවෙයි. මම මැයි මාසයේ මේ පිළිතුර කියෙව්වාට, JSC එකෙන් මේ පිළිතුර පසුගිය මාසයේ හදන්න ඇත්තේ, ඒ තිබෙන දත්ත එක්ක. තව මාස 8ක් ඉතුරු වෙලා තිබෙනවා. අපි සන්තෝෂ වෙන්න ඕනෑ, FR නඩු අඩු වෙනවා නම්. ඒ කියන්නේ මොකක්ද? රජය, විධායකය මිනිස්සුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කරන්නේ නැහැ කියන මතය. විවාදයක් නොවෙයි, මම අදහස විතරයි ඉදිරිපත් කළේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ඒ කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා සඳහන් කරපු කාරණය පිළිබඳව පොඩි correction එකක් කරන්න තිබෙනවා. 2025 වර්ෂයේ නඩු ප්‍රමාණයත් අඩු වෙනවා. මේ අගවිනිසුරුතුමා පත් කළේ 2025 වර්ෂයේ අග භාගයේ. මම ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. කිසිම රටක නඩු අඩු වෙන්නේ නැහැ. මගේ හැඟීම නම්, 2026 වර්ෂයේ නඩු ප්‍රමාණය අඩු වෙනවාය කියන්නේ, අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් යම් සහනයක් ලබා ගන්න බැරි තත්ත්වයක් උදා වෙනවා කියන එකයි. රටේ නීතිඥවරුන්ගේ හැඟීමත් ඒක. අප දෙදෙනාගේ අදහස දැන් අපි ඉදිරිපත් කළා. අධිකරණයට, විනිසුරුවන්ට, රටේ ජනතාවට සහ නීතිඥවරුන්ට භාරයි, ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගැනීම. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.29ට, 2026 ජූනි 09වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.29 மணிக்கு பாராளுமன்றம், 2026 யூன் 09, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.29 p.m. until 9.30 a.m. on Tuesday, 09th June, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 2003/2026 - පිළිතුර දීමට නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2003/2026 - விடையளிப்பதற்கு, வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ அவர்கள் இரண்டு வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Susil Ranasinghe, Minister of Housing, Construction and Water Supply has requested for two weeks' time to reply to Question No. 01 - 2003/2026 - raised by the Hon. Ravi Karunanayake appearing in today's Order Paper.

## මහවැලි යෝජනා ක්‍රමය: ජල විදුලි ධාරිතාව
## மகாவலித் திட்டம்: நீர் மின் உற்பத்தித் திறன்
## MAHAWELI SCHEME: HYDROPOWER CAPACITY

2004/2026

**2. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහවැලි යෝජනා ක්‍රමය යටතේ ස්ථාපිත මුළු ජල විදුලි ධාරිතාව සහ 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික විදුලි ජනනය කොපමණද;

(ii) එම ජල විදුලි පහසුකම් ඉදිකර, සේවාව ආරම්භ කරන ලද දිනය සහ එම ඉදිකිරීම් අනුමත කළ ජනාධිපතිවරයා කවුරුන්ද;

(iii) වික්ටෝරියා, රන්දෙණිගල සහ කොත්මලේ ඇතුළු ප්‍රධාන ජලාශවල වත්මන් අවසාදිත මට්ටම් සහ එමඟින් ජලාශවල රඳවා ගැනීමේ ධාරිතාවට ඇති බලපෑම කවරේද;

(iv) පසුගිය වසර 05 තුළ ජලාශ වේලිවල ආරක්ෂාව සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(v) වෙනස්වන වර්ෂාපතන රටාවන් හමුවේ කෘෂිකාර්මික වාරිමාර්ග, පානීය ජල සැපයුම සහ විදුලි ජනනය අතර සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) වාරිමාර්ග පද්ධතිය මත තැබිය හැකි විශ්වාසය සහ ගංවතුර කළමනාකරණ හැකියාව පිළිබඳව දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමක් සිදු කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மகாவலித் திட்டத்தின்கீழ் தாபிக்கப்பட்டுள்ள மொத்த நீர் மின் உற்பத்தித் திறன் மற்றும் 2020ஆம் ஆண்டு முதல் இன்று வரையிலான வருடாந்த உற்பத்தி யாது என்பதையும்;

(ii) அத்தகைய நீர் மின் வசதிகள் நிர்மாணிக் கப்பட்டு கையளிக்கப்பட்ட திகதி மற்றும் அவற்றின் நிர்மாணத்திற்கு அனுமதி வழங்கிய சனாதிபதி யார் என்பதையும்;

(ii) விக்டோரியா, ரன்தெனிகல மற்றும் கொத்மலை அணை உள்ளிட்ட பிரதான நீர்த்தேக்கங்களில் தற்பொழுது காணப்படும் மணல் படிவு மட்டங்கள் மற்றும் அவை நீர்த்தேக்கக் கொள்ளளவுமீது ஏற்படுத்தும் தாக்கம் யாது என்பதையும்;

(iv) கடந்த 05 ஆண்டுகளில் அணைகளின் பாதுகாப்பு மற்றும் புனரமைப்புப் பணிகளுக்காக ஒதுக்கப்பட்ட நிதியின் அளவு யாது என்பதையும்;

(v) மாறிவரும் மழைவீழ்ச்சிக் கோலங்களின்கீழ், விவசாய நீர்ப்பாசனம், குடிநீர் வழங்கல் மற்றும் மின் உற்பத்தி ஆகியவற்றைச் சமநிலைப்படுத்த எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) நீர்ப்பாசன நம்பகத்தன்மை மற்றும் வெள்ள முகாமைத்துவத் திறன் குறித்துக் காலநிலை மீள்திறன் மதிப்பீடு ஏதேனும் நடத்தப்பட்டுள்ளதா என்பதையும் அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) total installed hydropower capacity under the Mahaweli Scheme and the annual generation from 2020 to date;

(ii) date on which such hydropower facilities were constructed and commissioned, and the President who approved the construction;

(iii) current sedimentation levels in major reservoirs, including Victoria, Randenigala and Kotmale and its impact on storage capacity;

(iv) funds allocated for dam safety and rehabilitation during the last five years; and

(v) steps taken to balance agricultural irrigation, drinking water supply and power generation under changing rainfall patterns?

(b) Will he also inform this House whether a climate-resilient assessment has been conducted on irrigation reliability and flood management capacity?

(c) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) වගු අංක 01හි දැක්වේ.

වගු අංක 01:

| අනු අංකය | බලාගාරය | ස්ථාපිත ධාරිතාවය/ (මෙගාවොට්) | වාර්ෂික විදුලි ජනනය/ (මෙගාවොට් පැය) |
|---|---|---|---|
| 01 | කොත්මලේ | 201 | ලංකා විදුලිබල මණ්ඩලය විසින් පාලනය කරනු ලබයි. අප සතුව තොරතුරු නොමැත. |
| 02 | උකුවෙල | 40 | |
| 03 | වික්ටෝරියා | 210 | |
| 04 | රන්දෙණිගල | 122 | |
| 05 | රන්ටැඹේ | 50 | |
| 06 | බෝවතැන්න | 40 | |
| 07 | උඩවලව | 4 | |
| 08 | මොරගහකන්ද | 25 | වගු අංක 02 යටතේ දක්වා ඇත. |
| එකතුව | | 692 | |

වගු අංක 02: මොරගහකන්ද ජල විදුලි බලාගාරයේ 2020 වර්ෂයේ සිට මේ දක්වා විදුලි ජනනය

| අනු අංකය | වර්ෂය | වාර්ෂික විදුලි ජනනය/ (මෙගාවොට් පැය) |
|---|---|---|
| 1 | 2020 | 70,365.82 |
| 2 | 2021 | 85,134.58 |
| 3 | 2022 | 77,006.80 |
| 4 | 2023 | 62,154.35 |
| 5 | 2024 | 82,437.12 |
| 6 | 2025 | 97,189.01 |
| 7 | 2026 මාර්තු දක්වා | 23,028.32 |

(ii)

| ජලාශය | සේවාව ආරම්භ කළ වර්ෂය | ඉදිකිරීම් අනුමත කළ ජනාධිපතිවරයා |
|---|---|---|
| කොත්මලේ | 1985 | ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා |
| පොල්ගොල්ල | 1976 | විලියම් ගොපල්ලව මැතිතුමා |
| බෝවතැන්න | 1976 | විලියම් ගොපල්ලව මැතිතුමා |
| වික්ටෝරියා | 1985 | ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා |
| රන්දෙණිගල | 1987 | ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා |
| රන්ටැඹේ | 1990 | රණසිංහ ප්‍රේමදාස මැතිතුමා |
| මාදුරුඔය | 1983 | ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා |
| මොරගහකන්ද | 2018 | මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා |
| උඩවලව | 1986 | ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා |

(iii)

| ජලාශය | දළ ජල ධාරිතාවය (MCM) | අවසාධිත ප්‍රමාණ (MCM) |
|---|---|---|
| කොත්මලේ | 170.90 | 3.1 |
| පොල්ගොල්ල | 3.18 | 1.36 |
| බෝවතැන්න | 23.5 | මිනුම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. |
| වික්ටෝරියා | 722.00 | මිනුම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. |
| රන්දෙණිගල | 801.50 | 58.5 |
| රන්ටැඹේ | 6.14 | 5.1 |
| මාදුරුඔය | 596.60 | මිනුම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. |
| මොරගහකන්ද | 557.90 | මිනුම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. |
| උඩවලව | 278.20 | මිනුම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. |

(iv) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අයත් සියලු ජලාශවල වාර්ෂික නඩත්තු පිරිවැය (වියදම් කළ) පහත වගුවේ පරිදි වේ.

| වර්ෂය | ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය (රු. මිලියන) | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධන වියදම් | පුනරාවර්තන වියදම් | මුළු වියදම |
| 2021 | 360.99 | 259.67 | 620.67 |
| 2022 | 70.98 | 99.39 | 170.37 |
| 2023 | 219.00 | 297.092 | 516.092 |
| 2024 | 341.69 | 380.38 | 722.07 |
| 2025 | 346.19 | 474.26 | 820.44 |

(v) සෑම සතියකම සිකුරාදා දින ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන "සතිපතා ජල කළමනාකරණ කමිටුව" මඟින් ඉදිරි සතියට අවශ්‍ය මහවැලි ජල අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡා කර ඒ අනුව අවශ්‍ය මහවැලි ජලය බෙදා දීම සිදු කරනු ලබයි. ඒ සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහභාගි වන අතර, වෙනස් වන වර්ෂාපතන රටාවන් අනුව එහි දී පැන නැඟෙන ජල අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කර තීන්දු තීරණ ගනු ලබයි.

එසේම, සෑම මසකම මුල එම මාසයේ ජල අවශ්‍යතා සපයා ගැනීම සඳහා ද ඉහත ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මඟින් "මාසික ජල කළමනාකරණ කමිටුව" පවත්වනු ලබන අතර එය අමාත්‍ය මණ්ඩල නිර්දේශ අනුව සෑම මාසයකම මුල් සතියේ ජල කළමනාකරණ

කමිටුව හා සම්බන්ධ සියලු ආයතන සම්බන්ධ කරගෙන තීරණ ගනු ලබයි. ඒ සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, ජල කළමනාකරණ ලේකම් කාර්යාලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ අංශ, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ආදී රාජ්‍ය ආයතන බොහොමයක් සම්බන්ධ වෙමින් සමතුලිත ජල කළමනාකරණයක් සඳහා තීරණ ගැනීම සිදු කරනු ලබයි.

එසේම, සෑම කන්නයක් ආරම්භයට පෙර ගන්නෝරුව කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ පැවැත්වෙන ජල කළමනාකරණ රැස්වීමේ දී එම කන්නය සඳහා ජාතික ජල අවශ්‍යතාව සලකා බලමින් නිශ්චිත තීරණ ගනු ලබයි. එහි දී කෘෂිකාර්මික ක්ෂේත්‍රය, පානීය ජලය, විදුලි සැපයුම හා කාලගුණ තොරතුරු විශ්ලේෂණය කරමින් ඉහත ජාතික අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සමතුලිත ලෙස ජල කළමනාකරණය කර ගැනීම සඳහා තීරණ ගනු ලබයි.

මීට අමතරව සෑම වාරි ව්‍යාපාරයකටම ඇති "ව්‍යාපාර කළමනාකරණ කමිටු" මඟින් ව්‍යාපාරය තුළ මනා ජල කළමනාකරණයක් පවත්වා ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය ආයතන සම්බන්ධ වෙමින් වාරි ව්‍යාපාරයට අදාළ මනා ජල සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා ද කටයුතු සිදු කරයි.

(ආ)

| | |
|---|---|
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ප්‍රධාන ජලාශවල කාලීනව අවශ්‍ය නඩත්තු හා මෙහෙයුම් කටයුතු එම කාල සීමාවන්වල සිදු කරන අතර ඒ සඳහා වාර්ෂික වාර්තාවක් ලබා දෙනු ලැබේ. කුමන හෝ සිදුවිය හැකි ආපදාවක් හෝ හඳුනාගත් ප්‍රධාන අලුත්වැඩියා කටයුතු හා ජලාශ නිර්මිතවල ස්ථායිතාව පිළිබඳව එම වාර්ෂික වාර්තාවල මෙම තොරතුරු සඳහන් කර ඇත. එම වාර්තා අවශ්‍ය වේලාවන්හි පසු විපරම් කිරීම සඳහා ලේඛනාගාරයේ තබා ඇත. නිශ්චිත තොරතුරු රහිතව ලැබෙන වර්ෂාපතනය සහ එසේ ලැබෙන වර්ෂාපතනය නිවැරදිව ලැබෙන කාල පරාසය පිළිබඳව තොරතුරු රහිතව ජලාශවල ජලය ඉවත් කිරීම සිදු කළ නොහැකි වේ. දැනට අනුගමනය කරනු ලබන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පුරෝකථනය කරනු ලබන කාලගුණ දත්ත පමණි. ඒ අනුව ක්ෂණිකව ඇතිවන ලද වැසි නිසා ඇතිවන ගංවතුර පාලනය කිරීමේ හැකියාවක් නොමැත. |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති සියලුම මහා වාරි ව්‍යාපාර ඉදිකිරීමට පෙර ඒ සඳහා මනා සැලසුම් සහිතව ඉදිකිරීම් සිදු කර ඇත. විශේෂයෙන්ම විශාල ජලාශ ඉදිකිරීමේ දී ඒ සඳහා ලැබිය හැකි උපරිම වර්ෂාපතනයට හා ලැබිය හැකි උපරිම ගංවතුර ප්‍රමාණයට ආදියට ඔරොත්තු දීමේ සාධක ඇසුරු කරගෙන අදාළ නිර්මාණයන් සිදු කරනු ලබයි. තවද, එම සාධක පමණක් නොව අනතුරු වීමේ හැකියාව, ස්ථායිතාව, ජලාශයේ ධාරිතාව පෝෂක ප්‍රදේශවලින් ලැබෙන ජල ප්‍රමාණය, නිර්මිතවල ශක්තිමත් බව ආදී සියලු දේ ගණනය කර මෙම ඉදිකිරීම් සිදු කර ඇත. එම නිසා දේශගුණික විපර්යාස මත සිදුවන ගංවතුර ආදිය හමුවේ වාරිමාර්ග පද්ධතිය ස්ථායීව පැවතෙන අතර එමඟින් මනා ගංවතුර කළමනාකරණය ද සිදු කර ගත හැක. තවද වර්තමානයේ සිදු කරන විශාල ඉදිකිරීම් සඳහා ද වර්තමානයේ සිදු වන දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයනයන් සිදු කර ඒ අනුව ලැබෙන ජල ප්‍රමාණය ද ගණනය කර, එම දත්තයන් අනුසාරයෙන් සිදු කෙරෙන ගණනය කිරීම් අනුව නිර්මාණයන් සිදු කරනු ලබයි. |

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

(அ) (i) அட்டவணை 01இல் தரப்பட்டுள்ளது.

அட்டவணை 1

| தொடர் இலக்கம் | மின் நிலையம் | நிறுவப்பட்ட கொள்திறன்/ (மெகா வொட்) | வருடாந்த மின் உற்பத்தி/ (மெகா வொட் மணி) |
|---|---|---|---|
| 01 | கொத்மலை | 201 | இலங்கை மின்சார சபையினால் நிர்வகிக்கப் படுகின்றது. எம்மிடம் தகவல்கள் காணப் படுவதில்லை. |
| 02 | உக்குவெல | 40 | |
| 03 | விக்டோரியா | 210 | |
| 04 | ரன்தெனிகல | 122 | |
| 05 | ரன்டம்பே | 50 | |
| 06 | போவதென்ன | 40 | |
| 07 | உடவலவ | 4 | |
| 08 | மொரகஹகந்த | 25 | அட்டவணை இலக்கம் 02இன் கீழ் சுட்டிக்காட்டப் பட்டுள்ளது. |
| மொத்தம் | | 692 | |

அட்டவணை 02: மொரகஹகந்த நீர் மின் நிலையத்தின் 2020ஆம் ஆண்டிலிருந்து இது வரையான மின் உற்பத்தி

| தொடர் இலக்கம் | ஆண்டு | வருடாந்த மின் உற்பத்தி/ (மொகாவொட் மணி) |
|---|---|---|
| 1 | 2020 | 70,365.82 |
| 2 | 2021 | 85,134.58 |
| 3 | 2022 | 77,006.80 |
| 4 | 2023 | 62,154.35 |
| 5 | 2024 | 82,437.12 |
| 6 | 2025 | 97,189.01 |
| 7 | 2026 மார்ச் வரை | 23,028.32 |

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(ii)

| நீர்த்தேக்கம் | சேவை ஆரம்பிக் கப்பட்ட ஆண்டு | கட்டுமானத்தை அங்கீகரித்த சனாதிபதி |
|---|---|---|
| கொத்மலை | 1985 | ஜே.ஆர். ஜயவர்தன அவர்கள் |
| பொல்கொல்ல | 1976 | வில்லியம் கொபல்லவ அவர்கள் |
| போவதென்னை | 1976 | வில்லியம் கொபல்லவ அவர்கள் |
| விக்டோரியா | 1985 | ஜே.ஆர். ஜயவர்தன அவர்கள் |
| ரந்தெனிகல | 1987 | ஜே.ஆர். ஜயவர்தன அவர்கள் |
| ரன்டம்பே | 1990 | ரணசிங்க பிரேமதாச அவர்கள் |
| மாதுரு ஓய | 1983 | ஜே.ஆர். ஜயவர்தன அவர்கள் |
| மொரகஹகந்த | 2018 | மைத்திரிபால சிறிசேன அவர்கள் |
| உடவலவ | 1986 | ஜே.ஆர். ஜயவர்தன அவர்கள் |

(iii)

| நீர்த்தேக்கம் மொத்த நீர் கொள்திறன் (MCM)பதிவின் அளவு (MCM) | | |
|---|---|---|
| கொத்மலை | 170.90 | 3.1 |
| பொல்கொல்ல | 3.18 | 1.36 |
| போவதென் னை | 23.5 | அளவீட்டுப் பணிகளை எதிர்வரும் கால கட்டத்தில் முன்னெடுப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. |
| விக்டோரியா | 722.00 | அளவீட்டுப் பணிகளை எதிர்வரும் கால கட்டத்தில் முன்னெடுப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. |
| ரன்தெனிகல | 801.50 | 58.5 |
| ரன்டம்பே | 6.14 | 5.1 |
| மாதுரு ஓய | 596.60 | அளவீட்டுப் பணிகளை எதிர்வரும் கால கட்டத்தில் முன்னெடுப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. |
| மொரகஹகந்த | 557.90 | அளவீட்டுப் பணிகளை எதிர்வரும் கால கட்டத்தில் முன்னெடுப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. |
| உடவலவ | 278.20 | அளவீட்டுப் பணிகளை எதிர்வரும் கால கட்டத்தில் முன்னெடுப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. |

(iv) இலங்கை மகாவலி அதிகார சபையின் பிரதான அணைகள் மற்றும் நீர்த்தேக்கங்களின் செயற்பாட்டுப் பிரிவிற்குரிய அனைத்து நீர்த்தேக்கங்களினதும் வருடாந்த பராமரிப்புச் செலவுகள் (செலவிடப்பட்டவை) தொடர்பான விபரங்கள் கீழ்வரும் அட்டவணையில் குறிப்பிடப்பட்டுள்ளன.

| ஆண்டு | புனரமைப்புப் பணிகளுக்காக ஒதுக்கப்பட்ட நிதித் தொகை (ரூபாய் மில்லியன்) | | |
|---|---|---|---|
| | மூலதன செலவுகள் | மீண்டுவரும் செலவுகள் | மொத்தச் செலவு |
| 2021 | 360.99 | 259.67 | 620.67 |
| 2022 | 70.98 | 99.39 | 170.37 |
| 2023 | 219.00 | 297.092 | 516.092 |
| 2024 | 341.69 | 380.38 | 722.07 |
| 2025 | 346.19 | 474.26 | 820.44 |

(v) ஒவ்வொரு வாரமும் வெள்ளிக்கிழமையன்று நீர் முகாமைத்துவ செயலகத்தினால் ஒழுங்கு செய்யப்படும் "வாராந்த நீர் முகாமைத்துவக் குழு" மூலம் அடுத்த வாரத்திற்குத் தேவையான மகாவலி நீர்த் தேவைகள் தொடர்பாகக் கலந்துரையாடப்பட்டு, அதற்கேற்ப தேவை யான மகாவலி நீர் பகிர்ந்தளிக்கப்படுகின்றது. இதற்காக தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு சபை, இலங்கை மின்சார சபை மற்றும் நீர்ப்பாசனத் திணைக்களம் ஆகிய நிறுவனங்கள் பங்கேற்பதுடன், மாறிவரும் மழைவீழ்ச்சி முறைமைகளுக்கேற்ப மேலெழும் நீர்த்தேவைகள் தொடர்பாக கலந்துரையாடப் பட்டு தீர்மானங்கள் எடுக்கப்படுகின்றன.

அத்துடன், ஒவ்வொரு மாதத்தின் ஆரம்பத்திலும் அம்மாதத்திற்கான நீர்த் தேவைகளைப் பூர்த்தி செய்வதற்காக மேற்குறிப்பிட்ட நீர் முகாமைத் துவ செயலகத்தினால் "மாதாந்த நீர் முகாமைத் துவக் குழு" நடாத்தப்படுகின்றது. அமைச்சரவை யின் பரிந்துரைகளுக்கு அமைவாக ஒவ்வொரு மாதத்தின் முதல் வாரத்தில், நீர் முகாமைத்துவக் குழுவுடன் தொடர்புடைய அனைத்து நிறுவனங்களினதும் பங்கேற்புடன் குறித்த தீர்மானங்கள் எடுக்கப்படுகின்றன. இதற்காக வளிமண்டலவியல் திணைக்களம், இலங்கை மின்சார சபை, நீர் முகாமைத்துவ செயலகம், நீர்ப்பாசனத் திணைக்களம், அனர்த்த முகாமைத்துவப் பிரிவுகள், தேசிய நீர்வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை உள்ளிட்ட பல அரச நிறுவனங்கள் இணைந்து சம நிலையான நீர் முகாமைத்துவதற்கான தீர்மானங்களை எடுக்கின்றன.

அத்துடன், ஒவ்வொரு பயிர் போகம் ஆரம்பிக்கும் முன்னரும் கன்னோருவ விவசாய ஆராய்ச்சி நிறுவனத்தில் நடைபெறும் நீர் முகாமைத்துவக் கூட்டத்தில், அப்போகத்திற் கான தேசிய நீர்த் தேவைகள் கவனத்திலெடுக் கப்பட்டு உரிய தீர்மானங்கள் எடுக்கப் படுகின்றன. அதன்போது விவசாயத் துறை, குடிநீர், மின் விநியோகம் மற்றும் காலநிலைத்

தகவல்கள் ஆகியவை பகுப்பாய்வு செய்யப்பட்டு, மேற்கண்ட தேசிய தேவைகளைப் பூர்த்தி செய்யும் முகமாக சமநிலையான நீர் முகாமைத்துவம் தொடர்பான தீர்மானங்கள் எடுக்கப்படுகின்றன.

மேலும், ஒவ்வொரு பாசனத் திட்டத்திற்கும் உரித்தான "கருத்திட்ட முகாமைத்துவக் குழுக்கள்" மூலம், கருத்திட்டத்திற்குள் சிறந்த நீர் முகாமைத்துவத்தைப் பேணுவதற்குத் தேவையான வேலைத்திட்டங்கள் நடைமுறைப் படுத்தப்படுகின்றன. இதற்காக நீர்ப்பாசனத் திணைக்களம், விவசாயத் திணைக்களம், கமநல சேவைகள் திணைக்களம் உள்ளிட்ட அரச நிறுவனங்கள் இணைந்து, பாசனத் திட்டத்திற்குப் பொருத்தமான நீர் சமநிலையைப் பேணுவதற்குத் தேவையான நடவடிக்கைகள் முன்னெடுக்கப்படுகின்றன.

(ஆ)

| | |
|---|---|
| இலங்கை மகாவலி அதிகார சபை | இலங்கை மகாவலி அதிகார சபைக்கு உரித்தான பிரதான நீர்த்தேக்கங்களில் காலந்தோறும் தேவையான பராமரிப்பு மற்றும் செயற்பாட்டுப் பணிகள் குறித்த காலப் பகுதியில் மேற்கொள்ளப்படுவதுடன், அதற்கான வருடாந்த அறிக்கைகளும் சமர்ப்பிக்கப்படுகின்றன. எவ்விதத்திலேனும் ஏற்படக்கூடிய அனர்த்தங்கள் அல்லது அடையாளம் காணப்பட்ட பிரதான பழுது பார்ப்புப் பணிகள் மற்றும் நீர்த்தேக்கக் கட்டமைப்புகளின் நிலைத்தன்மை தொடர்பான தகவல்கள் அவ்வருடாந்த அறிக்கைகளில் உள்ளடக்கப்பட்டுள்ளன. அவ்வறிக்கைகள், தேவையான சந்தர்ப்பங்களில் பின்னாய்வு நடவடிக்கைகளுக்காக ஆவணக் காப்பகத்தில் பாதுகாக்கப்பட்டுள்ளன. துல்லியமான தகவல்களின்றி கிடைக்கும் மழைவீழ்ச்சி மற்றும் அது ஏற்படும் காலப்பகுதி தொடர்பான தகவல்கள் காணப்படாத நிலையில், நீர்த்தேக்கங்களிலிருந்து நீரை வெளியேற்ற முடியாதநிலை ஏற்படும். தற்சமயம் வளிமண்டலவியல் திணைக்களத்தினால் முன்னறிவிக்கப்படும் காலநிலைத் தரவுகளின் அடிப்படையிலேயே தேவையான நடவடிக்கைகள் முன்னெடுக்கப்படுகின்றன. அதனடிப்படையில் திடீரென ஏற்படும் மழையினால் உருவாகும் வெள்ளப்பெருக்கு நிலைகளைக் கட்டுப்படுத்துவதற்கு வாய்ப்புகள் நிலவுவதில்லை. |
| நீர்ப்பாசனத் திணைக்களம் | இலங்கையில் நிர்மாணிக்கப்பட்டுள்ள அனைத்து பாரியளவான நீர்ப்பாசனக் கருத்திட்டங்களும் உரிய திட்டமிடலுடன் கூடியதாக நிர்மாணிக்கப்பட்டுள்ளன. குறிப்பாக பாரியளவிலான நீர்த்தேக்கங்களை நிர்மாணிக்கும்போது கிடைக்கக்கூடிய அதிகபட்ச மழைவீழ்ச்சி மற்றும் ஏற்படக்கூடிய அதிகபட்ச வெள்ளப் பெருக்கு நிலைகள் போன்ற காரணிகளை அடிப்படையாகக்கொண்டு தொடர்புடைய வடிவமைப்புகள் மேற்கொள்ளப்படுகின்றன. மேலும், அக்காரணிகள் மட்டுமன்றி அனர்த்தம் ஏற்படக்கூடிய திறன், நிலைத்தன்மை, நீர்த்தேக்கத்தின் கொள்ளளவு, நீரேந்து பிரதேசங்களிலிருந்து கிடைக்கும் நீரினளவு மற்றும் கட்டமைப்புகளின் வலிமை உள்ளிட்ட அனைத்து காரணிகளும் கணக்கிலெடுக்கப்பட்டு இந்நிர்மாணிப்புப் பணிகள் முன்னெடுக்கப் பட்டுள்ளன. எனவே, காலநிலை மாற்றங்கள் காரணமாக ஏற்படும் வெள்ள நிலைமைகள் போன்ற சூழ்நிலைகளிலும் நீர்பாசனக் கட்டமைப்பு நிலைத் தன்மையுடன் செயற் படுவதுடன், அதன்மூலம் சிறந்த மற்றும் திறன்மிக்க வெள்ளமுகாமைத்துவத்தை மேற் கொள்ள முடிகின்றது. மேலும், தற்போது மேற்கொள்ளப்படுகின்ற பாரியளவிலான நிர்மாணிப்புகளின்போதும் காலநிலை மாற்றங்கள் தொடர்பான ஆய்வுகள் மேற்கொள் ளப்பட்டு, அத்தரவுகளின் அடிப்படையில் கிடைக்கக்கூடிய நீரினளவு கணக்கிடப்பட்டு தொடர்புடைய குறித்த வடிவமைப்புகள் தயாரிக்கப்படுகின்றன. |

(இ) மேற்குறித்த பதிலின் அடிப்படையில் பொருந்தாது.

(a) (i) Given in Table 01 below.

Table 01

| Serial No. | Power Station | Installed Capacity / (Megawatts) | Annual Power Generation (Megawatt Hours) |
|---|---|---|---|
| 01 | Kothmale | 201 | Controlled by the Ceylon Electricity Board. Information is not available. |
| 02 | Ukuwela | 40 | |
| 03 | Victoria | 210 | |
| 04 | Randenigala | 122 | |
| 05 | Rantambe | 50 | |
| 06 | Bowathenna | 40 | |
| 07 | Udawalawa | 4 | |
| 08 | Moragahakanda | 25 | Depicted in Table 02 |
| Total | | 692 | |

Table 02: Power Generation at Moragahakanda Hydropower Station (From 2020 up to the present)

| Serial No. | Year | Annual Power Generatio (Megawatt hours) |
|---|---|---|
| 1 | 2020 | 70, 365.82 |
| 2 | 2021 | 85, 134.58 |
| 3 | 2022 | 77, 006.80 |
| 4 | 2023 | 62, 154.35 |
| 5 | 2024 | 82, 437.12 |
| 6 | 2025 | 97, 189.01 |
| 7 | Up to March, 2026 | 23, 028.32 |

(ii)

| Reservoir | Year of Commencement of Operations | President who approved the constructions |
|---|---|---|
| Kothmale | 1985 | Hon. J.R. Jayewardene |
| Polgolla | 1976 | Hon. William Gopallawa |
| Bowathenna | 1976 | Hon. William Gopallawa |
| Victoria | 1985 | Hon. J.R. Jayewardene |
| Randenigala | 1987 | Hon. J.R. Jayewardene |
| Rantambe | 1990 | Hon. Ranasinghe Premadasa |
| Maduruoya | 1983 | Hon. J.R. Jayewardene |
| Moragahakanda | 2018 | Hon. Maithripala Sirisena |
| Udawalawa | 1986 | Hon J.R. Jayewardene |

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(iii)

| Reservoir | Gross Water Capacity | Sediment Volumes (MCM) |
|---|---|---|
| Kothmale | 170.90 | 3.1 |
| Polgolla | 3.18 | 1.36 |
| Bowathenna | 23.5 | The relevant surveys are scheduled to be conducted in the future. |
| Victoria | 722.00 | The relevant surveys are scheduled to be conducted in the future. |
| Randenigala | 801.50 | 58.5 |
| Rantambe | 6.14 | 5.1 |
| Maduruoya | 596.60 | The relevant surveys are scheduled to be conducted in the future. |
| Moragahakanda | 557.90 | The relevant surveys are scheduled to be conducted in the future. |
| Udawalawa | 278.20 | The relevant surveys are scheduled to be conducted in the future. |

(iv) The annual maintenance costs (expenditure incurred) on all reservoirs under the purview of the Operation and Maintenance Division of the Sri Lanka Mahaweli Authority are set out in the table below.

| Year | Allocation for Rehabilitation (Rs. Mn) | | |
|---|---|---|---|
| | Capital Expenditures | Recurrent Expenditure | Total Cost |
| 2021 | 360.99 | 259.67 | 620.67 |
| 2022 | 70.98 | 99.39 | 170.37 |
| 2023 | 219.00 | 297.092 | 516.092 |
| 2024 | 341.69 | 380.38 | 722.07 |
| 2025 | 346.19 | 474.26 | 820.44 |

(v) The Mahaweli water requirements for the ensuing week are assessed by the Weekly Water Management Committee convened every Friday by the Water Management Secretariat and the distribution of Mahaweli water is executed based on these assessments. This Committee is attended by the National Water Supply and Drainage Board, the Ceylon Electricity Board and the Department of Irrigation, where decisions are made regarding water requirements arising from changing rainfall patterns.

Further, at the beginning of each month, the Water Management Secretariat convenes the Monthly Water Management Committee to ensure that monthly water requirements are met and in accordance with Cabinet recommendations, this Committee meets during the first week of every month, bringing together all relevant stakeholder agencies to make strategic decisions. A multitude of State institutions, including the Department of Meteorology, the Ceylon Electricity Board, the Water Management Secretariat, the Department of Irrigation, disaster management divisions and the National Water Supply and Drainage Board participate in this process to make collective decisions aimed at ensuring balanced water resource management.

Further, prior to the commencement of each season, definitive decisions are taken regarding national water requirements for that season at the Water Management Meeting held at the Gannoruwa Agricultural Research Institute. During these deliberations, the agricultural sector, drinking water needs, electricity supply and meteorological data are thoroughly analysed to make strategic decisions for the balanced management of water resources in order to fulfil the aforementioned national requirements.

In addition, the Project Management Committees established for each irrigation scheme implement the necessary programmes to maintain effective water management within the respective project areas. State institutions such as the Department of Irrigation, the Department of Agriculture and the Department of Agrarian Development collaborate in this process to maintain an optimal water balance within the respective irrigation schemes.

(b)

| | |
|---|---|
| Mahaweli Authority of Sri Lanka | The timely and essential maintenance and operational activities for the major reservoirs belonging to the Mahaweli Authority of Sri Lanka are carried out during the respective periods and an annual report is provided to that effect. These annual reports incorporate detailed information regarding any potential disasters, identified major repairs and the structural stability of the reservoir structures. The said reports are archived in the record room for follow-up purposes, when required. In the absence of precise quantitative data regarding anticipated rainfall, as well as definite timelines for such precipitation, the release of water from reservoirs cannot be executed. Currently, operational decisions rely solely on meteorological data forecasted by the Department of Meteorology. Consequently, it is not feasible to mitigate or control floods resulting from sudden, high-intensity rainfall events. |
| Department of Irrigation | All major irrigation projects established in Sri Lanka were executed in accordance with meticulous and well-structured plans formulated prior to their construction. Particularly, in the construction of large-scale reservoirs, the relevant designs are engineered based on resilience factors capable of withstanding maximum probable precipitation and peak flood volumes. Furthermore, these constructions have been executed by calculating not only those factors, but all things such as the possibility of accidents, stability, the capacity of the reservoir, the amount of water received from catchment areas and the strength of the structures. Therefore, in the face of floods et cetera occurring based on climate change, the irrigation system remains stable and through that, proper flood management can also be carried out. Further, for large-scale constructions carried out at present as well, studies regarding climate change occurring at present are conducted, the amount of water received accordingly is also calculated and designs are carried out according to calculations performed based on those data. |

(c) Does not arise, as per the above Answer.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.